ඉහළ ගුවන කරා

ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

වාර්ෂික වාර්තාව 2022



ගුවන්තොටුපළ සහ ගුවන්සේවා
(ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

ඉහළ ගුවන කරා

අපේක්ෂාවන්ගෙන් ඔබ්බට ගමන් කිරීම, ගුවන්තොටුපළ සහ ගුවන්සේවා හි අප උත්සාහ කරනු ලබන ගුණාංගයකි. කෙසේ නමුත්, ගුවන්සේවා කර්මාන්තය තුළ අපගේ පිළිගැනීම තහවුරු කිරීමේදී, ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම මෙන්ම ඉන් ඔබ්බට ගමන් කිරීමට ඇති හැකියාව තීරණාත්මක වේ. සුවපහසුව සිට සුඛෝපභෝගීත්වය දක්වා, ආහාරපානවල සිට ආගන්තුක සත්කාරය දක්වා, අපගේ සමස්ත අද්දැකීම් කාර්ය ගලනය ශ්‍රී ලංකාව වෙත පැමිණෙන දහස් ගණන් ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව ලැබෙන අත්දැකීමක් වන්නා සේම ඉන් අපගේ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ සාක්ෂි සපයනු ලබයි. අපි සෑම දිනකම අත් විඳිනු ලබන අපගේ කණ්ඩායමේ වර්ධනය සහ ඵලදායීත්වය, අපගේ ඉලක්කයන්ගේ මුදුනටම යමින් අපි නව තලයකට ගමන් කිරීම ආදී ජයග්‍රහණයන් සඳහා අභියෝගාත්මක වසර කිහිපයක් මධ්‍යයේ පවා ඉමහත් කැපවීමක් පෙන්නුම් කරමින් අධිෂ්ඨානශීලිත්වයෙන් කටයුතු කිරීම හේතු වී ඇත.

පටුන

දැක්ම සහ මෙහෙවර	3
අපගේ ඓතිහාසික සන්ධිස්ථාන	6
විශේෂ මූල්‍ය තොරතුරු	8
කාර්යසාධන සුවිශේෂිතා	9
ආයතනික ව්‍යුහය	10
වසරේ සාරාංශය	11
සභාපතිතුමාගේ පණිවුඩය	12
නායකත්ව කණ්ඩායම	16
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	21
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	26
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව (AMC)	31
කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය	37
මූල්‍ය සමාලෝචනය	51
මානව සම්පත් කළමනාකරණය	57
අවදානම් කළමනාකරණය	63
ආයතනික පාලනය	69

මූල්‍ය වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව	78
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	86
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	87
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය	88
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	89
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	90
අප හා සබැඳි ගුවන්සමාගම් සහ ගුවන්යානා ගොඩබෑ හැකි විවිධ ස්ථාන	118
ආයතනික තොරතුරු	120

සභාපතිතුමාගේ පණිවුඩය

2022 වාර්ෂික වාර්තාව පිළිබඳ මාගේ අදහස් දැක්වීමේදී, සෑම කෙනෙකුම සුභවාදී බලාපොරොත්තුව අවසානයේ මුදුන්පත් වීම පිළිබඳව සතුටින් සිටීම සටහන් කර සිටිමි....

තව කියවන්න පිටුව 12

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

තව කියවන්න පිටුව 37

මූල්‍ය සමාලෝචනය

තව කියවන්න පිටුව 51

මානව සම්පත් කළමනාකරණය

තව කියවන්න පිටුව 57



දැක්ම

"තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම"

මෙහෙවර

"ආයතනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තෘප්තිය තහවුරු කිරීම සඳහා තරඟකාරී, ආරක්ෂිත ගුවන්සේවා සහ නවීන තාක්ෂණයෙන් හා වඩා හොඳ පරිචයන්ගෙන් සමන්විත වූ විශිෂ්ඨ වූ ආගන්තුක අත්දැකීම් ලබා දීම"





අපගේ ඓතිහාසික සන්ධිස්ථාන

එවකට 'දිවයින' හරහා ගුවන් මාර්ග සේවාවක් ආරම්භ වීමත් සමග ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස.) හි මූලාරම්භය වර්ෂ 1932 දක්වා දිවයයි. එතැන් පටන් ගෙවී ගිය අනූවක් වසර පුරා සෑම ආකාරයකින්ම ගුවන්සේවා කේන්ද්‍රස්ථානය වෙනස්කම් වලට භාජනය වී ඇත. සෑම කාලයකදීම ඉදිරි ගමන් මඟ ශක්තිමත් කරනු ලබන නව සංවර්ධනයන් සහ වෙනස්කම් දැකගැනීමට හැකි විය. "තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම" යන දැක්ම පෙරදැරි කරගනිමින්, ගු.ගු.සේ.ස. විසින් සිය විශිෂ්ටත්වය කරා යන ගමනේ කාර්යභාරය නිමවා ඇත. වර්තමානයේ ගු.ගු.සේ.ස. විසින් ලොව පුරා සිටින සිය සියලුම පාර්ශවකරුවන් වෙත මහඟු සේවයක් දායාද කරනු ලබයි.

1983 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සියලුම ගුවන් තොටුපළවල්හි සමස්ත සංවර්ධනය, නඩත්තුව, පරිපාලනය සහ සේවා සැපයුම ඔස්සේ ගු.ගු.සේ.ස. විසින් සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. එහි සංස්ථාගත කිරීමත් සමඟ, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සාමාජිකයෙකු ලෙස රාජකාරී භාර ගැනීමට රජයේ නියෝජිතයා ලෙස ගු.ගු.සේ.ස. පත් කරන ලදී.

1930

- වික්සත් රාජධානිය සහ ඉන්දියාව අතර ගුවන් තැපැල් සේවාව ලංකාව හරහා දීර්ඝ කිරීමට ලංකා අණ්ඩුකාරවරයා විසින් සාකච්ඡා කරනු ලැබීම.

1934

- රත්මලානේහි ගඟන යාත්‍රාංගනයක් ඉදිකිරීමට ලංකා රාජ්‍ය සභාව තීරණය කිරීම.

1936

- රත්මලානේ ගඟන යාත්‍රාංගනය නිම කිරීම.
- ලංකා ගුවන් සමාජය විසින් මහජනතාවට ගුවන් ගමන් අවස්ථා සැලසීම.

1937

- පළමු ගුවන් සංචලන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ලංකා වේ ලියාපදිංචි සලකුණ දරන පළමු ගුවන් යානා තුන ගුවන් යානා ලේඛනයට ඇතුළත් කිරීම.

1938

- පෙබරවාරි 28 දින රත්මලාන ගුවන්තොටුපළ (ර.ගු.) විවෘත කිරීම.
- සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂවරයා ලෙස රාජ්‍ය වැඩ අධ්‍යක්ෂවරයා පත් කිරීම.

1939

- පුත්තලමේදී හදිසි ගොඩබෑමක් සිදු කිරීම.

1942

- දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමඟ, රත්මලාන ගුවන්තොටුපළේ කටයුතු රාජකීය ගුවන් හමුදාව යටතට පත්වීම.

1945

- වික්සත් රාජධානිය - ඕස්ට්‍රේලියාව - 'ලැන්කස්ට්‍රියානු' ගුවන්සේවය ශ්‍රී ලංකාව හරහා ආරම්භ කිරීම.

1946

- ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව පිහිටුවාලීම.
- රත්මලාන ගඟන යාත්‍රාංගනය සිවිල් ගුවන් ගමන් සඳහා රාජකීය ගුවන් හමුදාව විසින් පවරා ගැනීම.

1947

- එයාර් සිලෝන් - ජාතික ගුවන්සේවය, සන්නිවේදන සහ වැඩ අමාත්‍යාංශය යටතේ පිහිටුවාලීම.
- යාපනය හරහා කොළඹ සිට මදුරාසියට ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කිරීම.

1948

- ශ්‍රී ලංකාව, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) සාමාජිකයෙකු ලෙස පත් කිරීම.

1950

- 1950 අංක 15 දරන ගුවන් නාවික පනත ප්‍රකාශයට පත්කිරීම.
- නියමුවන් පුහුණු කිරීම සඳහා ආයතනයක් පිහිටුවාලීම.

1955

- එයාර් සිලෝන් සමාගම, KLM රාජකීය ලන්දේසි ගුවන් සමාගම සමඟ ගිවිසුමකට එළඹීම.

1959

- ජාත්‍යන්තර ගුවන් ගමන්, කටුනායකට ගෙන යාම.

1963

- කටුනායක ගුවන්තොටුපළ සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීම.
- RAF ධාවන පථය, කැනඩා රජයේ ආධාර මත මීටර් 1,840 සිට මීටර් 3,350 දක්වා පුළුල් කිරීම.
- වසරකට මගීන් 150,000 ක් හැසිරවිය හැකි පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

1967

- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු.) විවෘත කිරීම.

1968

- විශාල පර්යන්ත ගොඩනැගිල්ලක්, ගුවන්යානා හැසිරවීමේ අංගනයක් සහ ගුවන් ධාවන පථයට පිවිසුම් මාර්ගය ඉදිකිරීම.

1979

- ජාතික ප්‍රවාහකයා ලෙස එයාර් ලංකා ගුවන්සේවය ආරම්භ කිරීම.
- 1979 දී ගුවන්තොටුපළ අධිකාරී පනත ප්‍රකාශයට පත්කර, ගුවන්තොටුපළ අධිකාරිය පිහිටුවාලීම.

1980

- ගුවන්තොටුපළ අධිකාරිය විසින් සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව වෙතින් සිවිල් ගුවන්තොටුපළ මෙහෙයුම් පවරා ගැනීම.

1981

- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා කටයුතු සඳහා රජය සතු සමාගමක් පිහිටුවීමට රජය තීරණය කිරීම.

1982

- ගුවන් නාවික පනත වෙත සංශෝධන සිදු කිරීම.

1983

- ගුවන්තොටුපළවල සමස්ත සංවර්ධනය, නඩත්තු කිරීම, පරිපාලනය සහ සේවා සැපයීම අධීක්ෂණය කිරීම සඳහා ගු.ගු.සේ.ස. ස්ථාපිත කිරීම.

1984

- නව ධාවන පථයක්, මගී පර්යන්ත ගොඩනැගිල්ලක්, භාණ්ඩ ගොඩබහාලන සංකීර්ණයක්, පාලක කුළුනු සහ සංඥා සේවා සහ නඩත්තු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සංවර්ධන වැඩසටහනක් ආරම්භ කිරීම.

1987/88

- වාර්ෂිකව මිලියන 3.5 ක මගීන් ප්‍රමාණයක් හැසිරවීමේ ධාරිතාවයෙන් යුත් නව ධාවන පථය සහ මගී පර්යන්ත ගොඩනැගිල්ල ආරම්භ කිරීම.

1992

- ගුවන් භාණ්ඩ බහාලුම් ගම්මානය විවෘත කිරීම.

1998

- ඩුබායි පදනම් වූ එමිරේට්ස් සමාගම විසින් එයාර් ලංකා සමාගම අර්ධ වශයෙන් අත්පත් කර ගැනීමෙන් පසුව "ශ්‍රී ලංකන් ගුවන් සමාගම" ලෙස සන්නාමගත කිරීම.

2005

- ගුවන් පාලම් අටක්, පුළුල් කළ පර්යන්තය, විවේකාගාර සහ වෙනත් පහසුකම් සමගින් නව පර්යන්තයක් ඉදිකිරීමෙන් ගුවන්තොටුපළට සම්පූර්ණයෙන්ම නව මුහුණුවරක් එක් කිරීම.

2008

- ගු.ගු.සේ.ස. විසින් සිය 25 වන රිදී ජුබිලිය සැමරීම.

2010

- 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත පාර්ලිමේන්තුවේදී සම්මත වීම.
- ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා ක්‍රියාත්මක කිරීම සඳහා ගු.ගු.සේ.ස. වෙත සහතිකය සහ බලපත්‍රය නිකුත් කිරීම.

2012

- පළමු ගුවන් යානය 1912 දෙසැම්බර් 7 වන දින කොළඹ තුරඟ තරග පිටියේදී සිය සාර්ථක ගුවන් ගමන ආරම්භ වීමත් සමග සිවිල් ගුවන්සේවා අංශය වසර 100ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

2013

- ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ වන හම්බන්තොට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.රා.ජා.ගු.) විවෘත කිරීම.

2015

- ම.රා.ජා.ගු. ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, රජය විසින් ම.රා.ජා.ගු හිදී ගුවන් සමාගම් සඳහා ලබා ගත හැකි ගුවන්සේවා නව වැදෑරුම් නිදහස සහිත පූර්ණ "විවෘත අහස ප්‍රතිපත්තියක්" ප්‍රකාශයට පත් කිරීම.

2017

- A 380 ගුවන්යානාවන්ට ඉඩපහසුකම් සලසමින් බ.ජා.ගු. හි ධාවන පථයේ පළල මීටර් 60 සිට මීටර් 75 දක්වා පුළුල් කිරීමෙන් "චිත් කේත" අනුකූලතාවයට උසස් කිරීම.

2018

- මඩකලපුව ගුවන්තොටුපළ, සිවිල් මෙහෙයුම් සඳහා නැවත විවෘත කිරීම.

2019

- යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (යා.ජා.ගු.) නැවත විවෘත කිරීම.

2020

- බ.ජා.ගු. 2 වන පර්යන්තය හි මුල් ගල තැබීම.

2021

- නවීකරණය කරන ලද "අරලිය විවේකාගාරය" ව්‍යාපාරික පන්තියේ මගීන් සඳහා විවෘත කිරීම.
- Google ගෘහස්ථ සිතියම් පහසුකම බ.ජා.ගු හි ආරම්භ කරමින්, ශ්‍රී ලංකාවේ මෙම විශේෂාංගය සක්‍රීය කළ පළමු ආයතනය ලෙස ඉතිහාසගත වීම.

2022

- ඉහළ මට්ටමේ සේවා ලබා ගන්නා මගීන් සඳහා 'විශිෂ්ඨ ගුවන්තොටුපළ අත්දැකීමක්' ලබා දීම සඳහා **'GOLD ROUTE'** විවේකාගාර සේවාව අරම්භ කිරීම.

විශේෂ මූල්‍ය තොරතුරු

	2022 රු. මිලියන	2021 රු. මිලියන	2022/21 +/- %	2020 රු. මිලියන	2021/20 +/- %
ලාභය සහ අලාභය					
පිරිවැටුම	27,647	7,879	+100%	8,011	-2%
ක්ෂය කිරීම් වලට පෙර මෙහෙයුම් වියදම්	12,575	9,006	40%	9,768	-8%
පොළී, බදු සහ ක්ෂය කිරීම් වලට පෙර ඉපයුම්	15,023	(1,176)	+100%	(1,805)	35%
ස්ථාවර වත්කම් ක්ෂය	2,367	2,648	-11%	2,854	-7%
ශුද්ධ මූල්‍ය පිරිවැය / (ආදායම)	6,272	(2,815)	-100%	(878)	+100%
බදු පෙර ලාභය	6,433	(961)	+100%	(3,733)	74%
ආදායම් බදු	1,630	1,123	45%	(1,228)	-100%
බදු පසු ලාභය	4,803	(2,084)	+100%	(2,504)	17%
කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ලාභය / (අලාභය)	4,803	(2,084)	+100%	(2,504)	17%
මුදල් ප්‍රවාහ					
ලාභාංශ	500	-	+100%	-	-
දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමාන දෑ	642	413	56%	826	-50%
වසර සඳහා මූළු ප්‍රාග්ධන වියදම	7,016	22,960	-100%	2,169	+100%
මූල්‍ය තත්ත්වය					
දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ අරමුදල්	45,257	41,314	10%	36,983	12%
දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් හි මූළු ධාරන වටිනාකම	89,790	79,414	13%	55,571	43%
දෙසැම්බර් 31 දිනට මූළු ජංගම වත්කම්	89,740	47,430	89%	47,645	0%
දෙසැම්බර් 31 දිනට මූළු ජංගම වගකීම්	21,195	7,927	+100%	6,202	28%

වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය විටෙක පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.
-100% හෝ +100%, 100% ට වඩා වැඩි විචලනයන් දක්වයි.
සියලුම සංඛ්‍යා වැටයීමේ වෙනස්කම් වලට යටත් වේ.



කාර්යසාධන සුවිශේෂිතා

		2022	2021	2020	2019	2018
මෙහෙයුම් සුවිශේෂිතා						
ජාත්‍යන්තර ගුවන්යානා සංචලන	සංඛ්‍යාව	37,641	21,204	20,881	62,195	67,351
මගී සංචලන*	සංඛ්‍යාව	5,503,198	1,505,479	2,375,056	9,958,688	10,884,028
භාණ්ඩ සංචලන**	මෙ.ටො.	173,597	200,179	150,075	259,089	279,559
හරහා පියාසර සංචලන	සංඛ්‍යාව	23,846	9,339	16,370	45,674	43,804
දෙසැම්බර් 31 දිනට මුළු සේවක සංඛ්‍යාව	සංඛ්‍යාව	3,854	3,985	4,098	4,182	3,836
අනුපාත සුවිශේෂිතා						
හිමිකම් මත ප්‍රතිලාභ	%	11	(5)	(7)	28	19
බදු පෙර ශුද්ධ ලාභය, මුළු ශුද්ධ ආදායමට	%	23	(12)	(47)	59	36
බදු පෙර ශුද්ධ ලාභය, කොටස් හිමියන්ගේ අරමුදලට	%	14	(2)	(10)	39	37
මුළු ආදායම මුළු වත්කම්වලට	වාර	0.15	0.06	0.08	0.24	0.29
එක් සේවකයෙකු සඳහා වන මුළු වත්කම්	රු.'000	46,583	31,830	25,187	25,891	26,286
එක් සේවකයෙකු සඳහා මුළු කාර්ය මණ්ඩල පිරිවැය- වසරකට	රු.'000	2,594	1,881	1,811	1,944	1,947
එක් ගුවන්යානාවක් හැසිරවීමට මුළු පිරිවැය	රු.'000	727	574	738	235	318
එක් මගියකුය ආදායම	රු.	5,024	5,234	3,373	2,580	2,640
එක් මගී සංචලන සඳහා බදු පසු ලාභය	රු.	873	(1,384)	(1,054)	1,104	488
එක් සේවකයකු සඳහා වන ගුවන් යානා සංචල	සංඛ්‍යාව	10	5	5	15	18
එක් ගුවන් යානයකට මගීන්	සංඛ්‍යාව	146	71	114	160	162
එක් සේවකයෙකුට මගීන්	සංඛ්‍යාව	1,428	378	580	2,381	2,837
තෝලන අනුපාතය	%	41	39	19	13	20
මුළු වත්කම් මත ප්‍රතිලාභ	%	3	(2)	(2)	10	5
ශුද්ධ ලාභ අනුපාතය	%	17	(26)	(31)	43	18
ප්‍රාග්ධන ඵලදායිතා දර්ශකය	වාර	0.00	0.00	0.10	0.25	0.29
කොටසක ඉපැයුම්	රු.	24,013	(10,417)	(12,522)	54,979	26,566
ජංගම අනුපාතය	වාර	4.23	5.98	7.68	7.23	3.49
මුළු ආදායමට මුළු වියදම	වාර	1.24	0.92	0.76	2.04	1.49

* මගී සංචලනයන්හි ඇතුළත් වන්නේ පැමිණීම, පිටවීම, මාරු වීම සහ මාර්ගස්ථ මගීන් වන අතර අභ්‍යන්තර ගුවන් මගීන් ඇතුලත් නොවේ.

** ගුවන් භාණ්ඩ සංචලයන්ට ඇතුළත් වන්නේ අපනයන, ආනයන සහ ප්‍රති පැටවීම් වන අතර අභ්‍යන්තර භාණ්ඩ සහ ගුවන් ලිපි ඇතුලත් නොවේ.



ආයතනික ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපතිතුමා/ප්‍රධාන විධායක නිලධාරීතුමා

උප සභාපතිතුමා

- යාන්ත්‍රික ඉංජිනේරු අංශය
- සැපයුම් දාම කළමනාකරණ අංශය
- මානව සම්පත් අංශය
- සිවිල් ගුවන්සේවා පුහුණු අංශය
- සිවිල් ඉංජිනේරු (නඩත්තු) අංශය
- ගෘහ නිර්මාණ, භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ අංශය
- ගිනි සහ මුදවා ගැනීමේ සේවා අංශය
- විදුලි ඉංජිනේරු අංශය
- ආරක්ෂණ ඒකකය

- තොරතුරු තාක්ෂණ අංශය
- මුදල් අංශය
- අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ අංශය
- ආරක්ෂක සේවා අංශය
- වාණිජ සහ දේපල අංශය
- නීති අංශය
- ගුවන්තොටුපළ කළමනාකරණ අංශය
- සිවිල් ඉංජිනේරු (සැලසුම් සහ නිර්මාණ) අංශය
- ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් සංචරණ ඉංජිනේරු අංශය
- ගුවන් සංචරණ සේවා අංශය
- ව්‍යාපෘති අංශය
- උපායමාර්ගික කළමනාකරණ අංශය
- අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන අංශය
- භාණ්ඩ සහ ගුවන් භාණ්ඩ කළමනාකරණ අංශය
- බුද්ධි සහ ආරක්ෂක මෙහෙයුම් අංශය
- ගඟන නාවික තොරතුරු කළමනාකරණ ඒකකය

"වෛද්‍ය සේවා ඒකකය" ගුවන්තොටුපළ කළමනාකරණ අංශය යටතට පත් කර ඇත.

වසරේ සාරාංශය

5,503,198
ජාත්‍යන්තර මගී සංචලන

37,641
ජාත්‍යන්තර ගුවන්යානා සංචලන

23,846
හරහා පියාසර සංචලන

මෙ.ටො.173,597
ගුවන් භාණ්ඩ සංචලන



රු. මිලියන 27,647
පිරිවැටුම

රු. මිලියන 4,803
බදු පසු ශුද්ධ ලාභය

රු. මිලියන 179,530
මුළු වත්කම් ප්‍රමාණය

3,854
සේවක සංඛ්‍යාව

සභාපතිතුමාගේ පණිවුඩය



"සාර්ථකත්වයට අවසානයක් නොමැත; අසාර්ථකත්වය සදාකාලික නොවේ: සියල්ල රඳා පවතිනුයේ උත්සහය මතයි." - වින්ස්ටන් චර්චිල්

2022 වාර්ෂික වාර්තාව පිළිබඳ මාගේ අදහස් දැක්වීමේදී, සෑම කෙනෙකුම සුභවාදී බලාපොරොත්තුව අවසානයේ මුදුන්පත් වීම පිළිබඳව සතුටින් සිටීම සටහන් කර සිටිමි. ඉතිහාසයේ දරුණුතම ආර්ථික පසුබෑමෙන් රට කෙමෙන් යථා තත්ත්වයට පත්වෙමින් ඇත. විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණු වෙමින් පවතින අතර, ඉන් අප හට යහපත් ඵල ගෙන දෙනු ලබයි.

සමාලෝචිත වර්ෂය සලකා බලන කල්හි එය අස්ථාවර සහ අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් ලෙස මම සිහිපත් කරමි. අනුකූලතාවය යනු ගුවන් සේවා කර්මාන්තයට හුරුපුරුදු දෙයක් වන අතර, ඊට මුහුණ දෙන විට ස්ථාවරත්වය සහ දිශාව පිළිබඳ නිවැරදි හැඟීම ඔබ හට දැකගත හැකි වනු ඇත. අප සමාගමේ, මාගෙන් ආරම්භ වී පහළට දිවෙන කනිෂ්ඨතම සේවකයා දක්වාම මෙම ගුණධර්ම මහඟු ලෙස දැක ගැනීමට ඇති බව මම සතුටින් ප්‍රකාශ කරමි. සැබවින්ම අපි ඊට මුහුණ දුන් අතර, එවැනි දුෂ්කර අවස්ථාවක නායකත්වය ලබා දීමට හැකි වීම පිළිබඳ මම අවංකවම ආඩම්බර වෙමි.

බ.ජා.ගු දෙවන පර්යන්තය ව්‍යාපෘතියේ වැඩකටයුතු නවතාලීම වසර තුළ අප මුහුණ දුන් විශාල පසුබෑමක් විය. 2018 වර්ෂය තුළදී (වසංගත තත්ත්වය ඇතිවීමට පෙර), අපි බ.ජා.ගු ඉතිහාසයේ විශාලතම මහී සංචලන සංඛ්‍යාව වාර්තා කරමින්, එහි ධාරිතාව පුළුල් කිරීම කඩිනමින් කළ යුතුයැයි යන්න අවධාරණය කළෙමු. වසංගත තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස මහී ගමනාගමනය අඩු වීම අපගේ ප්‍රධාන ආදායම් මාර්ග අවහිර කර දැමුවද, එය මෙම අභියෝගය සමඟ කටයුතු කිරීමට අවකාශය ලබා දෙන ලදී. තවද දෙවන පරියන්තයේ වැඩකටයුතු නැවත ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වන අතර, එය අපගේ මූලික ප්‍රමුඛතාවන් අතරින් එකකි.

සැපයුම, සෑම අතින්ම අඩාල කරමින් ඇති වූ ඉන්ධන හිඟය අපගේ මෙහෙයුම් සඳහා සෘජුවම බලපාන ලදී. අත්‍යවශ්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලැබීමට අවම සේවක සංඛ්‍යාවක් සඳහා ප්‍රවාහනය සැපයීම ප්‍රධාන අභියෝගයක් විය. කෙසේවෙතත්, කඩිනම් තීරණ ගැනීමත්, දූරදර්ශීව කටයුතු කිරීමත් හේතුවෙන් අපගේ ඉන්ධනහල් වෙත සීමාසහිතව, අඛණ්ඩ ඉන්ධන සැපයුමක් ලබා ගැනීම සඳහා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ විශේෂ සැපයුම් දාමයක් ස්ථාපිත කිරීමට අපි සමත් වූවෙමු. අපගේ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් ඉන්ධන ලබා ගැනීමටත්, අපගේ සේවකයින්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් ඉන්ධන සැපයීමට මෙන්ම අපගේ ගුවන්තොටුපළයන්හි තිරසාර මෙහෙයුම් සඳහා මූලිකව කටයුතු කරන ලද අනෙකුත් පාර්ශවකරුවන්ගේ ආයතනවලටද ඉන්ධන ලබා ගැනීමට ඉන් හැකියාව ලැබුණි. මෙමඟින් අපි රටේ ආර්ථික ප්‍රකෘතිය සඳහා සහය ලබා දෙනු ලබන අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වන ලදී.

ඊට අමතරව, වෘත්තීය ප්‍රභේදයන් හි සැලකිය යුතු සේවක සංඛ්‍යාවක් සිය අභිවෘද්ධිය කරා රට හැර යාමට අදහස් කිරීම හේතුවෙන් දැඩි බුද්ධි ගලනයක් අපි අත්විඳින ලද්දෙමු. අපේ සේවා මෙන්ම සංවර්ධනය දැඩි ලෙස බලපෑමට ලක් වන ලදී. එය කෙටිකාලීන විසඳුම් නොමැති ජාතික ගැටලුවක් බවට පත්වෙමින් පවතින නමුත් අපහට ආයතනික මට්ටමින් එයට මුහුණ දීමට සිදු විය. රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීමේ සීමාවන් ලිහිල් කරවා ගැනීමට අපි කටයුතු කර ඇති අතර, එමඟින් විකල්ප බඳවා ගැනීම්, ඔවුන් පුහුණු කිරීම සහ රඳවා තබා ගැනීම තුළින් අපගේ මානව ප්‍රාග්ධනය පවත්වා ගැනීමට අප හට හැකියාව ලැබේ.

මෙම අභියෝග මධ්‍යයේ වුවද, කෙටි කාලීන මෙන්ම දිගු කාලීන වශයෙන් වැදගත් ප්‍රතිලාභ අත්කර දෙනු ලබන සංවර්ධන කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අපහට හැකි විය. තීරුබදු රහිත මෙහෙයුම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සඳහා ඉතා විශාල වෙනස්කම් රුසක් අපි සිදු කළෙමු. අපි මගී පහසුකම් වැඩි දියුණු කළ අතර, ගෝල්ඩ් රූට් විවේකාගාරය විවෘත කිරීම වඩාත් වැදගත් අවස්ථාවකි. එය මේ වන විට ජනප්‍රිය වී ඇති අතර, ඉතා ආකර්ෂණීය මෙන් ස්ථාවර ආදායම් මාර්ගයක් ලෙස කටයුතු කරනු ලබයි. අපි බ.ජා.ගු හි භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා අති නවීන ආරක්ෂක සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ගොඩනඟන ලද අතර, නව ආනයන භාණ්ඩ පර්යන්තයක් ඉදිකිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. මෙය සමස්තයක් ලෙස භාණ්ඩ සහ ගුවන් භාණ්ඩ හි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන ආනයන/අපනයන ක්‍රියාකාරකම් සඳහා සැලකිය යුතු වත්කමක් එක් කරනු ලබයි. අප, හරහා පියාසර සඳහ අය කරනු ලබන ගාස්තු වැඩි කිරීමට පියවර ගත් අතර, එමඟින් ඩොලර් ගලා ඒම සුළු වශයෙන් වැඩි විය. එමෙන්ම, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙත නව ගුවන්සේවා ආරම්භ කළ අතර, වර්ෂය තුළදී යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී. අභියෝග මධ්‍යයේ ඉහත සඳහන් කළ වර්ධනයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සූක්ෂම සැලසුම්කරණය, අභිප්‍රේරණයක් ලබා දෙන නායකත්වය සහ නිසි දිශානතිය හේතු විය.

අපේක්ෂිත පරිදි, මෙම වර්ධනයන් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම දැක ගත හැකි විය. අප විසින් 2019 වර්ෂයේදී, රුපියල් බිලියන 26 ක ආදායමක් වාර්තා කර ඇති අතර, එය 2018 වර්ෂයට සාපේක්ෂව 11% ක පහත වැටීමකි. ඉන්පසු වසංගත තත්ත්වයේ සෘජු ප්‍රතිඵලයක් ලෙස, මෙහෙයුම් අලාභයක් ඇති කරමින් ආදායම රුපියල් බිලියන 7.9 ක පසුබෑමක් දක්වමින් 2019 වර්ෂයට සාපේක්ෂව 2020 සහ 2021 යන වර්ෂයන්හිදී අපගේ ආදායම තවදුරටත් 70% කින් පහත වැටුණි. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය තුළ අපි රුපියල් බිලියන 27.6 ක ආදායමක් වාර්තා කළෙමු. එය 2019 වසරට සාපේක්ෂව 7.5% ක වර්ධනයක් වන අතර, 2021 වසරට සාපේක්ෂව 251% ක විශිෂ්ට වර්ධනයකි. 2022 වර්ෂයේ අපගේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ශුද්ධ ආදායම රුපියල් බිලියන 15 ක් වේ. මෙය නිසැකයෙන්ම සංචාරකයින් පැමිණීම ක්‍රමානුකූලව වර්ධනය වීමේ සෘජු ප්‍රතිඵලයකි. රජය වෙත රුපියල් මිලියන 500 ක ලාභාංශයක් ගෙවීමට අපට හැකි වූ බව මා සතුටින් ප්‍රකාශ කර සිටින අතර, එය පුරවැසියන් විසින් මුහුණපාන ආර්ථික දුෂ්කරතා විසඳීමට රජය ගනු ලබන ප්‍රයත්නයන්ට සහය වීමට වර්තමාන තත්ත්වය යටතේ බෙහෙවින් උපකාරී වනු ඇත.

සභාපතිතුමාගේ පණිවුඩය

අපගේ වගකීම ලෙස, මෙම වර්ධනය තිරසාර කිරීමට මෙන්ම වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියලු පියවර අප විසින් ගෙන ඇත. දෙවන පර්යන්තය සංවර්ධන ව්‍යාපෘතිය අඩාල වූවද, වැඩි වන මගී සංඛ්‍යාව හසුරුවාලීම සඳහා අපි යටිතල පහසුකම් සහ පහසුකම් වැඩිදියුණු කළෙමු. කෙසේවෙතත්, දෙවන පර්යන්තය සංවර්ධනය නැවත ආරම්භ කිරීම අත්‍යවශ්‍ය බවත්, එසේ නොමැතිව වර්තමාන අනුපාතයට අනුව වර්ධනය වන මගී ගමනාගමනයට පහසුකම් සැලසීමට නොහැකි වේ යන්න අපි සලකනු ලබන්නෙමු.

මේ වනවිට, නව ගුවන් සමාගම් තුනක් විසින් ම.රා.ජා.ගු හි මෙහෙයුම් ආරම්භ කිරීම, මධ්‍යම ආසියානු කලාපයෙන් මගීන් ආකර්ෂණය වීම පිළිබඳ සාධක සපයනු ලබයි. චීනය ක්‍රමානුකූලව සංචාරක ව්‍යාපාරයට දොරටු විවෘත කිරීමත්, චීන සංචාරකයින් විසින් සිදු කරනු ලබන සංචාර වැඩි වශයෙන් සිදු කිරීම හේතුවෙන්, එම අංශයේ සංචාරක සංචලන ප්‍රමාණයන්හි සැලකිය යුතු වර්ධනයක් අපි අපේක්ෂා කරන්නෙමු. රජයේ අනුමැතිය ඇතිව, ම.රා.ජා.ගු හි නව ව්‍යාපාර ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර, මේ සඳහා ගුවන්යානා නැවතුම් පහසුකම්, භාණ්ඩ ප්‍රවාහනය, ගුවන් යානා නඩත්තු අළුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය (MRO), සහ ගුවන්යානා කොටස් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම ඇතුළත් වන අතර, මේ සියල්ල හිතකර ආදායම් උත්පාදනයන් ඇති කරයි. අයිලන්ඩ් ඒවියේෂන් මඟින් මෙහෙයවනු ලබන මාලදිවයින් ගුවන් සමාගම විසින්, රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත (කො.ජා.ගු.ර.) නැවත මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමේ සීමාවන්ගෙන් ඔබ්බට බලන කල්හි, රජය සතු ව්‍යාපාරයක් වශයෙන්, මූල්‍ය අර්බුදයෙන් මිදීම සඳහා රජය ගන්නා ප්‍රයත්නයන් සඳහා උපරිම සහයෝගය ලබා දීම වෙනුවෙන් අපගේ යුතුකම් අපි හඳුනාගෙන සිටියෙමු. ආර්ථික අවපාතයෙන් රට ගොඩගැනීමට දරන ප්‍රයත්නයන්ට අපි සක්‍රීයව සහයෝගයක් දැක්වූවෙමු. සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට අවශ්‍ය පහසුකම් සැපයීම සහ සහයෝගය දැක්වීම වත්මන් තත්ත්වය යටතේ අපහට ලබා දිය හැකි වැදගත්ම දායකත්වය යැයි අපි හඳුනා ගත්තෙමු. සංචාරකයින්, වඩාත් ලාභදායී මගී කාණ්ඩය ලෙස අපි හඳුනාගෙන ඇත්තෙමු. යුරෝපා සංගමයේ සංචාරක ගමනාන්ත තේරීම් යුක්‍රේනයේ යුද්ධය හේතුවෙන් වෙනස් වී ඇති අතර, මධ්‍යම ආසියානු කලාපයේ සංචාරකයින් වැඩි වැඩියෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට රුචිකත්වයක් දක්වනු ලබයි. එබැවින් සංචාරක ක්ෂේත්‍රය සහ හෝටල් හිමියන් සමඟ සම්බන්ධ වී මෙම අවස්ථාවන් ළඟා කරගැනීමට අපගේ ප්‍රයත්නයන් ශක්තිමත් කළෙමු.

ව්‍යාපාරයේ ප්‍රමුඛ අරමුණ වන පාර්ශවකරුවන්ගේ අගය වර්ධනය කිරීමේ පදනම, ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය ව්‍යාපාරික හවුල්කරුවන්/ පාර්ශ්වකරුවන් සමඟ හවුල් වීම මඟින් සාක්ෂාත් කර ගත හැකි අතර, 2023 සඳහා සහ ඉදිරි වසර 3 ට අදාල අපගේ මූලික උපායමාර්ගය "හවුල්කාරිත්වය හරහා වර්ධනය" යන තේමාව යටතේ ගොඩනඟා ඇත. මෙම හවුල්කාරිත්ව විවිධ අංග කැටි කොට ගත්තකි. ඇතැම් හවුල්කාරිත්ව අවශ්‍යතා සහයෝගී ප්‍රයත්නයන් සඳහා යොදා ගනී (උදා: සංචාරක බලධාරීන් සමඟ සහයෝගීතාවයෙන් රට තුළට සංචාරකයින් පැමිණීම වැඩි දියුණු කිරීම සඳහා මූලාශ්‍ර වෙළඳපොළවල් ශක්තිමත් කළ යුතුය). එමෙන්ම ඇතැම් හවුල්කාරිත්ව අවශ්‍යතා දත්ත බෙදාගැනීමේ අවශ්‍යතා සඳහා වේ (උදා: ගුවන් තොටුපළ ක්‍රියාකරුවන්ට ජන විකාශන සාධක පදනම් කරගනිමින් මගීන්ගේ මනාපයන් මත ගුවන් සමාගම් සහ ගුවන්තොටුපළවල් විසින් රැස් කරන ලද දත්ත භාවිත කිරීමට අවශ්‍ය වේ.) ACI සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය වැනි ආයතන සතුව මෙම දත්ත පවතින අතර, අපි මෙම දත්ත ලබා ගැනීමට අදහස් කරන්නෙමු. ඊට අමතරව, සේවා මට්ටමේ ගිවිසුම් (SLA) සාමූහික සේවා සැලසීමේ ප්‍රධාන මෙවලමකි. එබැවින්, අප අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ කාර්යසාධන දර්ශකය මත බිම් හසුරුවන්නා, දේශසීමා ආයතන සහ රේගු සමඟ කටයුතු කිරීමට උපාය මාර්ග සකස් කර ඇත.

වසංගත තත්ත්වයේ හේතුවෙන් වෙනස්කම් වූ ඇති වූ ව්‍යාපාරික පරිසරයේ දැඩි තරඟකාරීත්වය හේතුවෙන්, අපි අපගේ ව්‍යාපාරයේ ව්‍යාප්තිය සහ ප්‍රවර්ධනය කෙරෙහි නිසි ලෙස අවධානය යොමු කළෙමු. ශ්‍රී ලංකාවේ ප්‍රථම ජාත්‍යන්තර ගුවන් තොටුපළ වන කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - රත්මලාන (කො.ජා.ගු.ර.) හි 84 වැනි සංවත්සරය මඟින් මේ සඳහා අවස්ථාවක් ඇති කරන ලදී. අපි රත්මලානේදී මෙම සංවත්සරය සැමරීම උදෙසා උත්සවයක් සංවිධානය කරන ලද අතර, සියලු ආගම්වල ආගමික වතාවත් සිදු කරනු ලැබුවෙමු. ඉන් කර්මාන්තයට ඇති කරන වටිනාකම අගයමින්, අනාගත ගුවන් නියමුවන් අතර දැනුවත්භාවය ඇතිරීම සඳහා "ගුවන් අධ්‍යාපනය සහ ගුවන්තොටුපළ හුරුකරවීම" නමින් සමාජ සත්කාර වැඩසටහනක් සංවිධානය කරන ලදී. එමෙන්ම අපගේ ගුවන් තොටුපළ වෙත නව ගුවන්සේවා හෝ ගුවන් සමාගම් නැවත මෙහෙයුම් ආරම්භ කිරීම පිළිගැනීම උදෙසා අප විසින් පවත්වන ලද සෑම උත්සවයක්ම අපගේ නව ව්‍යාපාර ප්‍රචාරය කිරීමට අවස්ථාවක් විය.

සමාලෝචිත වර්ෂය අභියෝගවලින් පිරුණු වසරක් මෙන්ම, යළි ස්ථාවරත්වය ස්ථාපිත කොට අපගේ ක්‍රියාකාරකම් පුළුල් කළ වසරක් විය. අපි නැවත වරක් රටේ විශ්වාසවන්ත ආදායම් උපයන්නා බවට පත් වී සිටිමු. මා සහ අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය කෙරෙහි තැබූ විශ්වාසය පිළිබඳව ගරු අමාත්‍යතුමාටත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමාටත් මම ස්තුතිය පළ කර සිටිමි. එමෙන්ම ආගමන විගමන දෙපාර්තමේන්තුව, රේගුව, සෞඛ්‍ය අධිකාරීන් සහ අපගේ සේවා දාමයේ අනෙකුත් ආයතන වෙත සැමවිටම අප සමඟ එක්ව, පොදු අරමුණක් වෙනුවෙන් කටයුතු කිරීම වෙනුවෙන් මම ස්තුතිය පළ කර සිටිමි. සමාගම වෙත එහි මෙහෙවර සාක්ෂාත් කර ගැනීමට මඟ පෙන්වමින් කිසිදා නොඅඩුව දක්වන උද්යෝගය සහ ශුභවාදී බව පිළිබඳව උප සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට මම ස්තුතිය පළ කර සිටිමි. සමාගමේ අංශ සහ ඒකක ප්‍රධානීන්ගේ සිට සේවකයින් දක්වා වෙහස නොබලා කටයුතු කරමින් ඉතා අපහසු කාලයකදී පවා අපි සමඟ රැඳෙමින්, අපගේ ප්‍රතිසාධනයේ සැබෑ අයිතිකරුවන් වීම කෙරෙහි ස්තුතිය පළ කර සිටීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc
සභාපති

2023 මැයි 26


22

නායකත්ව කණ්ඩායම



1. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී වී චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති
2. වෛද්‍ය යූ වී මෙන්ඩිස් - උප සභාපති
3. ඩබ්ලිව් වී වී විජයසූරිය - විධායක නොවන අධ්‍යක්ෂ
4. ජී වී වී ප්‍රියන්ත - විධායක නොවන අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
5. වී එච් එස් ගුණවර්ධන - විධායක නොවන අධ්‍යක්ෂ/අමාත්‍යාංශ නිරීක්ෂක
6. ඩබ්ලිව් එස් ඩී ද සිල්වා - විධායක නොවන අධ්‍යක්ෂ



7. විස් වින් සුමනසේකර - විධායක නොවන අධ්‍යක්ෂ
8. කපිතාන් මිලින්ද රත්නායක - විධායක නොවන අධ්‍යක්ෂ
9. ඒ ඒ රන්දෙණිය - විධායක නොවන අධ්‍යක්ෂ
10. ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - විධායක නොවන අධ්‍යක්ෂ
11. ජී යූ කේ අල්ගෙවත්තගේ - විධායක නොවන අධ්‍යක්ෂ
12. එම් එම් රේණුකා පී ගුණසේකර (මිය) - සමාගම් ලේකම්

නායකත්ව කණ්ඩායම

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි මහතා RWP USP VSV ndc psc
සභාපති

මේජර් ජෙනරාල් ජී ඒ චන්ද්‍රසිරි මහතා 2019 දෙසැම්බර් මස ගු.ගු.සේ.ස. හි සභාපතිවරයා ලෙස පත්කරන ලද අතර, එතැන් පටන් ගු.ගු.සේ.ස. හි සභාපතිවරයා ලෙසත්, ප්‍රධාන විධායක නිලධාරිතුමා ලෙසත් කටයුතු කරනු ලබයි. ඔහු 2022 වසර තුළ ගු.ගු.සේ.ස. හි මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදන සහ සියළුම ගුවන්තොටුපළ හි ඉදිරි ගමන් මග අනුකම්ටුන් හි මුලසුන දැරුවේය.

එමෙන්ම ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ ලෙස ලංකා බැංකුව පීඑල්සී හි සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන අණ දීමේ සහ සේවා මණ්ඩල පත් කිරීම් තනතුරු කිහිපයක කටයුතු කරමින් හමුදා අංශයේ තිස්පස් වසරක කීර්තිමත් සේවයකට හිමිකම් කියනු ලබයි. ශ්‍රී ලංකා හමුදාවේ ප්‍රධානී, ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී සහ ශ්‍රී ලංකා යුධ හමුදා විශේෂ බලකායේ රෙජිමේන්තු අධිපති, යාපනය ආරක්ෂක බලකායේ නිලධාරී, ගරු ජනාධිපතිතුමාගේ හමුදා ආරක්ෂක සම්බන්ධීකාරක සහ යුද්ධය නිසාවෙන් උතුරු පළාතේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරලීම සඳහා නිසි අධිකාරිය වැනි තනතුරු ඒ අතර වේ. ඔහු රණ වික්‍රම පදක්කම (RWP), විශිෂ්ඨ සේවා විභූෂණ (VSV) සහ උත්තම සේවා පදක්කම (USP) වැනි ගෞරව සම්මාන වලින් පිදුම් ලද අයෙකි. එමෙන්ම 2009 සිට 2015 දක්වා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා ලෙස ද කටයුතු කරන ලද්දේය.

ඔහු ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලය සහ බංගලාදේශයේ ආරක්ෂක සේවා අණ දෙන සහ මාණ්ඩලික විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. එමෙන්ම ඔහු කොවිඩ්-19 උවදුර පැතිරීම වැළැක්වීමේ ජාතික කාර්ය සාධන බලකායේ සාමාජිකයෙකු ලෙසත්, පශ්චාත් කොවිඩ් සංචාරක පුනර්ජීවන කාර්යසාධන බලකායේ එම කාලය සඳහා සාමාජිකයෙකු ලෙස ද කටයුතු කලේය.

වෛද්‍ය යූ ඒ මෙන්ඩිස් මහතා
උප සභාපති

වෛද්‍ය උපුල් අජිත් මහතා MBBS, DLM/MCMA/FCMA 2022, ජූනි මස ගු.ගු.සේ.ස හි උප සභාපති ලෙස පත් වන ලද අතර මානව සම්පත් සහ වැටුප් අනු කමිටුවෙහි මුලසුන දැරුවේය. ඔහුගේ පත් වීම පටන් වත්මන් තනතුර දක්වා ගු.ගු.සේ.ස. යටතේ පවතින ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් පහක පරිපාලන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඊට අමතරව, ඔහු ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශවකරුවන්, ජනමාධ්‍ය ආයතන සහ සමාගමේ වෙනත් අභ්‍යන්තර ආයතන සමඟ සමීපව කටයුතු කරමින් ගුවන්තොටුපළේ පොදු ප්‍රතිරූපය සංවර්ධනය කරනු ලබයි.

ජ්‍යේෂ්ඨ කළමනාකරණ මට්ටමෙන් සෞඛ්‍ය අංශයේ වසර 45කට වැඩි අත්දැකීම් ඇති වෛද්‍ය මෙන්ඩිස් මහතා, පිළිගත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන් හි ඉහළ තනතුරු දරා ඇත. සෞඛ්‍ය අංශයේ කැපී පෙනෙන සේවය තුළ, ඔහු 2007 සිට 2012 දක්වා අවුරුදු පහක් පමණ කාලයක් සෞඛ්‍ය සේවයේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස සේවය කොට ඇත. වෛද්‍ය මෙන්ඩිස් මහතා නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලේ සභාපති ලෙස සහ ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කොට ඇත. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබයි. වෛද්‍ය මෙන්ඩිස් මහතා සමාජය වෙනුවෙන් මහඟු දායකත්වයක් ලබා දුන් අතර, එක්සත් රාජධානිය පදනම් කරගත් රාජ්‍ය නොවන ශ්‍රී ලංකාවේ ජනගහන සේවා හි දේශීය අධ්‍යක්ෂවරයා ලෙස සේවය කර ඇත.

වෛද්‍ය මෙන්ඩිස් මහතා ක්ෂේත්‍රයේ විවිධ වපසරියන්ගේ විශේෂඥ දැනුම ගු.ගු.සේ.ස. වෙත දායාද කරනු ලබන අතර, සිවිල් ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනයට සහ ගුවන්සේවා කර්මාන්තය නඟා සිටුවීමට කැපවී කටයුතු කරයි.

කපිතාන් මිලින්ද රත්නායක මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

හිටපු ගුවන් නියමුවෙකු වන කපිතාන් මිලින්ද රත්නායක මහතා, පැය 15,000කට අධික මහී ප්‍රවාහන ගුවන්යානා පියාසර කරමින්, අවුරුදු 40කට අධික කාලයක් එයාර් සිලෝන්, එයාර් ලංකා සහ ශ්‍රී ලංකන් ගුවන්සේවය හි මෙහෙයුම් පිළිබඳ ප්‍රවීණයෙකි. පියාසැරි වෘත්තිය හැරුණු කොට, ගුවන් යානා මෙහෙයුම් සහ සේවා සම්පාදනය අධීක්ෂණය පිළිබඳ කළමනාකරණ අත්දැකීම් පිරි අයෙකි (ආරක්ෂාව සැලැස්වීම, මැදිරි කාර්ය මණ්ඩලය සහ බිම් හැසිරවීම). එමෙන්ම ඔහු 2018 වර්ෂයේදී ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ උප සභාපති ලෙස කටයුතු කළේය.

ඔහු ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය සමඟ පියාසැරි මෙහෙයුම් කණ්ඩායම නියෝජනය කරනු ලබන එකම ශ්‍රී ලංකිකයා වේ. ගෝල්ෆ් ක්‍රීඩා ලෝලියෙකු වන කපිතාන් රත්නායක මහතා ගුවන්සේවා කර්මාන්තයේ ධනාත්මක වෙනසක් සහ සංවර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලබයි. ඔහු ඕස්ට්‍රේලියාව, ඈත පෙරදිග, යුරෝපය සහ උතුරු සහ දකුණු ඇමරිකාව වෙත සංචාරය කර ඇත.

ඔහු 2022 ජූනි මාසයේ සිට ගු.ගු.සේ.ස හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජියකු විය. ඔහු විගණන සහ කළමනාකරණ අනු කමිටුවෙහි සාමාජිකත්වය දරන අතර අවදානම් කළමනාකරණ අනු කමිටුවෙහි මුලසුන දරයි.

ඒ එස් සී වරුෂහෙන්නැදිගේ මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

අරුණ වරුෂහෙන්නැදිගේ මහතා 2019 දෙසැම්බර් මස පටන් ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වන අතර ඔහු අවදානම් කළමනාකරණ, සියළුම ගුවන්තොටුපළහි ඉදිරි ගමන් මග සහා ව්‍යාපෘති කළමනාකරණ අනුකමිටුන් හි සාමාජිකයෙකි. ඔහු ප්‍රාග්ධන වෙළඳපොළ කර්මාන්තයේ, ගුවන්තොටුපළ මෙහෙයුම්, ජාත්‍යන්තර ගුවන්යානා කළමනාකරණ, වෙළඳපොළ සැලසුම්, සන්නාමකරණය සහ ගුවන්සේවා උපායමාර්ග සංවර්ධන පිළිබඳ පුටුල අත්දැකීම් ඇති පළපුරුදු සභාපතිවරයෙකු/විධායක අධ්‍යක්ෂවරයෙකු වේ.

වරුෂහැන්නැදිගේ මහතා ලන්ඩන් සවුත් බෑන්ක් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MSc) දරයි.

එස් එන් සුමනසේකර මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ශෙහාන් සුමනසේකර මහතා 2019 දෙසැම්බර් මස පටන් ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකි. වාණිජමය වශයෙන් ශ්‍රේණිගත කරන ලද ගුවන් නියමුවෙකු ලෙස ඔහු, ගුවන්සේවා කර්මාන්තයේ අවකාශයන් සහ පවත්නා ඉල්ලුම හඳුනාගැනීමට අවශ්‍ය ශක්‍යතාවයන් රැසක් සහ තාක්ෂණික දැනුම් සම්භාරයක් ඇති අයෙකි. ඔහුගේ විවිධාකාර වූ අත්දැකීම් අතරට ගුවන් සේවය, තෙල් සහ ගෑස්, නැව්ගත කිරීම් සහ සැපයුම්, ගල් අඟුරු, රසායනික සහ තාර ආශ්‍රිත නිෂ්පාදන වැනි කර්මාන්තයන් ඇතුළත් වේ.

එමෙන්ම ඔහු මැක්ලොයිඩ් හෝල්ඩිංග්ස් හි කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිතුමා වන අතර, වෙනස් ආකාරයේ ආයතන තුනක අධ්‍යක්ෂ තනතුර දරනු ලබයි. සුමනසේකර මහතා වේල්ස් විශ්වවිද්‍යාලයෙන් (එංගලන්තය) ව්‍යාපාර පරිපාලනවේදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් දරන අතර, ඇමරිකා

එක්සත් ජනපදයේ ෆෙඩරල් ගුවන්සේවා අධිකාරියේ වාණිජ නියමු බලපත්‍රයක් ද (FAA) දරයි.

තවද ඔහු, 40% ක් ජාතික විදුලිය සඳහා විදුලිය උත්පාදනය කරනු ලබන, ලක්විජය ගල් අඟුරු බලාගාරය වෙත බලය ලබා දෙනු ලබන සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ සභාපති ලෙස 2022 වසරේදී පත් විය.

වසර ගණනක් පුරා ඔහු පාලනය සහ නියෝජනය කරනු ලබන සමාගම් සමූහයක් සඳහා ව්‍යාපාරහි අනපේක්ෂිත වර්ධනයක් ලබා දෙමින්, සේවයේ පළපුරුද්ද සහ සැපයුම් දාමය කළමනාකරණය කරමින් දායකත්වය ලබා දී ඇත.

එමෙන්ම සුමනසේකර මහතා විසින්, ජීවන තත්ත්වය නඟා සිටුවන්නට ජනතාව වෙත සහය ලබා දෙමින්, අධ්‍යාපනයේ සමානාත්මතාවය දරන්නට විවිධාකාරයේ අභිලාසයන් ඔස්සේ ශ්‍රී ලංකාවේ සිටින බොහෝමයක දරුවන්ගේ ජීවිත වෙනස් කරලීමට ලාභ නොලබන සංවිධානයක් වන "ජන සහන පදනම" හි මුලසුන දරනු ලබයි.

එමෙන්ම ඔහු ගු.ගු.සේ.ස. හි යමූල්‍ය කළමනාකරණ සහ ආදායම් උත්පාදන අනු කමිටුවේ ද සාමාජිකයෙකි.

ජී ඒ ඒ ප්‍රියන්ත මහතා
විධායක නොවන අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත

ජී ඒ ඒ ප්‍රියන්ත මහතා, 2021 ජූනි සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තෝරී පත් විය. සමාගමේ විගණන සහ කළමනාකරණ හා ගු.ගු.සේ.ස. හි ප්‍රසම්පාදන අත්පොත සැකසීමේ මණ්ඩල අනු කමිටුන්හි සභාපති ලෙස ද ඔහු කටයුතු කරනු ලබයි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව යන ආයතන දෙකෙහිම සහකාර අධ්‍යක්ෂ ඇතුලු තනතුරු බොහෝමයක සේවය කිරීමෙන්, මූල්‍ය අමාත්‍යාංශයේ වසර 18කට අධික අත්දැකීම් ඔහු සතුය. ප්‍රියන්ත මහතා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහ මුදල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇත. වර්තමානයේ ඔහු මුදල් අමාත්‍යාංශය සඳහා අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස (වැඩ බලන) කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු 2005 වසර පටන් බොහෝමයක් රාජ්‍ය ව්‍යවසායන් සහ රජයේ සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩල වල කටයුතු කර ඇත. ප්‍රියන්ත මහතා, කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද (B.Sc.) දරනු ලබයි.

ඒ ඒ රන්දෙණිය මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

රන්දෙණිය මහතා 2022 නොවැම්බර් සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කරන ලදී.

ඔහු අපරාධ සහ රේගු නීතිය යන ක්ෂේත්‍ර හි විශේෂඥ නීතීඥවරයෙකි. ඔහු විසින් එක්සත් රාජධානියේ ස්ට්‍රැත්ක්ලයිඩ් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර ව්‍යාපාර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (LL.M) ලබා ගෙන ඇත. ඔහු වර්තමානයේ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු, කාර්මික අධිකරණවල බේරුම්කරුවෙකු සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥයින්ට එරෙහි විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික අධ්‍යාපන ආයතනයෙහි නීති සම්පාදකයෙකි. ඔහු අධිකරණ අමාත්‍යාංශයේ විවිධ කමිටු හි සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබයි. ඒ සඳහා රටේ අධිකරණ බල ප්‍රදේශ සීමා කිරීම සඳහා වූ කමිටුව, දේපළ බැහැර කිරීම පිළිබඳ විශේෂ නීතිය සංවර්ධනය කිරීම සහ නව නිෂ්පාදන බැහැර කිරීමේ යාන්ත්‍රණයක් යෝජනා කිරීම පිළිබඳ වූ කමිටුව, හිරහාරයේ තබාගැනීමට විකල්පයක් ලෙස නිවාස අඩස්සියේ තබා ගැනීම හඳුන්වාදීමේ කමිටුව සහ විනිමය පනත් කෙටුම්පත සංශෝධනය කිරීමේ කමිටුව ආදිය ඇතුළත් වේ. ඔහු 2016 සිට 2018 දක්වා ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ ලේකම්වරයා ලෙසත්, 2013/15 කාලය තුළ කොළඹ නීති සංගමයේ සභාපතිවරයා ලෙසත් කටයුතු කර ඇත.

ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

අමිත විජයසූරිය මහතා විවක ජාතික ගමන් සහකරු වූ එයාර් ලංකා සමාගම සමඟින් 1981 වර්ෂයේදී සම්බන්ධ විය. වසර 38 ක දූර කාලය තුළ ශ්‍රී ලංකාව සහ විදේශයේ පදනම් වූ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයක් ඔහු විසින් දරා ඇත.

ඔහුගේ මෙහෙයුම් වපසරියේ ප්‍රධාන සුවිශේෂිතා වූයේ ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ, සියලුම කැබිනට් අමාත්‍යවරුන්ගේ සහ පාර්ලිමේන්තු සාමාජිකයින්ගේ VVIP සංචාර අධීක්ෂණය කිරීමයි. එමෙන්ම ඔහු පොලිස්පති ඇතුලු හමුදා බලකායේ ප්‍රධානීන්, අමාත්‍යංශ ලේකම්වරුන්ගේ විදෙස් සංචාරයන් පිළිබඳ වැඩභාරව සිටියේය. විජේසූරිය මහතා විකුණුම් සහ අලෙවිකරණය, මහජන සබඳතා, ප්‍රවර්ධන, රජයේ සහ මහජන කටයුතු වැනි විවිධාකාර වූ ගුවන්සේවා අංශයේ බෙහෝමයක් අත්දැකීම් ඇති අයෙකි. විශ්‍රාම ගැනීමෙන් පසුව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මහජන සහ රාජ්‍ය කටයුතු පිළිබඳ උපදේශකවරයෙකු ලෙස ඔහුව නැවත පත් කරන ලදී.

ඔහු, 2019 දෙසැම්බර් 31 සිට 2022 අගෝස්තු 12 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උප සභාපති ලෙස කටයුතු කරන ලදී.

ඔහු, 2022 සැප්තැම්බර් සිට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත්කරන ලද අතර ව්‍යාපෘති කළමණාකරන අනු කමිටුවේ හි මුලසුන දරයි.

ඩබ්ලිව් එස් ඩී ද සිල්වා මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

සුනිල් දි සිල්වා මහතා, ආයතනික බැංකුකරණය, ප්‍රාදේශීය බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍ය, ණය කළමනාකරණය සහ අයකිරීම් යන ක්ෂේත්‍රයන් හි අවුරුදු 41ක පමණ කාලයක පළපුරුද්ද ඇති බැංකුකරුවෙකි. ඔහු සිය බැංකුකරණ වෘත්තිය ලංකා බැංකුවෙන් ආරම්භ කළ අතර, ලන්ඩනයේ ලංකා බැංකු ශාඛාවෙ හි අවුරුදු තුනක සේවා කාලය ඇතුළුව ලංකා බැංකුව හි අවුරුදු 26ක පමණ කාලයක් සේවය කොට ඇත. එමෙන්ම ඔහු සෙලාන් බැංකුව පීචිල්සී හි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමන්‍යඅධිකාරී කළමනාකරු ලෙසත්, පෑන් ඒෂියා බැංකුව පීචිල්සී හි නියෝජිත නියෝජ්‍ය සාමන්‍යඅධිකාරී ලෙසත් සේවයකොට ඇත.

ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනයේ සාමාජිකයෙකු වන ඔහු, දශක දෙකකට වැඩි කාලයක් එහි බාහිර කථිකාචාර්යයවරයෙකු ලෙස සේවය කොට ඇත. IBSL බැංකුකරණ විභාගයේ අත්පොත සඳහා නිර්දේශ කරන ලද, "ණය කළමනාකරණය" පිළිබඳ ශ්‍රී ලංකාවේ එකම ග්‍රන්ථය හි කර්තෘ ද සිල්වා මහතා වේ. ද සිල්වා මහතා ශ්‍රී ලංකාවේ පළපුරුදු බැංකුකරුවන්ගේ සංගමයේ (APB) යාවජීව සාමාජිකයෙකු වන අතර, වර්තමානයේ ශ්‍රී ලංකාවේ පළපුරුදු බැංකුකරුවන්ගේ සංගමයේ උපදේශනාත්මක කමිටුවේ සහ ණය කළමනාකරණ කමිටුවේ සේවය කරනු ලබයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වෙළඳ සංගමයේ යාවජීව සාමාජිකයෙකි.

ද සිල්වා මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත.

ඔහු 2005-2010 දක්වා කාලය තුළ මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, 2020-2022 දක්වා කාලය තුළ සර්වෝදය ෆයිනෑන්ස් පීවිල්සී හි ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය.

සුනිල් ද සිල්වා මහතා, 2015-2018 දක්වා කාලය තුළ දකුණු අප්‍රිකාව වෙත ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස කටයුතු කරන ලද අතර, 2018-2019 කාලය තුළ කෙන්යාවේ මහ කොමසාරිස් ලෙස කටයුතු කර ඇත.

සුනිල් ද සිල්වා මහතා, 2018-2019 කාලය තුළ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN HABITAT) හි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිතයා ලෙස කටයුතු කර ඇත.

ඔහු, 2022 නොවැම්බර් මස පටන් ගු.ගු.සේ.ස හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් වූ අතර, විගණන සහ කළමනාකරණ කමිටුවෙහි සහ මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදන අනු කමිටුන් හි සාමාජිකත්වය දරයි.

ජී යූ කේ අල්ගෙවත්තගේ මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ගයාන් උදාර කෞෂල්‍ය අල්ගෙවත්තගේ මහතා වර්තමානයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති ලෙස කටයුතු කරනු ලබයි. එමෙන්ම සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (පෞද්ගලික) සමාගම (SAGT), කොළඹ ජාත්‍යන්තර බහාලුම් පරියන්තය (CICT), සීමාසහිත කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය (පෞද්ගලික) සමාගම, සීමාසහිත හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ (පෞද්ගලික) සමාගම (HIPG), සීමාසහිත හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා (පෞද්ගලික) සමාගම (HIPS) සහ සීමාසහිත ලංකා නාවික කටයුතු සංස්ථාව වැනි ප්‍රසිද්ධියේ ලැයිස්තුගත කර ඇති සහ පෞද්ගලික සමාගම් කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කරනු ලබයි.

අල්ගෙවත්තගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත්, නාවල විවෘත විශ්වවිද්‍යාලයෙන් LLB උපාධියත් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් පෛව විද්‍යාව පිළිබඳ උපාධියත් ලබා ගෙන ඇත.

බහුශ්‍රැත, කැපවූ, උද්‍යෝගී මෙන්ම අත්දැකීම් වලින් බහුල ජ්‍යේෂ්ඨ පරිපාලන නිලධාරියකු වන ඔහු, සුවිශේෂී නායකත්ව සහ විපුල කළමනාකරණ දැනුමෙන් පිරි අයෙකි. ඔහු සමාගම තුළ ඉහළ නිලධාරීන් සහ පහළ නිලධාරීන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට බොහෝ වශයෙන් නවෝත්පාදන සහ කාල කළමනාකරණය යොදා ගනු ලබන ශක්තිමත් සහ නිසැක සන්නිවේදකයෙකි.

ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයෙහි අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ඔහු, 2018 ඔක්තෝම්බර් - ජුනි 2022 දක්වා කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඵලදායීතා වෘත්තිකයෙකු වී ආසියානු ඵලදායීතා සංවිධානයේ විකල්ප අධ්‍යක්ෂ ලෙස ද සේවය කර ඇත. ඔහු 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයෙන් රැකියා කටයුතු ආරම්භ කළ අතර, වර්තමානයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ තනතුරු දරනු ලබයි. වසර 16 ක කැපී පෙනෙන වෘත්තීය ජීවිතයක් ඔහු සතුය. පරිපාලන සේවා ක්ෂේත්‍රයේ විවිධ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ප්‍රාදේශීය ලේකම් ලෙස ඔහු ලබා ගත් අත්දැකීම් වසර දහයකට වඩා වැඩි වේ.

ඔහු, 2022 ජුනි මස පටන් ගු.ගු.සේ.ස හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් වූ අතර, මානව සම්පත් සහ වැටුප් අනුකමිටුවෙහි සාමාජිකත්වය දරයි.

ඒ එච් එස් ගුණවර්ධන මහතා
විධායක නොවන අධ්‍යක්ෂ/අමාත්‍යාංශ නිරීක්ෂක

ඒ එච් සුනිල් ගුණවර්ධන මහතා, ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂවරයකු/අමාත්‍යාංශ නිරීක්ෂක ලෙස 2019 දෙසැම්බර් සිට කටයුතු කරන අතර සියළුම ගුවන්තොටුපළහි ඉදිරි ගමන් මග අනුකමිටුන් හි සාමාජිකයෙකි.
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු ලෙස සිය සේවය ආරම්භ කළ, ගුණවර්ධන මහතා වසර 25කට වැඩි කාලයක් රාජ්‍ය සේවයේ පළපුරුද්දක් ඇති අයෙකි. ඔහු පළමු වරට 1998 වර්ෂයේදී සැලසුම් සකස් කිරීමේ සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හි (SLAS II/II) සහකාර අධ්‍යක්ෂ ලෙස පත් වූ අතර, විවිධ අමාත්‍යාංශ සහ රජයේ ආයතන හි ජ්‍යෙෂ්ඨ තනතුරු දරමින් ප්‍රගතියක් ලැබූ අතර, විතුළින් අත්දැකීම් රැසක හිමිකාරයෙකු විය. ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මූල්‍ය සහ සැලසුම්කරණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස (SLAS I) ඔහුගේ පත්වීම් කාලය තුළ දී රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධනය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම, උද්හිත උද්‍යාන භාර අරමුදල, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ආදී රජය සතු ආයතන හි අධ්‍යක්ෂ මණ්ඩල නියෝජනය කර ඇත.

වර්තමානයේ වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලෙස කටයුතු කරනු ලබයි. ඔහුගේ සේවාව අතරතුර, 2019 වර්ෂයේදී ගමනාගමන සහ ගුවන්සේවා අමාත්‍යාංශයේ වැඩකටයුතු භාර ගැනීමට පෙර, වසර තුනක කාලයකට ශ්‍රී ලංකා රේගුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/රේගුවේ අධ්‍යක්ෂ ලෙසත්, වසර දෙකක කාලයකට ජාතික ලොතරැයි මණ්ඩලයේ කළමනාකාර ජෙනරාල් ලෙසත්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම් (පරිපාලන සහ සංවර්ධන) ලෙසත් සේවය කර ඇත.

ගුණවර්ධන මහතා ගු.ගු.සේ.ස. සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ හි වැඩ බලන සභාපති ලෙස පිළිවෙලින් 2019 සහ 2020 වර්ෂයන්හි කෙටි කාලයකට සේවය කර ඇත.

ගුණවර්ධන මහතා ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත. එමෙන්ම ඔහු ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ එම සරසවියෙන්ම ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ලබාගෙන ඇත. ඔහුගේ උසස් අධ්‍යාපනයට අදාළව පර්යේෂණ ලිපි දෙකක් ප්‍රකාශයට පත්කොට ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



එච් එස් හෙට්ටිආරච්චි
ගුවන්තොටුපළ කළමනාකරණ ප්‍රධානී



ජේ ඒ එම් ඩී එස් එස් අබේවර්ධන
මූල්‍ය ප්‍රධානී



ඒ අයි බී කරුණාරත්න
ව්‍යාපෘති ප්‍රධානී



එම් රත්නසිංහ (මිය)
නීති ප්‍රධානී



එච් පී එල් සිරිමාන්න
සැපයුම් දාම කළමනාකරණ ප්‍රධානී



කේ ඩී වයි චාන්දනී (මිය)
උපායමාර්ගික කළමනාකරණ ප්‍රධානී



යූ එම් විරවර්ධන
විදුලි ඉංජිනේරු ප්‍රධානී



ජේ එම් ද කෘස් රුබින්
ගෘහ නිර්මාණ, භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ ප්‍රධානී



යූ ජේ ලොකුආරච්චි
තොරතුරු තාක්ෂණ ප්‍රධානී

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



යූ එස් ජාගොඩ
සිවිල් ඉංජිනේරු (නඩත්තු) ප්‍රධානී



වින්ග් කොමාන්ඩර් (විශ්‍රාමික) එස් එම් ඩී විජේසූරිය
ගිනි සහ මුදවාගැනීමේ සේවා ප්‍රධානී



එස් එස් ද සිල්වා
අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන ප්‍රධානී



එම් කේ පී තැන්නගේ (මිය)
අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ ප්‍රධානී



ජේ කේ රත්නින්ද
ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් සංචරණ ඉංජිනේරු ප්‍රධානී



එන් සී අබේවර්ධන
ගුවන් සංචරණ සේවා ප්‍රධානී



ආර් ඩබ්ලිව් එල් බී මැදවැව
භාණ්ඩ සහ ගුවන් භාණ්ඩ කළමනාකරණ ප්‍රධානී



ඩී ජේ යූ පුරසිංහ
වාණිජ සහ දේපල ප්‍රධානී



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ඒ පී පල්ලාවෙල RWP RSP
ආරක්ෂක සේවා ප්‍රධානී



ලුතිනන් කර්නල් (විශ්‍රාමික) කේ එච් සී කුමාරසිංහ
බුද්ධි සහ ආරක්ෂක මෙහෙයුම් ප්‍රධානී -
සියලුම ගුවන්තොටුපළ



එස් පී පාලගම
යාන්ත්‍රික ඉංජිනේරු ප්‍රධානී



එස් ඩී ඒ එස් නිශාන්ත
සමාගමේ වෛද්‍ය නිලධාරී



ආර් විරශ්‍රී (මිය)
වැඩ බලන සිවිල් ඉංජිනේරු (සැලසුම් සහ නිර්මාණ)
ප්‍රධානී



කේ ඒ ආර් කොඩිකාර
මානව සම්පත් නියෝජ්‍ය ප්‍රධානී

ජායාරූපයේ නොමැත.
එච් ඒ ඒ කේ එම් සෙනෙවිරත්න
සිවිල් ගුවන්සේවා පුහුණු ප්‍රධානී

ඉහළට ගමන්
කිරීමේ ඇති සීමා
බිඳ දමා


SriLankan
oneworld
SriLankan
SriLankan
SriLankan

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කර සිටින්නෙමු. මෙහි දක්වා ඇති තොරතුරු, 2007 අංක 7 දරන සමාගම් පනතේ අනිවාර්ය අදාළ තොරතුරු සපයන අතර, හොඳම ගිණුම්කරණ භාවිතයන් අනුගමනය කර ඇත. මෙම වාර්තාවේ සංක්ෂිප්ත ඉදිරිපත් කිරීම හරහා, සමාගමේ කටයුතුවල තත්ත්වය සහ ගිණුම්කරණ කාලසීමාව තුළ සිදුවන කිසියම් වෙනස්කම් ඇඟයීම සඳහා කොටස් හිමියන්ට තොරතුරු ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් මනාව සිදු කර ඇති බවට අපි සහතික කර ඇත්තෙමු.

1. සමාගම පිළිබඳ

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස.) යනු, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්තොටුපළ කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ව්‍යවස්ථාපිත බලතල සහිත, සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

2. ප්‍රධාන ක්‍රියාකාරකම්

ගු.ගු.සේ.ස. හි ප්‍රධාන මෙහෙයුම් ක්‍රියාකාරකම්, 2010 නොවැම්බර් 04 වැනි දින ගැසට් පත්‍රය අනුව, 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත මඟින් පැවරී ඇති බලතල යටතේ, පහත සඳහන් ගුවන්සේවාවල එකම ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස එහි කාර්යභාරය අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.

2.1 බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.රා.ජා.ගු.), කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන (කො.ජා.ගු.ර.), මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.ජා.ගු.), සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (යා.ජා.ගු.), සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

2.2 ඉහත ගුවන් පර්යන්තවල සුපරීක්ෂා කිරීම්, ගලවාගැනීම් සහ ගිනි නිවීමේ සේවා සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම සහ නඩත්තු කිරීම.

2.3 කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළ සියලුම ගුවන් යානාවල සහ මඟීන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සහතික කරමින්, ගුවන් ගමනාගමන සේවා, ගඟන නාවික තොරතුරු සේවා, ගඟන නාවික සන්නිවේදන සේවා සහ ගඟන නාවික ආධාර ආදිය සැපයීම.

3. මෙහෙයුම් සමාලෝචනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය, සහ ගු.ගු.සේ.ස. හි ඉදිරි ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ වාර්ෂික වාර්තාවේ සභාපතිතුමාගේ පණිවුඩය (12 සිට 14 දක්වා පිටු), කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය (37 සිට 49 දක්වා පිටු) සහ මූල්‍ය සමාලෝචනය (51 සිට 56 දක්වා පිටු) මඟින් ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තා සහ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයක් වන අදාළ කටයුතුවල තත්ත්වයන් පිළිබිඹු කරයි.

"තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම" නම් වූ ගු.ගු.සේ.ස. හි දැක්ම සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක ක්‍රියාත්මත කිරීමෙන් මෙහෙයුම් කාර්යසාධනය අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.

4. මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන 86 සිට 117 දක්වා පිටු වල දක්වා ඇත.

5. වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුකූලව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති, 90 සිට 99 දක්වා පිටු වල ඇත. සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ, සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනසක් සිදු නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලබයි.

6. මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරන සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් එහි තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්ම පිළිබිඹු කිරීම සඳහා එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, සමාගම් පනත, 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ අනෙකුත් මූල්‍ය වාර්තාකරණ නියාමන අවශ්‍යතාවලට අනුකූලව, 86 සිට 117 දක්වා පිටු වල ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන් සඳහන් කරයි.

7. ස්වාධීන විගණකවරුන්, විගණක වාර්තාව සහ වේතන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තියේ, 2015 මැයි 15 වැනි දින පනවන ලද 19 වැනි සංශෝධනයට අනුව, ඕනෑම ලිඛිත නීතියක් යටතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රජයේ ව්‍යවසායන් පිළිබඳ විගණනය කිරීමට විගණකාධිපතිවරයාට බලය ඇත. මෙම නියෝග අනුව 2022 වසර සඳහා ගු.ගු.සේ.ස. හි විගණනය, විගණකාධිපති විසින් සිදු කරන ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව, මෙම වාර්තාවේ 78 සිට 85 දක්වා පිටුවල ඉදිරිපත් කර ඇත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තුව රුපියල් 1,096,500 (2021: රුපියල් 1,200,000) වූ අතර, විගණනයට අදාළ සේවා සහ විගණන නොවන සේවා සඳහා විගණකවරුන්ට ගෙවන ලද වෙනත් ගාස්තු නොවීය. අධ්‍යක්ෂවරුන්ගේ දැනුවත්වීම පරිදි, සමාගමේ විගණකවරයා වීමේ සම්බන්ධතාවය හැර, වෙනත් කිසිදු සම්බන්ධයක් විගණකවරුන්ට සමාගම සමඟ නොමැත.

8. අභ්‍යන්තර පාලන සහ ප්‍රධාන අභ්‍යන්තර පාලන ක්‍රියාවලි

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා එහි වත්කම් ආරක්ෂා කර ගැනීමට සුදුසු පියවර ගෙන ඇත. මෙම අරමුණ සඳහා, වසර පුරාවට සමාගම විසින් මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, පටිගත කිරීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් ඵලදායී සහ පුළුල් අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කර ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

මෙය අභ්‍යන්තර සමාලෝචන, අභ්‍යන්තර විගණනය සහ මෙහෙයුම් ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට, වත්කම් ආරක්ෂා කර ගැනීමට, වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට සහ සුරක්ෂිතව, ප්‍රායෝගික සහ වාර්තා වල විශ්වසනීයත්වය සඳහා අවශ්‍ය සමස්ත මූල්‍ය සහ වෙනත් පාලන පද්ධතියකින් සමන්විත වේ. විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) විසින් සමාගමේ අභ්‍යන්තර විගණකවරුන්, රජයේ විගණකවරුන් සහ නියාමන බලධාරීන් විසින් හඳුනාගෙන ඇති අභ්‍යන්තර පාලන ගැටලු නිතිපතා

සමාලෝචනය කරයි. අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණාත්මක බව කළමනාකරණය විසින් තක්සේරු කරනු ලබයි.

9. සමාගමේ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්වය

9.1 ආදායම

2022 වර්ෂය සඳහා සමාගම විසින් උපයා ඇති ආදායම රුපියල් බිලියන 27.6 (2021: රුපියල් බිලියන 7.9) ක් වන අතර, එය පෙර වසරට සාපේක්ෂව 251% ක සැලකිය යුතු වර්ධනයකි. ව්‍යාපාර අංශ මත පදනම් වූ සමාගම් ආදායම පිළිබඳ විශ්ලේෂණයක් 100 පිටුවේ, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5 හි අනාවරණය කර ඇත.

9.2 මෙහෙයුම් ප්‍රතිඵල

සමාගම විසින් 2022 වසරෙන් අවසන් වූ වසර සඳහා රුපියල් බිලියන 12.7 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කරන ලදී. වසරකට පෙර වාර්තා වූ රුපියල් බිලියන 3.8 ක මෙහෙයුම් අලාභය සමඟ සසඳන විට, මෙය 436% ක වර්ධනයකි.

සමාගම, 2021 වර්ෂයේ වාර්තා කළ රුපියල් බිලියන 2.1 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව, 2022 වර්ෂය සඳහා රුපියල් බිලියන 4.8 ක ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

9.3 සංචිත

කොටස් ප්‍රාග්ධනය, අනෙකුත් සංචිත සහ රඳවා ගත් ඉපැයීම් වලින් සමාගමේ සංචිත සමන්විත වේ. වසර තුළ දී ලාභයේ වර්ධනය හේතුවෙන් සංචිතවල වැඩිවීමක් වාර්තා විය. ඒ අනුව, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 41.3 ට සාපේක්ෂව, 2022 දෙසැම්බර් 31 වන විට වාර්තා වූ මුළු සංචිත රුපියල් බිලියන 45.3 කි. සමාගමේ කොටස්වල චලනය පිළිබඳ 88 පිටුවේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වේ.

9.4 ලාභාංශ

සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් රුපියල් මිලියන 500 ක ලාභාංශ ප්‍රකාශ කර ගෙවා ඇත.

9.5 පරිත්‍යාග

2022 වර්ෂයේදී, සමාගම විසින් රුපියල් 510,000 ක් (2021 වසරේදී: රුපියල් 20,047,158) වටිනා පරිත්‍යාග සිදු කර ඇත.

9.6 ප්‍රාග්ධන වියදම

සමාලෝචිත වර්ෂය තුළ, සමාගම විසින් ප්‍රාග්ධන වියදම්, 2021 වසරේ රුපියල් බිලියන 23 ට සාපේක්ෂව, රුපියල් බිලියන 7 ක් දරන ලදී. දේපළ, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ආයෝජනය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 11 සහ 12 හි දක්වා ඇත.

9.7 රජය වෙත දායකත්වය

ගු.ගු.සේ.ස. විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකන් ගුවන්සේවය වැනි අනෙකුත් රජයේ අධිකාරීන්ට ගුවන්තොටුපළ තුළ අදාළ සේවා සැපයීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් අඛණ්ඩව සම්පාදනය කරන ලදී. මෙම ගනුදෙනු සහ ගිණුම් ශේෂයන් පිළිබඳ 116 පිටුවේ මූල්‍ය ප්‍රකාශන වෙත සටහන් අංක 32 හි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු යටතේ අනාවරණය කර ඇත.

පසුගිය වසර 3 තුළ, බදු ගෙවීම ඔස්සේ රජය වෙත එක්‍ර දායකත්වය ලබා දීම පිළිබඳ පහත වගුවේ සහ ප්‍රස්තාරයේ දක්වා ඇත.

වසර	රුපියල් මිලියන				
	ලාභාංශ	එකතු කළ අගය මත බදු	ආදායම් බදු	සමාජ ආරක්ෂණ දායක බදු	උපයන විට ගෙවීම
2020	-	207	-	-	7
2021	-	117	15	-	6
2022	500	1,281	117	70	15

9.8 ආයෝජන

වසර අවසානයේදී ආයෝජන එකතුවේ වටිනාකම, රුපියල් බිලියන 41.4 කින් වර්ධනය වී ඇති අතර, එහි විස්තර පහත වගුවේ දක්වා ඇත.

ආයෝජන	රුපියල් මිලියන	
	2022.12.31 දිනට	2021.12.31 දිනට
භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර	22	20
කෙටි කාලීන බැංකු තැන්පතු	78,025	41,515
ණයකර සඳහා ආයෝජන	3,298	4,088
දිගු කාලීන බැංකු තැන්පතු	6,963	1,267
එකතුව	**88,308**	**46,890**

9.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන සමාගමේ කොටස් ප්‍රාග්ධනය රුපියල් 100/- බැගින් වූ සාමාන්‍ය කොටස් වලින් සමන්විත වේ. 2022 දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකාරිත්වය පහත පරිදි විය.

දරනු ලබන්නේ	කොටස් ගණන	වටිනාකම (රුපියල්)
මහා භාණ්ඩාගාර ලේකම්	200,000	20,000,000
ලේකම්- වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය	1	100
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජෙනරාල්	1	100
එකතුව	**200,002**	**20,000,200**

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

9.10 වාර්තා කිරීමේ කාලවකවානුවෙන් පසු සිදුවීම්

117 පිටුවේ මූල්‍ය ප්‍රකාශන වෙත 33 සටහනේ සඳහන් කර ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් හෝ හෙළිදරව් කිරීම සඳහා අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දිනයෙන් පසුව සිදුවී නොමැත.

9.11 අඛණ්ඩ පැවැත්ම

සුවිශේෂී විමසීම් වලින් පසු, සාමාන්‍ය පුරෝකථන ක්‍රියාවලිය අනුමත කිරීමෙන් සහ අනාගත අපේක්ෂාවන් සහ අවදානම් විභවයන් සලකා බැලීමෙන් පසු, ගු.ගු.සේ.ස. සතුව තක්සේරු කළ හැකි අනාගතය සඳහා මෙහෙයුම් පැවැත්ම පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සහ කැපවී සිටින ණය ගැනීමේ පහසුකම් ඇති බව අධ්‍යක්ෂවරු විසින් සලකනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සියලු මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

9.12 අසම්භාවයන් සහ බැඳීම්

අසම්භාවය බැරකම් පිළිබඳ විස්තර 114 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 හි අනාවරණය කර ඇත.

10. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනුකමිටු පිළිබඳ තොරතුරු

10.1 අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිතුමා (79 වැනි වගන්තිය) සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් (82 වැනි වගන්තිය) පත් කිරීම ගු.ගු.සේ.ස. හි සාංගමික ව්‍යවස්ථාවලිය හි ඉහත සඳහන් කරන ලද ඡේද වල දැක්වෙන අදාළ වගන්ති අනුව සිදු කර ඇත.

10.2 මූල්‍ය වර්ෂය අවසානයේ නිලතල දැරූ වත්මන් අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර

අධ්‍යක්ෂ මණ්ඩලය	තනතුර	පත්වීම් ලබාදුන් දිනය	ස්වාධීන
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc	සභාපති	12.12.2019	නැත
වෛද්‍ය යූ ඒ මෙන්ඩිස්	උප සභාපති	15.06.2022	නැත
ඒ එස් සී වරුෂහෙන්නැදිගේ	විධායක නොවන අධ්‍යක්ෂ	12.12.2019	ඔව්
එස් එන් සුමනසේකර	විධායක නොවන අධ්‍යක්ෂ	12.12.2019	ඔව්
කපිතාන් මිලින්ද රත්නායක	විධායක නොවන අධ්‍යක්ෂ	20.06.2022	ඔව්
ජී යූ කේ අල්ගෙවත්තගේ	විධායක නොවන අධ්‍යක්ෂ	15.06.2022	ඔව්
ඩබ්ලිව් ඒ ඒ විජේසූරිය	විධායක නොවන අධ්‍යක්ෂ	13.09.2022	ඔව්
ඩබ්ලිව් එස් ඩී ද සිල්වා	විධායක නොවන අධ්‍යක්ෂ	30.11.2022	ඔව්
ඒ ඒ රන්දෙණිය LL.M (UK)	විධායක නොවන අධ්‍යක්ෂ	30.11.2022	ඔව්
ජී ඒ ඒ ප්‍රියන්ත	විධායක නොවන අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත	11.06.2021	නැත
ඒ එච් එස් ගුණවර්ධන	විධායක නොවන අධ්‍යක්ෂ / වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශ නිරීක්ෂක	31.12.2019	නැත

10.3 2022 වර්ෂය තුළ ඉල්ලා අස් වූ අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර

අධ්‍යක්ෂ මණ්ඩලය	තනතුර	පත්වීම් ලබාදුන් දිනය	ඉල්ලා අස් වූ දිනය
ආර් සූරියආරච්චි	උප සභාපති	06.12.2019	10.06.2022
එස් එම් ඒ යූ එස් මංචනායක	විධායක නොවන අධ්‍යක්ෂ	12.12.2019	12.08.2022
සී විතාරණ	විධායක නොවන අධ්‍යක්ෂ	31.12.2019	31.05.2022
ඩී ඒ ද ලිවේරා (මිය)	විධායක නොවන අධ්‍යක්ෂ	31.12.2019	11.06.2022
ආර් ඒ පී විජේරත්නසේකර	විධායක නොවන අධ්‍යක්ෂ	31.12.2019	10.06.2022
ජනාධිපති නීතිඥ ඩී ඒ පී වීරත්න	විධායක නොවන අධ්‍යක්ෂ	02.03.2020	11.06.2022
ඩබ්ලිව් එම් ගිහාන් රශාන්ත	විධායක නොවන අධ්‍යක්ෂ	05.02.2021	10.06.2022
එන් එම් පී පී කේ කේ නවරත්න	විධායක නොවන අධ්‍යක්ෂ	20.06.2022	29.11.2022

10.4 අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය දැක්වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අනු කමිටු හතක් පත් කොට ඇත. වාර්තා කරන දිනයට එම කමිටුහි සංයුතිය පහත පරිදි වේ.

අනු කමිටුව	සංයුතිය
විගණන සහ කළමනාකරණ කමිටුව	ජී ඒ ඒ ප්‍රියන්ත - සභාපති
	කපිතාන් මිලින්ද රත්නායක - සාමාජික
	ඩබ්ලිව් එස් ඩී ද සිල්වා - සාමාජික
	එම් කේ පී තැන්නගේ (මිය)- කැඳවුම්කරු
	එම් එම් රේනුක පී ගුණසේකර (මිය)- ලේකම්
	කේ ඒ ඒ කුලතුංග (හිටපු එස් ඒ ඩී ඩිල්රුක්ෂි - (මිය)) - නිරීක්ෂක - රජයේ විගණන අධිකාරී
මානව සම්පත් සහ වැටුප් කමිටුව	වෛද්‍ය යූ ඒ මෙන්ඩිස් - සභාපති
	පී යූ කේ අල්ගෙවත්තගේ - සාමාජික
	කේ ඒ ආර් කොඩිකාර - කැඳවුම්කරු සහ/හෝ ලේකම්
මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදන කමිටුව	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි මහතා RWP USP VSV ndc psc - සභාපති
	එස් එන් සුමනසේකර - සාමාජික
	ඩබ්ලිව් එස් ඩී ද සිල්වා - සාමාජික
	ජේ ඒ එම් ඩී එස් එස් අබේවර්ධන - කැඳවුම්කරු සහ/හෝ ලේකම්
අවදානම් කළමනාකරණ කමිටුව	කපිතාන් මිලින්ද රත්නායක - සභාපති
	ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - සාමාජික
	කේ ඩී වයි චාන්දනී (මිය) - කැඳවුම්කරු සහ/හෝ ලේකම්
සියලුම ගුවන්තොටුපළ හි ඉදිරි ගමන්මග කමිටුව	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති
	ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - සාමාජික
	ඒ එච් එස් ගුණවර්ධන - සාමාජික
	එච් එස් හෙට්ටිආරච්චි - කැඳවුම්කරු සහ/හෝ ලේකම්
ව්‍යාපෘති කළමනාකරණ කමිටුව	ඩබ්ලිව් ඒ ඒ විජයසූරිය - සභාපති
	ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - සාමාජික
	ඒ අයි බී කරුණාරත්න - කැඳවුම්කරු සහ/හෝ ලේකම්
ගු.ගු.සේ.ස. හි ප්‍රසම්පාදන අත්පොත සැකසීම	ජී ඒ ඒ ප්‍රියන්ත - සභාපති
	එච් පී එල් සිරිමාන්න - කැඳවුම්කරු සහ/හෝ ලේකම්

10.5 කොටස් හෝ ණයකර ගනුදෙනු කරනු ලබන අධ්‍යක්ෂවරුන් පිළිබඳ අනාවරණය

කිසිදු අධ්‍යක්ෂවරයෙකු සතුව කොටස් හෝ ණයකර නොමැත.

10.6 ගිවිසුම් සහ යෝජිත ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ව්‍යාපාරයට සම්බන්ධ ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් පිළිබඳව කිසිදු අධ්‍යක්ෂවරයකු සෘජුව හෝ වක්‍රව උනන්දුවක් දක්වා නොමැත.

10.7 අධ්‍යක්ෂවරුන්ගේ වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ

සමාගම විසින් 2022 වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ දීමනා ලෙස, රුපියල් මිලියන 8.4 ක් ගෙවා ඇත (2021 - රුපියල් මිලියන 11.3). වසර අවසානයේ දී විධායක අධ්‍යක්ෂවරුන් දෙදෙනා සඳහා වේතන වශයෙන් රුපියල් මිලියන 2.6 ක් ගෙවා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ දීමනා, සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, ප්‍රසාද දීමනා, පාරිතෝෂික, සංග්‍රහ වියදම් ප්‍රතිපූරණය කිරීම, දුරකථන සහ අනෙකුත් දීමනා වැනි සියලුම මූල්‍ය ප්‍රතිලාභ මේ සඳහා ඇතුළත් විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් හට වසර තුළදී රුපියල් මිලියන 5.8 ක මුදලක් ගෙවා ඇති අතර, එය ගමන් වියදම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වීම සඳහා වූ ගාස්තුව වේ.

11. ආයතනික පාලනය

ඵලදායී ආයතනික පාලන රාමුවක් පවත්වා ගැනීම සහ ආයතනික පාලනයේ හොඳම භාවිතයන් සහ ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට අවශ්‍ය පද්ධති සහ ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීමට, අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

12. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ගේ දැනුවත්භාවය අනුව, සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු, ගාස්තු සහ අයකිරීම්, සමාගමේ සේවකයින්ට අදාළ සහ ඔවුන් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම සම්ප්‍රදාන, බදු සහ අයබදු සහ අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී සමාගම විසින් අයවිය යුතු සහ ගෙවිය යුතු දෑ වීම දිනට ගෙවා ඇති බව හෝ අදාළ ප්‍රතිපාදන සපයා ඇති බවට සහතික කරයි.

13. නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ විශ්වාසය අනුව, සමාගම රටේ නීති සහ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැත.

14. වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී, 2023 මැයි 30 වැනි දින ප.ව. 3:00 ට පවත්වනු ලබයි.

15. ස්තුතිය

අභියෝග මධ්‍යයේ සමාගමේ තවත් මූල්‍ය වර්ෂයක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් කළමනාකාරිත්ව කණ්ඩායම වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය ස්තුතිය පුද කරනු ලබයි. මෙම වසර කොවිඩ් වසංගත පසුකාලීන රැළි තත්වය සහ ලොව පුරා සංචාරක සීමා පැනවීම හේතුවෙන්, ගුවන්සේවා අංශය සඳහා අභියෝගාත්මක වසරක් විය. සංචාරක අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතන වෙත, සමාගමේ පාර්ශවකරුවන් සහ නියාමක වශයෙන් මෙම අවස්ථාවේදී සමාගමට දැක්වූ අඛණ්ඩ සහයෝගය පිළිබඳ අපි විශේෂ කෘතඥතාව පළකර සිටිමු.

තවද, අප කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් අපගේ පාරිභෝගිකයින් ඇතුළුව සමාගමේ අඛණ්ඩ මෙහෙයුම් සඳහා සම්බන්ධ වූ සහ දායක වූ සියලුම පාර්ශවකරුවන්ට අපගේ හෘදයාංගම ප්‍රශංසනය සහ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමු. අවසාන වශයෙන්, මෙම අභියෝගාත්මක වසර තුළදී ගු.ගු.සේ.ස. කාර්යමණ්ඩලය වෙත ඔවුන්ගේ අඛණ්ඩ කැපවීම, අඛණ්ඩතාව සහ වෙහෙස මහන්සි වී කටයුතු කිරීම සම්බන්ධයෙන් අපගේ ස්තුතිය පළ කර සිටිමු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව



මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි මහතා RWP USP VSV ndc psc
සභාපති

2023 මැයි 26

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව (AMC)

කාර්යභාරය

විගණන සහ කළමනාකරණ කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත්ව පත් කරන ලද අනු කමිටුවකි. එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන අතර ඒ සඳහා වගකීම දරයි.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර/බාහිර විගණන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඉටු කිරීමට සහ අධීක්ෂණය කිරීමට සහය ලබා දීම විගණන සහ කළමනාකරණ කමිටුවේ මූලික කාර්යභාරය වේ.

සංයුතිය

විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත විගණන සහ කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්දේශිත නියමයන්ට (TOR) අනුව කටයුතු සිදු කරයි. සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

විගණන සහ කළමනාකරණ කමිටුවේ සංයුතිය			
අධ්‍යක්ෂතුමාගේ නම	**ධුර කාලය (සිට - දක්වා)**		**තනතුර**
ජී ඒ ඒ ප්‍රියන්ත	29.06.2021	මේ දක්වා	සභාපති
කපිතාන් මිලින්ද රත්නායක	20.06.2022	මේ දක්වා	සාමාජික
ඩබ්ලිව් එස් ඩි ද සිල්වා	30.11.2022	මේ දක්වා	සාමාජික
එස් එම් ඒ යූ එස් මංචනායක*	12.12.2019	12.08.2022	සාමාජික
ජනාධිපති නීතිඥ ඩී ඒ පී වීරත්න**	23.10.2020	11.06.2022	සාමාජික
එන් එම් පී පී කේ කේ නවරත්න***	20.06.2022	29.11.2022	සාමාජික

* එස් එම් ඒ යූ එස් මංචනායක මහතා 2022 අගෝස්තු 12වන දින ඉල්ලා අස්වීමත් සමඟ කපිතාන් මිලින්ද රත්නායක මහතා විගණන සහ කළමනාකරණ කමිටුව වෙත පත් කරන ලද අතර, එස් එම් ඒ යූ එස් මංචනායක මහතා අවසන් වරට සහභාගී වන ලද්දේ 2022 පෙබරවාරි 17වන දින පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම සඳහාය.

** ජනාධිපති නීතිඥ ඩී ඒ පී වීරත්න මහතා 2022 ජූනි 11වන දින ඉල්ලා අස්වීමත් සමඟ එන් එම් පී පී කේ කේ නවරත්න මහතා විගණන සහ කළමනාකරණ කමිටුව සඳහා පත් කරන ලදී.

*** එන් එම් පී පී කේ කේ නවරත්න මහතා 2022 නොවැම්බර් 29වන දින ඉල්ලා අස්වීමත් සමඟ ඩබ්ලිව් එස් ඩි ද සිල්වා මහතා විගණන සහ කළමනාකරණ කමිටුව සඳහා පත් කරන ලදී.

රැස්වීම්

2022 වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර හයක් (06) පවත්වන ලදී. ඒ සඳහා කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත වගුවේ දැක්වේ.

අධ්‍යක්ෂතුමාගේ නම	පැවැත්වූ කමිටු රැස්වීම් වාර ගණන	සහභාගී වූ රැස්වීම් වාර ගණන
ජී ඒ ඒ ප්‍රියන්ත	06	06
කපිතාන් මිලින්ද රත්නායක	05	05
එන් එම් පී පී කේ කේ නවරත්න	05	01
එස් එම් ඒ යූ එස් මංචනායක	01	01
ජනාධිපති නීතිඥ ඩී ඒ පී වීරත්න	01	01
ඩබ්ලිව් එස් ඩි ද සිල්වා	-	-

විගණන සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර්තා එම කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරන සමාගම් ලේකම්තුමිය විසින් සටහන් කරනු ලබයි. එමෙන්ම විගණන සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර්තා ප්‍රායෝගිකත්වය මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මීළඟ රැස්වීමේදී ඉදිරිපත් කරනු ලැබිණි.

නිර්දේශිත නියමයන්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්දේශිත නියමයන් (TOR) ප්‍රකාරව, විගණන සහ කළමනාකරණ කමිටුව කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව අධ්‍යක්ෂ ණ්ඩලය විසින් විගණන සහ කළමනාකරණ කමිටුව වෙත පහත සඳහන් කටයුතු කිරීමට බලය පවරා ඇත.

1. අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය සහ වගකීම් තීරණය කිරීම.
2. වාර්ෂික විගණන සැලැස්ම සහ කාර්ය වැඩසටහන සමාලෝචනය කර අනුමත කිරීම. මෙහිදී අභ්‍යන්තර විගණකවරයා විසින් විගණකාධිපති (බාහිර විගණක) සමඟ සාකච්ඡා කර වාර්ෂික විගණන සැලැස්ම සකස් කළ යුතුය.
3. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කර ඇගයීම.
4. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය සහ විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපිය සඳහා කළමණාකාරිත්වයේ ප්‍රතිචාරය පසු විපරම් කිරීම.
5. අයවැය සමාලෝචන වාර්තා ඇතුළු මූලික අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
6. ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
7. අභ්‍යන්තර විගණකවරුන් සහ බාහිර විගණකවරුන් සමඟ කටයුතු කිරීම.
8. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යමණ්ඩලය, ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීතිරීති හා රෙගුලාසි පිළිබඳව ඇති දැනුවත්භාවය සහතික කර ගැනීම සහ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම පිළිබඳ සමාලෝචනය කිරීම.
9. අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තාව/ විමසීම් නිතිපතා සමාලෝචනය කිරීම සහ ඒ මගින් පෙන්වා දෙන ලද අඩුපාඩු සම්බන්ධයෙන් එක් එක් අංශ ප්‍රධානීන් විසින් ගන්නා කඩිනම් ක්‍රියාමාර්ග පිළිබඳ සහතික කිරීම.

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව (AMC)

10. බාහිර විගණකවරුන්ගේ වාර්තාව/ විමසීම් සමාලෝචනය කර, එමගින් පෙන්වා දෙන ලද අඩුපාඩු පුනරාවර්තනය වීම වැළැක්වීම උදෙසා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම.
11. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව සමාලෝචනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග/ සහතික කිරීම් වරින් වර අධීක්ෂණය කිරීම.
12. අභ්‍යන්තර විගණකවරුන්ගේ අඛණ්ඩ අපක්ෂපාතීත්වය සහ ඔවුන්ගේ කාර්යසාධනය සමාලෝචනය කිරීම.
13. අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සහ කෝප් කමිටුවේ නිර්දේශ සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබා දීම.
14. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම.
15. නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා අවම වශයෙන් මාස තුනකට වරක් විගණන සහ කළමනාකරණ කමිටුව රැස්වී එහි නිර්දේශ, රැස්වීම් වාර්තාව සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දීම.

මූල්‍ය වාර්තාකරණය

වාර්තාකරණය සිදු කරනු ලබන කාලසීමාව තුළ පාර්ශවකරුවන්ට සපයනු ලබන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා, මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ කාර්යසාධනය පිළිබඳව විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ගිණුම් පොත් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, සත්‍ය සහ සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම ඉටු කිරීමට කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය. සියලුම ගනුදෙනු නිවැරදිව සහ සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල සටහන් කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා, අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත් බව සහ කාර්යසාධන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. මාසික පදනම මත සකස් කරන ලද අතුරු මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු කරන ලද සැලකිය යුතු උපකල්පන සහ විනිශ්චයන් ඇතුළත් ආධාරක තොරතුරු සමග කමිටුව සමාලෝචනය කළේය. එමෙන්ම, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ 2023 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.

පවතින අභ්‍යන්තර පාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි තක්සේරු කිරීමෙන් පසු, සමාගමේ මූල්‍ය තත්ත්වය මනාව නිරීක්ෂණය කර නිවැරදිව වාර්තා කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් පාලන පද්ධති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක බව විගණන සහ කළමනාකරණ කමිටුව විශ්වාස කරනු ලබයි.

අභ්‍යන්තර පාලනය

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ කාර්යසාධනය තක්සේරු කරන ලදී. මෙම ක්‍රියාවලිය මඟින් විවිධ අවදානම් අවම කිරීම සහ නීති හා රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා, අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ කාර්යසාධනය තක්සේරු කරන ලදී. ගු.ගු.සේ.ස. හි අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA&QA) අංශ ප්‍රධානියාගේ නිර්දේශ මත කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සහතික කරනු ලබයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කාර්යයන් පවත්වා ගෙන යාමට සහ අවශ්‍ය පියවර ගැනීමට සහය ලබා දේ.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන (IA) ක්‍රියාවලිය, ස්වාධීන සහ අපක්ෂපාති සහතික කිරීමේ කාර්යයක් වන අතර, එය ගු.ගු.සේ.ස. සඳහා එහි සමස්ත පාලන රාමුව වැඩිදියුණු කිරීමට සහය දක්වයි. ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලීන්ගේ සැලසුම් සහ කාර්යසාධනය ඇඟයීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමානුකූල සහ විනයානුකූල ප්‍රවේශයක් පවත්වා ගැනීමට අභ්‍යන්තර විගණන කාර්යය දායක වේ.

අභ්‍යන්තර විගණන කාර්යය, ගු.ගු.සේ.ස. හි මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් නිවැරදි වශයෙන් සිදුකිරීමට වගකිව යුතු අයගේ මෙන්ම, යහපත් ආයතනික පාලන පිළිවෙත්වලට අනුකූලව යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියැලී සිටින හෝ ගු.ගු.සේ.ස විසින් සිදු කරනු ලබන කාර්යයන් සහ සේවාවන් සපයනු ලබන අයගේ පාලනයෙන් ස්වාධීන බව කමිටුව විසින් සහතික කරන ලදී. විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, විගණන ක්‍රියා පටිපාටීන්ගේ ආවරණ සීමාව සහ කාර්යසාධනය අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් 2023 වර්ෂය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර, තක්සේරු කර අනුමත කරන ලදී. එමෙන්ම විගණන සහ කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණනයේ සැලකිය යුතු නිරීක්ෂණ සහ නිර්දේශ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර දැක්වීම් සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

බාහිර විගණනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියට අනුව, ගු.ගු.සේ.ස. හි බාහිර විගණනය සිදු කිරීමට විගණකාධිපතිවරයා වෙත බලය පැවරී ඇත. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා කටයුතු කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ මූල්‍ය ප්‍රකාශනවල අනුකූලතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ වගකීම දරනු ලබන බාහිර විගණකවරයා සමඟ විගණන සහ කළමනාකරණ කමිටුව සමීපව කටයුතු කරයි.

සියලුම විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස බාහිර විගණකවරයාට ආරාධනා කරන ලද අතර, එමඟින් කමිටුවට ඔහුගේ අදහස් ලබා ගැනීමට සහ නියාමන හා අනුකූලතා අවශ්‍යතා සහ පාලන හෝ ක්‍රියා පටිපාටි දුර්වලතා තිබේ නම් ඒවා පිළිබඳ ඔහුගේ අදහස සාකච්ඡා කිරීමට හැකි විය.

යහපත් සාමූහික පාලනය

රාජ්‍ය චක්‍රලේඛ වැනි නියාමන අවශ්‍යතා අනුගමනය කිරීමේ වැදගත්කම සහ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීම මගින් ගු.ගු.සේ.ස. හි සාමූහික පාලනය, ක්‍රියාශීලී සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම උදෙසා විගණන සහ කළමනාකරණ කමිටුවට ඉමහත් දායකත්වයක් ලබා දිය හැකි විය.

නිගමනය

විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යභාරය මගින් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණාත්මක බව සහ සඵලතාවය, බාහිර විගණනය සහ නීති හා රෙගුලාසි වලට අනුකූලවීම අධීක්ෂණය කිරීම උදෙසා ගු.ගු.සේ.ස. ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති බැඳීම් සහ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය සහ මඟපෙන්වීම සමග ගු.ගු.සේ.ස. හි ව්‍යාපාර කටයුතු පිළිබඳ ව තුලනාත්මක සහ ස්වාධීන අධීක්ෂණයක් පවත්වා ගෙන යාමට බලාපොරොත්තු වේ. වසර තුළදී තම සේවය සාර්ථකව ක්‍රියාවට නැංවීමත්, ඉහළ මට්ටමකට ගෙන ඒමත්, ඒ හරහා සමාගමේ අගය වැඩි දියුණු කළ බව විශ්වාස කරලීමට හේතු රැසක් ඇති බවට විගණන සහ කළමනාකරණ කමිටුව විශ්වාස කරයි.

පී ඒ ඒ ප්‍රියන්ත
සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

2023 මැයි 26

අපගේ විශිෂ්ඨ සේවාවන් අත්විඳීම


NESCAFÉ

මෙහෙයුම් ලාභය

රු. බිලියන 13 ක්

සමඟ 436% ක

වර්ධනයක්

මගීන්

5,503,198 ක්

සමඟ 266%

වර්ධනයක්

හරහා පියාසර

23,846 ක්

සමඟ 155% වර්ධනයක්

ගුවන්යානා සංචලන

37,641 ක්

සමඟ 78% වර්ධනයක්



කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

1) ගෝලීය සහ දේශීය ගුවන්සේවා කර්මාන්තයේ සමාලෝචනය සහ තත්ත්වය

ගුවන් ගමන් සහ මගී සංචලනයේ ඇති වූ ව්‍යාකූල තත්ත්වය හේතුවෙන්, 2022 වර්ෂය ගෝලීය ගුවන් සේවා කර්මාන්තය සඳහා අභියෝගාත්මක විය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා, ජාත්‍යන්තර දේශසීමා වසා දැමීම සහ ගුවන්යානා ඉන්ධන මිල සහ ගුවන් ගමන් ගාස්තු ඉහළ යාම මඟින්, 2022 මූල්‍ය වර්ෂයේ පළමු මාස හය ගුවන්සේවා කර්මාන්තය සඳහා ඍණාත්මක බලපෑමක් ඇති කරන ලදී. කෙසේවෙතත් මෙම පසුබෑම වසරේ අගභාගය පුරා ගුවන් ගමන් වෙත පැවති ඉහළ ගිය ඉල්ලුම මඟින් සමනය කරන ලදී. එබැවින් 2022 වසර අවසානය වන විට ගෝලීය ගුවන්සේවා කර්මාන්තය සාමාන්‍ය තත්ත්වයට පත් විය. මෙම සුවිශේෂී වර්ධනය හේතුවෙන්, ධනාත්මක වෙනසක් සනිටුහන් කිරීමක් මෙන්ම ස්ථිර පසුබිමක් සහිතව ආරම්භ කළ 2023 මූල්‍ය වර්ෂය ධනාත්මක විය. රුසියාව-යුක්රේනය අතර ගැටුම් සහ චීනයේ සීමා කරන ලද සංචරණ ප්‍රතිපත්ති හි අනපේක්ෂිත තත්ත්වය මඟින් අතිරේක අවදානමක් ඇති කරන ලදී.

ගුවන්සේවා කර්මාන්තය නවෝත්පාදනය අතින් ප්‍රමුඛ ස්ථානයක් දරන බැවින්, වර්තමානයේ ගමනාගමනයේ ආරක්ෂිතම මෙන්ම වඩාත් විශ්වසනීය මාධ්‍ය ලෙස පිළිගෙන ඇත. ගුවන් සේවය මඟින් විවිධ රටවල් සහ නගර අතර සංචලන වේගවත්ව සිදු කරන්නා සේම සංචාරයේ කාර්යක්ෂමතාවය වැඩි කරනු ලබයි. එබැවින් එහි ප්‍රතිඵලයක් වශයෙන් දිනකට ගෝලීයව වාණිජ ගුවන්යානා 100,000කට අධික ප්‍රමාණයක් පියාසර කරනු ලබන අතර, පැයකට කාලසටහන් ගත වාණිජ ගුවන්යානා 400 ක් පියාසර කරනු ලබයි. ලොව දළ දේශීය නිෂ්පාදනයෙන් (GDP) 4.2% ක් ලෙස වගකියන අතර ලොව වටා මිලියන 65 ක් පමණ රැකියා උත්පාදනය කරමින් ගුවන්සේවය ලෝක ආර්ථිකයේ සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත (මූලාශ්‍රය: ICAO)

උපායමාර්ගික පිහිටීම සහ දකුණු ආසියාවෙහි මූලික ප්‍රවේශයක් ලෙස ශ්‍රී ලංකාව පිහිටා තිබීම වැදගත් වේ. 2022 වර්ෂය ඉතා අභියෝගාත්මක සහ අස්ථාවර වර්ෂයක් විය, මෙම වර්ෂය තුළදී අනපේක්ෂිත ආර්ථික සහ සමාජීය අර්බුදයන්ට ශ්‍රී ලංකාව මුහුණපාන ලදී. එනම් බලශක්තිය හිඟවීම සහ මහජනතාවගේ නොසන්සුන්භාවය දේශීය ආර්ථිකය සහ ගුවන් සේවා අංශය සඳහා අයහපත් ලෙස බලපාන ලදී. 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය 9.2% කින් පසුබෑමකට ලක් වෙමින්, ඍණාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, දෙසැම්බර් මස අවසානය වන විට උද්ධමන අනුපාතිකය 59% ක් ලෙස වාර්තා විය. ආර්ථිකය පසුබෑමකට ලක් වූවද, 2022 වර්ෂයේ 4වන කාර්තුවේදී කාර්යසාධන නැඹුරුව හේතු කොට සමාලෝචිත වර්ෂයේදී ජාත්‍යන්තර සංචාරක පැමිණීම් 700,000 ඉක්මවන ලදී.

1.1 ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) දිගුකාලීන ගුවන් ගමන් පුරෝකථනය උදෙසා කොවිඩ්-19 හි බලපෑම

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ ලේකම් අංශය, දිගුකාලීන ගමනාගමන පුරෝකථන (MDWG-LTF) පිළිබඳ බහු විනය ක්‍රියාකාරී කණ්ඩායම් සමඟ කටයුතු කළ අතර, 2018 සිට 2050 දක්වා මාර්ග කණ්ඩායම් අනුව පශ්චාත් කොවිඩ්-19 පුරෝකථන මාලාවක් සකස් කරන ලදී. මෙම පුරෝකථනයන් මගී සහ භාණ්ඩ ප්‍රවාහන සඳහා සංවර්ධනය කර ඇති අතර, මධ්‍යම, ඉහළ සහ පහළ යන අවස්ථා තුන යටතේ සිදු කරනු ලබයි.

කොවිඩ්-19 වසංගත තත්ත්වයේ කෙටි කාලීන බලපෑම සහ අවසාන දිගු කාලීන ප්‍රතිසාධන යන අංශ දෙකම ගණනය කරනු ලබන දිගු කාලීන පුරෝකථන (LTF) පිළිබඳ මගීන් දැනුවත් කිරීම කොවිඩ්-19 පුරෝකථනයේ මූලික පරමාර්ථය විය. මේ සඳහා යාවත්කාලීන කළ සාර්ව ආර්ථික දත්ත සහ ගුවන්සේවා කර්මාන්තයේ ඉල්ලුමේ වෙනස්කම් (කිලෝමීටරයකට මගී ආදායම (RPK) හි වෙනස්කම් වලින් ගණනය කරනු ලබයි) පිළිබඳ මෑතකාලීන තක්සේරුවන් අවශ්‍ය වේ.

මගී පුරෝකථන සිදු කරනු ලබන ආකාරයට සමාන අයුරින් ගුවන් භාණ්ඩ LTF නැවත ඇස්තමේන්තු කරන ලදී. මේ සඳහා යාවත්කාලීන කරන ලද ආර්ථික පුරෝකථන සමඟ 2018 වර්ෂයේ ICAO LTF මාදිලි, 2020 ආර්ථික පසුබෑමට ලක්වීමේ ප්‍රමාණය සහ MDWG-LTF හි ආදානය මඟින් මඟ පෙන්වනු ලබන මෑතකාලීන ප්‍රතිසාධන සහ කර්මාන්තයෙන් ලද තොරතුරු යොදා ගන්නා ලදී.

මෙම අවිනිශ්චිත කාලයන් හමුවේ, ලේකම් සහ MDWG-LTF විසින් පශ්චාත් කොවිඩ් පුරෝකථන සිදුවීම් සංවර්ධනය කිරීම මෙන්ම, ගුවන්සේවා දත්ත සහ විශ්ලේෂණ කම්ටුව (ADAP) විසින් නිසි ලෙස අනුමැතිය ලබා දෙන අතර, ඉන් රජයේ, ගුවන්සේවයේහි, ගුවන්තොටුපළෙහි, ගුවන් සන්තරණ සේවා ප්‍රතිපාදක (ANSP) සහ සෙසු පාර්ශවකරුවන්ගේ සැලසුම්කරණ අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම අපේක්ෂා කරනු ලබයි.

1.1.1 ආසියානු පැසිෆික් ගුවන්තොටුපළ ගමන් මාර්ග යථා තත්ත්වයට පත් වීම පිළිබඳ 2023 වර්ෂය සඳහා පුරෝකථනය

ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලයට (ACI) අනුව, 2023 වසර වන විට බිලියන 3.4 ක පමණ වූ 2019 වසරේ පූර්ව කොවිඩ් තත්ත්වයේ පැවති මගී සංඛ්‍යාව වෙත ආසියා පැසිෆික් ගුවන් කළාපය ළඟා වනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. ඉදිරි වසර 20 තුළදී සියලු ගෝලීය කළාප අතරින් ආසියානු පැසිෆික් සහ මැදපෙරදිග ගුවන් කළාප සීඝ්‍රයෙන් වර්ධනය වන බවට ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය, ලෝක ගුවන්ගමන් පුරෝකථනය කොට ඇත. 2040 වර්ෂය වන විට සමස්ත මගී ගමනාගමන මැදපෙරදිග ගුවන් කළාපයේ +5.2% කින් සහ ආසියානු පැසිෆික් ගුවන් කළාපයේ +4.7% කින් සංයුක්ත වර්ධන අනුපාතයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කරනු ලබයි. 2020 වර්ෂයේදී තහවුරු කළ යුතු සංඛ්‍යාලේඛන අනුව ආසියානු පැසිෆික් ගුවන් කළාපය -58% කින් සහ මැදපෙරදිග ගුවන් කළාපය -72% කින් පහත බසිනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. 2024 වන විට මැදපෙරදිග ගුවන් කලාපය කොවිඩ් වසංගත තත්ත්වයට පෙර පැවති තත්වයට ළඟා වනු ඇතැයි බලාපොරොත්තු වේ. ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලයේ ආසියානු පැසිෆික් හි අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වන ස්ටෙෆානෝ බාරොන්සි විසින් පවසන ලද්දේ, "මෙම පුරෝකථනය සිදු කරන ලද්දේ 2021 වර්ෂයේදී කාර්යක්ෂව එන්නත් බෙදා හරිනු ඇතැයි සහ 2022 වර්ෂය වන විට විශාල ජන සංඛ්‍යාවක් වෙත එන්නත්කරණය සිදු කරනු ඇතැයි යන උපකල්පනය මත බවයි. සීමිත එන්නත්කරණ සැපයුම් සහ මන්දගාමී බෙදාහැරීම්, දිගුකාලීන ආර්ථික පසුබෑමක් සමඟ ඒකාබද්ධව 2024 වන විට සමස්ත කළාපයම යථා තත්ත්වයට පත් වීම මන්දගාමී කරනු ලැබුණි." 2019 සිට 2040 දක්වා සංයුක්ත වර්ධන වේගයකින් මිලියන 50කට වඩා වැඩි මගීන් සංඛ්‍යාවක් හසුරුවන වේගයෙන් වර්ධනය වන රටවල් දහය අතර මැද පෙරදිග පිහිටි සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඉරානය සහ ආසියානු පැසිෆික් කළාපයේ පිහිටි ඉන්දුනීසියාව, ඉන්දියාව, වියට්නාමය, පිලිපීනය සහ චීනය යන රටවල් වේ. ගුවන්සේවා කර්මාන්තය, අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව සැපයීම සඳහා සහ ගෝලීය එන්නත් බෙදා හැරීමේ කර්තව්‍ය සඳහා සහය වීමට, ප්‍රතිශක්තිකරණ නිර්දේශ සහ ජාතික එන්නත් සැලසුම් පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපායමාර්ගික උපදේශක කණ්ඩායමේහි කොටසක් ලෙස සියලුම ගුවන්සේවා සේවකයින් සහ ගුවන්තොටුපළ කාර්යමණ්ඩලය අත්‍යවශ්‍ය සේවකයින් ලෙස ඇතුළත් කරගන්නා ලෙස ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය - ආසියානු පැසිෆික් විසින් පවසා සිටිනු ලබයි.

1.2 2024 වර්ෂය සහ ඉන් ඉදිරියට වර්ධනය විය යුතු ගෝලීය ගුවන් මඟී සංඛ්‍යාව

2024 වර්ෂය වන විට පූර්ව කොවිඩ්-19 මට්ටම අභිබවා යමින් (2019 වර්ෂයේ සමස්තයෙන් 103%) සමස්ත සංචාරකයින් සංඛ්‍යාව බිලියන 4ක් කරා ළඟා වනු ඇතැයි ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් අපේක්ෂා කරනු ලබයි (එක් මඟියෙක් ලෙස විවිධ අංශයන් ගණනය කරමින් සංචාර සම්බන්ධ කරමින්).

මෙය 2021 නොවැම්බර් සමඟ සසඳන කළ, බොහෝ වෙළඳපළයන්හි ලිහිල් කිරීම් වැඩි වශයෙන් සිදුවීම හෝ සංචරණ සීමා ඉවත් කිරීම, ජාත්‍යන්තර ප්‍රතිසාධනයන්ගේ මෑත කාලීන ශුභවාදී සිදුවීමකි. 2021 වර්ෂයේදී දේශීය සංචාරකයින් ප්‍රමාණය 2019 වර්ෂයේ පැවති මට්ටමින් 61% කි. මෙය 2022 වර්ෂයේදී 93%, 2023 වර්ෂයේදී 103%, 2024 වර්ෂයේදී 111% කින් සහ 2025 වර්ෂයේදී 118% කින් වර්ධනය වීම අපේක්ෂා කරනු ලබයි.

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය විසින් සිදු කරන ලද පුරෝකථනය අනුව, 2040 වර්ෂය අවසානය වන විට, ගෝලීය ගුවන් මඟී සංඛ්‍යාව රූපසටහන 01 හි දක්වා ඇති ආකාරයට බිලියන 8 ක් වනු ඇත. ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ සංඛ්‍යා ලේඛන අනුව, 2025 වර්ෂය වන විට ආසියානු පැසිෆික් කලාපය එහි සාමාන්‍ය දර්ශකය වෙත ළඟා වනු ඇත (2019=100). එමෙන්ම රූපසටහන 02 හි දක්වා ඇති ආකාරයට 2040 වර්ෂය වන විට එය ඉහළම අගයන් කරා ළඟා වනු ඇත.

රූපසටහන 01 - ගෝලීය ගුවන් මඟීන්, අතීත සහ ඉදිරි පුරෝකථන, බිලියන



රූපසටහන 02 - සමස්ත කලාපීය ගුවන් මඟී දර්ශකය 2019=100



(මූලාශ්‍රය: ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය, සංචාරක ආර්ථික ගුවන් මඟී පුරෝකථනය)

1.3 2022 වර්ෂය තුළ අභියෝගාත්මක අවස්ථාවන් හැසිරවීම උදෙසා කළමනාකරණය විසින් යොදාගත් උපක්‍රම

කෝවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2022 වර්ෂය ගු.ගු.සේ.ස. වෙත අභියෝගාත්මක වර්ෂයක් වූ අතර වීම තත්ත්වය කිසිදු වෙනසක් නොමැතිව ගෝලීය වශයෙන් ද මුහුණ දෙන ලද්දකි. විවිධ හේතු කරණ කොට ලොව වටා ගුවන්සේවා කර්මාන්තයට කොවිඩ්-19 උවදුරේ බලපෑම් ඇති විය. ගුවන් තොටුපළවල් හුදකලා කරමින් කලාපයන් වසා දැමීම හේතුවෙන් ගුවන් ගමන් බොහෝමයක් අවලංගු කරන ලදී. ඉක්මනින් වැළඳිය හැකි බැවින් මෙන්ම ඉතා දැඩි සෞඛ්‍ය රෙගුලාසි සහ අතිරේක සටහන් හේතුවෙන් ලොව වටා සංචාරකයින් විසින් සිදු කරනු ලබන අත්‍යවශ්‍ය ගුවන් ගමන් පමණක් සිදුවන අතර බොහෝමයක් අපහසුතා මධ්‍යයේ සිදු කරන ලදී. ඒ හා සමගාමීව විවිධ අභියෝග රැසකට මුහුණ දීමටත් ඒවා හසුරුවාලීමට විවිධ ක්‍රමවේද යොදා ගැනීමටත් ගු.ගු.සේ.ස. හට සිදු විය.

1.3.1 පීසීආර් උපකරණ එකතුව, සෞඛ්‍ය නහවුරු කරනු ලබන ක්‍රියාවලිය, නිරෝධායන පහසුකම් සැලසීම, හුදකලා කිරීම සහ ආසාදිත මඟීන් රෝහල්ගත කිරීම ආදිය සිදු කරන ලදී.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද නිරන්තරයෙන් වෙනස්වීමට ලක්වන සෞඛ්‍ය මාර්ගෝපදේශයන් හේතුවෙන් ඇති වනු ලබන නව අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීමට විවිධ අවස්ථාවලදී ගු.ගු.සේ.ස. හට අවකාශය, කාර්යමණ්ඩල පහසුකම් සැලසීමට සහ විවිධ උපායමාර්ග හඳුනාගැනීම මෙන්ම ක්‍රියාවලීන් යොදා ගැනීමට සිදු විය. සමාගමට අතිරික්ත පිරිවැයක් ඇති නොවන පරිදි එවැනි අවශ්‍යතා සපුරාලීමට පවත්නා පහසුකම් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමට මෙන්ම, බ.ජා.ගු. හි මඟී අත්දැකීමට අවම බලපෑමක් ඇති වන පරිදි මඟී ප්‍රවාහනය සහ ක්‍රියාපටිපාටි වෙත අඛණ්ඩ වෙනස්කම් සිදු කිරීමට ගු.ගු.සේ.ස. හට සිදු විය.

1.3.2 කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් ශ්‍රම බලකාය ආරක්ෂා කිරීම

කොවිඩ්-19 වෛරසය පැතිරීමේ තත්ත්වය සේවයට පැමිණෙනු ලබන කාර්යමණ්ඩලය වෙත ඇති කරන බලපෑම අවම අන්දමින් පවත්වා ගැනීමට දෛනික රාජකාරී/සේවාමුර ලබන කාර්යමණ්ඩලය සඳහා අවම ශ්‍රම බලකායක් පවත්වා ගැනීම විශාල අභියෝගාත්මක තත්ත්වයක් විය. එබැවින්

ගු.ගු.සේ.ස. විසින් එය සාක්ෂාත් කර ගැනීම උදෙසා දැඩි ප්‍රයත්නයන් සහ විවිධ වූ උපායමාර්ගයන් සිදු කරන ලදී. සේවාමුර /වැඩ වාර පදනම් කරගනිමින් කාර්යමණ්ඩලය කණ්ඩනය කරන ලද අතර, සමාගමේ ප්‍රවාහනය ඔස්සේ පමණක් සේවයට වර්තා කිරීම, පදිංචිය පදනම් කරගත් පෙළව ආරක්ෂිත බුබුලු සකස් කිරීම, සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කිරීම මෙන්ම අනාවරණය වීම අවම කිරීමට අත්‍යාවශ්‍ය සේවා කටයුතු සඳහා වෙන් වූ ශ්‍රම බලකායක් යොදා ගන්නා ලදී.

1.4 පරියන්තය 2 - අභියෝගාත්මක ඉදිරි ගමන් මග

'A' පැකේජය - මගී පර්යන්ත ගොඩනැඟිල්ල සහ ආශ්‍රිත කටයුතු

බ.ජා.ගු. හි දෙවන පර්යන්ත ව්‍යාපෘතිය, නවීන ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස ගුවන්තොටුපළ තත්ත්වය උසස් කිරීමට නිර්මාණය කරන ලද ආකර්ෂණීය සහ නවෝත්පාදන සංවර්ධන කටයුත්තකි. එහි නවීන සැලසුම, දියුණු පහසුකම් සහ උපායමාර්ගික පිහිටුම සමඟින් නව පර්යන්තය ඉදිරියේ දී සංචාරය සහ ව්‍යාපාර කටයුතු සඳහා කලාපයේ වැදගත් කේන්ද්‍ර ස්ථානයක් ලෙස කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකාව, එහි පුරවැසියන් සහ සංචාරකයින් වෙනුවෙන් ඉතා උසස් තත්ත්වයේ යටිතල පහසුකම් සහ සැපපහසුව සලසන බැව් මෙම නවීන පර්යන්තය මඟින් තහවුරු කරනු ලබයි. උසස් මගී පිරිස්සුම් උපාංග සහ අධිවේගී වයි-ෆයි සබඳතා, තීරු බදු රහිත සාප්පු සවාරි, අවන්හල්, විවේකාගාර සහ වෙනත් සේවා ඇතුළත් සංචාරකයින් සඳහා විවිධාකාරයේ සැපපහසුකම් වලින් පිරි මෙම පර්යන්තය නව සුරක්ෂිතතාවය සහ සන්නිවේදන පද්ධති වලින් සමන්විත වේ.

නවීන සහ ආකර්ෂණීය සැලසුම දෙවන පර්යන්තයේ වඩාත් සිත්ගන්නා අංගයකි. කාර්යක්ෂමතාව, සුවපහසුව සහ සෞන්දර්යාත්මක බව කෙරෙහි අවධානය යොමු කරමින් පර්යන්තය සැලසුම් කර ඇති අතර කලාපයේ සෙසු ගුවන්තොටුපළවල් අතරින් අද්විතීය බවක් එක් කරනු ලබන විශේෂාංග රාශියකින් සමන්විත වේ. පර්යන්තයේ අගනා විදුරු බිත්ති ඔස්සේ ධාවන පථය සහ අවට වටපිටාව ඉතා අලංකාරව දිස් වන අතර එහි අභ්‍යන්තරය ඉඩකඩ සහ වාතාශ්‍රය සහිත බැවින් විවෘතභාවයක් මෙන්ම නිදහසක් ඊට එක් කරනු ලබයි.

ඇතැම් විට වඩාත් වැදගත් ලෙස, දෙවන පර්යන්තයේ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාවට එහි ආර්ථිකය සහ සංචාරක කර්මාන්තය නඟා සිටුවීමේ ප්‍රයත්නයන් වෙනුවෙන් වැදගත් නව පියවරක් වනු ඇත. නව පර්යන්තය ඔස්සේ ජාත්‍යන්තර ගුවන් ගමන් සහ සංචාරකයින් රට වෙත ආකර්ෂණය කරගැනීමට අපේක්ෂා කරනු ලබන අතර, එමඟින් නව රැකියා උත්පාදනය, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සහ ගෝලීය මට්ටමෙන් ශ්‍රී ලංකාව නියෝජනය වර්ධනය කරනු ඇත. සමස්තයක් ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ හි දෙවන පර්යන්තය යනු, ශ්‍රී ලංකාව සහ එහි පුරවැසියන් වෙත විශාල ලෙස අවස්ථාවන් ඇති කරවනු ලබන ධනාත්මක සංවර්ධනයකි.

බ.ජා.ගු. සංවර්ධන ව්‍යාපෘතිය අවධිය II අදියර 2 හි පැකේජය 'A' මගී පර්යන්තයේ ගොඩනැඟිල්ල සහ ආශ්‍රිත කටයුතු කොන්ත්‍රාත්තුව, 2020 මාර්තු මාසයේදී තයිසෙයි කෝපරේෂන් වෙත ලබා දුන් අතර, ඉදි කිරීම් කටයුතු 2020 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. ඉදිකිරීම් කටයුතු ආරම්භයේ පටන්, ප්‍රධාන පර්යන්ත ගොඩනැඟිල්ලෙහි උප සැලසුම් කටයුතු, පියර් 2 සහ පියර් 3 වැනි මගී පාලම ඉදිකිරීම, මගී පාලම් ආවරණ, බිම් තළාඳ සහ උපයෝගීතා උමං මාර්ගය හි ඇතැම් කොටස් 2022 වර්ෂයේදී ද සිදු කෙරිණි. ඊට අමතව ප්‍රධාන පර්යන්ත ගොඩනැඟිල්ල හි මතුපිට ගොඩනැඟිලි කුළුණු සහ කොන්ක්‍රීට් පුවරු කිහිපයක් 2022 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී. තවද, පෙනෙරේටර්, ධාවක, වානේ වලින් සකස් කරන ලද වහල සැකසුම, වහළට අවශ්‍ය ද්‍රව්‍ය, ජල ආරක්ෂණ ද්‍රව්‍ය ආදී විදේශීය ප්‍රසම්පාදනයන්, 2022 වර්ෂයේදී සිදු විය. තෙල් හිඟය ඇතුළු රට තුළ පැවති අස්ථාවර ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ඒවා නිෂ්පාදන කටයුතු ද සිදු විය. එමෙන්ම ගු.ගු.සේ.ස විසින් කොන්ත්‍රාත්තරුවන් හට අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම සඳහා පහසුකම් සපයන ලදී.

කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරය විසින් 2022 අප්‍රේල් 12 දින නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවා සැපයීම සම්බන්ධ අතුරු ප්‍රතිපත්තිය සහ පසුව ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය මඟින් ණය ලබා දීම තාවකාලිකව නවතාලීම හේතුවෙන්, 2022 ජූලි මාසයේදී පැකේජය 'A' හි කටයුතු කොන්ත්‍රාත්කරු විසින් අත්හිටුවන ලද අතර, 2022 ජූලි 25 දින පැකේජය 'A' හි අවසන් කිරීමේ නිවේදනය එහි කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරනු ලැබුණි.

තාවකාලික අත්හිටුවීමේ කාල සීමාව තුළදී, ව්‍යාපෘති භූමියෙහි ආරක්ෂාව සහ පාරිසරික සලකාබැලීම් සිදු කරන ලද අතර, 2023 වර්ෂය අවසානයට පෙර ආරම්භ කිරීමට අපේක්ෂිත ණය විසඳුම් නිර්දේශ කළ පසු ඉතිරි කටයුතු ආරම්භ කරන තෙක්, ඉදිකිරීම් අසම්පූර්ණ සැකසුම්වල වානේ දිරාපත්වීම වැලැක්වීම සඳහා ප්‍රධාන පර්යන්ත ගොඩනැඟිල්ල, පියර් 2 සහ පියර් 3 හි සැලකිය යුතු ආරක්ෂිත කටයුතු සිදු කිරීමට විධිවිධාන පිළියෙල කරන ලදී.

2) ගු.ගු.සේ.ස. හි - ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPIs) ශක්තිමත් කිරීම සහ ත්‍රිත්ව පාදක රේඛාව (TBL) වර්ධනය කිරීම

2.1 2022 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යසාධන දර්ශකය වෙත ඇති වූ බලපෑම

සාර්ව මට්ටමින් ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPIs) ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාවේ භූගෝලීය වපසරිය තුළ ගුවන්තොටුපළ සේවා සැලසීමේ සහ කොළඹ ගුවන් ගමන් කලාපය තුළ ගුවන් සංතරණ සේවා සැපයීමේ වගකීම් ගු.ගු.සේ.ස. විසින් දරනු ලබයි. දෙවන පරිච්ඡේදයේ තොරතුරු අනුව, ගු.ගු.සේ.ස. යටතේ ගුවන්තොටුපළවල් පහක් ක්‍රියාත්මක කරනු ලබන අතර ගු.ගු.සේ.ස. ව්‍යවස්ථානුකූල සේවා සැපයුම්කරු ලෙස කටයුතු කරනු ලබයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු.), කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන (කො.ජා.ගු.ර.), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.රා.ජා.ගු.), මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.ජා.ගු.), යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (යා.ජා.ගු.) යන ගුවන්තොටුපළවල් වේ. මෙම ගුවන්තොටුපළවල් 5 අතරින්, (ඇමුණුම 14 හි ගුවන්තොටුපළ අවශ්‍යතාවයන් සාර්ථක කිරීම හේතුවෙන්) බ.ජා.ගු. සහ ම.රා.ජා.ගු. ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් ලෙස ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් ප්‍රකාශයට පත් කොට ඇත. සෙසු ගුවන්තොටුපලවල් තුන එනම් කො.ජා.ගු.ර., ම.ජා.ගු., සහ යා.ජා.ගු. 2019 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය (GoSL) මඟින් ගැසට් නිවේදනයක් නිකුත් කරමින් ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් ලෙස නම් කරන ලදී.



බ.ජා.ගු.

වර්තමානය වන විට ගුවන්සේවා කර්මාන්තයේ සංචරණ සහ සංචාරක වර්ධනය අපි කෙමෙන් කෙමෙන් අත්විඳින බැවින්, ජාත්‍යන්තර මගී සංචලන 5,490,973 ක්, ජාත්‍යන්තර ගුවන් යානා සංචලන 37,363 ක් සහ භාණ්ඩ සංචලන මෙ.ටොන් 173,595 ක් හැසිරවීමට බ.ජා.ගු. වෙත හැකි විය.

සංඛ්‍යාලේඛන අනුව, ජාත්‍යන්තර මගී සංචලන සහ ජාත්‍යන්තර ගුවන්යානා සංචලන පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් 273% සහ 81%කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. කෙසේ වෙතත් 2021 වසරට සාපේක්ෂව භාණ්ඩ සංචලනයන් හි 13%ක සුළු අඩු වීමක් පෙන්නුම් කරයි.



ම.රා.ජා.ගු.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (ම.රා.ජා.ගු) විසින් එහි 10 වැනි සංවත්සරය 2023 මාර්තු 18 දින සමරන ලද අතර, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙත විකල්ප ගුවන්තොටුපළ ලෙස සහ ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ ලෙස දිවයිනේ දක්ෂිණ සහ නැගෙනහිර පළාතට ම.රා.ජා.ගු සේවය සපයනු ලබයි.

වර්ෂය තුළදී ම.රා.ජා.ගු. හි ජාත්‍යන්තර මගී සංචලන 11,547ක්, ජාත්‍යන්තර ගුවන්යානා සංචලන 216 ක් සහ භාණ්ඩ ප්‍රවාහන සංචලන මෙට්‍රික් ටොන් 2 ක් හසුරුවන ලදී. කෙසේ වෙතත්, පෙර වසර සමඟ සසඳන කළ ජාත්‍යන්තර මගී සංචලන, ගුවන්යානා සංචලන සහ භාණ්ඩ ප්‍රවාහන සංචලන පිළිවෙලින් 65%, 63% සහ 96% ක් ලෙස පසුගිය වසරට සාපේක්ෂව අඩු විය.



කො.ජා.ගු.ර.

1935 වසර පටන් කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, රත්මලාන (කො.ජා.ගු.ර.) කොළඹ දකුණ හි පිහිටා ඇත. එබැවින් සියලුම ජාත්‍යන්තර සහ දේශීය මගීන් හට නවීන පහසුකම්වලින් සමන්විත මෙම වෛතිහාසික ගුවන්තොටුපළ වෙතින් පිරිනමනු ලබන අව්‍යාජ ආගන්තුක සත්කාරය අත්විඳිය හැකිය.

ජාත්‍යන්තර ව්‍යාපාරික පෙට් යානාවලට වෙළඳපොළ අවකාශයක් ලෙස කො.ජා.ගු.ර. කටයුතු කරනු ලබයි. දේශීය ගුවන්සේවා ප්‍රවර්ධනය කරනු ලබන රටේ මූලික අභ්‍යන්තර ගුවන්තොටුපළක් ලෙස කටයුතු කරමින්, කො.ජා.ගු.ර. විසින් සියලුම ආකාරයේ ගුවන් ගමන් පුහුණු කිරීම් සඳහා පහසුකම් සලසයි.

වාර්තා කරන ලද වර්ෂය තුළදී කොජාගුරව විසින් අභ්‍යන්තර මගී සංචලන 2,482 ක් සහ අභ්‍යන්තර ගුවන් ගමන් සංචලන 16,883 ක් සිදු කරන ලදී. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළදී කොජාගුරව සහ යාජාගු ගුවන්තොටුපළවල් ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් ලෙස සහතික කරන ලද අතර, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් ගුවන්තොටුපළ සහතිකය ලබා ගන්නා ලදී. එමෙන්ම ගු.ගු.සේ.ස. විෂයපථය යටතේ බිම් හැසිරවීම් සේවා අංශය පිහිටුවාලන ලදී. කොජාගුරව සහ යාජාගු හි බිම් හැසිරවීම් පිළිබඳ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සහතිකය සඳහා නිර්දේශිත බිම් හැසිරවීම් පිළිබඳ පාඨමාලා සියල්ල ලබා දෙමින් ගු.ගු.සේ.ස සේවකයින් 30 දෙනෙකු සමාන්තරව පුහුණු කරන ලදී.

යාජාගු.

2021 මූල්‍ය වර්ෂයේ වාර්තා කරන ලද ශූන්‍ය ජාත්‍යන්තර සංචලන වලට සාපේක්ෂව, 2022 මූල්‍ය වර්ෂය තුළදී යාජාගු. ජාත්‍යන්තර මගී සංචලන 594 සහ ජාත්‍යන්තර ගුවන් ගමන් සංචලන 24ක් වාර්තා කොට ඇත. සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී යාජාගු. ගුවන්තොටුපළ සහතිකය නැවත අලුත් කරන ලදී.





ම.ජා.ගු.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළට ආසන්නව මඩකලපුව නගරයට ගිනිකොන දෙසින් කිලෝ මීටර් 2.4 ක් දුරින් මඩකලපුව ගුවන්තොටුපළ භූ උපායමාර්ගික ප්‍රදේශයක පිහිටා ඇත.

2022 මූල්‍ය වර්ෂය තුළදී ම.ජා.ගු. අභ්‍යන්තර මගී සංචලන 1,321ක් සහ අභ්‍යන්තර ගුවන් ගමන් සංචලන 334 ක් වාර්තා කොට ඇත. ඒ අනුව, පසුගිය වසරට සාපේක්ෂව මගී සංචලන සහ ගුවන් ගමන් සංචලන පිළිවෙලින් 22% කින් සහ 29% කින් වර්ධනය වී ඇත.

ගු.ගු.සේ.ස. සියලුම ගුවන්තොටුපළවල්හි ගුවන ගමන් සංචලන, මගී සංචලන සහ භාණ්ඩ සංචලන අංශයන්හි ප්‍රධාන කාර්යසාධන දර්ශක ඉදිරියටම ගමන් ගන්නා බව සහතික කිරීම සහ පවතින ඉදිරි ධනාත්මක අපේක්ෂාවන් සීඝ්‍රයෙන් ප්‍රතිසාධනය කරගන්නා බව සහතික කරයි.

ගු.ගු.සේ.ස. හි ත්‍රිත්ව පාදක රේඛාව ශක්තිමත් කරනු ලබන මෙහෙයුම් ප්‍රධාන කාර්යසාධන දර්ශකය වනුයේ,
අ) ගුවන් ගමන් සංචලන
ආ) මගී සංචලන
ඇ) භාණ්ඩ සංචලන

ඉහත ප්‍රධාන කාරයසාධන දර්ශක වල ඉක්මන් ප්‍රතිසාධනය සහ ස්ථාවර වැඩි දියුණු කිරීම් සහතික කිරීම සඳහා 2022 වසර පුරා සිදු වූ වැදගත් සිදුවීම් මාලාව පහත සරංශගත කර ඇත.

අ) ගුවන් ගමන් සංචලන ඔස්සේ ත්‍රිත්ව පාදක රේඛාව ශක්තිමත් කිරීම

රට තුළ වූ නොයෙක් අහිතකර සිදුවීම් සහ දුර්වල ආර්ථික පසුබිම හමුවේ වූවද, රට තුළ සහ ගෝලීයව ඇති වූ ධනාත්මක වතාවරණය හේතුකොට, ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් ආරම්භ කරන ලද ගුවන් යානා මෙන්ම ඔවුන්ගේ ගුවන් ගමන් ආරම්භ කරන ලද ගුවන් සමාගම් කිහිපයක් දැක ගත හැකිය.

2022 වර්ෂයේදී රුසියාවේ විශාලතම ගුවන් සේවා අතරින් එකක් වන **රෙඩ් විංග් එයාර්ලයින්ස්** විසින් රුසියාවේ මොස්කව් සිට ම.රා.ජා.ගු. වෙත රුසියානු සංචාරකයින් 389 ක් සමඟින් ශ්‍රී ලංකාව වෙත කාල සටහන්ගත වරලත් ගුවන් ගමන් ආරම්භ කරන ලදී. ගුවන් සේවය විසින් බොයිං 777-200 ඔස්සේ සතියකට පියාසැරි දෙකක් මෙහෙයවන ලදී. මෙම ගමන් පථ සංවර්ධනය ඔස්සේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, විශේෂයෙන් පශ්චාත් කොවිඩ් වසංගත කාලපරිච්ඡේදය ශක්තිමත් කරනු ඇත. රුසියාව, ශ්‍රී ලංකාව වෙත සංචාරකයින්

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය



රෙඩ් වින්ග්ස් එයාර්ලයින්ස් විසින් ම.රා.ජා.ගු වෙත කාලසටහන්ගත ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කිරීම



එලායන්ස් එයාර් විසින් යා.ජා.ගු හි ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම





ඊඩිල්වයිස්/සුවිස් ජාත්‍යන්තර ගුවන් සමාගම විසින් බ.ජා.ගු වෙත සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම

ආකර්ෂණය කරනු ලබන මහත් විශ්වසනීය සහ හිතෛෂී ගමනාන්තයක් ලෙස කටයුතු කර ඇත. එමෙන්ම දශක ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ ගමනාගමන සහ සංචාරක සංවර්ධනයන් සඳහා වැදගත් මූලාශ්‍රයක් ලෙස එහි විභවතාවයන් පෙන්නුම් කර ඇත.

එලායන්ස් එයාර් ඒඅයි ඇසෙට්ස් හෝල්ඩින්ස් ලිමිටඩ් (AIAHL) හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන එලායන්ස් එයාර් විසින් 2022 දෙසැම්බර් මස චෙන්නායි ජාත්‍යන්තර ගුවන්තොටුපළ සිට යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා වාණිජ ගුවන් මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී. රටේ උතුරු ප්‍රදේශයේ ගුවන් සංචරණ සඳහා වර්ධනය වන ඉල්ලුම සලකා බලමින්, ශ්‍රී ලංකා සහ ඉන්දියානු රජයේ සහයෝගය ඇතිව අසල්වැසි රටවල් සම්බන්ධ කිරීමේ අරමුණින් සහ දකුණු ඉන්දියානු සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ සියලු පිරිස වෙත හිතකර සබඳතාවක් ඇති කරමින් සතියට දින හතරක් සෘජු පියාසැරි ආරම්භ කිරීමට තීරණය කොට ඇත.

ලුෆ්තාන්සා සමූහයේ සාමාජිකයෙකු වන **ඊඩිල්වයිස්/සුවිස් ඉන්ටනැෂනල් එයාර්ලයින්ස්** විසින් 2022 නොවැම්බර් මස පටන්, ස්විට්සර්ලන්තය සිට ශ්‍රී ලංකාව වෙත අඛණ්ඩ සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කරන ලදී. සමාරම්භක ගුවන් ගමන සූරිච් සිට කොළඹ වෙත සිදු කරන ලදී. යුනයිටඩ් වෙන්චර්ස් සමූහය, ශ්‍රී ලංකාවේ ලුෆ්තාන්සා සමූහය වෙත සාමාන්‍ය විකුණුම් නියෝජිතයා (GSA) විසින් සෑම බ්‍රහස්පතින්දා දිනකම කොළඹ දක්වා සතිපතා සේවය සිදු කරනු ලබයි. සුවිස් ඉන්ටනැෂනල් එයාර්ලයින්ස්හි ආරම්භයත් සමග ශ්‍රී ලංකාව වෙත සංචාරක පැමිණීම වර්ධනය වන අතර, ශ්‍රී ලංකාව සහ ස්විට්සර්ලන්තය අතර වෙළඳ, මූල්‍ය, අධ්‍යාපනය සහ සංස්කෘතිය යන ක්ෂේත්‍රයන් හි ආර්ථික සහයෝගයන් ශක්තිමත් කරනු ඇත.

එයාර් ෆාරාන්ස් විසින් සතිපතා ගුවන් ගමන් තුනක් සමඟින් 2022 නොවැම්බර් මස කොළඹ සහ ප්‍රංශය අතර මෙහෙයුම් නැවත ආරම්භ කරන ලදී. මෙම ගමන් පථයේ එයාර් ෆාරාන්ස් මෙහෙයුම් සෘතුමය වශයෙන් සිදු වේ. ගනුදෙනුකරුවන් හට කොළඹ සිට තවදුරටත් පැරිස්, චාර්ල්ස් දි ගෝල් හි මධ්‍යස්ථාන හරහා ගමනාන්ත 170 ක් ඇතුළත් එයාර් ෆාරාන්ස් හි ගෝලීය ජාලය වෙත සම්බන්ධ විය හැකිය.

රුසියාවේ විශාලතම වරලත් ගුවන්සේවය වන **අසූර් එයාර්** විසින් 2022 නොවැම්බර් මස බ.ජා.ගු. වෙත ගුවන් ගමන් නැවත ආරම්භ කරන ලදී.

එරෝෆ්ලොට් එයාර්ලයින්ස් විසින් මොස්කව් සිට කොළඹ දක්වා එහි ගුවන් ගමන් මෙහෙයුම් සඳහා සතියකට ගුවන් ගමන් වාර 2ක් නිර්දේශය කර ඇත. 2022 නොවැම්බර් සිට 2023 මාර්තු දක්වා සතියකට ගුවන් ගමන් වාර තුනක මෙහෙයුම් සිදු කිරීමට ගුවන් සමාගම විසින් තීරණය කරනු ලැබුණි. කොළඹ සහ මොස්කව් අතර ගුවන් ගමන් මෙහෙයුම් නැවත අරම්භ කරමින් එයාර්බස් 330-300 SU 288 ගුවන්යානාවෙන් සංචාරකයින් 252ක් සමඟින් 2022 ඔක්තෝම්බර් 10වන දින බ.ජා.ගු. වෙත ලඟාවිය. එරෝෆ්ලොට් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකාව වෙත නිර්දේශය කිරීම මඟින් ගුවන් සේවා, ගමනාගමන සහ සංචාර ක්ෂේත්‍ර නඟා සිටුවීමට මහඟු දායකත්වයක් සපයනු ඇත.

තායි එයාර්වේස් හි අනුබද්ධිත ආයතනයක් වන තායි ස්මයිල් එයාර්වේස් විසින් බ.ජා.ගු. සහ බැංකොක් ස්වර්ණභූමි ගුවන්තොටුපළ අතර සෘජු ගුවන් ගමන්, 2022 මැයි මස සිට දෛනිකව ආරම්භ කරන ලදී.

කටාර් එයාර්වේස් විසින් 2022 පෙබරවාරි සිට ආරම්භ කරන ලද, දෝහා සිට කොළඹ දක්වා තම පස්වැනි දෛනික පියාසැරි නැවත වැඩිකරමින් නව සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. වැඩි කරන ලද වාර සංඛ්‍යාව සමඟ කොළඹ වෙත එහි පූර්ව කොවිඩ් තත්ත්වයට නැවත ළඟා වීමට හැකි විය. එමෙන්ම එය හමාඩ් ජාත්‍යන්තර ගුවන්තොටුපළ (HIA) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.ජා.ගු.) අතර අබණ්ඩ සේවා සපයනු ලබන එකම ගුවන්සේවය විය.

උස්බෙකිස්තානයේ ජාතික ගුවන්සේවය වන **උස්බෙකිස්තාන් එයාර්වේස්** ම.රා.ජා.ගු. හි මෙහෙයුම් 2022 පෙබරවාරි මස සිට ආරම්භ කරන ලදී. සෑම බදාදා දිනකදීම උස්බෙකිස්තානය සහ ම.රා.ජා.ගු. අතර සතිපතා පියාසැරි ආරම්භ කරන ලදී. උස්බෙකිස්තාන් එයාර්වේස් මෙහෙයුම් සමඟින් ශ්‍රී ලංකාව වෙත සංචාරකයින් බෙහෝමයක් පැමිණෙනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර, එය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දැඩි ලෙස බලපෑමට ලක් වූ සංචාරක කර්මාන්තය නගා සිටුවීමට උපකාරී වනු ඇත.



එයාර් ෆාරාන්ස් විසින් බ.ජා.ගු හි මෙහෙයුම් නැවත ආරම්භ කිරීම


අසුර් එයාර් විසින් බ.ජා.ගු හි මෙහෙයුම් නැවත ආරම්භ කිරීම



කටාර් එයාර්වේස් විසින් බ.ජා.ගු හි ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම


රුසියානු ප්‍රමුඛතම ගුවන් සේවය වන එරෝෆ්ලොට් එයාර්ලයින්ස් විසින් බ.ජා.ගු හි මෙහෙයුම් නැවත ආරම්භ කිරීම


උස්බෙකිස්තාන් එයාර්වේස් විසින් ම.රා.ජා.ගු හි පියාසැරි මෙහෙයුම් ආරම්භ කිරීම


තායි ස්මයිල් එයාර්වේස් විසින් බ.ජා.ගු. වෙත සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම

ආ) මගී සංචලන ඔස්සේ ත්‍රිත්ව පාදක රේඛාව ශක්තිමත් කිරීම

නව සේවා නිෂ්පාදනයක් ආරම්භ කිරීම

බ.ජා.ගු හරහා ගුවන් ගමන් සිදු කරනු ලබන මගීන්හට "උසස් ගුවන්තොටුපළ අත්දැකීමක්" ලබා දීමේ අමුණින් 'ගොල්ඩ් රූට්' යන සන්නාමය යටතේ ගු.ගු.සේ.ස. සිය නව ස්ථාපිත සේවා නිෂ්පාදනය 2022 අගෝස්තු මස දියත් කරන ලදී. මෙම සේවාවේ සුවිශේෂී ලක්ෂණය වනුයේ, උසස් සේවා අත්දැකීමක් සමඟින් පැමිණීමේ සහ පිටවීමේ ක්‍රියාවලීන් වේගවත් කිරීම සඳහා සුවිශේෂී මාර්ගයක් භාවිත කිරීමට සුබෝපභෝගී මගීන්ට හැකියාව ලැබීමයි. ගොල්ඩ් රූට් විවේකාගාරයේදී රේගු, ආගමන හා විගමන, සහ අනෙකුත් සියලුම විධිමත් කිරීම් ඇතුළුව කාර්යක්ෂම පිරික්සුම් ක්‍රියාවලියක් අමුත්තන්ට අත්විඳිය හැකිය. බ.ජා.ගු හි ගොල්ඩ් රූට් සේවා පහසුකම, මගීන්ට ඇමරිකානු ඩොලර් 200ක් (පැමිණීම හෝ පිටවීම සඳහා) අයකරන අතර www.airport.lk හරහා වෙන් කරවා ගත හැකිය.





"ගෝල්ඩ් රූට්" විවේකාගාරය මගින් ලබාදෙන විශිෂ්ඨ ගුවන්තොටුපළ අත්දැකීම

පැමිණිලි සහ මගීන්ගේ විමසිම් හැසිරීම් - පාරිභෝගික අභිමුඛ රාජ්‍ය ආයතනයක් ලෙස ගු.ගු.සේ.ස. විසි පාර්ශවකරුවන්හට ප්‍රශස්ථ තෘප්තිමත් සේවාවක් ලබාදීම සඳහා පැය 24 පුරාම ක්‍රියත්මක වෙයි. එබැවින් මගීන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ නියමිත වේලාවට පැමිණිලි වලට ප්‍රතිචාර දැක්වීම ප්‍රමුඛ කාර්යයකි. ඒ අනුව ගු.ගු.සේ.ස. විසින් 2022 වසරේදී අපගේ මගී පැමිණිලි පද්ධතිය හරහා පැමිණිලි 835ක් හසුරුවා ඇත. මේ අතර ගුවන්තොටුපළ පහසුකම්, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි යනාදී විවිධ ප්‍රවාහයන් ඔස්සේ ලැබුණු මගීන්ගේ විමසීම් 3,702ක් විසඳා ඇත. වැඩිම විමසීම් සංඛ්‍යාවක් වූයේ සංචාරක අවශ්‍යතා සහ ගුවන් ගමන් සඳහා කොවිඩ්-19 සම්බන්ධ කරුණු පිළිබඳ විමසීම්ය.

VIP සේවා හැසිරවීම - ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ සහ ගුවන් යානා භාවිත කරනු ලබන එක් එක් මගීන්ගේ පහසුව ගු.ගු.සේ.ස. හි ඉහළම ප්‍රමුඛතාවයක් වේ. කෙසේ වෙතත්, විවිධ හේතු මත විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් බලයලත් රජයේ බලධාරීන් විසින් හඳුනාගනු ලබන ඉතා වැදගත් මගීන් හැසිරවීම සමාගම සතු වගකීමකි. 2022 වර්ෂයේදී බ.ජා.ගු. හි VIP විවේකාගාරය හරහා ජාතික අවශ්‍යතා සපුරාලමින් VIP සංචලන 2,194කින් සුවිශේෂී පුද්ගලයින් 4,368කට පහසුකම් සලසා ඇත.

එක්ස්සේකටිව් විවේකාගාර පහසුකම් ප්‍රතිපාදන සඳහා ඉන්දියානු ගුවන්තොටුපළ සේවා සමූහ සමාගම සමඟ හවුල් වීම - මගීන් සඳහා එක්ස්සේකටිව් විවේකාගාර පහසුකම් සැපයීම සඳහා 2022 මාර්තු 6 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ගු.ගු.සේ.ස. විසින් ඉන්දියානු ගුවන්තොටුපළ සේවය සමඟ ගිවිසුම් අත්සන් කරන ලදී. මෙම සංවිධානය ප්‍රමුඛයෙකු වන බැවින් සහ තාක්ෂණය මත පදනම් වූ වේදිකාවක් භාවිත කරමින් මගීන්ට වැඩිදියුණු කළ ගුවන්තොටුපළ අත්දැකීම් ලබා දෙනු ලබන වස් ඉන්දියාවේ විශාලතම ගුවන්තොටුපළ සේවාවක් වන බැවින් මෙය බ.ජා.ගු. සඳහා විශාල ජයග්‍රහණයකි. ඔවුන් විවේකාගාර, ආහාර පාන, සම්භාහන මධ්‍යස්ථාන, හමුවී සහයවීම් සහ ගුවන්තොටුපළ මාරුවීම්, සංක්‍රමණ හෝටල් / විවේක කාමර ප්‍රවේශය, ගමන් මලු මාරු කිරීම සහ වෙනත් සේවා වැනි සේවාවන් සඳහා පාරිභෝගිකයින්ට ප්‍රවේශය පහසු කරනු ලබයි.

ඇ) භාණ්ඩ සංචලන ඔස්සේ ත්‍රිත්ව පාදක රේඛාව ශක්තිමත් කිරීම

ගුවන් භාණ්ඩ බහාලුම් ගම්මානය පිවිසුම් /පිටවීමේ ගොඩනැඟිල්ල බ.ජා.ගු. කටුනායක

මෙම ව්‍යාපෘතියේ විෂය පථය සඳහා තට්ටු දෙකකින් යුතු ගොඩනැඟිල්ලක් ඉදිකිරීම (දළ වශයෙන් වර්ග මීටර් 575) සහ රථගාලක් (දළ වශයෙන් වර්ග මීටර් 464), සිවිල් වැඩ කටයුතු, ව්‍යුහාත්මක තුරු වානේ නිර්මාණ, ලෝහ කටුයුතු සහ කවුළු, වෙන් කිරීම්, ආවරණ, විද්‍යුත්, යාන්ත්‍රික, තොරතුරු තාක්ෂණය සහ වෙනත් අදාළ සේවා ඇතුළත් වේ. සමස්ත කොන්ත්‍රාත්තු අගය රුපියල් මිලියන 149 ක් වන අතර 2022 සැප්තැම්බර් 15 වන දින ව්‍යාපෘතිය සාර්ථකව නිමකරන කරන ලදී.





ගුවන් භාණ්ඩ බහාලුම් ගම්මානයේ පිවිසුම් / පිටවීමේ ගොඩනැඟිල්ල ඉදිකිරීම

ත්‍රිත්ව පාදක රේඛාව ප්‍රශස්ත කරනු ලබන පරිසරයක්
රට තුළ පැවති ඉතා අයහපත් ආර්ථික පසුබෑමෙහි අහිතකර බලපෑම් අවම කිරීමේ ප්‍රයත්නයන්ට රජයට සහය දැක්වීම සඳහා, වගකීම් සහගත රජයේ ආයතනයක් ලෙස ගු.ගු.සේ.ස. විසින් රජය වෙනුවෙන් සේවාවක් ලෙස එහි පිරිවැය භාරයන් අවම කරගැනීමට සියලු ප්‍රයත්නයන් දරන ලදී. එක් එක් පුද්ගලයාට ඉටු කිරීමට කාර්යභාරයක් ඇති බව හඳුනා ගනිමින් සකසුරුවම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට ගු.ගු.සේ.ස. හි අංශයන් යොමු විය. ඊට අමතරව, ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් අවම කිරීම සඳහා නිකුත් කරන ලද 2022 අප්‍රේල් මස රජයේ චක්‍රලේඛය පිළිපැදීමට ගු.ගු.සේ.ස. විසින් විශේෂ පියවර ගනු ලැබුණි. නියාමන සහ අත්‍යවශ්‍ය පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා පමණක් ගු.ගු.සේ.ස. හි විදේශ පුහුණු අයවැය විශාල ලෙස කප්පාදු කරන ලදී. එමෙන්ම අලෙවිකරණ සහ ප්‍රවර්ධන වියදම් ද අවම මට්ටමකට ගෙන එන ලදී. පසුව සඳහන් කරන ලද වැඩ පිළිවෙල මඟින් සන්නාමයට වැඩි වටිනාකමක් එක් කරනු ලබන, අවම වියදමකින් සේවා බෙදාහැරීම් වැඩිදියුණු කිරීම් හරහා ඇති වන අලෙවිකරණ අවස්ථා කෙරෙහි අවධානය යොමු කරන ලදී.

2.2 ගු.ගු.සේ.ස - ත්‍රිත්ව පාදක රේඛාව (TBL) වර්ධනය කරමින්
සීඝ්‍ර ප්‍රතිසාධනයක් අත් කරගැනීම තහවුරු කිරීම සහ ඉහත ප්‍රධාන කාර්ය සාධන දර්ශකය වර්ධනයේ ස්ථාරභාවය සඳහා 2022 වර්ෂය තුළදී ඇති වූ වැදගත් අවස්ථාවන් පහත දක්වා ඇත.

ත්‍රිත්ව පාදක රේඛාව යනු ව්‍යාපාර ආයතනයක් විසින් එහි සමාජීය සහ පාරිසරික බලපෑම් ගණනය කිරීම සිදු කළ යුතුය යන්න ඉදිරිපත් කරනු ලබන ව්‍යාපාර සංකල්පයකි. එනම් ප්‍රජාව, මිහිතලය සහ ලාභය උත්පාදනය වෙත ආයතනයක් විසින් සිදු කරනු ලබන ධනාත්මක සංකල්පයකි. මෙම සංකල්පය 3Ps නමින් හැඳින්වෙයි. මෙම සංකල්පය මඟින් හුදෙක් මූල්‍ය කාර්යසාධනය හෝ ලාභය හෝ නියමිත ආදායම උත්පාදනය වෙත පමණක් අවධානය යොමු කිරීම, වාණිජ ආයතනයක සමස්ත කාර්යසාධනය මැනීම සඳහා ප්‍රමාණවත් නොවන බවයි. සමාලෝචිත වර්ෂය තුළ ගු.ගු.සේ.ස. හි ලාභය, ප්‍රජාව සහ මිහිතලය යටතේ දැක්වෙන පදනම් තුනහිම වර්ධනයක් දැකගත හැකි විය. සමාගමේ මූල්‍ය කාර්යසාධනය මූල්‍ය සමාලෝචනය යටතේ පුළුල්ව විස්තර කරනු ලබන අතර එහි "ප්‍රජාව" පිළිබඳ මානව සම්පත් කළමනාකරණය යටතේ ද "මිහිතලය" පිළිබඳ තිරසාරත්වය මඟින් ද සාකච්ඡා කරනු ලබයි.

2.2.1 ඉපැයීමේ හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා සාර්ථක ප්‍රාග්ධන යෙදවීම සහ මෘදුකාංග ආයෝජනය

රත්මලාන, කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ යාත්‍රාංගනය සහ නැගෙනහිර පිවිසුම මඟ ප්‍රතිසංස්කරණය
මෙම ව්‍යාපෘතියේ විෂය පථය සඳහා නැගෙනහිර පිවිසුම් මඟ (පළල - මීටර 25 සහ දිග - මීටර 400 ආසන්න විශයෙන්) ඉදිකිරීම සහ රත්මලාන ගුවන්තොටුපළේ පවතින කානු පද්ධතිය වෙනස් කිරීම ඇතුළුව දැනට පවතින යාත්‍රාංගනය (ආසන්න වශයෙන් වර්ග මීටර් 4,200ක ප්‍රමාණයක්) ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වේ. සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 231 ක් වූ අතර, ව්‍යාපෘතිය 2022 මාර්තු 26 වන දින සාර්ථකව නිම කරන ලදී.

ගුවන් භාණ්ඩ බහාලුම් ගම්මානය පිවිසුම් /පිටවීමේ ගොඩනැඟිල්ල බ.ජා.ගු. කටුනායක
භාණ්ඩ සංචලන ශක්තිමත් කිරීම යටතේ ව්‍යාපෘති විෂය පථය දක්වා ඇත.

බ.ජා.ගු. සහ කො.ජා.ගු.ර. හි සනනිවේදන පද්ධතිය උසස් කිරීම
බ.ජා.ගු හි VHF සහ හඬ සන්නිවේදන පද්ධතිය සහ කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ප්‍රදේශ පාලන මධ්‍යස්ථානය අත්හදා බැලීමේ පදනම යටතේ සම්පූර්ණයෙන්ම වැඩිදියුණු කර සහ ක්‍රියාත්මක කර ඇත. පුළුල් අත්හදා බැලීම් වලදී නව පද්ධතිවල ස්ථායිතාව මනාව නිරීක්ෂණය කර ඇති අතර, අඛණ්ඩ තාක්ෂණික සහය සමඟින් පද්ධති සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතිය හරහා පැරණි යල්පැනගිය පද්ධති ප්‍රතිස්ථාපනය කරමින්, නව VoIP පාදක කරගත් තාක්ෂණය හඳුන්වා දෙමින් කොළඹ ප්‍රවේශ පාලන මධ්‍යස්ථානයේ සහ ප්‍රදේශ පාලන මධ්‍යස්ථානයේ මෙහෙයුම් වල ආරක්ෂාව සහතික කර ඇත.

ගඟන නාවික තොරතුරු කළමනාකරණ පද්ධතිය
පුළුල් පරීක්ෂණ මෙහෙයුම් වලින් අනතුරුව පියාසැරි සැලසුම්කරණය, NOTAM කළමනාකරණය, අන්තර්ජාල සැසි, සංඛ්‍යාත්මක ගඟන නාවික දත්ත කළමනාකරණය, සහ විද්‍යුත් ගඟන නාවික තොරතුරු ප්‍රකාශන වෙත පද්ධති මොඩියුලය 2002 වර්ෂයේදී ස්ථාපනය කර ඇත. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ ආසියානු පැසිෆික් කලාපයේ නවතම නියාමන අවශ්‍යතාවලට සමගාමීව, ආරක්ෂාව සහතික කරමින් සහ ජාත්‍යන්තර කර්මාන්ත සම්මතයන්ට අනුව යමින් ගඟන නාවික මෙහෙයුම් කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට ගු.ගු.සේ.ස. වෙත ගඟන නාවික දත්ත සැපයීමට මෙම ව්‍යාපෘතිය මඟින් හැකි වී ඇත.

බ.ජා.ගු හි ගුවන් ගමන් කළමනාකරණ පද්ධතිය
2022 වසරේදී බ.ජා.ගු හි කොළඹ ප්‍රවේශ පාලන මධ්‍යස්ථානයේ නව ගුවන් ගමනාගමන කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම අවසන් කර ඇති අතර එය ADS-B (ස්වයංක්‍රීය ආයත්ත සුපරීක්ෂණ විකාශනය), Mode-S රේඩාර්, AMHS (ATS පණිවුඩ හැසිරවීමේ පද්ධතිය) වැනි බොහෝ නව තාක්ෂණයන්ට අනුකූලව මනාව සකස් කර ඇත. පද්ධති ක්‍රියාකාරිත්වය සත්‍යාපනය කිරීම සඳහා පුළුල් පරීක්ෂණ මෙහෙයුම් සිදු කර ඇති අතර පද්ධති විකුණුම්කරු සහ අභ්‍යන්තර ඉංජිනේරු කණ්ඩායමේ අඛණ්ඩ සහය ඇතිව පද්ධතිය සජීවී අත්හදා බැලීමේ මෙහෙයුම් සඳහා සූදානම්ය.

මූල්‍ය හා සැපයුම් දාම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම
ගු.ගු.සේ.ස. විසින් 2021 ජූලි 1 වනදා සිට IFS ERP ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සමඟ මෙහෙයුම් සිදු කරනු ලබයි. එතැන් පටන්, පද්ධතිය දැනට පවතින තත්ත්වයට ස්ථාවර මට්ටමකට ගෙන ඒම සඳහා ගු.ගු.සේ.ස හට බොහෝ බාධක වලට මුහුණ දීමට සිදු විය. පද්ධතිය තරමක් ස්ථායී වූ පසු, තොරතුරු තාක්ෂණ අංශය විසින් අපගේ අභ්‍යන්තර සංවර්ධනය කරන ලද බිල්පත් පද්ධතිය වෙත ERP පද්ධතියට ඒකාබද්ධ කිරීමට ගු.ගු.සේ.ස විසින් පියවර ගන්නා ලදී. මෙම ඒකාබද්ධ කිරීම් සමඟින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායමට තොරතුරුමය තීරණ ගැනීම සඳහා සජීවී තොරතුරු ලබා ගත හැකි තත්ත්වයකට ළඟා වෙමින්, අවම ප්‍රමාදයන් සහිතව බිල්පත් කිරීම අපේක්ෂා කරනු ලබයි. සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා ගු.ගු.සේ.ස විසින් සෑම පද්ධති ඒකාබද්ධතාවයකදීම බොහෝ කාලය වැය කරමින් තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලියක් සිදු කරන ලදී. එබැවින් ගු.ගු.සේ.ස දැනට ඒකාබද්ධ කර ඇති පද්ධති වලින් සමන්විත වන අතර, තත්ත්ව සහතිකය අවසන් වූ පසු ඒකාබද්ධ කිරීමට අදහස් කරනු ලබයි.

2.2.2 ප්‍රජාව වෙත නිසි අවධානයක් යොමු කිරීම

සීමාසහිත හේමාස් ශෛල්‍ය සහ චිකිත්සා (පුද්ගලික) සමාගම විසින් බ.ජා.ගු වෙත ගුවන්තොටුපළේ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ස්වයංක්‍රීය බාහිර ඩීෆයිබ්‍රිලේටරයක් (AED) පරිත්‍යාග කිරීම

සීමාසහිත හේමාස් ශෛල්‍ය සහ චිකිත්සා (පුද්ගලික) සමාගමෙහි කළමනාකරණ අධ්‍යක්ෂ විසින් 2022 දෙසැම්බර් 19 වන දින බ.ජා.ගු.හි සභාපතිතුමා වෙත ස්වයංක්‍රීය බාහිර ඩීෆයිබ්‍රිලේටරයක් (AED) පරිත්‍යාග කරන ලදී. AED සහ CPR භාවිතය පිළිබඳ පුහුණුවක් ගු.ගු.සේ.ස කාර්යමණ්ඩලය සඳහා ශ්‍රී ලංකා නිර්විඳ්දන හා තීව්‍ර වෛද්‍ය විද්‍යාලයේ (COAISL) අධීක්ෂණය යටතේ ලබා දෙනු ඇත.



සීමාසහිත හේමාස් ශෛල්‍ය සහ චිකිත්සා (පුද්ගලික) සමාගම විසින් AED කට්ටලය පරිත්‍යාග කිරීම

බ.ජා.ගු.හි හදිසි අවස්ථා අභ්‍යාස - 2022

සියලුම ගුවන්තොටුපළ පාර්ශවකරුවන් විසින් පැහැරගැනීම් තර්ජන සමඟ කටයුතු කිරීම සඳහා හදිසි සැලැස්මේ සහ ක්‍රියා පටිපාටිවල කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීමේ අරමුණින්, 2022 නොවැම්බර් 9 සහ 10 යන දිනවලදී බ.ජා.ගු හි සැලසුම්ගත පැහැරගැනීම් වලදී ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පුහුණුවක් පවත්වන ලදී.

මෙම පුහුණුව අනුකරණය කරන ලද ව්‍යාජ තත්වයක් යටතේ සිදු කරන ලද අතර, ගු.ගු.සේ.ස, ආරක්ෂක හමුදා, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු විවිධ ආයතන මෙම ක්‍රියාකාරකමට සම්බන්ධ විය. මෙම පුහුණුව සියලුම ආයතන අතර සැලසුම්ගත පැහැරගැනීම් අවස්ථාවන්හි සංකීර්ණතා හැසිරවීමේ සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීමට සහ ශක්තිමත් කිරීමට උපකාරී වේ.





බ.ජා.ගු. හි සිදුකල හදිසි ගිනි ගැනීම් පිළිබඳ අභ්‍යාස

ඕස්ට්‍රේලියානු රජය විසින් බ.ජා.ගු වෙත පුපුරණ ද්‍රව්‍ය අනාවරක ලබා දීම.

ඕස්ට්‍රේලියානු රජය විසින් 2022 මාර්තු 1 වන දින ගු.ගු.සේ.ස වෙත රුපියල් මිලියන 18 ක් වටිනා "පුපුරන ද්‍රව්‍ය අනාවරක" 3 ක් පරිත්‍යාග කරන ලදී. පුපුරන ද්‍රව්‍ය අනාවරක ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් - අතිගරු ඩේවිඩ් හොලි මහතා විසින් ගු.ගු.සේ.ස. සභාපතිතුමා වෙත පිරිනමන ලදී. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයා, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ ඕස්ට්‍රේලියානු රජයෙන් ශ්‍රී ලංකාවට පැමිණි අනේකුත් සම්භාවනීය නිලධාරීන් මේ සඳහා සහභාගී වන ලදී.

බ.ජා.ගු. හි ETD ඒකකය මඟින් ශ්‍රී ලංකාවේ පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීමේ හැකියාව ශක්තිමත් කරනු ඇත. මගීන්ගේ, කාර්යමණ්ඩලයේ, භාණ්ඩ ප්‍රවාහනය සහ ගුවන් යානයේ අඛණ්ඩතාව ආරක්ෂා කරමින් ඕස්ට්‍රේලියානු සහ එක්සත් රාජධානියට යන සියලුම සෘජු ගුවන් ගමන් පරීක්ෂා කිරීමට මෙම උපකරණ යොදවනු ඇත. මීට අමතරව, අනෙකුත් සියලුම ගුවන් ගමන් සඳහාද මෙම උපකරණය යොදවනු ඇත. ජාත්‍යන්තර හොඳම භාවිතයන් සහ ප්‍රමිතීන්ට අනුකූලව ETD ඒකක ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සහතික කිරීම සහ පුපුරණ ද්‍රව්‍ය සඳහා මගීන් සහ ඔවුන්ගේ ගමන් මලු පරීක්ෂා කිරීම සඳහා ඕස්ට්‍රේලියාව විසින් බ.ජා.ගු ගුවන්තොටුපළ ආරක්ෂක පරීක්ෂකයින්ට පුහුණුව ලබා දෙනු ඇත. ශ්‍රී ලංකාව මෑතකදී තම දේශසීමා නැවත විවෘත කර ජාත්‍යන්තර ගුවන් ගමන් නැවත ආරම්භ කර ඇති බැවින් ETD ඒකකය කාලෝචිත පිරිනැමීමකි.



බ.ජා.ගු වෙත ඕස්ට්‍රේලියානු රජයෙන් (ETD) පරිත්‍යාගයක් ලැබීම

බ.ජා.ගු. විසින් 2022 - 2023 සඳහා 2 වන වරටත් ACI ගුවන්තොටුපළ සෞඛ්‍යය සහතිකය ලබා ගැනීම

ගු.ගු.සේ.ස. විසින් බ.ජා.ගු. සඳහා දෙවන වරටත් 2022 - 2023 ACI සෞඛ්‍ය ප්‍රතිපත්තිය ලබාගෙන ඇත. මෙය අපගේ ගුවන්තොටුපළවල මගීන්ගේ සහ සේවකයින්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙමින් අනුගමනය කරන සෞඛ්‍ය ප්‍රමිතීන් පිළිබඳ වැඩිදුර සහතික කිරීමකි.

අපගේ ගුවන්තොටුපළ සංචාරකයින් සඳහා ආරක්ෂිත සහ සුරක්ෂිත පිවිසුම් / පිටවීමේ ස්ථානයක් බවට පත් කරමින් වසංගතය තත්ත්වය තුළ ගු.ගු.සේ.ස විසින් ජාත්‍යන්තර ආරක්ෂණ ප්‍රමිතීන් අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.



ACI ගුවන්තොටුපළ සෞඛ්‍ය සහතිකය 2022-2023

ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමියේ ඩිප්ලෝමා සම්මාන

ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ඇකඩමිය මගින් මෙහෙයවන ලද ගුවන් සේවා අධ්‍යයන ඩිප්ලෝමාව සාර්ථකව නිම කළ 8 වැනි සිසුන් කණ්ඩායම වෙත 2022 ජනවාරි 10 වැනි දින රත්මලාන විද්‍යාපීඨ ශ්‍රවණාගාරයේ දී පැවැති උත්සවයකදී ඩිප්ලෝමා ප්‍රදානය කරන ලදී.

ගු.ගු.සේ.ස සභාපතිතුමා මෙහි ප්‍රධාන ආරාධිතයා විය. චාරිත්‍රානුකූල දේශනය පවත්වමින් එතුමා විසින් පුහුණු කිරීම් සඳහා පහසුකම් වෙනුවෙන් ආයෝජනය කිරීමේ වැදගත්කම පිළිබඳව සඳහන් කළ අතර, පුහුණුවේ වැදගත්කම වටහාගෙන අගය කරන බැවින් ගු.ගු.සේ.ස විසින් මෙම ආයෝජනය කර ඇති බව ද තවදුරටත් පවසන ලදී.

ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ඇකඩමිය යනු ගු.ගු.සේ.ස හි පුහුණු අංශය වන අතර ICAO මගින් නිසි ලෙස තහවුරු කර ඇත. එය ශ්‍රී ලංකා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වෘත්තීය පුහුණු ආයතනයක් ලෙස ද පිළිගෙන ඇත.



ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ඇකඩමිය හි ඩිප්ලෝමා සම්මාන පිරිනැමීම

ආයතනික සමාජීය වගකීමේ පදනමක් වශයෙන් ඊළඟ පරම්පරාව වෙනුවෙන් පාසල් චාරිකා පහසුකම් සැලසීම

සමාගමේ ආයතනික සමාජීය වගකීමේ ප්‍රතිපත්තියට අනුකූලව ආයතනික සමාජීය වගකීමේ මූලපිරීමක් ලෙස ගු.ගු.සේ.ස විසින් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ගොඩබිම් හැසිරවීම, ගුවන්තොටුපළ මෙහෙයුම් සහ ගුවන් නාවික සේවා පිළිබඳව අනාගත පරපුර දැනුවත් කිරීම සහ ගුවන්සේවා ක්ෂේත්‍රයෙන් බිහිවන අනාගත වෘත්තීය අවස්ථා පෙන්වා දීමේ අරමුණින් වසර පුරා පාසල් චාරිකා 113 කට පහසුකම් සලසා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉදිරි පරම්පරාවල සේවා නියුක්තිය පුළුල් කිරීම සඳහා තරුණ පරම්පරාවන් අතර ගුවන්සේවා ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව උනන්දුවක් ඇති කිරීම ගු.ගු.සේ.ස විසින් අපේක්ෂා කරනු ලබයි.



පාසල් චාරිකා සඳහා ගු.ගු.සේ.ස හි පහසුකම් සලසා දීම



ළමා දිනය සැමරීම වෙනුවෙන් ගු.ගු.සේ.ස හි සේවා වනිතා ඒකකය විසින් සංවිධානය කරන ලද ගුවන්තොටුපළ චාරිකාව

ළමා සුරැකුම් මධ්‍යස්ථානය නැවත ප්‍රතිස්ථාපනය කිරීම

2022 අප්‍රේල් 23 වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා නවතම ළමා සුරැකුම් කාමරයක් ඉදිකර විවෘත කරන ලදී. පැවති ළමා සුරැකුම් කාමරයෙහි පහසුකම් ඉතා අඩු මට්ටමක පැවතුනු බැවින් මෙම නව නැවතුම්පළ ප්‍රතිස්ථාපනය කිරීම සිදු විය.

පුහුණු කිරීම් හරහා නාමික ඉතුරුම් සඳහා දායකත්වය

සමාලෝචිත වර්ෂය තුළ, සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය "ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ඇකඩමිය (SLAAA)" ලෙස නැවත නම් කරන ලදී. පුහුණු අංශය, මඟින් මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා ගුවන් සංතරණ සේවා, ගුවන්තොටුපළ කළමනාකරණය, සැපයුම් දාම කළමනාකරණය, මානව සම්පත්, සිවිල් ඉංජිනේරු (නඩත්තු), ආරක්ෂක සේවා, ඉලෙක්ට්‍රොනික් හා ගුවන් සංතරණ ඉංජිනේරු, සිවිල් ගුවන්සේවා පුහුණුව, තොරතුරු තාක්ෂණය සහ ගුවන් තොරතුරු කළමනාකරණය යන විෂයන් ඔස්සේ ලබා දුන් පුහුණු කිරීම් ඔස්සේ නාමික ඉතුරුම් හරහා සමාගමේ ආදායම ශක්තිමත් කිරීමට දායක විය. වර්ෂය සඳහා ඇස්තමේන්තුගත මුළු නාමික ඉතුරුම් රුපියල් මිලියන 783 කි.

2.2.3 මිහිතලය පිළිබඳ අවධානය යොමු කිරීම

ගු.ගු.සේ.ස තිරසාර ප්‍රතිපත්තිය

පසුගිය වසර කිහිපය තුළ ආයතනික තිරසාරභාවය පිළිබඳ සංකල්පය පාරිසරික සාධකයට වැඩි නැඹුරුවක් ලබා දෙමින් නවීන ආයතනික වර්ධන උපායමාර්ග හි කැපී පෙනෙන ලෙස සඳහා සැලකිය යුතු ලෙස වෙනස්කම් වලට ලක් වී ඇත. මෙම වර්ධනය මඟින් සේවකයින් සහ පාර්ශවකරුවන් වෙත දිගු කාලීන තිරසාරභාවය ප්‍රවර්ධනය කරනු ලබන යහපත් විසදුම් නිරන්තරයෙන් සොයා යාම අවසාන වශයෙන් යහපත් ලාභදායිත්වයක් බවට පත් කිරීම සඳහා හේතු වී ඇත. ගු.ගු.සේ.ස තිරසාර ආඥාව සරල හරිත ප්‍රතිපත්තියකට සීමා නොවේ. මිහිතලය සංවිධානයේ නිශ්චිත පාර්ශවකරුවෙකු ලෙස හඳුනාගෙන ඇත.

පුළුල් ආයතනික ඉදිරි දර්ශනයක් ක්‍රියාත්මක කිරීම ඔස්සේ කල්පවත්නා වටිනාකමක් නිර්මාණය කළ හැකි යැයි අපි විශ්වාස කරන්නෙමු. අපගේ ප්‍රවේශය මඟින් සංවිධානයට බලපාන සමාජීය හා සංස්කෘතික අංගවල වැදගත්කම හඳුනා ගනු ලබයි. එබැවින් අපගේ සැලැස්ම සහ උපායමාර්ග මෙම අංග වල ධනාත්මක බව මූලික කරගන්නා අතර, එය සංවිධානය සහ සියලුම පාර්ශවකරුවන් වෙනුවෙන් කල්පවත්නා වටිනාකමක් ඇති කිරීම සඳහා යොමු කරනු ලබයි.

ඒ අනුව, ගු.ගු.සේ.ස විසින් විමෝචන පාලනය, කාබන් පියසටහන අවම කිරීම, ස්වභාවික සම්පත් පුනර්ජනනයට සහය වීම සහ මානව තිරසාරත්වයට බාධා කරන බාධක ඉවත් කිරීම යන අංශ හතර කෙරෙහි අවධානය යොමු කරයි.

විමෝචන පාලනය

සමාගම විසින් ස්වාභාවික පරිසරයට විමෝචනය කරනු ලබන හෝ මුදා හරින සියලුම ද්‍රව්‍ය අඛණ්ඩව ඇගයීමට ලක් කරන අතර, එමඟින් විමෝචනය අවම කර, හරිතාගාර ආචරණය පාලනය කරනු ලබයි.

- අපද්‍රව්‍ය පවිත්‍රාගාරය - පරිසරයට මුදා හරින අපද්‍රව්‍යවල විෂ සහිත මට්ටම් පාලනය කිරීම.
- දාහක යන්ත්‍රය සහ අපද්‍රව්‍ය කළමනාකරණය - ගු.ගු.සේ.ස හි අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍රය (EPL) යටතේ ආරම්භ කරන ලද අති නවීන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ දාහකයකි.

කාබන් පියසටහන අවම කිරීම

- ගු.ගු.සේ.ස හි බලශක්ති කළමනාකරණ භාවිතයන් නවමු, තිරසාර විසඳුම් මාලාවක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලදී.
- පවතින ගොඩනැගිල්ල සඳහා බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණය, ආලෝක පාලන සහ මෝටර් පාලන පද්ධති අලුතින් සවි කරන ලදී (උදා: T5 fluorescent උපාංග, C-Bus පාලන පද්ධතිය, AHUz, PAU සඳහා ධාවක).
- සිසිලන යන්ත්‍ර සඳහා පවතින ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය සඳහා නව සිසිලන පද්ධති ඒකාබද්ධ කිරීම.
- ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති වලදී බැලස්ට් සහ බල්බ භාවිතය.
- විචල්‍ය වේග ධාවකයන් සහ මෘදු ආරම්භක පාලනයන් යොදා ගෙන ගොඩනැගිලි වායු හැසිරවීමේ ඒකක වැඩිදියුණු කිරීම.
- උණු ජල පද්ධති සඳහා සූර්ය තාපක හඳුන්වාදීම.
- පියැසි කවුළු සහ අඳුරු කිරීම් නියාමක සමඟ ස්වභාවික ආලෝකය භාවිතය ප්‍රශස්ත කිරීම.
- මගී පර්යන්ත ගොඩනැගිල්ලේ චලන සංවේදක, භාවිත කරන අවස්ථා සඳහා වූ සංවේදක භාවිතය.
- බල සාධක නිවැරදි කිරීම්, සංක්‍රමණ හෝටලයේ යතුරු ටැග් සක්‍රිය කර ඇති ප්‍රධාන ස්විච්, ආහාර උණුසුම් කිරීම සඳහා උණුසුම් කබඩ් සිට මයික්‍රෝවේව් උදුන් දක්වා වෙනස් කිරීම බලශක්ති ඉතිරියක් ඇති කරනු ලබයි.
- වායු සමීකරණ භාවිතයෙන් තොරව කාර්යාල ප්‍රදේශයේ කාර්යාල වේලාවෙන් පසු සහ සති අන්තයේ වායු පංකා භාවිත කිරීම.
- ගුවන්තොටුපළ පරිශ්‍රයේ පිහිටි ඉහළ පාරිසරික වටිනාකමක් ඇති ගස් 200ක් ගු.ගු.සේ.ස හි කළපු භූමියේ නැවත සිටුවීම. දළ වශයෙන් තවත් ගස් 200ක් ඉදිකිරීම් කටයුතු සඳහා නොකපා සංරක්ෂණය කිරීමට වෙන් කර ඇත. මෙම සංරක්ෂණ සැලැස්ම හැරුණු විට, ගු.ගු.සේ.ස විසින් බ.ජා.ගු සංවර්ධන ව්‍යාපෘති සමඟ එක්ව නව රුක් රෝපණ කටයුතු ආරම්භ කර ඇත.

ස්වභාවික සම්පත් පුනර්ජනනය සඳහා සහය වීම

ආයතනික අවශ්‍යතා සපුරාලීම සඳහා විකල්ප සම්පත් සොයමින් ස්වාභාවික සම්පත් මත යැපීම අවම කිරීමේ අභියෝගය ගු.ගු.සේ.ස විසින් භාර ගෙන ඇති අතර එමඟින් පුනර්ජනන ප්‍රයත්නයන්ට ඵලදායී ලෙස සහය වේ.

ජල සංරක්ෂණය- බ.ජා.ගු හි දෛනික පානීය ජල අවශ්‍යතාවයෙන් 50%කට වැඩි, දළ වශයෙන් මුළු ඝන මීටර 2,200 න් ඝන මීටර 1,200 ක් පරිශ්‍රයේ හාරන ලද ළිං ජලයෙන් සපුරා ගනී.

මානව තිරසාරත්වයට ඇති බාධා තුරන් කිරීම

- **ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනය සඳහා සහය වීම**

සමාගම විසින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ට, ඩිප්ලෝමාධාරීන්ට සහ කාර්මික අභ්‍යාසලාභීන් සඳහා තොරතුරු තාක්ෂණ, මූල්‍ය, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික ඉංජිනේරු, සාමාන්‍ය පරිපාලන, ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය සහ මෝටර් රථ ඉංජිනේරු ඇතුළු විවිධ විෂයයන් පිළිබඳ පුහුණුව ලබා දෙයි.

- **මහරගම අපේක්ෂා රෝහලට පරිත්‍යාග සිදු කිරීම**

බ.ජා.ගු, ගු.ගු.සේ.ස. හරහා ගමන් කළ මිලියන සංඛ්‍යාත ත්‍යාගශීලී මගීන්ට ස්තූතිවන්ත වෙමින්, ආයතනික සමාජීය වගකීම් (CSR) මුලපිරීමක් ලෙස 2022 ඔක්තෝබර් 25 වන දින මහරගම අපේක්ෂා රෝහලට රුපියල් 4,338,230ක් පරිත්‍යාග කිරීමට හැකි විය. බ.ජා.ගු හි සංක්‍රමණ ප්‍රදේශයේ තබා ඇති පුණ්‍යාධාර චකතු කිරීමේ ස්ථාන වලින් මෙම පරිත්‍යාග මුදල් එකතු කරනු ලැබිණි.

ගු.ගු.සේ.ස විසින් වසර ගණනාවක් පුරා මෙම පුණ්‍යාධාර වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර, බ.ජා.ගු මගීන් විසින් ලබා දෙන පරිත්‍යාග සැබවින්ම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිතවල වෙනසක් ඇති කර ඇත.



මහරගම අපේක්ෂා රෝහලට පරිත්‍යාග භාරදීම

- **2022 ලෝක ළමා දිනය පැවැත්වීම**

ගු.ගු.සේ.ස. විසින් 2022 ලෝක ළමා දිනය සමරනු ලැබුවේ බ.ජා.ගු. අවට පාසල් ළමුන් සඳහා විශේෂ ගුවන්තොටුපළ අත්දැකීම් ලබා දීමේ වැඩසටහනක් පවත්වමිනි. ගු.ගු.සේ.ස. යනු ප්‍රමුඛතාවයක් ලෙස සලකමින් සැමවිටම ළමුන් වෙනුවෙන් සහයෝගය දක්වන ආයතනයකි.

අභියෝගයන්ට මුහුණදෙමින්

ඉදිරියේ ඇති වන ඕනෑම අභියෝගයකට මුහුණදීමට අපි සූදානමින් සිටින්නෙමු. අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයකදී වුවද, අපගේ ප්‍රජාව රඳවා තබා ගැනීමට, නැවත පුහුණු කරවීමට මෙන්ම නැවත මෙහෙයවීමට අපි කටයුතු කරන්නෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ කාර්ය මණ්ඩලය නොවෙනස්ව, ඉහළ ශක්‍යතාවන්ගෙන් පරිපූර්ණව පවතින බැවින් මෙහෙයුම් නොපමාව වර්ධනය කිරීමට අපි අපේක්ෂාවෙන් සිටින්නෙමු. සැබවින්ම අපගේ ප්‍රජාව ඒ සඳහා පියවර ගෙන ඇත. ඒවා මෙහෙයවීම මෙන්ම, එක්ව පැවතිය යුතු වෙනස් වන බොහෝ කාණ්ඩයන් එක්කාසු කිරීම අතින් අපහසුතා ඇති විය. නිරන්තරයෙන් වෙනස් වන කාලයක, අපගේ වටිනාකම් නොවෙනස්ව පැවතුණි. ගු.ගු.සේ.ස ශක්තිමත් කරනු ලබන අපේ වටිනාකම් වෙත බැඳී සිටීම වැදගත් වේ. අපගේ ප්‍රජාව වෙත නැවත ලබා දීමද අපගේ ප්‍රධාන භූමිකාවකි. ඊට අමතරව, එකිනෙකට බැඳුණු පද්ධතියක් ලෙස අපගේ කර්මාන්තය ක්‍රියාත්මක වන බව හඳුනාගනිමින්, එකිනෙකට බැඳුණු මෙම පද්ධතිය නොකැඩී පැවතීම, ක්‍රියාත්මක වීම පවත්වා ගෙන යාම සඳහා අපි ගුවන්සේවා හවුල්කරුවන් සහ බදුකරුවන් වෙත සහයෝගය නිතැනින් ලබා දුන්නෙමු. අභියෝගවලට මුහුණදීමේදී අපි සූක්ෂම, කැපවූ සහ අධිෂ්ඨානශීලී සමාගමක් ලෙස කටයුතු කර ඇත. අපගේ ප්‍රජාව ඔරොත්තු දීමේ හැකියාව ඇති අභියෝගයන්ට මුහුණදීමට සූදානම් පිරිසක් වේ. 2022 වර්ෂයේදී දැඩි තීරණයක් ගැනීමට ගු.ගු.සේ.ස වෙත බලපෑම් කරන ලද මෙම පසුබිම තුළ වුවද, වසරේ විශේෂ සිදුවීම් පිළිබඳ පූර්ණ විස්තරයක් සමඟින් අපගේ ඉදිරි සැලසුම් පාර්ශවකරුවන් වෙත පිරිනමනු ලබන කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය අපි සතුටින් ඉදිරිපත් කර සිටිමු.


DIOR
SAUVAGE
MASCARA
EYES

මූල්‍ය සමාලෝචනය

ආදායම
රු. මිලියන **27,647**
(2021 රු. මිලියන 7,879)

මූල්‍ය ආදායම
රු. මිලියන **6,137**
(2021 රු. මිලියන 3,321)

මෙහෙයුම් ලාභය
රු. මිලියන **12,705**
(2021 රු. මිලියන -3,776)

බදු ගෙවීමෙන් පසු ලාභය
රු. මිලියන **4,803**
(2021 රු. මිලියන -2,084)

වත්කම
රු. මිලියන **179,530**
(2021 රු. මිලියන 126,844)

දළ විශ්ලේෂණය

2022 වසර සඳහා ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකාවේ විකම ගුවන් සේවා සපයන්නා ලෙස සිය තත්ත්වය තවදුරටත් වැඩිදියුණු කරලීමට ගු.ගු.සේ.ස. සමත් විය. විවිධාකාර අභියෝග මධ්‍යයේ මෙම වසරේ නිමාව සිදු විය. රුසියාව සහ යුක්‍රේනය අතර ඇති වූ භූ දේශපාලන ගැටලුවල බලපෑම හමුවේ ඇතිවූ උද්ධමන පීඩනය හේතුවෙන් ඉන්ධන මිල ඉහළ යාමත් සමඟ ගෝලීය ආර්ථිකයට බාධාවලට මුහුණ පැමට සිදු විය. 2022 වසර ආරම්භයේ පටන් චීනය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වූ බාධාවන් සහිත සබඳතා හේතුවෙන්, බොහෝමයක් රටවල ආර්ථික පසුබෑම තවත් වැඩි විය.

ඊට අමතරව, රට වසා තැබීමේ කාලය තවත් දීර්ඝ කරන ලද චීනයේ කොවිඩ් තුරන් කිරීමේ ප්‍රතිපත්ති මඟින් නිශ්චල දේපළ වෙළඳාම් ක්ෂේත්‍රයේ ඍණ ආයෝජනයක් ඇති කරන ලද ආර්ථික පසුබෑමකට හේතු වූ අතර, එය අවසානයේදී ගෝලීය වාණිජයමය මන්දගාමිත්වයක් ඇති කරන ලදී. විදුලිය, ඉන්ධන, ආහාර සහ ඖෂධ අර්බුදය ඇතුළු දේශීය අස්ථාවරත්වය ද ආර්ථික පරිසරයට බලපෑ අතර, එය සංචාරක කර්මාන්තයට අහිතකර ලෙස බලපාන ලදී. මෙම අභියෝග හමුවේ වූවද ගු.ගු.සේ.ස. විසින් මූල්‍යමය වශයෙන් දරා සිටීමට සමත් වූ අතර, ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයට සමගාමීව යහපත් ප්‍රතිසාධනයක් ලබා ගන්නා ලදී.

ආදායම

ගු.ගු.සේ.ස. විසින් රුපියල් මිලියන 27,647 දක්වා ආදායමේ 251%කින් ස්ථාවර වර්ධනයක් වාර්තා කරන ලදී. ගු.ගු.සේ.ස. හි ආදායම් මාර්ගයන් නිර්ණය කරන ලද මූලික පරාමිතීන් අතරට ගුවන් ගමන් සංචලනයන් සහ මගී සංචලනයන් ඇතුළත් වේ. පෙර වසරට සාපේක්ෂව, ජාත්‍යන්තර මගී සංචලන 266%ක වර්ධනයක් මෙන්ම, ජාත්‍යන්තර ගුවන් යානා සංචලනය 78%ක වර්ධන වේගයක් පෙන්නුම් කරනු ලබයි. මීට අමතරව ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්ෂය වීම හේතුවෙන්, සියලුම ඇමරිකානු ඩොලර් ආදායම් ප්‍රභවයන් ඉහළ අනුපාතයකින් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් එය 251%කින් ආදායම් වර්ධනයට ධනාත්මක ලෙස බලපෑ අතර, ධනාත්මක සහ බලාපොරොත්තු සහිතව වසර අවසන් කිරීමට හැකි විය.



ගුවන් ගමන් සංචලන හි කාර්යසාධනය

ජාත්‍යන්තර මගී සංචලන



ජාත්‍යන්තර ගුවන් ගමන් සංචලන



ගු.ගු.සේ.ස. හි ආදායම් මාර්ග මූලික වශයෙන් ගඟන නාවික මෙහෙයුම් සහ ගඟන නාවික නොවන මෙහෙයුම් මඟින් උත්පාදනය වන ආදායම් වලින් සමන්විත වේ. මෙම ආදායම් මාර්ග දෙකෙහි වර්ගීකරණය පහතින් දක්වා ඇත.

ප්‍රධාන ගඟන නාවික ආදායම

- ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම
- හරහා පියාසර ආදායම
- ගුවන් පාලම් ආදායම
- අභ්‍යන්තර ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම

ප්‍රධාන ගඟන නාවික නොවන ආදායම

- අනුග්‍රාහක ගාස්තු
- ගුවන් යානාවට නැගීමේ ගාස්තු
- බදුකුලී
- වෙනත් ගඟන නාවික නොවන ආදායම

ගඟන නාවික ආදායම



ගඟන නාවික නොවන ආදායම



සමාලෝචිත වසර තුළ සමාගම විසින් රුපියල් මිලියන 6,194 ගඟන නාවික ආදායමක් වාර්තා කළ අතර, එය 2021 වසරේ වාර්තා කළ රුපියල් මිලියන 2,299 ට සාපේක්ෂව 169% වර්ධනයකි. සාමාලෝචනය වන කාලය තුළදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 83%කින් ක්ෂය වූ බව සඳහන් කළ යුතුය. එය ගඟන නාවික සහ ගඟන නාවික නොවන යන ආදායම් දෙඅංශය කෙරෙහිම දැඩි බලපෑමක් ඇති කරන ලදී. තවත් සුවිශේෂී දායකත්වයක් ගොඩ බැසීමේ සහ නැවතුම්, හරහා පියාසර ආදායම සහ ගුවන් පාලම් ආදායම මඟින් උත්පාදනය කරන ලදී. ගෝලීය සංචරණ සීමා ලිහිල් කිරීම ආදායම් මාර්ග වර්ධනය සඳහා ධනාත්මකව බලපාන ලදී.

පසුගිය වසරේ වාර්තා කළ රුපියල් මිලියන 5,087 ට සාපේක්ෂව, 289%ක වර්ධනයක් නිරූපණය කරමින් වසර තුළ ගඟන නාවික නොවන ආදායම රුපියල් මිලියන 19,812 ලෙස වාර්තා කරන ලදී. ගුවන් ගමන් තහනම් ලිහිල් කිරීම සහ කේන්ද්‍රගත ප්‍රචාරණ කටයුතු, සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනයක් ඇති කරන ලදී. මෙය සමස්ත සංචාරක කර්මාන්තය සඳහා වාසිදායක වූ අතර, රට තුළ ධනාත්මක තත්ත්වයක් ඇති කරන ලදී. මෙය පසුගිය වසරට සාපේක්ෂව ගුවන් යානාවට නැගීමේ ගාස්තු, අනුග්‍රාහක ගාස්තු සහ බදුකුලී ආදායම් හි ස්ථාවර සංචලනයක් ඇති කරන ලදී.

ලාභදායිත්වය

2022 මූල්‍ය වර්ෂය තුළ දී, ගු.ගු.සේ.ස. විසින් මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 12,705ක් ලෙස වාර්තා කළ අතර, එය පෙර වසරේ රුපියල් මිලියන 3,776ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව, 436%ක සැලකිය යුතු වර්ධනයකි. මෙය වසර තුළ සාක්ෂාත් කර ගන්නා ලද ආදායම් වර්ධනය මූලික වශයෙන් නිරූපනය කරනු ලබයි. ශ්‍රී ලංකානු රුපියල් සහ ඇමරිකානු ඩොලර් තැන්පතු අනුපාතයන් සහ ආයෝජන හි වර්ධනය, 2021 වසරේ රුපියල් මිලියන 3,321 සිට රුපියල් මිලියන 6,137 දක්වා වර්ධනය වෙමින් මුළු මූල්‍ය ආදායම සඳහා ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී.

ණය සහ ණයකර සඳහා වන පොලී වියදම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල විනිමය ලාභ/අලාභ, ණය පරිවර්තනය සහ තැන්පතු පරිවර්තනය වලින් සමන්විත මූල්‍ය පිරිවැය, වසර තුළ පැවති විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් බෙහෙවින් බලපෑමට ලක්විය. 2021 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 506 ට සාපේක්ෂව, 2022 වසරේදී මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 12,409ක් ලෙස වාර්තා විය. අනෙකුත් මුදල් ඒකකවලට සාපේක්ෂව, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමානය වීම හේතුවෙන් සැලකිය යුතු විනිමය අලාභයන් ඇති කරන ලදී. 2022 වසරේදී ශුද්ධ මූල්‍ය පිරිවැය මිලියන 6,272ක් වූ අතර, 2021 වසරේදී ශුද්ධ මූල්‍ය ආදායම මිලියන 2,815ක් විය. මෙම ප්‍රතිඵලය, රුපියල් මිලියන 6,433ක බදු පෙර ලාභයක් වාර්තා කරමින් සමාගමට දායකත්වයක් සැපයූ අතර, එය පෙර වර්ෂයේ රුපියල් මිලියන 961ක බදු පෙර අලාභයට සාපේක්ෂව 769%ක සැලකිය යුතු වර්ධනයක් විය. ඒ අනුව, ආදායම් බදු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමෙන් පසු, 2021 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 2,084ක ශුද්ධ අලාභයට සාපේක්ෂව, 2022 වර්ෂය සඳහා සමාගමේ බදු පසු ලාභය රුපියල් මිලියන 4,803 ලෙස වාර්තා විය.



මෙහෙයුම් වියදම්

කාර්යමණ්ඩල පිරිවැය, පරිපාලනය සහ ස්ථාපිත කිරීම, අලුත්වැඩියා සහ නඩත්තු වියදම්, සහ ක්ෂයවීම් වියදම් යන සංරචකයන්ගෙන් ගු.ගු.සේ.ස හි මෙහෙයුම් වියදම් සමන්විත වේ.

සමාලෝචනය කරනු ලබන වසර තුළ, ගු.ගු.සේ.ස හි සමස්ත මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 14,941 දක්වා වර්ධනය විය. එය පසුගිය වසරෙහි වූ රුපියල් මිලියන 11,654ට සාපේක්ෂව 28%ක පිරිවැය වර්ධනයකි. පුද්ගයින් මූලික කරගත් මෙහෙයුම් කාර්යසාධනයක් පවත්වා ගනිමින්, කාර්යමණ්ඩල පිරිවැය මුළු මෙහෙයුම් පිරිවැයෙන් ආසන්න වශයෙන් 67%ක් සඳහා දායක වේ. එබැවින් පසුගිය වසරට සාපේක්ෂව 33%ක වර්ධනයක් කාර්ය මණ්ඩල පිරිවැයෙහි පෙන්නුම් කරයි.



	2021	2022
කාර්යමණ්ඩල පිරිවැය	64%	67%
ණයගැතියන්ගේ අපහායනය සඳහා ප්‍රතිපාදන	-5%	1%
අලුත්වැඩියා සහ නඩත්තු	3%	3%
විදුලි වියදම්	7%	6%
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය	23%	16%
වෙනත් වියදම්	8%	7%

ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම

ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම යනු පොලී ආදායම, මෙහෙයුම් මත පොලී වියදම සහ විනිමය ලාභ/(අලාභ), ණය සහ ස්ථාවර තැන්පතු පරිවර්තනය සහ විදේශ ව්‍යවහාර මුදල් වලින් දැක්වෙන වෙනත් පරිවර්තනයන් හි ශුද්ධ ප්‍රතිඵලයයි. පහත වගුවේ දක්වා ඇති පරිදි, ඇමරිකානු ඩොලරය, යුරෝ සහ ජපන් යෙන් වැනි මුදල් ඒකක වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සැලකිය යුතු විනිමය අලාභයක් සඳහා තුඩ දුන් අතර, ශුද්ධ මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 6,277ක් ලෙස වසර අවසානය සමාප්ත කරමින් පිරිවැය අංශයට බලපෑම් ඇති කරන ලදී. ණය පරිවර්තන ආලාභ සහ ඇමරිකානු ඩොලර් ස්ථාවර තැන්පතු පරිවර්තන ලාභ හේතුවෙන් ඇති වූ ශුද්ධ ආලාභ හේතුවෙන්, පසුගිය වසරේ රුපියල් මිලියන 2,815ට සාපේක්ෂව වසර තුළ ශුද්ධ මූල්‍ය ආදායම රුපියල් මිලියන ඍණ 6,272 දක්වා පහත වැටෙන ලදී.

	රු. මිලියන	
	2022	2021
මූල්‍ය ආදායම	6,137	3,321
ණය පොලී	(1,854)	(1,140)
ණය පරිවර්තන මත විනිමය ලාභය/(ආලාභ)	(43,977)	(2,141)
ස්ථාවර තැන්පතු පරිවර්තනය මත විනිමය ලාභ/(අලාභය)	33,422	2,775
ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම	**(6,272)**	**2,815**



විනිමය අනුපාත

ශ්‍රී ලංකා රුපියල පසුගිය වසරට සාපේක්ෂව 83%කින් අවප්‍රමාණය වූ අතර, 2022 වසර අවසානයේදී ශ්‍රී ලංකා රුපියල් 372/- ඇමෙරිකානු ඩොලරය (විකුණුම් අනුපාතය) දක්වා වැඩි විය. රුපියල තවදුරටත් අවප්‍රමාණය වීම වැළැක්වීම සඳහා මහ බැංකුව විසින් ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල රඳවා ගැනීම හේතුවෙන් අපනයන ඉපැයීම් සහ සහ වාණිජ බැංකු හරහා මෙරටට එන ශ්‍රමික ප්‍රේෂණ පහත වැටීම හේතුවෙන් ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ විකුණුම් අනුපාතය දිගින් දිගටම අවප්‍රමාණය විය. එමෙන්ම ජපන් යෙන් සහ යුරෝ වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල පිළිවෙළින් 58% සහ 71% කින් අවප්‍රමාණය විය.



මූල්‍ය තත්ත්වය

වත්කම්

2022 දෙසැම්බර් 31 වන දිනට, සමාගමේ මූල්‍ය තත්ත්වය රුපියල් මිලියන 179,530ක් වූ අතර, එය මූල්‍ය වර්ෂයේ ආරම්භයේදී වාර්තා කළ රුපියල් මිලියන 126,844ට සාපේක්ෂව 42%ක සැලකිය යුතු වර්ධනයක් ලෙස සැලකේ. මෙම වර්ධන ප්‍රවණතාවය ප්‍රධාන වශයෙන් ඇමරිකානු ඩොලර් වලින් පවතින කෙටි කාලීන ස්ථාවර තැන්පතු වර්ධනය නිසාවෙන් ඇති විය. එය පසුගිය වසරෙහි වූ රුපියල් මිලියන 39,544 සමඟ සැසඳීමේ දී, මෙම වසරේ දී රුපියල් මිලියන 75,143ක් විය. මීට අමතරව, නොනිමි ප්‍රාග්ධන සහ දිගු කාලීන බැංකු තැන්පතුවල අගය පිළිවෙලින් රුපියල් මිලියන 36,697ක් සහ රුපියල් මිලියන 6,962ක් ලෙස සමාගමේ මුළු වත්කම් පදනම ඉහළ නැංවීමට දායක විය.



වගකීම්

සමස්ත වගකීම් රුපියල් මිලියන 48,743කින් වර්ධනය වූ අතර, එය විශේෂයෙන්ම ඇමරිකානු ඩොලරය, යෙන් සහ යුරෝ වලට සාපේක්ෂව රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන්, රුපියල් වලින් දක්වා ඇති අවසාන ණය ශේෂයන් හි වර්ධනයන් හේතුවෙන් සිදු විය.

කාරක ප්‍රාග්ධනය

2022 මූල්‍ය වසර සඳහා ගිණුම් නිම කිරීමේදී, ගු.ගු.සේ.ස හි ජංගම වත්කම් සහ වගකීම් පිළිවෙලින් රුපියල් මිලියන 89,740 සහ රුපියල් මිලියන 21,194ක් විය. ඒ අනුව ශුද්ධ කාරක ප්‍රාග්ධන ශේෂය රුපියල් මිලියන 68,545ක් විය. පසුගිය වසරේ ශේෂයට වඩා 74%ක ධනාත්මක වර්ධනය ඔස්සේ සමාගමේ වර්තමාන මෙහෙයුම් සඳහා අරමුදල් සැපයීමේ හැකියාව සහ අනාගත වර්ධනය සඳහා ආයෝජනය කිරීමේ හැකියාව නිරූපණය කරනු ලබයි. වර්ධනය වූ කෙටි කාලීන බැංකු තැන්පතු සඳහා වූ රුපියල් මිලියන 36,510ක ශුද්ධ බලපෑම සහ විදේශ ණයවල කෙටි කාලීන කොටස මෙම වර්ධනය සඳහා මූලිකව හේතු විය.



ණය සහ ප්‍රාග්ධන ව්‍යුහය

2022 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ සමස්ත ණය ලබා ගැනීම් රුපියල් මිලියන 110,273 වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 60%ක වර්ධනයකි.

සමාගම විසින් විදේශීය ණය සහ දේශීය ණය සඳහා ප්‍රාග්ධන ආපසු ගෙවීම පිළිවෙලින් රුපියල් මිලියන 4,706ක් සහ රුපියල් මිලියන 267ක් ලෙස සිදු කර ඇත. විදේශ මුදල් ණය ලබා ගැනීම රුපියල් මිලියන 2,544ක් ලෙස වාර්තා විය. එය "බ.ජා.ගු සංවර්ධන ව්‍යාපෘතිය II වන අවධිය 2 වන අදියර" සඳහා පහසුකම් සැලසීම සඳහා විය. සලකා බලන වර්ෂය තුළදී දේශීය ණය කිසිවක් ලබා ගෙන නොමැත.

2022 දෙසැම්බර් 31 වන විට, කොටස්හිමියන්ගේ අරමුදල් සහ හිමිකම් සමාගමේ මුළු වත්කම් පදනම වන රුපියල් මිලියන 179,530න් 25%ක් ද, ජංගම නොවන වගකීම් 63% ක් ද, ජංගම වගකීම් 12%ක් ද විය.

සමාලෝචනය කරනු ලබන මූල්‍ය වර්ෂයේ ආරම්භය සමඟ සසඳන විට, ප්‍රාග්ධන ව්‍යුහයේ ණය කාණ්ඩයේ 8%ක සුළු වර්ධනයක් දැකගත හැකි විය.



මුදල් ප්‍රවාහය

පසුගිය වසරේ රුපියල් මිලියන 715ක මුදල් ගලා යෑමට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය තුළදී මෙහෙයුම් ක්‍රියාකාරකම් වල රුපියල් මිලියන 14,577ක ශුද්ධ මූල්‍ය ගලා ඒමක් වාර්තා කරන ලදී. මෙම ධනාත්මක තත්ත්වයට හේතු වූ ප්‍රධාන උපයෝගී සාධකය ලෙස, වසර තුළ ශුද්ධ ලාභයේ වර්ධනය සහ විදේශ ණය සහ ස්ථාවර තැන්පතු පරිවර්තන මත ශුද්ධ විනිමය අලාභය සඳහා ගැළපීම දැක්විය හැකිය.

ප්‍රධාන වශයෙන් දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම අඩුවීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ශුද්ධ මුදල් ප්‍රවාහය 24%කින් අඩු විය. එමෙන්ම මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය පෙර වසරට සාපේක්ෂව 119%ක පහත වැටීමක් පෙන්නුම් කර ඇත. මේ සඳහා පසුගිය වසරට සාපේක්ෂව ණය ලැබීම් අඩුවීම හේතු වී ඇත. ඉහත සඳහන් කළ හේතූන් මත කාල සීමාව අවසානයේ දී මුදල් හා මුදල් හා සමාන දෑ රුපියල් මිලියන 642ක් ලෙස දක්වමින් 56%කින් වර්ධනය විය.

මූල්‍ය සමාලෝචනය

ප්‍රාග්ධන කළමනාකරණය

සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය කළමනාකරණය කිරීමේ මූලික අරමුණ වනුයේ, අවම ප්‍රාග්ධන පිරිවැයක් ළඟා කරගැනීමට ඵලදායී ණය සහ හිමිකම් සංකලනයක් පවත්වා ගැනීම මෙන්ම, මූල්‍ය නම්‍යශීලීභාවය රඳවා ගැනීමේ යෝග්‍යතාවය සැලකිල්ලට ගනිමින් ව්‍යාපාරික අවස්ථා ගවේෂණ සහ මූල්‍ය ගලනය සඳහා කොවිඩ්-19 වසංගත තත්ත්වය වැනි අනපේක්ෂිත සිදුවීම්වල බලපෑම අවම කිරීමට ද්‍රවශීලතාවයට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා ගැනීම වේ.

සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහය අධ්‍යක්ෂවරුන් විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර, ආර්ථික තත්ත්වයන්, ව්‍යාපාර උපායමාර්ගයන් සහ ඉදිරි වගකීම් නිරූපණය වන පරිදි වෙනස්කම් සිදු කරනු ලබයි. ප්‍රාග්ධන කළමනාකරණයේ ප්‍රධාන කාණ්ඩ 4 වනුයේ, කාරක ප්‍රාග්ධනය, ණය, හිමිකම් සහ වෙළඳ ප්‍රාග්ධන වේ. අදාළ වර්ෂය තුළදී, සමාගම විසින් සියලුම ආකාරයේ ප්‍රාග්ධනය සම්පත් ශක්තිමත් ආකාරයකින් කළමනාකණයකොට ඇත. කෙසේවෙතත්, 2022 අප්‍රේල් මාසයේදී "ශ්‍රී ලංකාවේ බාහිර රාජ්‍ය ණය සේවා සම්බන්ධ අතුරු ප්‍රතිපත්ති" යන මාතෘකාව යටතේ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද විශේෂ ලිපිය හේතුවෙන් එහි ණය ප්‍රාග්ධන කළමනාකරණය තරමක් බාධාකාරී විය. ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් ලබාගෙන ඇති විදේශ ණය පියවා නොගන්නා ලෙසට උපදෙස් දෙන ලදී. එබැවින් අදාළ වර්ෂය තුළ ණය වාරිකය නියමිත පරිදි ගෙවා නොමැත.

අගය එකතු කිරීමේ ප්‍රකාශය

	2022 රුපියල් 000	%	2021 රුපියල් 000	%
ආදායම	26,006,396		7,386,170	
වෙනත් ආදායම්	1,640,401		492,782	
මූල්‍ය ආදායම	6,136,674		3,321,110	
ආයුගණක උපකල්පනයේ වෙනස්කම් මත ඇතිවන ලාභය/(අලාභය)	(278,211)		667,426	
	33,505,260		11,867,489	
පරිපාලන සහ ආයතනික වියදම්	(2,579,345)		(1,509,513)	
අගය එකතු කිරීම	**30,925,915**		**10,357,976**	

එකතු කළ අගයේ ව්‍යාප්තිය

සේවකයින් හට	වැටුප් සහ ප්‍රතිලාභ	9,995,360	32%	7,496,875	72%
රජයට	බදු	877,224	3%	-	0%
කොටස් හිමියන්ට	ලාභාංශ	500,000	2%	-	0%
ණය ප්‍රාග්ධනය සපයන්නන්ට	පොලී	1,854,365	6%	1,140,366	11%
ව්‍යාපාරය තුළ රඳවා ගැනීම්	ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය	2,366,794	8%	2,648,419	26%
ව්‍යාපාරය තුළ රඳවා ගැනීම්	සංචිත	15,332,172	49%	(927,685)	-9%
		30,925,915	**100%**	**10,357,976**	**100%**

එකතු කළ අගයේ ව්‍යාප්තිය



මානව සම්පත් කළමනාකරණය



මානව ප්‍රාග්ධනය, ව්‍යාපාරික ආයතනයක ඉපැයීමේ විභවය, ඵලදායීතාවය සහ දිගුකාලීන තිරසාරත්වය සඳහා මූලික දායකත්වයක් සපයනු ලබන්නකි. එය ව්‍යාපාර කටයුතු සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස ගු.ගු.සේ.ස විසින් සලකනු ලබයි. ඒ අනුව, සමාගම විසින් සාර්ථකත්වය ළඟා කරගැනීමට සේවකයින්ගේ කුසලතා, ශක්‍යතා, දක්ෂතා සහ ඵලදායීතාවය සංවර්ධනය කිරීම වැදගත් කොට සලකනු ලබයි. එමෙන්ම සමාගම විසින් නව දක්ෂතා ආකර්ෂණය කර ගැනීම, දක්ෂයින් රඳවා තබා ගැනීම සහ අභිප්‍රේරණය කිරීම සඳහා මූලික වැදගත්කමක් ලබා දෙන අතර, සේවකයින් සහ සමාගම වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කරමින්, සේවක ඵලදායීතාවය සහ තෘප්තිය වැඩිදියුණු කරනු ලබයි.

නිරන්තර සහභාගීත්වය සහ හවුල් වටිනාකමක් නිර්මාණය කිරීම සහතික කිරීම තුළින් සමාගමේ තිරසාර වර්ධනයට දායකත්වය සපයන සුවිශේෂී විවිධත්වයකින් යුතු සේවකයින් 3,854 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් (2022 වන විට) ගු.ගු.සේ.ස. සතු වේ. 'විශිෂ්ට සේවා ස්ථානයක්' ලෙස පිළිගැනීම ඇතුළුව ගු.ගු.සේ.ස. හි වසර 40ක කීර්තිමත් සේවා කාලය සමාගම වෙත වෙළඳපොළේ පවතින හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට හේතු විය.

මානව සම්පත් සැලසුම්කරණය සහ මූලාශ්‍රකරණය

සේවකයින් බඳවා ගැනීම පිළිබඳ රජය විසින් පනවන ලද සීමාවන්, සේවක ඉල්ලා අස්වීම්, රජය විසින් විදෙස් රැකියා සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ සේවකයින්ගේ විශ්‍රාමික වයස වෙනස් කිරීමට රජය විසින් ගන්නා ලද තීරණ, 2022 වර්ෂයේදී අප විසින් මුහුණ දෙන ලද අභියෝගයන් වේ. 2022 වර්ෂය තුළදී සමස්ත සේවක පිරිවැටුම වූ 188 ට සාපේක්ෂව, තීරණාත්මක මෙහෙයුම් තනතුරුවල බාහිර බඳවා ගැනීම් නව සේවකයින් 61 දෙනෙකුට පමණක් සීමා විය.

ඉහළ තනතුරු හි ඇති වූ සේවක පුරප්පාඩු හේතුවෙන් මානව සම්පත් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම අභියෝගාත්මක විය. එමනිසා රැකියා උසස් කිරීම් නිසා ඇති වන පුරප්පාඩු තනතුරු කළමනාකරණය මහත් ගැටලුකාරී විය.

සුමට මෙහෙයුම් ක්‍රියාවලියක් සඳහා සියලුම ගුවන්තොටුපළවල් අත්‍යවශ්‍ය ශ්‍රම බලකායකින් සමන්විත බව සහතික කිරීම සඳහා පවතින සම්පත් සමඟ කටයුතු කිරීමට මානව සම්පත් කණ්ඩායම විසින් විවිධ මූලපිරීම් අනුගමනය කරන ලදී.

කෙසේ වෙතත්, සමාලෝචනය කරන ලද වර්ෂය තුළ, විවිධ මූලාශ්‍ර ඔස්සේ පහත දැක්වෙන දක්ෂතා අත්පත් කරගැනීමට මානව සම්පත් කළමනාකරණ අංශය කටයුතු කර ඇත.

සේවක වර්ගීකරණය අනුව බඳවා ගැනීම් සහ උසස්කිරීම් හි ව්‍යාප්තිය පහතින් දැක්වේ.

උසස්කිරීම්/බඳවා ගැනීම් - 2022



සේවක වර්ගීකරණය අනුව බඳවා ගැනීම් සහ උසස්කිරීම්



සේවක කාණ්ඩයන් වෙත බාහිර බඳවා ගැනීම් හි ව්‍යාප්තිය පහතින් දැක්වේ.

2022 දෙසැම්බර් 31 දිනට සමස්ත ශ්‍රම බලකාය පහත පරිදි වේ.

බාහිර බඳවා ගැනීම් වර්ගීකරණය



සේවක වර්ගීකරණය අනුව සමස්ත සේවක සංඛ්‍යාව



ස්ත්‍රී/පුරුෂභාවය අනුව සේවකයින් වර්ගීකරණය





මානව සම්පත් සංවර්ධනය

මානව සම්පත් සංවර්ධනය යනු මානව සම්පත් කළමනාකරණයේ ඉතා වැදගත් අංගයකි.

ගු.ගු.සේ.ස. විසින් වසංගත කාලය, ඉන්ධන සහ මූල්‍ය අර්බුදය හමුවේ මුහුණ දෙන ලද අභියෝග මධ්‍යයේ වුවද, සේවකයින් සඳහා අවශ්‍ය දැනුම ලබා දීම සහ ඔවුන්ගේ විභවතා හඳුනා ගැනීම සහතික කිරීමට පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම් අඛණ්ඩව සිදු කරන ලදී.

2022 වර්ෂයේදී මුහුණ දෙන ලද අභියෝගයන්ට අවධානය යොමු කරමින්, සේවක රැකියා අභිවර්ධනයට සම අවස්ථාවක් ලබා දෙමින්, 2022 වර්ෂය සඳහා වෙන් කළ දේශීය පුහුණු ප්‍රතිපාදන ඉක්මවා යාමට මානව සම්පත් සංවර්ධන අංශයට හැකි විය. වසර තුළදී දේශීය වශයෙන් සේවකයින් 844 දෙනෙකුද, ජාත්‍යන්තර වශයෙන් සේවකයින් 46 දෙනෙකුද පුහුණු කරන ලදී.

තවද, සේවකයින් 116 දෙනෙකු පුහුණු කිරීම සඳහා රත්මලාන ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන්සේවා පුහුණු ආයතනය සමඟ කටයුතු කිරීමට අපි සමත් වීමු. ආයතනික සමාජ වගකීම් හි අංගයක් ලෙස, විවිධ විශ්වවිද්‍යාල සහ පුහුණු ආයතනයන් හි සිසුන් හට කාර්මික පුහුණු කිරීම් අවස්ථා 116 ක් පිරිනමන ලදී.

විශාල පුහුණු කණ්ඩායම් සඳහා අවසර නොමැති හෙයින්, වසරේ මුල් කාර්තුවේදී භෞතික පුහුණුව සීමිත විය. මෙම ගැටලුවට විසඳුමක් ලෙස අතථ්‍ය පුහුණු අවස්ථාවන් ආරම්භ කළ අතර, එය ගු.ගු.සේ.ස. හි කාර්ය මණ්ඩලයේ වෘත්තිමය සංවර්ධනයන් වැඩිදියුණු කිරීමට දායකත්වයක් ලබා දෙන ලදී.

සලකා බලනු ලබන කාල රාමුව තුළදී රුපියල් 40,683,552ක් වියදමක් දරමින් පුහුණු පැය 47,077ක සම්පූර්ණ කිරීම සහ නව 'සාමාන්‍ය' තත්වයට හැඩගැසීම පහසු කාර්යයක් නොවීය. වෘත්තීය ප්‍රගතිය සඳහා සපුරාලිය යුතු NVQ මට්ටමේ සහතික සංවර්ධනය කිරීම සඳහා වැදගත් වූ ශිල්පීය මට්ටමේ පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම වසර තුළ සිදු වූ තවත් වැදගත් කාර්යයකි. මීට අමතරව, කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ-රත්මලාන සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළවල මෙහෙයුම් සඳහා සහය වීමට විශේෂිත බිම් හැසිරවීමේ පුහුණු වැඩසටහන්ද සංවිධානය කරන ලදී.

සේවකයින්ගේ වත්මන් රැකියාවට අමතරව, ඔවුන්ගේ විවිධ කුසලතා හඳුනාගැනීමට සමාගම විසින් විශේෂ කුසලතා සංවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇති අතර, ඒවා සමාගමේ සාර්ථකත්වය උදෙසා ප්‍රශස්ත ලෙස සහ ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා සුදුසු පරිදි යොදා ගෙන ඇත. බඳවාගැනීම් සීමා කිරීම් හේතුවෙන් මිනිස් ශ්‍රමයේ පවතින හිඟය පියවා ගැනීම සඳහා මෙය විකල්ප විසඳුමක් ද විය.

මානව සම්පත් තොරතුරු සහ කාර්යසාධන කළමනාකරණය

ගු.ගු.සේ.ස. හි කාර්යසාධන කළමනාකරණ පද්ධතිය සමාගමේ ව්‍යාපාර අරමුණු වලට අනුකූල වේ. ගු.ගු.සේ.ස. හි කාර්යසාධන කළමනාකරණ පද්ධතියේ අරමුණ වනුයේ සමාගමේ ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගනිමින්, ගු.ගු.සේ.ස. හි සියලු සේවකයින්ගේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමයි. කාර්යසාධන ප්‍රතිඵල, පුහුණු සහ සංවර්ධන අවස්ථාවන්, රැකියා සංවර්ධන අවස්ථා සහ සාර්ථකත්ව සැලසුම් ප්‍රතිපාදනය සමඟ සබැඳේ. එය කාර්යසාධන පරතරයන්, පුහුණු අවශ්‍යතා, ප්‍රවර්ධන සහ පාරිතෝෂික හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලබයි.

ගු.ගු.සේ.ස. හි සේවකයින්ගේ කාර්යසාධනය මැනීම සඳහා දැනට කාර්යසාධන කළමනාකරණ පද්ධති දෙකක් යොදා ගනු ලබයි.

කාර්යසාධන කළමනාකරණ සහ සංවර්ධන පද්ධතිය (PMDS)

- PMDS යටතේ, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ කළමනාකරණ මට්ටම යටතේ වර්ගීකරණය කරන ලද නිලධාරීන් රැකියාවේ අරමුණු සහ චර්යාත්මක නිපුණතා පිළිබඳ ප්‍රමිතීන් සපුරාලීම මත ඇගයීමට ලක් කෙරේ.

180° තක්සේරු පද්ධතිය

- සෙසු සියලුම කාර්යමණ්ඩල තක්සේරු කිරීම්, 180° තක්සේරු පද්ධතිය යොදා ගනිමින් සිදු කරනු ලබයි. මෙම කාර්යසාධන කළමනාකරණ පද්ධතිය යටතේ සේවකයින්ගේ වෘත්තීය දැනුම, කුසලතා සහ ආකල්ප ඇගයීමට ලක් කෙරේ.

කාර්යසාධන කළමනාකරණ පද්ධති හරහා සමස්ත සේවක සංඛ්‍යාව 3,889ක් ඇගයීමට ලක් කළ අතර, 2022 වර්ෂය තුළදී කාර්යසාධනය මත ඔවුන්ගේ වාර්ෂික වර්ධක ප්‍රදානය කරන ලදී.

සේවයේ නියැලීමෙන් බැහැරවීම

පෙර වසර සමඟ සසඳන කළ, 2022 වසර තුළදී සේවයේ නියැලීමෙන් බැහැරවීම් සැලකිය යුතු ලෙස වර්ධනය විය. විශ්‍රාම ගැනීමේ වයස් සීමාව පිළිබඳ රජය විසින් පනවන ලද ප්‍රතිපත්තිය මේ සඳහා බලපාන ලද අතර, සමාජ ආර්ථික පරිසරයේ අභියෝගයන් හමුවේ වූ ඉල්ලා අස්වීම් සහ කලින් විශ්‍රාම ගැනීම ඉහළ යාම, මේ සඳහා බලපාන ලදී.

සේවක ඇගයීම් - 2022 වර්ෂය



සේවයේ නියැලීමෙන් බැහැරවීම - 2022 වර්ෂය



ඵලදායී සුබසාධන ක්‍රියාකාරකම් තුළින් මානව සම්පත් හි යහපැවැත්ම ගොඩනැංවීම

සමාගම වෙහි ව්‍යාපාරික අරමුණු කරා ගෙන යනු ලබන සේවකයින් නඟා සිටුවීම සහ පවත්වාගෙන යාම මානව සම්පත් අංශයේ අනිවාර්ය අංගයකි.

ගු.ගු.සේ.ස. විසින් කාර්යමණ්ඩලය වෙත තම ජීවන තත්ත්වය නඟා සිටුවීම සහ උපරිම ඵලදායිතාවයක් ඇති කිරීම තුළින් ඔවුන් දිරිමත් කිරීමේ අරමුණ ඇතිව ආකර්ෂණීය පහසුකම් ලබා දෙමින් සහය ලබා දෙනු ලබයි. සේවකයින්ට යහපත් ප්‍රතිලාභ සහ පහසුකම් සැලසීම උදෙසා ප්‍රමුඛතාවයක් ලබා දීම අධික පිරිවැයක් වැයවෙන තීරණයක් වූවද, මෙම උපායමාර්ගවල දිගුකාලීන ප්‍රතිලාභ අතිමහත්ය. එය මනා කාර්යසාධනයක් සහ කුසලතා සහිත සේවකයින් රඳවා ගැනීමට සමාගමට උපකාරී වේ.

ගු.ගු.සේ.ස. සිය සේවකයින්ට පුළුල් වපසරියක පහසුකම් ලබා දෙන අතර, මේ සඳහා සමාගම් වෛද්‍ය යෝජනා ක්‍රමයක්, මරණ සඳහා පරිත්‍යාග යෝජනා ක්‍රමයක්, කාර්යමණ්ඩල ණය පහසුකම්, කාර්යමණ්ඩල ප්‍රවාහන පහසුකම්, නිවාඩු නිකේතන පහසුකම්, කාර්යමණ්ඩල නිල නිවාස පහසුකම්, නිවාස ණය සඳහා 5% පොලී ආපසු ගෙවීම සහ විදේශීය වන්දනා ගමන් සඳහා මූල්‍ය ආධාර, ක්‍රීඩා සහ විනෝදාස්වාද පහසුකම්, වාර්ෂික රැස්වීම් සහ වන්දනා ගමන් ඇතුළත් වේ. මෙම සුභසාධන ක්‍රියාකාරකම් මඟින් ව්‍යාපාර වර්ධනයට මඟ පෙන්වනු ලබන සහ ගු.ගු.සේ.ස. හි තරඟකාරිත්වය ඉහළ නංවනු ලබන සේවකයින් දිරිමත් කිරීම සහ අභිප්‍රේරණය කිරීම සිදු කරනු ලබයි.

සමාගමේ වෛද්‍ය යෝජනා ක්‍රමය

ගු.ගු.සේ.ස තුළ අද්විතීය සෞඛ්‍ය ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පවතින අතර එමඟින් සේවකයින් හට ගෘහස්ථව හෝ බාහිර සෞඛ්‍ය සේවා සපයන්නන්ගෙන් ප්‍රතිකාර ලබා ගත හැකිය. මෙම යෝජනා ක්‍රමය ස්ථිර සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ඒකක වෙත පිරිනමනු ලබයි. මෙම යෝජනා ක්‍රමය රුපියල් 150,000 සිට රුපියල් 350,000 දක්වා පරාසයක පවතින අතර, සේවකයින්ට තම අවශ්‍යතාවය අනුව තෝරා ගැනීමේ හැකියාව පවතී. දිවයින පුරා විසිරී ඇති ලියාපදිංචි රෝහල් 48කින් ණය පදනම මත තවදුරටත් ගෘහස්ථ සේවාව ලබා ගත හැකිය.

මරණ සඳහා පරිත්‍යාග

මෙම ක්‍රමය වසර 15කට වැඩි කාලයක් පුරාවට ගු.ගු.සේ.ස හි ක්‍රියාත්මක වේ. සියලුම ස්ථිර සේවකයන් හට මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ඇති අතර, මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා තම පවුලේ සාමාජිකයන් ද ඇතුළත් කර ගත හැකිය. ගු.ගු.සේ.ස විසින් 2022 වසර තුළ සාමාජිකයින් 297ක් සඳහා රුපියල් 15,425,000ක් ගෙවා ඇත.

කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රම

ස්ථිර සේවකයින් ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා අනුව ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි. ණය මුදල, වාර්ෂික පොලී අනුපාතය 4.2% කට යටත්ව රුපියල් 200,000ක් වන අතර උපරිම වසර හතරක කාලයක් තුළ ආපසු ගෙවිය හැකිය. 2022 වර්ෂයේදී මෙම ණය මුදල රුපියල් මිලියන 250ක් දක්වා දීර්ඝ කිරීමෙන් සේවකයන්ට ප්‍රතිලාභ හිමි විය.

කාර්ය මණ්ඩල ප්‍රවාහන පහසුකම්

විවිධ ස්ථානයන් හි සිට පැමිණෙන සේවකයින් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව සමාගම දැනුවත් වී ඇත. මෙම දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා සමාගම සේවකයින්හට කාර්යමණ්ඩල ප්‍රවාහන පහසුකමක් හඳුන්වා දී ඇත. ඉන්ධන අර්බුදය මධ්‍යයේ බ.ජා.ගු, කො.ජා.ගු.ර, ම.රා.ජා.ගු හි සේවකයින්ගේ භාවිතය සඳහා බස් රථ 27 ක් යොදවා ඇති අතර, බ.ජා.ගු සහ යා.ජා.ගු/ම.ජා.ගු අතර ප්‍රවාහන පහසුකම්ද සපයන ලදී.

කාර්ය මණ්ඩල නිල නිවාස

ආයතනයේ සේවකයින් සඳහා සීමිත කාර්යමණ්ඩල ඉඩපහසුකම් කටුනායක, අත්තිඩිය, මඩකලපුව, මත්තල ප්‍රදේශයන්හි සපයන ලද අතර යා.ජා.ගු හි කාර්ය මණ්ඩලය සඳහා කුලී පදනම මත නිවාස 9ක් ලබා දී ඇත.

නිවාඩු නිකේතන පහසුකම්

පිටුරුතලාගල නිවාඩු බංගලා පහසුකම් සහ කතරගම වන්දනාකරුවන්ගේ විවේක පහසුකම් සහන මිලකට ලබාදීම සිදු කරනු ලබයි. සේවකයින්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා නිවාඩු බංගලා දෙකෙහිම මෑතකදී ප්‍රතිසංස්කරණයන් සිදු කරන ලදී. තවද, පහසුව සඳහා, රියදුරන්ගේ විවේක ගැනීමේ පහසුකමද මෙම සංකීර්ණයට එකතු කරන ලදී.

නිවාස ණය 5% පොලී ආපසු ගෙවීම

ආයතනයේ වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා මෙම පහසුකම ලබා ගත හැකිය.

විදේශ වන්දනා ගමන් සඳහා මූල්‍ය ආධාර

බෞද්ධ, ක්‍රිස්තියානි හෝ මුස්ලිම් සමිති සංගම්වල සාමාජිකත්වය දරන සමාගමේ සියලුම ස්ථිර සේවකයන් මෙම පහසුකම ලබා ගැනීමට සුදුසුකම් ලබයි. සත්‍ය ගමන් වියදම් නොතකා වන්දනාව සඳහා විදෙස්ගතවීමේ පිරිවැය ආවරණය කිරීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවෙකුට 4.2% ක වාර්ෂික පොලියකට (මාසික වාරික 18 කින් අයකර ගනු ලැබේ) උපරිමය රු. 50,000 ක් දක්වා මුදලක් ලබා ගැනීමට හිමිකම් ඇත.

පුද්ගල අනතුරු රක්ෂණ ප්‍රතිපත්ති

සේවකයාගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ වටිනාකම හඳුනා ගනිමින් සමාගම සිය සියලුම සේවකයන් සඳහා පැය 24 පුරාවටම ආවරණය වන පෞද්ගලික අනතුරු රක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. සේවක කාණ්ඩය අනුව වන්දි සීමාවන් රුපියල් 550,000 සිට රුපියල් 2,200,000 දක්වා පරාසයක පවතී. මෙමඟින් ස්වභාවික මරණ ද ආවරණය කරයි.

මානව සම්පත් කළමනාකරණය

ක්ෂේත්‍රයේ සබඳතා සහ රැකියා ආශ්‍රිත ආක්ෂාව සහ සෞඛ්‍ය

වසංගතය ආරම්භ වීමත් සමඟ වසර කිහිපයක් පුරා සේවකයින් නිරතව සහ තෘප්තිමත්ව පවත්වා ගැනීම මානව සම්පත් අංශයේ විශිෂ්ට ප්‍රමුඛතාවයක් වී ඇත. 2022 වර්ෂය තුළදී යාන්ත්‍රණයේ සිදු වූ පසුබෑම හේතුවෙන් මෙය වඩාත් අභියෝගාත්මක විය. ආර්ථික අර්බුද කාලයකදී ඇතිවන, බාහිර බලපෑම හේතුවෙන් සේවක කාර්යසාධන මට්ටම සහ අභිප්‍රේරණය විවිධ විය හැකිය.

ගු.ගු.සේ.ස. ද මෙම අභියෝගයට මුහුණ දුන් අතර මෙම අවස්ථාව මැඩපවත්වා ගැනීමට අවස්ථාවන් සලකා බලන ලදී.

ඇඳිරිනීතිය පැනවීම, ඉන්ධන හිඟය සහ පොදු ප්‍රවාහනයේ ලුහුඬුකම් හේතුවෙන් ගු.ගු.සේ.ස. කාර්යමණ්ඩලය සේවයට වාර්තා කිරීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. සමාගමේ මෙහෙයුම් සහ සේවක සහභාගීත්වය වෙත බලපෑම අවම කිරීමට ගු.ගු.සේ.ස. විසින් ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ආරම්භ කරන ලද නිවසේ සිට රැකියා කටයුතු සිදු කිරීම (WFH) එලෙසම පවත්වා ගෙන යාම සහ ඉන්ධන හිඟය, පොදු ප්‍රවාහන ගැටළු සහ ඇඳිරි නීතිය පැනවූ දිනයන් හිදී ඇති වූ දුෂ්කරතා හේතුවෙන් සේවයට වාර්තා කිරීමේ අපහසුතාවලට පත් වූ සේවකයින් සඳහා වැටුප් සහිත විශේෂ නිවාඩු ලබා දීම සිදු කරන ලදී. එමෙන්ම, ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ප්‍රමාද වී සේවයට වාර්තා කිරීමට විශේෂ අනුමැතියක් ලබා දෙමින් එවැනි දුෂ්කරතා මධ්‍යයේ සේවකයින්ගේ පැමිණීම දිරිමත් කරන ලදී.

සේවකයින්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව

සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව (OSH) සහතික කිරීම, වර්ෂය තුළදී මානව සම්පත් අංශය විසින් නව්‍යකරණය කිරීමට කටයුතු කරනු ලබන තවත් වැදගත් අංශයකි. වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ක්‍රියාපටිපාටීන් නවීකරණය කිරීම සඳහා නව පියවරයන් ගෙන ඇති අතර, ක්‍රියාවට නැංවීමේ කටයුතු ඉදිරි වසර දක්වා සිදු කරනු ඇත.

වර්ධනය වන සංකීර්ණ ජීවන රටාව, ආර්ථික අර්බුදය, හේතුවෙන් සේවකයින් වෙත ලබා දෙන උපදේශන සේවා හි අවශ්‍යතාවය වැදගත් වී ඇත. සමාගමේ සේවකයින් සඳහා උපදේශන සේවා සතියකට වරක් සපයනු ලබයි. සේවකයින්ට භෞතිකව හමුවී හෝ දුරකතන මාර්ගයෙන් උපදේශන සේවා ලබා ගත හැකිය.

සංගම් පැවැත්වීමේ නිදහස

සේවකයින්ට සංගම්වල කටයුතු කිරීමට නිදහස ඇති බව ද වෘත්තීය සමිතියක්/සංගමයක් නියෝජනය කිරීමට ඔවුන්ට අයිතියක් ඇති බවද අපි හඳුනාගෙන ඇත්තෙමු. ගු.ගු.සේස. හි දේශපාලනික සබඳතා සහිත වෘත්තීය සමිති 5ක් සහ නියැලෙන වෘත්තීය පදනම් කරගත් සංගම් 26ක් ඇති අතර, අපි නිරන්තර සාකච්ජා ඔස්සේ ඔවුන් සමඟ සුහද සබඳතා පවත්වා ගන්නෙමු.



දළ විශ්ලේෂණය

සෙසු ව්‍යාපාර ආයතනයන්ට මෙන්, ගු.ගු.සේ.ස. සඳහා අවදානම් කළමනාකරණයේ ඉදිරි අරමුණු විග්‍රහ කිරීම අවදානම් සහගත වේ. දෛනික පදනම යටතේ අපගේ මඟීන්ට ඉතා උසස් අත්දැකීමක් පිරිනැමීම සහතික කිරීමට තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී, ඵලදායී අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය අංගයක් යැයි අපි තරයේ විශ්වාස කරන්නෙමු.

ශ්‍රී ලංකාව තුළ ගුවන්තොටුපළ මෙහෙයුම්කරු ලෙස, සුවිශේෂී ජාත්‍යන්තර අත්දැකීම් සමඟින් ඉහළ ගතිකත්වයකින් යුතු පරිසරයක අපි මෙහෙයුම් සිදු කරන්නෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමේ මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනය සඳහා පමණක් නොව රටේ ප්‍රතිරූපය සඳහා අවදානමක් ඇති කරනු ලබන විවිධාකාර අත්දැකීම් වලට අපි මුහුණපාන්නෙමු.

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ ප්‍රවේශය ඔස්සේ ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සමාගමේ අත්දැකීම් වර්ධනය කිරීමට අරමුණු කරනු ලබයි. ආයතනික පාලන රාමුවේ ප්‍රධාන පදනමක් වශයෙන් මෙම ක්‍රියාවලිය මඟින් එහි අදාළත්වය නිරූපණය කරන බැවින්, ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

ගු.ගු.සේ.ස. විසින් අවදානම් කළමනාකරණය ඔස්සේ පහත කරුණු සාක්ෂාත් කර ගැනීමට අරමුණු කරයි.

- විවිධාකාරයේ අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම.
- ආයතනික පරිසරයෙන් නව අවස්ථාවන් වලින් ප්‍රයෝජන ලබා ගනිමින් අනතුරුදායක තර්ජනයන් අවම කිරීම සහ/හෝ තුරන් කිරීම.
- සමාගමේ සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීමට සහය ලබා දීම.
- සමාගම තුළ අවදානම් පිළිබඳ සන්නිවේදනය සාර්ථකව කළමනාකරණය.
- රටේ ආර්ථිකය, සමාජය වෙත විශාල වශයෙන් සහ දිගු කාලීනව සහයෝගය දැක්වීමෙන් ගු.ගු.සේ.ස. හි නියම භූමිකාවන් වන මහජනතාවට යුක්තිය ඉටු කිරීම.

ගුවන් සේවා මෙහෙයුම් හි ප්‍රධාන අභියෝග

අපි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, සමස්තයක් වශයෙන් ව්‍යාපාර මඟින් මුහුණපානු ලබන අභියෝග සමඟ සටන් කිරීමට සහ අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමේ වඩාත් ව්‍යුහගත ක්‍රමවේදයක් ලෙස සලකන්නෙමු. බාහිර සාධක අනුව වෙනස් වීමෙන් පහත දැක්වෙන අභියෝග මඟින් අපගේ අවදානම් ව්‍යුහය සඳහා බලපෑම් ඇති කරනු ලබයි.

දේශීය ආර්ථික තත්ත්වයන්ට ඉහළ බලපෑම

බහුතරයක් ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා අවශ්‍ය යෙදවීම් දේශීය ආර්ථිකය මඟින් ලබා ගනී. එබැවින් දේශීයව ඇති වන සමාජ ආර්ථික පරිසරයේ සිදුවන ඕනෑම වෙනසක් සෘජුවම ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා මෙන්ම ගුවන්තොටුපළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනයටද බලපානු ලබයි.

ව්‍යාපාරික මෙහෙයුම් සඳහා බොහෝ ආර්ථික විචල්‍යයන් ඍණාත්මක තත්වයට පත් වූ දේශීය ආර්ථිකයේ ඩොලර් අර්බුදය හේතුවෙන්, 2022 වසරේදී අපි මේ සඳහා මුහුණ දෙන ලද්දෙමු. සිවිල් ගුවන්සේවා මෙහෙයුම් සඳහා ගුවන් යානා ඉන්ධන හිඟය, අධික මෙහෙයුම් පිරිවැය, නිරන්තරයෙන් විදුලිය විසන්ධි කිරීම හා ගුවන්සේවා වෘත්තිකයන් රට හැර යාම අහිතකර ලෙස බලපාන ලදී. තවද, ඒ හේතුවෙන් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අත්හිටවනු ලැබුණි.

● ඉහළ නඩත්තු පිරිවැය

පිරිවැය ව්‍යුහයේ විචල්‍ය පිරිවැයේ අඩු ප්‍රතිශතයට සාපේක්ෂව, ගුවන්තොටුපළ යටිතල පහසුකම් නඩත්තු කිරීමේදී විශාල ස්ථාවර පිරිවැයක් දැරීමට සිදු වීම, ඉහළ නඩත්තු පිරිවැය, රුපියල හායනයට ලක්වීම සහ ආර්ථික අර්බුදය හමුවේ ආනයනය සීමා කිරීම මඟින් මෙය තවදුරටත් අයහපත් තත්ත්වයට පත් විය.

● සීමිත ව්‍යාපාර වර්ගීකරණය

ගුවන්සේවා තුළ භෞතික සහ මානව සම්පත් මූලිකව පැවතිය යුතු බැවින් සෙසු කර්මාන්ත සමඟ සසඳන කළ ගුවන් කර්මාන්තයේ ව්‍යාපාර විවිධාංගිකරණය සඳහා ඇති ඉඩකඩ බෙහෙවින් අඩුය. මේ හේතුවෙන් විශේෂයෙන්ම ඉහත දක්වා ඇති ආකාරයේ බාහිර වෙනස්කම් හේතුවෙන් ගුවන් ගමන් සඳහා බලපෑමක් ඇති කරනු ලබන අවස්ථාවේදී ඉහළ සිට පහළ මෙන්ම පහළ සිට ඉහළ දක්වා මේ හරහා විශාල බලපෑමක් සිදු කරනු ලබයි.

නවතම පහසුකම් සහතික කිරීම

සේවා පදනම් කරගත් කර්මාන්තයක් ලෙස, සියලුම ගුවන්තොටුපළ පරිශීලකයින්ට සුවපහසු සහ උසස් ආගන්තුක අත්දැකීමක් සහතික කිරීම බෙහෙවින් වැදගත් වේ. මේ සඳහා කලාපයේ සෙසු ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් මෙන් ගුවන්තොටුපළ පහසුකම් සහ යටිතල පහසුකම් නඩත්තු කිරීම අවශ්‍ය වේ.

● සංචාරක කර්මාන්තයේ අස්ථිර ස්වාභාවය

ගුවන් සේවා, ගෝලීය ආර්ථික තත්ත්වය මෙන්ම, සීමා පැනවූ තත්ත්වයක සංචාරය සහ සංචාරක කර්මාන්තය අවම ප්‍රමුඛතාවක් බවට පත් වූ හෙයින් වෙනස්වීමේ අවදානමක් මත සංචාරක කර්මාන්තය දැඩි ලෙස රඳා පවතී.

● ගුවන් ගමන් සඳහා පිරිවැය-තරඟකාරිත්වය සහ ඉල්ලුම මත බලපෑම

දේශීය රාමුව තුළ පවතින උද්ධමනීය බලපෑම, ගිවිසුම්ගත ප්‍රාග්ධන ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් මිල ගණන් සහ සීමා සහිත සැපයුම්වල මිල ගණන් ඉහළ යාමට හේතු වේ. පිරිවැය ව්‍යුහය අනුව තරඟකාරිත්වයට තර්ජනයක් වන බැවින් මෙය ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා අහිතකර ලෙස බලපානු ලබයි. එමෙන්ම, ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ගුවන් යානා ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ගුවන් සමාගම් දුෂ්කරතාවයට මුහුණපානු ලබයි. එය ප්‍රවේශපත්‍ර මිල ඉහළ යාමට සහ ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම අඩුවීමට හේතු වනු ඇත.

වේගයෙන් වෙනස් වන තාක්ෂණය

ගුවන්තොටුපළ ක්‍රියාකරුවන් විසින් ගුවන්තොටුපළ සඳහා නවීන උපාංග හඳුන්වාදීම මඟින් වෙනස්වන තාක්ෂණය සඳහා බලපෑම් ඇති කරනු ලබයි. මෙමඟින් ගුවන්තොටුපළවල් අතර තරඟය තීව්‍ර කරන අතර නව තාක්ෂණය සඳහා ආයෝජනය කිරීමට පොළඹවනු ලබයි. කිසිදු හෝ අවම මිනිස් මැදිහත්වීමකින් භෞතික සබඳතාවයෙන් තොර ගුවන්තොටුපළ මෙහෙයුම් පවත්වා ගෙන යාම ළඟා කර ගැනීමට අපහසු ඉලක්කයක් බවට පත් වී ඇත.

● පාරිසරික බලපෑම

ගුවන්තොටුපළ මෙහෙයුම් වලින් සැලකිය යුතු පාරිසරික බලපෑමක් ඇති කරනු ලබයි. ගුවන්සමාගම් ගුවන් යානා වල කාබන් විමෝචනය සඳහා වගකිව යුතු අතර, ගුවන්තොටුපළවල් සඳහා මේ සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඇත. අවම කාබන් පියසටහන් පවත්වා ගැනීම අරමුණු කරගනිමින්, අවම ඉන්ධන පරිභෝජනයක් සහතික කිරීම සඳහා ගුවන් මාර්ග ව්‍යුහය ප්‍රශස්ත කිරීම කෙරෙහි ගුවන්තොටුපළ විශේෂයෙන් අවධානය යොමු කළ යුතුය.

නිසි ලෙස බැහැර කළ යුතු, සැලකිය යුතු අපද්‍රව්‍ය ප්‍රමාණයක් ගුවන්තොටුපළවල්හි පවතී. පාරිසරික මාර්ගෝපදේශ සහ හොඳම භාවිතයන්ට අනුකූලව මෙය සිදු කරන බව සහතික කිරීම ගු.ගු.සේ.ස. සඳහා ඉතා වැදගත් වේ. අප අපගේ පරිසර හිතකාමී අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් සනාථ කරමින්, මධ්‍යම පරිසර අධිකාරියෙන් සහ අනෙකුත් නියාමන ආයතනවලින් සහතික ලබා ගෙන ඇත.

දිගු කාලීන අභියෝග සහ අවම කිරීමේ මිනුම්

වෙනස් වන තාක්ෂණයට අනුවර්තනය වීම, තිරසාර බව සහතික කිරීම, ශක්‍යතා කළමනාකරණය සහ දක්ෂ ශ්‍රම බලකාය ආකර්ෂණය කර ගැනීම, ගු.ගු.සේ.ස. දිගු කාලීනව මුහුණ දෙන අභියෝග ලෙස අපි පුරෝකථනය කරමු.

තාක්ෂණික දියුණුව යනු වෙනස්වන තාක්ෂණය සමඟ ඉදිරියට යා යුතු අඛණ්ඩ ක්‍රියාවලියකි. පෙළඹීමිතික හඳුනාගැනීමේ පද්ධති භාවිතයෙන් සම්බන්ධතා රහිත මඟී පිරිසැකසුම් භාවිතය, ස්වයං-පරීක්ෂා කිරීම සහ ගමන්මලු ලබාදීම, ස්වයං ඇතුළුවීමේ ප්‍රවේශ සහ ජංගම ගෙවීම් ආදිය භාවිත කිරීම අනාගතයේදී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් මෙම පහසුකම් අපගේ ගුවන්තොටුපළ තුළද සැලසීම අත්‍යවශ්‍ය වේ. රටේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ ඇති වන බොහෝ අභියෝගයන් නොතකා ඉදිරි වසර පහ තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිතය. කෙසේවෙතත්, මෙමඟින් සයිබර් ආරක්ෂණ අවදානම් ඇති වන අතර ඒ පිළිබඳ ද සැලකිලිමත් විය යුතුය.

ලෝකය ක්‍රමක්‍රමයෙන් පරිසර හිතකාමී වෙමින් පවතී. මෙය අනාගතයේදී ගුවන් සමාගම්වල කාබන් මට්ටම ප්‍රශස්තව පවත්වා ගැනීම උදෙසා බලපෑම් කරනු ලබයි. ඒ අනුව, ඉදිරි දශක කිහිපය සඳහා කාබන් විමෝචනය අවම කිරීමේ ඉලක්ක සපුරාලීමට අපට සිදු වනු ඇත. එය ගු.ගු.සේ.ස. ආයතනික ඉලක්කයන්හි තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) අතරින් එකකි. ගුවන් මාර්ග ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ගොඩබිම් ක්‍රියාකාරකම් මත මෙන්ම කොළඹ ගුවන් තොරතුරු කලාපය තුළ කාබන් විමෝචනය අවම කිරීම සඳහා උපායමාර්ග සකස් කරනු ලබයි.

ලෝකයේ මඟී කිලෝමීටර් ප්‍රමාණයෙන් තුනෙන් එකක් ආසියානු කලාපයට අයත් වේ. මෙම පරිමාව වර්ධනය විය හැකිය. ඉහළ පරිමාවක් ඇති කලාපය තුළ පිහිටීම හේතුවෙන්, ශ්‍රී ලංකාවට ද මඟී ගමනාගමන වැඩිවීම් හරහා ප්‍රතිලාභ ලැබෙනු ඇත. ක්‍රියාවලි වෙනස්කම් සහ තාක්ෂණික වෙනස්වීම් සමඟින් අවසන් කිරීමට බලාපොරොත්තු වන දෙවන පරියන්තයේ ඉදිකිරීම් කටයුතු වර්තමානයේ තාවකාලිකව නතර කර ඇත.

අපගේ ගුවන්තොටුපළවල විශිෂ්ට ආගන්තුක අත්දැකීම රඳා පවතින්නේ, ඔවුන්ගේ ජනවිකාශ සාධක මත පදනම්ව අප පාරිභෝගික මනාපයන් කෙතරම් දුරට තේරුම් ගෙන ඇතිද යන්න මත

වේ. එය ගතික වන බැවින් අභියෝගාත්මක වේ. අපගේ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ (CRM) ක්‍රියාවලියට අඛණ්ඩ වෙනස්කම් හඳුන්වාදීමෙන්, මේ සමඟ කටයුතු කිරීමට අදහස් කෙරේ.

ඊට අමතරව ගු.ගු.සේ.ස.හි ආයතනික සැලසුම සංවර්ධනය කරන අවස්ථාවේදී, ඉහත අභියෝගයන් අවදානයට ලක් කරමින් ව්‍යාපෘති හි ප්‍රමුඛතාවය සිදු කරනු ලබයි.

ගු.ගු.සේ.ස. අවදානම් කළමනාකරණ රාමුව
අපගේ අවදානම් කළමනාකරණ රාමුව තුළ, උපද්‍රවයන් හඳුනාගැනීම, අසාර්ථකවීම් හඳුනාගැනීම සහ අහිතකර ප්‍රතිවිපාක හඳුනාගැනීම සිදු කරනු ලබයි. බාහිර පරිසරයේ වෙනස්වීම් හේතුවෙන් ඇති වන ධනාත්මක විවිලත්‍යයන් ප්‍රාග්ධනය කිරීම, එනම් ආදායම ඉහළ නැංවීම හෝ පිරිවැය අවම කිරීම හෝ දෙයාකාරයට පරිවර්තනය කිරීමට අවස්ථා හඳුනාගැනීම ඊට ඇතුළත් වේ.

අපගේ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය හරහා, අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලපෑහැකි අවස්ථා පිළිබඳ මනා දැනුවත් කිරීමක් සැපයීමට අප බලාපොරොත්තු වන්නෙමු.

අවදානම් හඳුනාගැනීම සහ ව්‍යාපාරයට ඉන් ඇති බලපෑම මත පදනම්ව, ගු.ගු.සේ.ස. හි අවදානම් පැතිකඩ සමඟ සැසඳීමෙන් එක් එක් විශේෂිත අවදානම හඳුනාගත යුතුද, විසඳුම් සැපයිය යුතුද යන්න පිළිබඳව අපි තීරණ ගන්නෙමු.

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් සඳහා අවදානම් වාර්තා කිරීම, අවදානම් සඳහා විසඳුම්, අවශේෂ වාර්තාකරණය සහ අධීක්ෂණය ඇතුළත් වේ.

පිළිගත හැකි මට්ටමකට අවදානම පාලනය කළ පසු, එය අඛණ්ඩව පාලනය කිරීම සහතික කිරීම සඳහා අවදානම නිරීක්ෂණය කළ යුතුය.

අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම
අවදානම් කළමනාකරණය සියලු ව්‍යාපාර වලදී සලකනු ලබන කාරණාවක් වන අතර, ව්‍යාපාරයේ සියලුම ක්ෂේත්‍රයන් සමඟ කළමනාකරණය කරමින්, සමස්ත ක්‍රියාවලිය මධ්‍යගතව අධීක්ෂණය කළ යුතුය. මෙම අරමුණ උදෙසා ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ වගකීම් උපායමාර්ගික කළමනාකරණ අංශය (SMD) යටතේ පවතී. උපායමාර්ගික කළමනාකරණ අංශය මඟින් සමාගමේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට කිසිදු බාධාවක් නොමැති බව සහතික කරමින්, සමාගම තුළ යෝග්‍ය අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් හඳුන්වාදීමට පියවර ගැනීමටත්, පවත්වා ගැනීමටත් වගකියනු ලැබේ. අවදානම් හඳුනාගැනීමේ අරමුණ සඳහා SWOT විශ්ලේෂණය, PESTEEL සහ පෝටර්ගේ පංච බලවේග වැනි මෙවලම් භාවිතයෙන්, උපායමාර්ගික සැලසුම් ක්‍රියාවලිය සඳහා බාහිර සහ අභ්‍යන්තර පරිසරය පිළිබඳ සැලකිලිමත්වීමද සිදු කරනු ලබයි. මෙය ඉහළ සිට පහළ සහ පහළ සිට ඉහළ යන ද්විත්ව ප්‍රවේශය යොදා ගනිමින් සමස්ත අංශ, සමස්ත මට්ටම් හි තොරතුරු විමසීම ඔස්සේ සිදු කරනු ලබයි.

තවද, සමාගමේ අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතිකකරණ අංශය (IA&QA) විසින් ඔවුන්ගේ සේවා විෂය පථය තුළ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් කාර්යයභාරයක් ඉටු කරනු ලබයි. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතිකකරණ අංශය විසින් විගණනය සිදු කළ යුතු අවදානම් ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමට එහි වාර්ෂික විගණන සැලසුම් සකස් කිරීමේදී, අවදානම් පුරෝකථනයක් සිදු කරනු ලබයි.

අවදානම් කළමනාකරණය සමඟ කටයුතු කිරීමට අවදානම් කළමනාකරණ කමිටුව (RMC) සහ සෙසු විධිමත් ක්‍රියාවලි
අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක්, අවදානම් කළමනාකරණ කමිටුව (RMC) පිහිටුවා ඇත. ඒවා ප්‍රධාන වශයෙන් ව්‍යාපාර අවදානම්, ආයතනික අවදානම් සහ ක්‍රියාකාරීත්වයේ අවදානම් සඳහා අවධානය යොමු කරනු ලබයි. ක්ෂේත්‍රයේ අවදානම මෙන්ම උපායමාර්ගික අවදානම නිසි ලෙස අධීක්ෂණය කොට ඇති අතර, ගු.ගු.සේ.ස. හි උපායමාර්ගික සැලසුම් කිරීමේ ක්‍රියාවලිය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය මට්ටමෙන් සාකච්ඡා කිරීමට අවදානම් ඇඟවීම් සහ නිර්දේශයන් සාකච්ඡා කිරීම හෝ යෝජනා කිරීම සිදු කරනු ලබයි.

අවදානම් ලැයිස්තුව, අවදානම් ඇති වීමේ හැකියාව සහ බරපතලකම හඳුනාගැනීමට මූලික වශයෙන් යොදා ගනු ලබයි. යෝජනා කරන ලද අවම කිරීමේ ක්‍රමවේදයන් සමඟින් එය සියලුම අංශ වල යාවත්කාලීන කරනු ලබන අතර උපායමාර්ගික කළමනාකරණ අංශය මඟින් මධ්‍යස්ථව මෙහෙයවනු ලබයි. පිළියම් නොකළ ඕනෑම අවදානමක් සහ ඒ ආශ්‍රිත ගැටලු අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඒ සඳහා සුදුසු තීරණ ගැනීමට යොමු කරනු ලබයි.

ව්‍යාපාර සඳහා බලපෑමක් ඇති මෙහෙයුම්, සැලසුම් සහ උපායමාර්ගික අවදානම් සාකච්ඡා කිරීමට සහ අවම කිරීම සඳහා සුදුසු විකල්පය තෝරා ගැනීමට ගු.ගු.සේ.ස. හි සියලුම අංශ නියෝජනය කරමින් අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. මෙම රැස්වීම් වලදී න්‍යාය පත්‍රයේ අවදානම් ක්ෂේත්‍ර කිහිපයක් සඳහන් කර ඇති බැවින් ඒවා විස්තරාත්මකව සහ ඵලදායී ලෙස සාකච්ඡා කළ හැකිය. කෙසේවෙතත් සහභාගීවන්නන් හට කාලෝචිත සහ බලපෑමක් ඇති අවදානම් පිළිබඳ න්‍යාය පත්‍රයට සීමා නොවී සාකච්ඡා කිරීමට අවසර ඇත. ඇතැම් උපායමාර්ගික අවදානම්, මානව සම්පත් කළමනාකරණ අවදානම් සහ තාක්ෂණයට අදාළ අවදානම් අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව මඟින්ද ඇඟයීමට ලක් කරනු ලබයි. මේ හරහා පවතින සියලුම අවස්ථා ඔස්සේ හේතුව සහ බලපෑම සලකා බලමින් අවම කර ගැනීමේ ක්‍රමවේදයන් ශක්තිමත් කර ගැනීමට සහය වේ.

එමෙන්ම, සමාගමේ ආරක්ෂණ ඒකකය මඟින් ගඟන යාත්‍රාංගණ ආරක්ෂාව පිළිබඳ කරුණු සොයා බලනු ලබයි. මෙය ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ මාර්ගෝපදේශ (ඇමුණුම 19) යටතේ සිදු කරයි. පවතින වෙනත් යාන්ත්‍රණ අතර සියළුම ගුවන්තොටුපළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන පහසුකම් සපයන කමිටු රැස්වීම් මේ අතර වේ. සියලුම අවදානම් සහ ගැටලු පිළිබඳ පැවසීමට සහ සාකච්ඡා කිරීමට සහ ඒවා සාමූහිකව විසඳීමට සියලු පාර්ශවකරුවන් හට සමාන අවස්ථාවක් ලබා දෙයි. ගුවන්සේවා ක්‍රියාකරුවන්ගේ කමිටුව (AOC) මඟින් ගුවන් සමාගම් සහ මඟින් විසින් මුහුණපානු ලබන ගැටලු සාකච්ඡා කරනු ලබන අතර, ගුවන්සේවා ආරක්ෂක කමිටුව ඔස්සේ සියලුම ගුවන්තොටුපළ වත්කම් මඟින් ආරක්ෂාව පිළිබඳ අවදානම් සහ පවතින අවදානම් සාකච්ඡා කරනු ලබයි. මෙම ක්‍රියාවලියන් සමාගමේ මෙහෙයුම් අවදානම් පැතිකඩයන් සමඟ කටයුතු සිදු කරන අතර ඒවා බාහිර පාර්ශවකරුවන් සමඟ සම්බන්ධවෙමින් සාකච්ඡා කරනු ලබයි. විගණන සහ කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය අවදානම් වලට අදාළ කුවිතාන්සි සහ ශේෂයන් පිළිබඳ කටයුතු කරනු ලබයි.

අවදානම් පුරෝකථනය
අවදානම් පුරෝකථනය පවතින අවදානම් හඳුනාගැනීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සමාගමේ අවදානම් පුරෝකථනය කරනු ලබන කාලසීමාව, ආයතනික සැලසුමේ කාල සීමාව මත පදනම් වේ. වර්තමානයේ එය අවුරුදු 3ක කාලසීමාවක් සඳහා සකස් කොට ඇත. පසුගිය වසර කිහිපය පුරා, ගු.ගු.සේ.ස. විසින් ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය (ACI) සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) වැනි ගුවන්සේවා වෘත්තීය ආයතන විසින් නිකුත්කොට ඇති පුරෝකථනයන්/ වෙනත් ප්‍රකාශනයක් මත (එනම්, ගුවන්යානා අංශය සඳහා ප්‍රදේශයේ හෝ රටේ දෘෂ්ටිය) බොහෝවිට රඳා පවතින අතර, ඉන් ගුවන්සේවා සහ සංචාරක ක්ෂේත්‍රයේ අනපේක්ෂිතතාවයන් සමඟ කටයුතු කිරීම අපේක්ෂා කරනු ලබයි..

අවදානම් කළමනාකරණය

මෙම අදියරේදී පහළ සිට ඉහළට සහ ඉහළ සිට පහළට සන්නිවේදන ක්‍රමවේදයක් ඔස්සේ සියලුම අංශවල සේවක සහභාගීත්වය යොදා ගනු ලබයි. අවදානම් හඳුනාගැනීම උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියේදී භාවිත කරනු ලබන්නක් වන අතර, සේවකයින්ගේ සහභාගීත්වය දිරිමත් කරනු ලබයි.

ගු.ගු.සේ.ස. පහත කරුණු සමඟින් අවදානම් හඳුනා ගනු ලබයි:

- උපායමාර්ගික සහ මෙහෙයුම් අවදානම්
- මානව සම්පත් අවදානම
- ආරක්ෂාව, සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ අවදානම
- මූල්‍ය අවදානම
- කීර්ති නාමය පිළිබඳ අවදානම
- නෛතික අවදානම

අවදානම් තක්සේරුව

කරුණු දෙකක් පාදක කරගනිමින් අවදානම් තක්සේරු කරනු ලබයි;

- අවදානම් ඇති වීමේ හැකියාව (සම්භාවිතාව)
- මෙම අවදානම් වල බලපෑම් හි බරපතලකම

ඉහත සියල්ල 1 සිට 5 දක්වා පරාසයක ලකුණු දක්වා ඇති අතර, අදාළ පරිදි 1 මඟින් අවම සම්භාවිතාවක් හෝ අවදානම අඩු බව දක්වන අතර 5 මඟින් ඉහළ හැකියාවක් දක්වනු ලබයි. ඉන්පසුව නිෂ්පාදනය ලබා ගැනීමට ඇති හැකියාව සහ බලපෑම සඳහා දක්වා ඇති අගයන් එකිනෙක ගුණ කරනු ලබයි. මෙම අගයන් 1-25 දක්වා පරාසයක් ඇති අතර, අවදානම් තක්සේරු ව්‍යුහයේ නියමිත ප්‍රදේශයේ දක්වා ඇත. 25 දක්වා ඇති අගයන් මඟින් සැලකිලිමත් අවදානයක් අවශ්‍ය තීරණාත්මක අවදානම් සහ ඒවා අවම කිරීමට වඩාත් ශක්තිමත් යාන්ත්‍රණයක් දක්වනු ලබයි.

අවදානම් තක්සේරු ව්‍යුහය

අපගේ අවදානම් ලැයිස්තුවේ හඳුනා ගන්නා ලද අවදානම් වර්ග 186 හඳුනාගන්නා ලද්දේ සම්භාවිතාව සහ බලපෑම යන මානයන් 2ක් පදනම් කරගනිමින් වන අතර, 2022 වසර සඳහා අවදානම් පැතිකඩේ ලකුණු ගණනය කොට ඇත. ඒ අනුව ව්‍යුහයේ නිශ්චිත කොටුවක දක්වා ඇති අවදානම් වර්ග පහත වගුව මඟින් දැක්වේ. තවද අඩු අගයන් වරහන් ඇතුළේ දක්වා ඇත.

සම්භාවිතාව / බලපෑම	කලාතුරකින් සිදු වන	සිදු වියනොහැකි	සම්භාවිතාවක් ඇති	සිදු වියහැකි	ස්ථිර ලෙස සිදුවිය හැකි
නොවැදගත්	1	2	3	4	5
අල්ප	2 (1)	4	6 (3)	8 (2)	10
මධ්‍යම	3 (1)	6 (1)	9 (16)	12	15 (3)
ඉහළ	4 (1)	8 (5)	12 (51)	16 (40)	20 (4)
උපරිම	5	10 (8)	15 (17)	20 (19)	25 (14)

සම්බවිතාව සහ බලපෑම විශ්ලේෂණය බොහෝ දුරට ගුණාත්මක විශ්ලේෂණයක් වන අතර, අදාළ අංශ සමඟින් වෘත්තීමය විශේෂඥයින් මේ සඳහා සම්බන්ධ කර ගනු ලබයි. එමෙන්ම, මූල්‍ය අවදානම් වැනි වෙනත් අවදානම් ද පවතී. එහිදී එවැනි සිදුවීම් වල අතීත රටාවන් සහ මූල්‍ය කොන්දේසී වල බලපෑම ගණනය කිරීම සලකා බලමින් සම්භාවිතාවක් ඇති සහ/හෝ බලපෑම/බලපෑම් ප්‍රමාණාත්මකව මනිනු ලැබේ.

හඳුනාගන්නා ලද සහ අවබෝධ කරගන්නා ලද ඇතැම් අවදානම් වලට අනුව, ප්‍රධාන කාර්ය දර්ශක කිහිපයක් අප හඳුනාගෙන ඇත. ඊට අමතරව අපි මූල්‍ය කාර්යසාධනය මැනීම සඳහා පාරිභෝගිකයාගේ තෘප්තිමත්භාවය, සේවකයින්ගේ තෘප්තිමත්භාවය හා ගුවන්යානා ආශ්‍රිත අනතුරු සහ සිදුවීම් ආදියට අදාළව සාමාගමේ කාර්යසාධනය මැන බලන්නෙමු. මෙමඟින් මෙම ක්ෂේත්‍රයන්හි විය හැකි අවදානම් හඳුනාගැනීමට හා අවම කරගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම මඟින් ඒවා විශ්ලේෂණය කිරීම පහසු කරවනු ලබයි.

පහත වගුව මඟින් පසුගිය වසර හතර සමඟ සංසන්දනය කරන විට සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන වෙනස්කම් පෙන්නුම් කරන ලද ප්‍රධාන අවදානම් ගෙනහැර දක්වනු ලබයි.

අවදානමේ ස්වාභාවය	ව්‍යාපාර සඳහා බලපෑම	අවදානම් අවම කිරීම	වර්ෂයන් පුරා අවදානම් පැතිකඩේ වෙනස්වීම				
			2022	2021	2020	2019	2018
ව්‍යාපාර මෙහෙයුම් බිඳ වැටීමේ අවදානම	ගුවන් සේවයේ ඉන්ධන සැපයීමේ අවිනිශ්චිතතාවය හමුවේ, වෙනත් රටවල් සඳහා පියාසැරිවල අපහසුතා ඇති වනු ඇත. එය අපගේ මෙහෙයුම් සඳහා අහිතකර වන හෙයින් ආදායමටද බලපානු ලබයි.	ගු.ගු.සේ.ස. විසින් අඛණ්ඩ ඉන්ධන සැපයුම සහතකික කිරීමට අදාළ රජයේ ආයතන සමඟ ගිවිස ගැනීම් ආරම්භ කරන ලදී. සුදුසු පරිදි නියමිත වේලාවට අදාළ NOTAM නිකුත් කිරීමට CAASL සමඟ සමීපව කටයුතු කිරීම	●	●	●	●	●
යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හි ප්‍රමාදයේ අවදානම	ශ්‍රී ලංකා රජය සියලු විදේශ ණය පැහැර හැරීම ප්‍රකාශ කිරීම හේතුවෙන් පර්යන්තය 02 සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ණය දෙනු ලබන ආයතනය විසින් ව්‍යාපෘතිය අත්හිටුවමින් ණය ලබා දීම නවත්වන ලදී. මෙඟින් පශ්චාත් කොවිඩ් වර්ධන හැකියාවට ඇති අවස්ථාවන් අවහිර කරනු ඇත.	ඇප ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාර්ථක සාකච්ඡාවල රජය දරන උත්සාහයන්, T2 ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අපගේ අරමුදල් සපයන ආයතනවලින් අරමුදල් නිකුත් කිරීම සහතික කරනු ඇත.	●	●	●	●	●
ආරක්ෂණ සහ සුරක්ෂිතතාව පිළිබඳ අවදානම	ගුවන්තොටුපළ මෙහෙයුම් වලදී මගී ආරක්ෂාව සහ සුරක්ෂිතතාව ප්‍රධාන වේ. එබැවින් මෙම කාරණා දේශීය සහ විදේශීය නියාමන මඟින් බෙහෙවින් පාලනය කරනු ලබයි. ගුවන් තොටුපළ මෙහෙයුම් හි දී ඕනෑම උල්ලංඝනයක් බරපතල ප්‍රතිවිපාක ඇති කරනු ලබයි.	ආරක්ෂාව සහ සුරක්ෂිතතාව පිළිබඳ අවදානම් අවම කිරීමට දේශීය සහ විදේශීය මාර්ගෝපදේශයන්ට (CAASL සහ ICAO) අනුකූල වීම.	●	●	●	●	●
ගුවන්සේවා වෘත්තිකයන් රඳවා ගැනීමේ අවදානම	දුර්වල සමාජ ආර්ථික තත්වය සහ බදු/නීති හි ඇති වන වෙනස්කම් හේතුවෙන් බුද්ධිමතුන් රට හැර යාමට පොළඹන ලදී. මේ හේතුවෙන් සමාගමට මනා පුහුණුවක් ලද ගුවන් සේවා වෘත්තිකයින් අහිමි වනු ඇත.	අදාළ ක්ෂේත්‍රයන්ට සුදුසුකම් ලත් සේවකයින් ප්‍රමාණවත් තරම් බඳවා ගැනීමට සහ පුහුණු කිරීමට අධිකාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම.	●	●	●	●	●
ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදෙස් මුදල් වලට එරෙහිව අගය අඩුවීම, විශේෂයෙන්ම ඇමරිකන් ඩොලර්	ගු.ගු.සේ.ස. සතුව සැලකිය යුතු විදේශ විනිමය ණය ගැනීම් ප්‍රමාණයක් පවතින අතර, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වූ විට ඒවා සමානාත්මතා අලාභයන්ට නැඹුරු වේ.	විදේශ මුදල් මුල් කරගත් ඉපැයුම් සහ ආයෝජන පවත්වා ගැනීම මඟින් අපිට පරිවර්තනය සහ ගනුදෙනු වලින් විශාල ලෙස සිදුවන අවදානම අවම කරනු ලබයි.	●	●	●	●	●

අවදානමේ ස්වාභාවය	ව්‍යාපාර සඳහා බලපෑම	අවදානම් අවම කිරීම	වර්ෂයන් පුරා අවදානම් පැතිකඩේ වෙනස්වීම				
			2022	2021	2020	2019	2018
පොලී අනුපාතික අවදානම	දේශීය ආර්ථිකයේ පොලී අනුපාතිකයේ වෙනස්කම් මඟින් සමාගම සඳහා ඉහළ පොලී අනුපාතිකයක් සහතික කරනු ලබයි. එමෙන්ම එය සමාගම විසින් නිකුත් කරන ලද ණයකරවල පොලී වියදම් වර්ධනය කරනු ලබයි. කෙසේවෙතත් විදේශ ණය ගැනීම් වන බැවින් ණය මත පොලී වියදම් බලපානු නොලැබේ.	සමාගමේ ආයෝජන කළඹ දේශීය සහ විදේශීය මුදල් උපකරණ ආයෝජන වලින් සමන්විත වේ. ඒ අනුව, පොලී අනුපාතික වල වෙනස්කම් ද යොදා ගත හැකිය.	🔴	🟡	🟡	🟡	🟡
වෙළඳ මිල ගණන් අවදානම්	විශේෂයෙන් අමතර කොටස්, ඉලෙක්ට්‍රොනික සහ ලිපිද්‍රව්‍ය ආදියේ මිල ඉහළ යාම මඟින් අපගේ මෙහෙයුම් පිරිවැය ඉහළ යාමට බලපාන ලදී.	මූලික නොවන සේවාවන් හි පිරිවැය පාලන සහ මිල සංශෝධන හරහා මේවා අවශෝෂණය කර ගනී.	🔴	🟡	🟡	🟢	🟢
සයිබර් ආක්‍රමණ අවදානම්	ඇති වියහැකි සයිබර් ආක්‍රමණ මඟින් ගුවන් ගමන් ආරක්ෂණ ඉලෙක්ට්‍රොනික පද්ධතියට තර්ජනයක් විය හැකිය.	ඉහළ සුරක්ෂිතතාව (උදා: ෆයිර්වෝල්) හඳුන්වාදීම සහ යාවත්කාලීනව පවත්වා ගැනීම	🟡	🟡	🟡	🟡	🟢

🟢 අවම
🟡 මධ්‍යම
🔴 ඉහළ

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය

ඉහතින් නිර්වචනය කරන ලද අවධානම් කළමනාකරණයේදී යොදාගනු ලබන ක්‍රියාවලිය මඟින් පහත ප්‍රතිලාභ ඇති කොට ඇත.

- විවිධ පැතිකඩයන් ඔස්සේ අධ්‍යනය කිරීමෙන් අවදානම් පිළිබඳ විස්තරාත්මක ඇඟයීමක් පැවතී හේතුවෙන් අවදානම් ඵලදායී ලෙස අවම කිරීම
- ධනාත්මක අවදානම් ප්‍රාග්ධනීකරණය කිරීමට උපායමාර්ග පැහැදිලි කිරීම (ව්‍යාපාර අවස්ථා)
- අවදානම් හඳුනාගැනීම සහ අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් යොදා ගැනීම සඳහා ගු.ගු.සේ.ස. හි සියලු අංශයන් සම්බන්ධ විය.
- අවදානම් ලැයිස්තුව පවත්වා ගැනීම හේතුවෙන් ඕනෑම අවස්ථාවක කටයුතු නොකළ අවදානම් පිළිබඳ සමාගම දැනුවත් විය.

ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි පාලන ව්‍යුහය



*ගු.ගු.සේ.ස. හි සභාපතිතුමා විසින් එහි සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරිතුමා යන ද්විත්ව භූමිකාවක් ඉටු කරයි.

ආයතනික විනය සහ වගකීම්සහගත ව්‍යාපාර හැසිරවීම සඳහා දායක වන ගතික ආයතනික පද්ධතියක් සමාගම විසින් යොදා ගනු ලබයි. මෙම අරමුණ මුදුන්පත් කිරීම සඳහා ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි සමඟ අවශ්‍ය රාමුවක් ස්ථාපිත කිරීම තුළින්, වගකීම් පිළිබඳ පැහැදිලි බවක් ලබා දීම, මත ගැටුම් මඟහරිමින් සහ අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය, විනිවිදභාවය සහ සමස්ත වගවීම පිළිබඳ තෘප්තිමත් ක්‍රියාවලි සහ පද්ධතියක් සහතික කරමින්, ගු.ගු.සේ.ස. විසින් පැහැදිලි සහ ක්‍රමානුකූල තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පිහිටුවා ඇත.

සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය, අවශ්‍ය ප්‍රවීණතාව, ශක්‍යතාව සහ පළපුරුද්ද ඇති මනා සංයුතියකින් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත වන අතර, එහි ගතික ආයතනික කළමනාකරණ කණ්ඩායම සමඟින් එක්ව වෙනස්වන සහ අභියෝගාත්මක සාර්ව ආර්ථික පසුබිමක ව්‍යාපාර මඟින් මුහුණදෙනු ලබන අවදානම් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව, සියලුම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට ගු.ගු.සේ.ස. හි මෙහෙයුම් සඳහා හැකියාව ඇති කරමින්, ශක්තිමත් පාලන පද්ධතියක් ඇති කිරීමේ අරමුණ කරා කටයුතු කරනු ලබයි.

ආයතනික පාලන මූලධර්ම වාර්තා මඟින්, 2007 අංක 7 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ 2017 ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහය සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, මුදල් අමාත්‍යාංශය යටතේ 'අ' වර්ගීකරණ වාණිජ රාජ්‍ය ව්‍යවසාය හි මාර්ගෝපදේශ වලට සමාගාමීව අනුකූලතාවයේ තත්ත්වය පිළිබඳ විස්තර දක්වනු ලබයි.

සමාගමේ ආයතනික උපායමාර්ග, සමාගමේ දැක්ම සහ මෙහෙවර සමඟ සමගාමී වන අතර, එහි සේවකමණ්ඩලය, කොටස්හිමියන් සහ පාර්ශවකරුවන් සමඟ ඵලදායී ලෙස සම්බන්ධවීම සහතික කර ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ග සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම, කළමනාකරණය සමඟ අන්තර් ක්‍රියාව මඟින් විශේෂයෙන්ම අනුකමිටුවෙහි කාලාන්තර රැස්වීම් හරහා සිදු කරනු ලබයි.

ගු.ගු.සේ.ස. ආයතනික පාලන රාමුව සාධාරණත්වය, වගවීම, වගකීම, සහභාගීත්වය සහ විනිවිදභාවය පිළිබඳ මූලික වටිනාකම් මත පදනම් වී ඇති අතර එම කරුණු තිරසාර ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය, වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම සඳහා වැදගත් වේ.



සාධාරණත්වය සහ සදාචාරාත්මක සංස්කෘතිය

- කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් රැකගැනීම.
- සියලුම කොටස්හිමියන්, සේවකයින්, විකුණුම්කරුවන් සහ ප්‍රජාව සඳහා සාධාරණයෙන් සහ සමාන වැදගත්කමින් සැලකීම.
- උල්ලංඝනය සඳහා ඵලදායී පිළියම් සැපයීම.
- පුළුල් රැකියා පරිසරයක් සෑම අවස්ථාවකදීම පෝෂණය වන බව සහතික කිරීම.

භාරකාරිත්වය සහ නායකත්වය

- අධ්‍යක්ෂ මණ්ඩලය, ආයතනයේ ගැටලු සහ කළමනාකරණය ක්‍රියාකාරකම් අධීක්ෂණය සඳහා වගකියනු ලැබේ.
- අධ්‍යක්ෂ මණ්ඩලය, සමාගමේ සාර්ථකත්වය, අඛණ්ඩ කාර්යසාධනය පිළිබඳ දැනුවත් වන අතර, සහය ලබා දීම සිදු කළ යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලය, සමාගමේ සහ එහි ආයෝජකයින්ගේ යහපත වෙනුවෙන් කටයුතු කළ යුතුය.

වගවීම සහ විනිවිදභාවය

- අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ක්‍රියාකාරකම් හි අරමුණු සහ එහි ප්‍රතිඵල පිළිබඳ පැහැදිලි කළ යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා රජය (GoSL) සඳහා වගකියනු බව සහතික කිරීම.
- මූල්‍ය තත්වය, කාර්යසාධනය, හිමිකාරිත්වය සහ ආයතනික පාලනය ඇතුළුව, සියලු වැදගත් කරුණු කාලානුරූපීව සහ නිවැරදිව අනාවරණය කිරීම සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය සමාගමේ ශක්‍යතා, විභවතා සහ කාර්යසාධනය තක්සේරු කිරීම උදෙසා වගකිව යුතුය.
- වැදගත් කරුණු සම්බන්ධයෙන් කොටස්හිමියන්ව දැනුම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි.

ස්වාධීනත්වය

- අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන වන අතර සෑම අවස්ථාවකම සමාගමේ අභිවෘද්ධිය උදෙසා සියලුම තීරණ ගනු ලබයි.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමබර බව සහතික කිරීම.
- කමිටුව වෙත නාම යෝජනා කිරීමේදී ස්වාධීන බව සහතික කිරීම.
- ගන්නා ලද තීරණ සහ පිහිටුවා ඇති අභ්‍යන්තර ක්‍රියාවලි විෂය ඉලක්කගත බව සහ බලපෑමට ලක් නොවන බව සහතික කිරීම.

අඛණ්ඩ වර්ධනය

- අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් සියලුම ආකාරයේ අවදානම් හඳුනාගැනීම සහ හොඳින් පාලනය කරනු ලබන ආකාරය පිළිබඳ තහවුරු කළ යුතුය.
- කළමනාකරණය කිරීම සඳහා ඔවුන් විම නිර්දේශයන් පිළිබඳ කටයුතු කළ යුතුය.
- පවතින සහ අවදානම් තත්වය පිළිබඳ අදාළ සියලුම පාර්ශවයන් ඔවුන් දැනුවත් කළ යුතුය.

පාලනය සහ උපායමාර්ග

- පැහැදිලි උපායමාර්ගික දර්ශනයක් පිහිටුවාලීම.
- ආයතනයේ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අධ්‍යක්ෂවරුන් ක්‍රියාශීලීව සම්බන්ධ වීම වැදගත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් සඳහා ඇතුළත් වනුයේ:

- සමාගමේ දිගු කාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් තිරසාර, ඉහළ, මධ්‍යස්ථ, සහ දිගු කාලීන මට්ටමේ උපායමාර්ග සකස් කිරීම සඳහා සමාගම වෙත නිර්දේශය සහ මඟ පෙන්වීම.
- ආයතනික අවදානම් කළමනාකරණ විෂය පථයේ රාමුව තුළ මෙහෙයුම් තීරණ ගැනීමේදී සහ මෙහෙයුම් සිදු කිරීමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ප්‍රමාණවත් අධිකාරියක් පැවරීම තහවුරු කිරීම.
- පාලන සහ අනුකූලතා පද්ධති අධීක්ෂණය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ වගකීම් ඉටු කිරීම උදෙසා, විවෘතභාවයෙන් යුතු සංස්කෘතියක්, ඵලදායී සංවාද සහ සාධනීය අභියෝග, සේවක සවිබල ගැන්වීම් සහ සහභාගීත්වය මෙන්ම සියලුම පාර්ශවකරුවන්ට සම්බන්ධවීම සඳහා පහසුකම් සපයන පරිසරයක් ප්‍රවර්ධනය කරනු ලබයි. සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ සෙසු සේවකයින් දක්වා ගලනය වනු ලබන වෘත්තීය ප්‍රමිතීන් සහ ආයතනික වටිනාකම් ප්‍රවර්ධන කිරීම මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගුණාත්මකභාවය දිරිමත් කරමින් පිහිටුවාලනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සහ පැමිණීම

වසර ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලසුම්කරණු ලබයි. රැස්වීම්වලදී සාකච්ඡා කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන සහ උපායමාර්ගික තොරතුරු සකස් කිරීමට හැකි වන පරිදි අධ්‍යක්ෂවරුන්ට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ප්‍රමාණවත් දැනුම්දීමක් සපයා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දින 07කට පෙර න්‍යාය පත්‍රය, මණ්ඩලික පත්‍රිකා සහ අදාළ පත්‍රිකා ඇතුළත් මණ්ඩලික ලිපි ලේඛන, අධ්‍යක්ෂවරුන් වෙත බෙදා හරිනු ලබන අතර, මෙමඟින් ඔවුන්ට රැස්වීමේදී සාකච්ඡා කළ යුතු අන්තර්ගතය පිළිබඳව අදහසක් ලබා දේ.

සුදුසු තීරණයකට එළැඹීම සඳහා, එක් එක් න්‍යාය පත්‍ර කාරණා සඳහා කලින් කාලය වෙන් කරගනිමින්, සියලු අංශ නිසි ලෙස සාකච්ඡා කර, ආවරණය කර ඇති බව සහතික කරන අතර, රැස්වීම් පැවැත්වීමේදී වෘත්තීය සහ ක්‍රමානුකූල ප්‍රවේශයක් භාවිත කරනු ලැබේ. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීමට අවශ්‍ය වූ විට, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අංශ ප්‍රධානීන් සහභාගී වේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අංක 16ක් කැඳවා ඇති අතර, ඉන් එක් රැස්වීමක් කලින් කල් තබන ලද රැස්වීමක ඉතිරි කොටසක් වූ අතර, එය සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය හි 55 වැනි වගන්තිය ප්‍රකාරව පවත්වන ලදී. රට තුළ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ සංචාරන සීමා කිරීම් මධ්‍යයේ කැඳවන ලද මුළු රැස්වීම් 16න්, රැස්වීම් 05ක් අතථ්‍ය ලෙස පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයාගේ නම	තනතුර	පැමිණීම
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc	සභාපති	16/16
වෛද්‍ය යූ ඒ මෙන්ඩිස් (2022 ජුනි 15 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී)	උප සභාපති	09/09
ඒ එස් සී වරුෂහෙන්නැදිගේ	විධායක නොවන අධ්‍යක්ෂ	16/16
එස් එන් සුමනසේකර	විධායක නොවන අධ්‍යක්ෂ	15/16
කපිතාන් මිලින්ද රත්නායක (2022 ජුනි 20 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	09/09
ජී යූ කේ අල්ගේවත්තගේ (2022 ජුනි 15 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	08/09
ඩබ්ලිව් ඒ ඒ විජේසූරිය (2022 සැප්තැම්බර් 13 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	06/06
ඩබ්ලිව් එස් ඩී ද සිල්වා (2022 නොවැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	02/02
ඒ ඒ රන්දෙණිය (2022 නොවැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	01/02
ජී ඒ ඒ ප්‍රියන්ත	විධායක නොවන අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත	16/16
ඒ ඒච් එස් ගුණවර්ධන	විධායක නොවන අධ්‍යක්ෂ/වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශ නිර්ක්ෂක	16/16

අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයාගේ නම	තනතුර	පැමිණීම
ඉල්ලා අස්වීම්		
ආර් සූරියආරච්චි (2022, ජුනි 10 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	උප සභාපති	07/07
එස් එම් ඒ යූ එස් මංචනායක (2022, අගෝසතු 12 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	07/07
සී විතාරණ (2022, මැයි 31 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	01/06
ඩී ඒ ද ලිවේරා (මිය) (2022, ජුනි 11 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	06/07
ආර් ඒ පී විජේරත්නසේකර (2022, ජුනි 10 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	07/07
ජනාධිපති නීතිඥ ඩී ඒ පී වීරත්න (2022, ජුනි 11 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	06/07
ඩබ්ලිව් එම් ගිහාන් රණාන්ත (2022, ජුනි 10 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	07/07
එන් එම් පී පී කේ කේ නවරත්න (2022, නොවැම්බර් 29 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී)	විධායක නොවන අධ්‍යක්ෂ	04/07

අපගේ ප්‍රවේශය සහ කැපවීම

ගු.ගු.සේ.ස. යනු සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන අතර, එහි අධ්‍යක්ෂ මණ්ඩලය යහපාලනය මඟින් සමාගමේ උපායමාර්ගික මඟපෙන්වීම සහ අධීක්ෂණය සඳහා රජය වෙත වගකියනු ලැබේ. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් නිර්දේශිත ආයතනික පාලන නියාමන රාමුව මඟින් සමාගම පාලනය වනු ලබයි.

ඉහත කරුණු වලට අමතරව, 2007 අංක 7 දරන සමාගම් පනත හි දක්වා ඇති මූලික අවශ්‍යතා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මඟින් නිකුත් කර ඇති ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහයේ දක්වා ඇති අභිමත අනුකූලතා ද අපගේ පාලන රාමුවේ කොටස් වේ.

ගු.ගු.සේ.ස. හි, අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පාලන ක්‍රියාවලියේ වැදගත් අංගයකි. පැහැදිලිව නිර්වචනය කරන ලද යොමු නියමයන් සහිත මණ්ඩල අනුකමිටු හතක් පත් කොට ඇත. එනම්, විගණන සහ කළමනාකරණ කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, මානව සම්පත් සහ වැටුප් කමිටුව, මූල්‍ය කළමනාකරණය සහ ආදායම් උත්පාදන කමිටුව, සියලුම ගුවන්තොටුපළ හි ගතික ඉදිරි ගමන්මඟ කමිටුව, ව්‍යාපෘති කළමනාකරණ කමිටුව සහ ගු.ගු.සේ.ස. සඳහා ප්‍රසම්පාදන අත්පොත සකස් කිරීමේ කමිටු වේ. එබැවින් මෙම එක් එක් ක්ෂේත්‍රයට අදාළ කරුණු මනාව විශ්ලේෂණය කොට, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. මේ ආකාරයෙන්, තීරණ ගැනීමේ සාමූහික වගකීම දරමින්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ විශේෂඥ දැනුම නිසි ලෙස භාවිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සමත් වී ඇත.

ඒ අනුව, අපගේ පාලන යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සමාගම තුල ඉහත කමිටු ක්‍රියාත්මක වේ.

සමාලෝචිත වර්ෂය තුළ, සමාගම් පනතේ දක්වා ඇති සියලුම අනිවාර්ය ආයතනික පාලන අවශ්‍යතා සහ පහත අංශවල විස්තර කර ඇති පරිදි ස්වේච්ඡා අනුකූලතාවලට ගු.ගු.සේ.ස. අනුකූල විය.

මෙම පාලන රාමුව මූලික මූලධර්ම පහක් යටතේ ක්‍රියාත්මක වේ.
1) නායකත්වය සහ මඟ පෙන්වීම
2) විනිවිදභාවය සහ අඛණ්ඩතාවය
3) ප්‍රධාන කොටස්හිමියා ලෙස රජය වෙත වගවීම
4) පාර්ශවකරුවන්ගේ නීත්‍යනුකූල අයිතිවාසිකම් හඳුනාගැනීම
5) කාලීන සහ සමබර ප්‍රතිපත්ති අනාවරණය

1) නායකත්වය සහ මඟ පෙන්වීම

සමාගමේ ව්‍යාපාර සහ මෙහෙයුම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ කළමනාකරණය කරනු ලබයි. එහි ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයේ සහ මූල්‍ය පාලනයේ අත්දැකීමෙන් සහ දැනුමෙන් පිරි සාමාජිකයින්ගෙන් සමන්විත ය. එය සංගමයේ ලිපිවලට අනුකූලව වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි. සමාගමේ ආයතනික පාලන ප්‍රතිපත්ති වලට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය සැපයීම සඳහා වගකීම් දරනු ලබන සභාපතිතුමා, පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. එමඟින් යහපාලනය ඇති කිරීම සහ ඵලදායීතාවය සහතික කරලීම සිදු කරනු ලබයි. එමෙන්ම සභාපතිතුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක සහ විධායක නොවන සාමාජිකයන් අතර ඵලදායී කාර්ය සබඳතා පවත්වාගෙන යාම සහතික කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ සහය ඇතිව සභාපතිවරයා විසින් පහත කරුණු සහතික කරනු ලබයි:

- අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාපටිපාටි අනුගමනය කරනු ලබයි
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු කාර්යක්ෂමව දැනුම් දෙනු ලබයි

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් සමාගමේ භාරකාරිත්වයේ ව්‍යවස්ථාපිත වගකීම් ක්‍රියාවට නංවනු ලබයි. ඔවුන්ගේ ප්‍රධාන කාර්යභාරය වන්නේ:

- සමාගම එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා මෙහෙයවීම.
- සමස්තයක් ලෙස සමාගමේ කළමනාකරණ, මෙහෙයුම් සහ කාර්යසාධනය අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් එකොළොස්දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් නවදෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, දෙදෙනෙකු විධායක අධ්‍යක්ෂවරුන් වන අතර, සභාපතිතුමා සහ උප සභාපතිතුමා එම භූමිකාවෙන් කටයුතු කරනු ලබයි. සභාපතිතුමා ගු.ගු.සේ.ස. හි සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරිතුමා යන ද්විත්ව භූමිකාවන් සිදු කරනු ලබයි. ආයතනික පාලන මාර්ගෝපදේශවල අවශ්‍යතා අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරයක් ඉහළ කීර්තියක් දරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදීම සියලුම විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට තනි ඡන්ද අයිතියක් ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය මඟින් කරුණු සහ පැතිකඩ යන දෙඅංශයෙන්ම

කළමනාකරණයේ ස්වාධීනත්වය පිළිබිඹු කරයි. ඒ සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික සම්බන්ධතා, පුද්ගල, රැකියාව හෝ ව්‍යාපාර මත පමණක් නොව, කළමනාකාරිත්වය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත ආකල්පය මත ද බලපානු ලබයි. විෂය මූලික ස්වාධීන විනිශ්චයක් ලබා දීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යභාරයේ මූලික හරය වේ.

සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරු සම්බන්ධයෙන් සියලුම අධ්‍යක්ෂවරුන්ට ස්වාධීන සහ ඒකාබද්ධ ප්‍රවේශයක් ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන් අනුගමනය කරන බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් නෛතික අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ සපයන බවටත් සමාගම් ලේකම්වරයා විසින් සහතික කරනු ලබයි.

මීට අමතරව, ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැන්වීම්, රැස්වීම් වාර්තා සහ ප්‍රමාණවත් තොරතුරු සමඟ අදාළ ලියකියවිලි බෙදා හරිනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් ද ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

1.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ නායත්වය සඳහා වෙන් කර ඇති කාරණා සඳහා ඇතුළත් වනුයේ:

මනා සැලසුමකින් යුතු ආයතනික පාලන රාමුවක් සමාගම සතු වේ. එය සියලුම ව්‍යාපාර ක්‍රියාකාරකම් පුරා ක්‍රියාත්මක වන අතර, ස්ථිර කොටස්හිමියන්ගේ වටිනාකම් පවත්වාගැනීම සහ වර්ධනය කිරීම සඳහා අවශ්‍ය අංගයකි.

අ) සමාගම සඳහා දැක්ම සහ දිශාව සැපයීම

ආ) 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධානවල විෂය පථය තුළ ගොඩනගා ඇති එහි නිශ්චිත මෙහෙවර සහ එය රජයේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සඳහා වඩාත් හොඳින් සේවය කළ හැකි ආකාරය මත පදනම් වීම.

ඇ) 2007 අංක 7 දරන සමාගම් පනතේ සහ සංගමයේ වගන්තිවල විධිවිධානවලට අනුකූලව නෛතික අවශ්‍යතා සපුරාලීම සහ සමාගම ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

ඈ) රජය සහ වෙනත් ප්‍රධාන පාර්ශවකරුවන් වෙත ප්‍රශස්ත ආපසු යැවුම් සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමට අවදානම් කළමනාකරණය ඇතුළුව විවිධ ප්‍රතිපත්ති සකස් කිරීම.

ඉ) නිරන්තරයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති අරමුණු සමාලෝචනය කිරීම සහ දිගු කාලීන අරමුණු සකස් කිරීමට උපායමාර්ගික මඟපෙන්වීම් සැපයීම සහ ඉදිරි වර්ධනය උදෙසා අරමුණු සැකසීම.

ඊ) වගකීම සඳහා බලය පැවරීම මඟින් ප්‍රමාණවත් වගවීමක් සහතික කිරීම.

1.2 මෙම ශක්‍යතාවය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා විශේෂ කාරණා සඳහා ඇතුළත් වනුයේ:

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන අරමුණු සංක්ෂිප්තව දැක්වුවහොත්, සෘජුවම ඔවුන්ගේ විෂය පථයට අයත් වන්නේ:

අ) සමස්ත නිර්දේශ තක්සේරු කිරීම සහ ව්‍යාපාරයේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

ආ) පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් රැකගැනීම උදෙසා විශ්වසනීය සේවා සැපයීම.

ඇ) සමාගම එහි මෙහෙයුම් නිසි ආකාරයෙන් පවත්වාගෙන යන බව සහතික කරමින්, කළමනාකරණ තොරතුරු වාර්තාව හරහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය අධීක්ෂණය සහ ඇගයීම.

ඈ) පාලන ක්‍රියාමාර්ග හි ඵලදායීතාව සහතික කිරීම.

ඉ) අවදානම් තක්සේරුව සහ කළමනාකරණය සඳහා, අනෙක් අය අතර අභ්‍යන්තර පාලනය ඇතුළත්ව සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

ඊ) අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සකස් කරන අවස්ථාවේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදී නිසි ලෙස, ආයතනයේ සහ සමස්තයක් ලෙස පොදු යහපත අනුව සිදුවන බවට සහතික කිරීම.

උ) අපේක්ෂා කළ ආකාරයෙන් ප්‍රතිඵල ලබා ගත නොහැකි අවස්ථාවේදී අරමුණු සාක්ෂාත් කරගැනීම සහතික කිරීමට ප්‍රමාදයකින් තොරව විකල්ප ගැනීම සහතික කිරීම.

ඌ) කළමනාකරුවන් වැනි කාර්යක්ෂම සේවා මණ්ඩලයක් පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් අතර ප්‍රමාණවත් අධිකාරී බලය පැවරීමක් ඇති බව සහතික කිරීම.

එ) රාජ්‍ය ව්‍යවසාය රැස්වීම් (COPE) සඳහා කමිටුවට සහ පාර්ලිමේන්තුවේ උපදේශක කමිටුවට (PCC) සහභාගීවීම් හෝ අවශ්‍ය අවස්ථාවකදී සහ අවශ්‍ය විටකදී එම ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් වෙත බලය පැවරීම.

1.3 ආයතනික පාලන අංශයන්හි විගණන සහ කළමනාකරණ කමිටුවේ (AMC) භූමිකාව

විගණන සහ කළමනාකරණ කමිටුව

ගු.ගු.සේ.ස. හි කාර්යයන්හි අධීක්ෂණය සඳහා පාලන මණ්ඩලය වෙත සහයෝගය දැක්වීමට සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාවය සහ ගු.ගු.සේ.ස. හි ක්‍රියාවලිය සහතික කිරීම සඳහා PED/12 ජේදය 7:4:1 ට අනුකූලව විගණන කළමනාකරණ කමිටුව (AMC) පිහිටුවන ලදී.

විගණන සහ කළමනාකරණ කමිටුවේ කාර්යභාරය වන්නේ, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාවය, අභ්‍යන්තර පාලන සහ සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධති, සහ එහි නෛතික සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම, බාහිර විගණනයේ කාර්යසාධනය, සුදුසුකම් සහ ස්වාධීනත්වය සහ සමාගම විසින් සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණවත් බව සහ කාර්යසාධනය සම්බන්ධයෙන් වගකීම් අධීක්ෂණය සාර්ථක කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය සැපයීමයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන කමිටුවේ TOR හි කාර්යයන් සහ වගකීම්වල විෂය පථය ඵලදායී ලෙස දක්වා ඇත. ගිණුම්කරණ සහ මූල්‍ය ක්‍රියාකාරකම්, පරිපාලන රෙගුලාසි (AR), මූල්‍ය රෙගුලාසි (FR) සහ ගු.ගු.සේ.ස. රෙගුලාසි ආවරණය කරමින්, රජයේ රෙගුලාසි පිළිපැදීම සහ අනුකූල වීම සහතික කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඇත.

බාහිර හා අභ්‍යන්තර විගණන කාර්යයන් විගණනය කරන ලද මූල්‍ය තොරතුරුවල අඛණ්ඩතාවයට දායක වෙමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, අවම වශයෙන් කාර්තුමය ලෙස ඒවා විගණන කමිටුව විසින් අධීක්ෂණය සහ ඵලදායී ලෙස ඇගයීම සිදු කළ යුතුය. රේඛීය අමාත්‍යාංශය, වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සඳහා ගු.ගු.සේ.ස. හි විගණන කාර්යයන් ඵලදායී සහ දැඩි ලෙස ඇගයීමට ලක් කර ඇති බවට සහතිකයක් අවශ්‍ය වේ. ඇඟයීම්වල විෂය පථය සඳහා සියලු කරුණු සහ පහත කරුණු ඇතුළත් විය යුතුය:

- ඇඟයීම සිදු කරන කාලය තුළදී සිදු කරන කාර්යයන් හි ගුණාත්මකභාවය.
- විගණන කාර්යමණ්ඩලයේ හැකියාව සහ පළපුරුද්ද.
- රජය සහ අභ්‍යන්තර විගණනයට අදාළව එහි වාර්තාකරණ කාර්යයේ යෝග්‍යතාවය.

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කර ඇති අතර, කිසියම් අපගමනයක් නිරීක්ෂණය කිරීමේදී, පවතින පද්ධති වැඩිදියුණු කිරීමට යෝජනා වරින් වර එහි අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් ඇති කරන ලද විමසීම් සහ අදාළ අවදානම් තුරන් කිරීම සඳහා ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික කිරීම සඳහා අදාළ අංශ විසින් ලබා දී ඇති ප්‍රතිචාර ද කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

2 විනිවිදභාවය සහ අඛණ්ඩතාවය

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් දියුණු පාලනයක්, වගවීමක් සහ විනිවිදභාවයක් අපේක්ෂා කරනු ලබන සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාවය හඳුනාගැනීමට සහ පවත්වාගැනීමට සමාගමේ සංස්කෘතිය සහ ක්‍රියාකාරකම් නිරන්තරයෙන් අධීක්ෂණය සහ සමාලෝචනය කොට ඇත. භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව, සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමාගමේ එක් වැදගත් ක්‍රියාවලියකි. එමෙන්ම එය භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමේදී පූර්ණ විනිවිදභාවයෙන් යුත් ක්‍රියාපටිපාටි සපයනු ලබයි.

2.1 අභ්‍යන්තර විගණනය

AMC සඳහා ගු.ගු.සේ.ස. හි අභ්‍යන්තර විගණනය සහ තත්ත්ව සහතික කිරීමේ (IA & QA) අංශය මගින් සහය ලැබේ. අභ්‍යන්තර විගණනය සහ තත්ත්ව සහතික කිරීමේ අංශයේ ප්‍රධානී, AMC කැඳවුම්කරු ලෙස කටයුතු කර සභාපතිතුමාට වාර්තා කරනු ලබයි. අභ්‍යන්තර විගණනය සහ තත්ත්ව සහතික කිරීමේ අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ, ගුවන්තොටුපළ සේවාවන්හි ඇතැම් ක්ෂේත්‍ර සඳහා තත්ත්ව ප්‍රමිතීන් සහතික කරමින්, අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත්භාවය, අඛණ්ඩතාවය සහ ඵලදායීතාවය ඇගයීමෙන් පවතින සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතියේ ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීම මෙන්ම අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කළමනාකරණය වෙත නිසි නිර්දේශ සිදු කිරීම වේ. අභ්‍යන්තර විගණනය විසින් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය සහ සමාගමේ නීති සහ රෙගුලාසි සහ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම පිළිබඳව සභාපතිවරයා වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී. අභ්‍යන්තර විගණනයට ඇතුළත් වනුයේ:

අ) පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රධාන තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

ඇ) AMC වෙත සහ ගු.ගු.සේ.ස. හි සභාපති වෙත ගු.ගු.සේ.ස. හි එක් එක් අංශයේ විෂය පථයට ගැනෙන කළමනාකරණ තීරණ සහ ක්‍රියාකාරකම් පිළිබඳ අවදානම් තක්සේරුව ඇගයීම් සහ නිර්දේශයන් කිරීම, ඉදිරිපත් කිරීම.

ඈ) පද්ධති සහ පාලනයන් සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් අවදානම් තක්සේරුව මත නිරීක්ෂණ සිදු කිරීම.

ඉ) ආදායම් සහ වියදම් සඳහා තත්ත්ව සහ කාලානුරූපී මූල්‍ය සමාලෝචන සහ එහි හඳුනා ගැනීම සහ වාර්තා කිරීම.

ඊ) ව්‍යාපාරයේ තෝරාගත් ක්ෂේත්‍රයන්හි තත්ත්ව විගණනයක් සිදු කිරීම

උ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායනයට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම.

3. ගු.ගු.සේ.ස. හි ප්‍රධාන කොටස්හිමියා ලෙස රජය වෙත වගවීම

සම්පූර්ණයෙන් රජය සතු ව්‍යාපාරයක් ලෙස රජය වෙත වගකීම්, වගවීම රේඛීය අමාත්‍යාංශය හරහා ගු.ගු.සේ.ස. විසින් පහත ක්‍රියාවලි භාවිත කරමින් ක්‍රියාත්මක කරනු ලබයි.

3.1 පාර්ලිමේන්තුව

2002 මැයි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ PE/PF 21 ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසානයේ සිට දින 150ක් ඇතුළත සමාගමේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

3.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (COPE) සඳහා සමාගමේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ සමාගම කාර්යසාධන ඉලක්ක සපුරා ගන්නා සහ සමාජ වගකීම් ඉටු කරන ප්‍රමාණය තක්සේරු කිරීමට බලය ඇත. කෝප් කමිටුව විසින් කැඳවූ විට සභාපති, අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය එක්ව වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්, ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා, සමාගමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසියම් විමසීමක් සහ සැලකිලිමත් වන කරුණු සඳහා ප්‍රතිචාර දැක්වීමට සමාලෝචනය සඳහා පැමිණි සිටිය යුතුය. ගු.ගු.සේ.ස. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සමාලෝචනය වන වර්ෂය තුළ කැඳවනු නොලැබුණි.

3.3 මූදල් ඇමති/ මහා භාණ්ඩාගාරය

රාජ්‍ය ව්‍යවසාය ඇතුළුව රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සම්බන්ධයෙන් මුදල් ඇමති හෝ ඔහු වෙනුවෙන් භාණ්ඩාගාරය වගකිව යුතුවේ. කාර්යසාධනය අධීක්ෂණය කිරීමත්, ප්‍රඥප්ති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සහ අමාත්‍යවරයාට අදාළ ඕනෑම කරුණක් පිළිබඳ වාර්තා කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර නියෝජිත ජී වී අජිත් ප්‍රියන්ත මහතා විසින් මෙම කාර්යය ඉටු කරන ලදී.

රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය කළමනාකරණය සහ පාලනය අධීක්ෂණය කිරීමේ වගකීම පවතින්නේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (DPE), මතය.

3.4 වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය

වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම් සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා මූල්‍ය පරිපාලනය සහ සමාගමේ කළමනාකාරිත්වය සඳහා රජයට වගකිව යුතු වේ. එමෙන්ම මෙම වපසරිය තුළ වසර තුළ මණ්ඩලය සමඟ පහත සඳහන් කරුණු නිතිපතා සමාලෝචනය කරයි.

අ) ආයතනික සැලැස්ම සහ අයවැය

ආ) වත්මන් වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති වල භෞතික සහ මූල්‍ය කාර්යසාධනය

ඇ) සමස්තයක් ලෙස වසරේ කළමනාකරණ ලිපිය සහ මූල්‍ය කාර්යසාධනය ඇතුළත්ව විගණන බාර දීම

ඈ) COPE රැස්වීම් හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත/නියාමන ආයතනයක රැස්වීම් මඟින් පැන නඟින කරුණු

4. පාර්ශවකරුවන්ගේ නීත්‍යනුකූල අයිතිවාසිකම් හඳුනාගැනීම

ආයතනයක් පාර්ශ්වකරුවන්ට හොඳින් සලකනවිට, වර්ධනයේ අපේක්ෂාවන් සපුරාලන විට සහ ප්‍රජා වගකීම් සහ නෛතික අනුකූලතාව සම්බන්ධයෙන් කීර්තියක් ඇතිවිට පාර්ශ්වකරුවන්ගේ වටිනාකම වර්ධනය වේ. පාර්ශ්වකරුවන්ගේ වටිනාකම කළමනාකරණ ක්‍රියාවලියක් ලෙස හඳුන්වනු ලබයි. එහි මූලික අරමුණ ලෙස සමාගමක පාර්ශවකරුවන්ගේ (කොටස්හිමියන්, ගනුදෙනුකරුවන්, සේවකයින් සහ ප්‍රජාව ඇතුළුව) ශුභසිද්ධිය උපරිම කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. මෙම ප්‍රවේශයේ පරමාර්ථය වන්නේ, ආයතනයේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නංවමින් පිරිවැය පාලනය ඉහළ නැංවීම සිදු කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙන් පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම

කිරීම, සමාගමේ සේවකයින්ගේ කුසලතා සහ සර්වශ්‍රහදායී වීම වැඩිදියුණු කිරීම සහ ආයතනය විසින් සම්පත් සහ තිරසාරත්වය ලබා ගන්නා ප්‍රජාවේ දියුණුව සුරක්ෂිත කිරීමයි. ඒ අනුව, රජය සහ ගු.ගු.සේ.ස. හි කටයුතු පිළිබඳ සැලකිල්ලක් ඇති අනෙකුත් අනුබද්ධ ආයතන, සේවකයින්, ගුවන්තොටුපළ භාවිත කරන්නන් (ගුවන් සේවා, මගීන් සහ ගුවන්තොටුපළ තුළ තම ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරික ප්‍රජාව), සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සහ සමස්තයක් ලෙස ප්‍රජාව ඇතුළු සියලුම නෛතික පාර්ශවකරුවන් වෙත සමාගම විසින් නෛතික සහ වෙනත් වගකීම් හඳුනාගනු ලබයි. මෙම බැඳීම් දිගුකාලීන පාර්ශවකරුවන්ගේ වටිනාකම ප්‍රශස්ත කිරීම සඳහා වන වැදගත් කාර්යභාරයේ කොටසක් ලෙස සලකනු ලැබේ.

සුදුසු ආයතනික භාවිතයන් සඳහා එහි කැපවීම එමඟින් පැහැදිලි කරනු ලබන අතර එය පහත සඳහන් ක්ෂේත්‍රවලින් සමන්විත වේ:

අ) නියාමන රාමුව සඳහා මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් නිසි විසඳුම් සැපයීම.

ආ) ගුවන්තොටුපළ මෙහෙයුම් හි නීත්‍යනුකූල සේවා සපයන්නා ලෙස කටයුතු කරමින් රජයේ වගකීම් සම්පූර්ණ කිරීම.

ඇ) ණයහිමියන් සහ මූල්‍ය ආයතන වෙත ඇති වගකීම් කඩිනමින් සපුරාලීම.

ඈ) සාධාරණ වෙළඳාමට අදාළ වගකීම් අඛණ්ඩව සපුරාලීම සහ සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සමඟ ගනුදෙනු කිරීමේදී සම මට්ටමේ ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම.

ඉ) ප්‍රජාව කෙරෙහි බලපානු ලබන ආචාරධර්මීය ව්‍යාපාර ක්‍රියාකාරකම් සහතික කිරීම.

ඊ) නීතිය මඟින් ක්‍රියාත්මක කර ඇති පරිදි සියලුම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ උචිත පරිදි නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම.

උ) සියලු ගුවන්තොටුපළ පරිශීලකයන් වෙත නොවෙනස්ව සැලකීම.

ඌ) සේවකයින්ට සාධාරණව, ගෞරවාන්විතව සහ සමානාත්වයෙන් සැලකීම.

5. කාලීන සහ සම්බර ප්‍රතිපත්ති අනාවරණය

අවශ්‍ය විචක්ෂණ තීරණ ගැනීම සඳහා සංකීර්ණ සහ පුළුල් ලෙස කාලෝචිතව, නිවැරදි තොරතුරු සැපයීම අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද අපගේ තොරතුරු අනාවරණය කිරීමේ මූලික හරය වේ. මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියම කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs/LKASs) ඇතුළුව, සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සියලුම නීති සහ රෙගුලාසිවල අනාවරණය කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරයි.

ගු.ගු.සේ.ස. විසින් ව්‍යාපාර, අවදානම් ආකෘතිය, මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් කාර්යසාධනය සහ ආයතනයේ ප්‍රවණතා අවබෝධ කරගැනීමට කොටස්හිමියන්ට උපකාර කිරීම උදෙසා පාර්ශවකරුවන් සමඟ ඵලදායී හා අවංක සන්නිවේදනයක් පවත්වාගෙන යයි. බොහෝ කාලීන මෙන්ම තත්කාර්ය වාර්තා සහ විශ්ලේෂණය කරන ලද තොරතුරු, භාවිතයක් ලෙස සහ ඉල්ලුම මත සපයනු ලබයි. මෙමඟින් ආයතනික මෙහෙයුම්, මූල්‍ය මෙහෙයුම් සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සැබෑ තත්ත්වය පිළිබඳ සේවකයින් යාවත්කාලීන වේ. සමාගමේ අන්තර්ජාලය මඟින් සේවකයින්ට තොරතුරු බෙදා හැරීමේ උසස් අරමුණ ඉටු කරනු ලබයි. අපගේ ව්‍යාපාරයට බලපාන සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවට බලපාන නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම, බලාත්මක කිරීම සහ සංශෝධනය කිරීම සිදුවන සෑම අවස්ථාවකම, ගු.ගු.සේ.ස. විසින් පොදු ප්‍රතිපත්තිමය සංවාදයකට දායකත්වය සපයයි.

සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාපටිපාටි අනුගමනය කරන බවත්, ක්‍රමානුකූලව විමර්ශනය කරන බවත් සහතික කරමින් සමාගම් ලේකම් විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තා සහ සටහන් පවත්වා ගෙන යාමට අමතරව, ලේකම් විසින් කාලෝචිත සහ නිවැරදි තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබෙන බව සහතික කරනු ලබයි. ඊට අමතරව වර්ෂය තුළ ආයතනික පාලන කටයුතු, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි සහ අදාළ නීති සහ විධිවිධාන උපදෙස් සපයනු ලබයි. මතු කරන ලද සහ වාර්තා කිරීමට බලාපොරොත්තු වන සියලු ගැටලු ලේකම් විසින් ප්‍රමාණවත් කරුණු සහිතව ලේඛනගත කර ඇත.

අදාළ ව්‍යවස්ථාපිත, නව රෙගුලාසි සමඟ අනුකූල වීම සහතික කිරීම සමාගම් ලේකම්ගේ මූලික වගකීම වන අතර, කළමනාකාරිත්වය සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් අතර පාලන කටයුතු පිළිබඳ සම්බන්ධ කිරීම සිදු කරනු ලබයි.

අප සමඟ විශිෂ්ඨ අත්දැකීම් ලබා ගැනීම



මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. AAV/A/AASL/01/22/26 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 26 May 2023

සභාපති
ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 කොන්දේසි සහිත මතය

ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 කොන්දේසි සහිත මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 29 වැනි වගන්තියට අනුව, එක් එක් ප්‍රමාණාත්මක අයිතමයන් මූල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන් වශයෙන් පෙන්වීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අතිකාල සහ ප්‍රසාද දීමනාව සඳහා ගෙවා ඇති රුපියල් මිලියන 536ක් සහ රුපියල් මිලියන 358ක මුදලක් වෙන් වෙන් වශයෙන් පෙන්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය අංක 16 හි 51 වැනි වගන්තියට අනුව, වත්කමක අවශේෂ වටිනාකම සහ ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂිත වටිනාකම් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය අංක 8ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට, කාණ්ඩ 7කට අදාළව ධාරණ අගය රුපියල් මිලියන 28,580 ක වටිනාකමක් ඇති වත්කම් ප්‍රමිතිවලට අනුව සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා රුපියල් මිලියන 5,011 ක සමස්ථ වටිනාකමකින් යුත් ව්‍යාපෘති හතරක් (4) සිදු කර ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 55 වැනි ඡේදය මගින් දක්වා ඇති පරිදි ප්‍රාග්ධනීකරණය සහ ක්ෂය කිරීම වෙනුවට ව්‍යාපෘතිවල පිරිවැය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ නොනිමි තොග තුළ පෙන්වා දී ඇත.

(ඈ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 07 හි 14 වැනි වගන්තියට අනුව, වගකීම් සඳහා ඇපකරයක් ලෙස තබා ඇති මූල්‍ය වත්කම්වල ධාරණ අගය ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. කෙසේ වෙතත්, රුපියල් මිලියන 5,000ක් දක්වා ණය පහසුකම සඳහා ඇපයක් ලෙස තබා ඇති රුපියල් මිලියන 400ක ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල අංක 2.1.4 සටහනට අනුව, ආයෝජන දේපළ සාධාරණ වටිනාකමට තක්සේරු කරනු ලබයි. කෙසේ වෙතත්, සමාගම විසින් කුලියට ගත් මෙහෙයුම් ගොඩනැගිල්ල තුළ පවතින ස්ථාන 299 ක් ආයෝජන දේපළ ලෙස හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඊ) ඉහත දක්වා ඇති පනතේ, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ 9 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට පවරන සහ හිමි කර ගන්නා 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2050/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මඟින් අමාත්‍යවරයා විසින්, දෙවන උපලේඛනයේ (කටුනායක ගුවන් තොටුපළ සහ රත්මලාන ගුවන් තොටුපළ) නිශ්චිතව දක්වා ඇති අතර, ගුවන් යානා පහසුකම් හත සහ ඊට අදාළ ඉඩම (එහි ඇති ගොඩනැඟිලි සහ ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම) තුන්වන උපලේඛනයේ දක්වා ඇත. සමාගම විසින් 1983 වර්ෂයේ එය පිහිටුවන ලද දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා ඉඩමේ හිමිකාරිත්වය පැවරීමකින් තොරව ව්‍යවස්ථාපිත සේවා සපයන්නෙකු ලෙස) ගුවන් තොටුපළේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 76,328 ක මුදලක් (ධාරණ වටිනාකම) ආයෝජනය කර ඇත.

(උ) පැකේජය A - මගී පර්යන්ත ගොඩනැඟිලි සහ ආශ්‍රිත වැඩ ණය ගිවිසුමේ I ඡේදයේ 03 වන වගන්තියට අනුව, ණය ගැනුම්කරු විසින් මුදලෙහි භාවිත නොකළ මුළු ශේෂය මත වසරකට සියයට 0.1ක (0.1%) අනුපාතයකින් JICA වෙත බැඳීම් ගාස්තු අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. ව්‍යාපෘති අත්හිටවූ කාල සීමාව තුළ දැරූ බැඳීම් ගාස්තු සහ ව්‍යාපෘති ආශ්‍රිත වියදම් (උදා. වැටුප්, ආරක්ෂක වියදම්, සනීපාරක්ෂක සේවා, ආදිය) රුපියල් 68,980,863 කි. ආර්ථික නොවන බැඳීම් ගාස්තු සහ ව්‍යාපෘති ආශ්‍රිත වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත අය කළ යුතු වූවද, එය නොනිමි කාර්යයක් ලෙස ගණන් බලා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී රඳවා ගත් ඉපැයීම් සහ නොනිමි කාර්යයන් සමාන ප්‍රමාණයකින් අතිප්‍රකාශ කර ඇත.

(ඌ) උපදේශන සේවා ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිය 6.2 (ආ) සහ (ඇ) අනුව, පුද්ගලයන් සඳහා ගෙවීම තීරණය කරනු ලබන්නේ, එවැනි පුද්ගලයින් විසින් සේවා ඉටු කිරීම සඳහා සැබවින්ම වැය කරන කාලය සහ ප්‍රතිපූරණය කළ හැකි වියදම් සහ සේවාලාභියා විසින් උපදේශකයා වෙත සිදු කළ යුතු සේවා කාර්ය සාධනය සඳහා උපදේශකයා විසින් දරන ලද සාධාරණත්වය පදනම් කරගෙනය. කෙසේ වෙතත්, සේවාලාභියා විසින් උපදේශකයා වෙත ලබා දිය යුතු විදේශීය මුදලින් යෙන් 120,891,450 ක් වන සහ දේශීය මුදලින් රුපියල් 147,259,653 ක් වන අගය ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව නොනිමි කාර්ය සහ කොන්ත්‍රාත්කරුගේ ගෙවිය යුතු ගණන සමාන ප්‍රමාණයකින් ඌන ප්‍රකාශය කර ඇත.

(එ) මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 12 දිනැති ලිපියට අනුව, සමාගම විසින් ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගත් රුපියල් මිලියන 4,278 ක විදේශ ණය තුනක් 2022 දෙසැම්බර් 31 වන දිනට ආපසු ගෙවීම අත්හිටුවා ඇත. ණය ගිවිසුම් අනුව, ණය ගැනුම්කරු නියමිත දිනට ගෙවිය යුතු කිසියම් මුදලක් ගෙවීමට අපොහොසත් වුවහොත්, ණය ගිවිසුම්වල සඳහන් අනුපාතයකට නියමිත දින සිට සැබෑ ගෙවීමේ දිනය දක්වා කල් ඉකුත් වූ මුදල සඳහා පොළී උපචිත වේ. කෙසේ වෙතත්, ඉහත ණය තුනෙහි පැහැර හරින ලද පොළී සඳහා ප්‍රතිපාදන හෝ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම සිදු කර නොතිබුණි.

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

1.3 කාරණා අවධාරණය කිරීම

(අ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන, ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන (සම්මත අරමුදල) සහ රඳවාගත් ආදායම් අරමුදල සමඟ ඒකාබද්ධ කිරීමේ පදනම පැහැදිලි කරන මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන 2.1.1 වෙත අවධානය යොමු කරමි. 2005 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2006 පෙබරවාරි 09 වන දින ඔහුගේ අංක PE/GOCO/1/1 ලිපිය මඟින් දැනට රජයට අයත් ගුවන් තොටුපළේ ඉඩම සහ ගොඩනැඟිල්ල, සමාගම සතු අනෙකුත් චංචල සහ නිශ්චල වත්කම් සහ ශ්‍රී ලංකා රජය විසින් එවකට සේවය කරන ලද ගුවන් තොටුපළ සංවර්ධනයට අදාළ වගකීම් භාර ගැනීම සහ ශුද්ධ වත්කම් වටිනාකම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීම තක්සේරු කරන ලෙස සමාගමට නියෝග කර ඇත.

තවද, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාගමේ ඉල්ලීම මත නීතිපතිවරයා විසින් 2010 පෙබරවාරි 08 දිනැති සිය ලිපිය මඟින් ගුවන් තොටුපළේ ඉඩම් සහ ගොඩනැඟිලි සහ දැනට සිවිල් ගුවන් සේවා අධිකාරියට සහ ශ්‍රී ලංකා රජයට අයත් අනෙකුත් සියලුම චංචල සහ නිශ්චල වත්කම් අන්‍යෝන්‍ය වශයෙන් පැවරීමට අදාළ බැවින්, නව කැබිනට් අනුමැතියක් ලබා ගන්නා ලෙස උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, නව කැබිනට් තීරණයක් ලබා ගැනීමට සමාගම මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

තවද, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනත යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති ගැසට් නිවේදනය මඟින් අමාත්‍යවරයා විසින් කටුනායක ගුවන්තොටුපළ, රත්මලාන ගුවන්තොටුපළ, රත්මලාන සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානයෙහි ඉඩම්, ගොඩනැඟිලි සහ ව්‍යුහයන්, අත්තිඩියේ ගුවන් නාවික සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, ගම්පහ සහ පමුණුගම ගුවන්විදුලි නාවික ආධාරක, පිදුරුතලාගල රේඩාර් මධ්‍යස්ථානය, නුවරඑළියේ නිවාඩු බංගලාව සහ හෙක්ටයාර් 0.125 ක අනුරාධපුර ඉඩම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා සමාගමට පවරාගෙන පවරා ඇත. එබැවින් සමාගම විසින් භාවිත කරන ලද ඉඩම් සහ ගොඩනැඟලි වල අයිතිය විගණනයේ දී සැක සහිත විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගොඩනැඟිලි පමණක් නැවත ප්‍රත්‍යාගණනය කර ඇති අතර, තක්සේරුව අවසන් කර ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 අප්‍රේල් 12 දින මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකා බාහිර ණය සේවා සම්බන්ධයෙන් අතුරු ප්‍රතිපත්තිය" විශේෂ ලිපිය අනුව 2 අදියර ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමත් සමඟ සමාලෝචිත වර්ෂය අවසානයේ ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයන් පැහැදිලි කරනු ලබන අංක 29 සටහන වෙත මාගේ අවධානය යොමු කරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඉහත තීරණයට අනුව ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් සහතිකයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඉදිකිරීම්කරු විසින් ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලදී. එබැවින් ඉදිකිරීම්කරුට ප්‍රමාද ගාස්තු ඇතුළු හිඟ ගෙවීම්, අමතර ගබඩා ගාස්තු සමඟ ඇණවුම් කරන ලද පිරියත හා ද්‍රව්‍යවල පිරිවැය, කාර්ය පවත්වාගැනීමේ පිරිවැය (ආරක්ෂාව, මෙහෙයුම්, පාරිසරික), පරිශ්‍රයේ අසම්පූර්ණ වැඩ සඳහා නඩත්තු වියදම්, ද්‍රව්‍ය දිරාපත්වීම නිසා ඇති වන අලාභය, තාවකාලික වැඩ කොටස් ඉවත් කිරීම සහ ස්ථාවර කුලියට දීම, ඉදිකිරීම් උපකරණ, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සහ සේවයේ යොදවා ඇති ශ්‍රමය ආපසු ගෙන්වා ගැනීමේ පිරිවැය, වෙනත් ඕනෑම කොන්ත්‍රාත්කරුවෙකුගේ අත්හිටුවීමෙන් හා අවසන් කිරීමෙන් පැන නගින හිමිකම් පෑම්, ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් ආපසු අයකරනු ලබන TC හි උප කොන්ත්‍රාත්කරුවන් හේතුවෙන් ඇති විය හැකි නඩු ගාස්තු, සේවා යෝජකයාට ආදායම අහිමි වීම, ණය උපයෝජනය පිළිබඳ ගැටළුව යනාදිය ඇතුළත් දැඩි මූල්‍ය බලපෑම් සමාගමට මුහුණ දීමට සිදුවනු ඇත.

අත්හිටුවීමෙන් පැන නගින කොන්ත්‍රාත්කරුගේ සම්පූර්ණ හිමිකම් ප්‍රමාණය IPA 16-20 අනුව ඉදිරිපත් කර ඇති අතර ඒවා ශ්‍රී ලංකා රුපියල් 15,729,888,690 (ජපන් යෙන් 6,352,071,405) බවට පරිවර්තනය කර ඇත. ඒවා උපදේශක විසින් සමාලෝචනය කර ඇති අතර, 2022 දෙසැම්බර් 9 දින සිට බලාත්මක වන පරිදි අවසන් වීමට නියමිතව ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු තවමත් අත්හිටුවීමේ හිමිකම් ඇතුළුව අවසන් කිරීමේ හිමිකම් (අවසාන හිමිකම් පෑම) ඉදිරිපත් කර නැත.

මේ කාරණය සම්බන්ධයෙන් මගේ මතය සංශෝධනය කර නොමැත.

1.4 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු.

වෙනත් තොරතුරු සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු වලින් සමන්විත වන අතර, එයට මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ සම්බන්ධ මාගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරණය නොවන අතර ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක තහවුරුවක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන්, මාගේ වගකීම වනුයේ වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර එහිදී, වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශ අතර ප්‍රමාණාත්මක නොගැලපීමක් පවතීද, විගණනයේ දී අප ලද දැනුම අනුව හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇතිද යන්න සොයා බලනු ලබයි.

මම විසින් සමාගමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා පාලනය සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින අයට එම කාරණය සන්නිවේදනය කිරීමට මට අවශ්‍ය වේ. තවදුරටත් ප්‍රමාණාත්මකව නිවැරදි නොකළ සාවද්‍ය ප්‍රකාශ තිබේ නම් ඒවා නියමිත වේලාවට සභාගත කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකාරිත්වයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරිත්වයෙහි වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම සහ සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකාරිත්වයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගම විසින් සිය ආදායම්, වියදම්, වත්කම්, සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරයාගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති විය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණ භාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මවිසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක වැරදි අවුරුදු අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනා නොගැනීමට වඩා වැඩිය. මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇති කිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.

- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි. නමුත් එසේ සිදු කරන්නේ සමාගමේ අභ්‍යන්තර පාලනයෙහි ඵලදායීතාවය සහ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා ඊට සම්බන්ධ අනාවරණය කිරීම් වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.

- කළමනාකාරිත්වය ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමාගමට අඛණ්ඩ පැවැත්මක් ඇති වීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේ ද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශන වල අදාළ අනාවරණයන් පිළිබඳව මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත මගේ නිගමනය පදනම් වී ඇත. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්ත්වයන් මඟින් සමාගම අඛණ්ඩව පැවැත්ම නැවැත්වීමට හේතු විය හැකිය.

- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මඟින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේ ද යන්න තක්සේරු කරමි.

මගේ විගණනයේ දී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ වේලාව සහ සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත්ය:

2.1.1 මගේ වාර්තාවේ මතය සඳහා පදනම යන අංශයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනෙන පරිදි සමාගම විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(1) (ඈ) වගන්තිය අනුව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය අනුව නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වර්ෂය හා සංගත වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ නියමයන්ට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි මා විසින් පසුගිය වර්ෂය සඳහා සිදුකරන ලද සියලුම නිර්දේශ කිරීම් අන්තර්ගත වේ..

2.2 සිදු කරන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් කරුණු වලට සීමා වූ බැවින්, කිසිවක් මගේ අවධානයට යොමු වී නැත.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙ හි 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව ව්‍යාපාරයේ සාමාන්‍ය පිළිවෙතට බැහැරව සමාගම විසින් ඇති කර ගත් ඕනෑම කොන්ත්‍රාත්තුවක් සඳහා සමාගමේ පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාව ප්‍රකාරව සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධානයන් සමඟ සමාගම පහත අවස්ථාවන් හි දී හැර අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීම;

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නීතිය/විධානය වෙත	විස්තරය
(අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතෙ හි 14 වන වගන්තිය	2023 මැයි 15 දින දක්වා ගුවන් යානා ස්ථාපිත කිරීම හෝ පුළුල් කිරීම පිළිබඳ ප්‍රධාන සැලැස්මක් සමාගම විසින් සකස් කොට නොතිබූ අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ) රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021- ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය	
(i) වගන්තිය 2.2.2 (ආ) xii, සහ 4.3 (අ), (ආ)	අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල නිසි ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ සමාගමේ අවදානම් පැතිකඩ හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා අවදානම් කමිටුවේ කාර්යභාරය සහතික කිරීම සහ අවදානම් කළමනාකරණ රාමුවක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ග නිර්දේශ කිරීම සහ අවදානම් ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවලියක් ඇතුළු පාලන පද්ධතිය අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතා සපුරාලීම තක්සේරු කිරීම සඳහා තොරතුරු හෝ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.
(ii) වගන්තිය 2.2.2 (ආ) xiv, (2.3)	කාර්ය සාධන විශිෂ්ටත්වය අධීක්ෂණය කිරීමේදී, සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සැලකිල්ලට ගනිමින් සමාගම තුළ පශ්චාත් සමාලෝචන යාන්ත්‍රණයක් පිහිටුවාලිය යුතුය. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාවට නැංවීමේ සඵලතාවය වරින් වර ඇගයීමට ලක් කර සහතික කළ යුතු අතර අවශ්‍ය පරිදි නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය, ප්‍රධාන ව්‍යාපෘති හෝ කොන්ත්‍රාත්තු සම්බන්ධ තීරණාත්මක ගැටළු සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර නොතිබුණි.
(ඇ) රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021- රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොත	
(i) 1 ඡේදය	පවතින ව්‍යුහයන් සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතෙහි නිර්දේශිත ඒවා අතර පරතරය විශ්ලේෂණය කිරීම සඳහා අනෙකුත් මෙහෙයුම් ප්‍රධානීන් සමඟ සහයෝගයෙන් වෙනස්කම් පිළිබඳ විශ්ලේෂණයක් සිදු කළ යුතු අතර, මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා ඒවායේ පවතින මෙහෙයුම් ව්‍යුහයන් සුදුසු පරිදි වැඩිදියුණු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර ක්‍රියා කළ යුතුය. සමාගම විසින් ඉහත අවශ්‍යතාවය මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි.
(ii) 2.1 ඡේදය	සමාගමට තම අරමුණු ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසන මනා පද්ධතියක් සහ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බවට සමාගම සහතික කළ යුතුය. මෙම පද්ධති සහ ක්‍රියාවලීන් සමාගමට එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහසුකම් සලසන සහතික කිරීම සඳහා වරින් වර සමාලෝචනය කළ යුතුය. තවද, සමාගමට අදාළ වන පුළුල් නෛතික සහ නියාමන රාමුව තුළ සෑම නිලධාරියෙකුම තම යුතුකම් සහ වගකීම් පිළිබඳව දැනුවත් බව මණ්ඩලය සහතික කළ යුතුය. කෙසේ වෙතත්, වික් වික් තනතුරු සඳහා රාජකාරි ලැයිස්තුව නිර්වචනය කර නොතිබුණි. තවද, 2019 වර්ෂයේදී ක්‍රියා පටිපාටි අත්පොත් සකස් කර අනුමත කර ඇති අතර ඇතැම් අත්පොත් යාවත්කාලීන කර නොමැත/ඇතැම් අත්පොත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන යාවත්කාලීන කර තිබුණි.
(iii) 3.2 (i) ඡේදය	සමාගම විසින් සේවක තනතුරු, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR), වැටුප් ව්‍යුහය සහ දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාළ ඔවුන්ගේ ඉල්ලීම්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සමඟ, අදාළ රාජ්‍ය ව්‍යවසාය අධ්‍යක්ෂ ජනරාල් (DGNB), හෝ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තුව (DGMS) වෙත පිටපතක් සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ (DGMS) අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම හැර ඉහත අවශ්‍යතා සමාගම විසින් සපුරා නොතිබුණි.
(iv) 3.4 ඡේදය	රැකියා විස්තරය, අධ්‍යයන සුදුසුකම්, පළපුරුද්ද ආදිය ඇතුළත් කිරීම සඳහා බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා යෝජනා ක්‍රම සැකසීමේදී සමාගම සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාගම බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට රැකියා විස්තරය සහ බඳවා ගැනීමේ ක්‍රමය ඇතුළත් කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නීතිය/විධානය වෙත	විස්තරය
(v) 4.3 (i), (iii) ඡේදය	සමාගම විසින් තම අවශ්‍යතා තක්සේරු කිරීම සහ අවශ්‍ය භාණ්ඩ සඳහා නියම ප්‍රමාණය, ගුණාත්මකභාවය සහ කාලය තීරණය කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් පවත්වා ගැනීම අවශ්‍යතාවයකි. තවද, යෙදවුම් කළමනාකරණය සඳහා විධිමත් තොග කළමනාකරණ පද්ධතියක් ඇති බව සමාගම සහතික කළ යුතුය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන දිනට කොටස් අයිතම 955ක් සඳහා ශූන්‍ය කොටස් ශේෂයන් පැවතුණි.
(vi) 6.6 ඡේදය	මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික වාර්තාව සහ ගිණුම් කෙටුම්පත් විගණකාධිපති වෙත භාර දිය යුතුය. කෙසේ වෙතත්, සමාගමේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපතිවරයා වෙත යොමු කර නොතිබුණි.
(vii) 6.11 ඡේදය	විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් දැනුවත් තීරණ ගැනීමට සමාගමට පහසුකම් සලසන එහි අභ්‍යන්තර හා බාහිර යන දෙඅංශයේම පාර්ශ්වකරුවන් සමඟ පැහැදිලි සන්නිවේදන පිළිවෙතක් සමාගමට තිබිය යුතු අතර, සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්ම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සමාග මේ වෙබ් අඩවියේ දැක්වීමද අනිවාර්ය වේ. කෙසේ වෙතත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම තවමත් සමාගමේ වෙබ් අඩවියේ දැකගත නොහැක.
(viii) 7.1 සහ 7.4 ඡේදය	සියලුම රජය සතු ආයතනවල කාර්යසාධන ඇගයීම් අනිවාර්ය වන අතර එය අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධ කාර්ය සාධන ඇගයීම් ස්ථාපිත කිරීමට පහසු වන සරල සහ පැහැදිලි යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු අතර, මාසික මණ්ඩල රැස්වීම් වලදී පරීක්ෂා කිරීමට ව්‍යාපෘති/කොන්ත්‍රාත්තුවල ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලව භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත යොමු කර නොතිබුණි.
(ඈ) පොදු ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/2003 ජූනි 2වනිදා සහ 12වනිදා හි 9.3.1, 9.3.1 (ස) සහ 9.7 වගන්තිය	සමාගම විසින් සේවක තනතුරු, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR), වැටුප් ව්‍යුහය සහ දීමනා ඇතුළු සේවක සංඛ්‍යාවට අදාළ ඔවුන්ගේ ඉල්ලීම්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සමඟ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 2,216 දක්වා විවිධ ආකාරයේ දීමනා 16ක් කාර්ය මණ්ඩලය වෙත ගෙවා ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.
(ඉ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 01/2015 හි 2.3 සහ 3.1 වගන්තිය සහ 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) චක්‍රලේඛය	සමාගමේ HM 1-1 කාණ්ඩයට සමාන හෝ ඊට වැඩි තනතුරු අනුමැතියක් ඇති වෙනත් ඕනෑම නිලධාරීන් සඳහා ලීටර් 115 ක් ලබා දෙනු ලබයි. කෙසේ වෙතත්, S_{10} වැටුප් පරිමාණයේ නිලධාරීන් 128 ක් සඳහා ලීටර් 130 ක් සහ S_{11} නිලධාරීන් 209 ක් සඳහා ලීටර් 200 ක් (ඉහළ වැටුප් පරිමාණය සමාගම විසින් ලබා දී ඇත) සමාගම විසින් අනුමත කර ඇත. නියැදි විගණන පරීක්ෂණයේ දී අනාවරණය වූ පරිදි, චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අනුමත සීමාවන්ට වඩා අතිරික්ත මාසික ඉන්ධන දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 337 දෙනෙකු සඳහා රුපියල් මිලියන 88.9 ක ඉන්ධන ලීටර් 240,280 ක් ලබා දී ඇත.
(ඊ) 2021 අප්‍රේල් 27 වැනි දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය (අංක.ඊජ-ඊඑ-03-27/04/2021)	සමාගමේ අංශවල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සඳහා යටිතල පහසුකම්, මූල්‍ය උපායමාර්ග, මෙහෙයුම් උපායමාර්ග සහ අලෙවිකරණය සහ ව්‍යාපාර සංවර්ධන උපායමාර්ග සහ මානව සම්පත් උපායමාර්ග යන කාණ්ඩ පහ (5)ක් පත් කර ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එම කාණ්ඩ පහ මඟින් සිය රාජකාරි කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූලව සමාගම සිය බලතල, කාර්යයන් සහ රාජකාරි ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ය) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, නියමිත කාල සීමාව තුළ සහ අදාළ නීතිවලට අනුකූලව සමාගමේ සම්පත් ආර්ථික, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ලබාගෙන ඒවා භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීම.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.5 *වෙනත් කරුණු*

(අ) 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ අංශ 23 කට අයත් අයිතම 7,527 ක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ කමිටු මණ්ඩල වාර්ෂික සමීක්ෂණ වාර්තාවේ පෙන්වා ඇති රුපියල් මිලියන 3,783.8 ක චංචල වත්කම් භෞතිකව හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් භෞතිකව සත්‍යාපනය කළ නොහැකි විය. එබැවින් එම වත්කම්වල පැවැත්ම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) අත්තිකාරම් ලෙස ණය ගැතියන්ගෙන් ලද රුපියල් මිලියන 193 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවීමකින් හෝ අදාළ ණය ගැතියන්ට එරෙහිව හිලවු නොකිරීමෙන් පෙන්වා දී තිබුණි. තවද, ණය ශේෂයන් පිළිබඳ වෙනම වයස් විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සියලුම දෙපාර්තමේන්තු සහ අංශ ප්‍රධානීන් විසින් ලබාගත් සැපයුම්කරු අත්තිකාරම් අදාළ වර්ෂය අවසන් වීමට පෙර පියවිය යුතු වුවද, සමාගමේ විවිධ දෙපාර්තමේන්තු විසින් වසර තුළ සහ ඊට පෙර වසර තුළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලබාගත් රුපියල් මිලියන 100 ක අත්තිකාරම් පියවා නොතිබුණි.

(ඈ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 11 වැනි වගන්තියට අනුව, තක්සේරු වර්ෂය සඳහා ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම ගණනය කිරීමේදී, ආදායම් නිෂ්පාදනයේදී වර්ෂය තුළ දරන ලද වියදම් අඩු කරනු ලැබේ. ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා මෙම වගන්තිය යටතේ කිසිදු අඩු කිරීමකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, ව්‍යාපාරයෙන් තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී, සමාලෝචිත වර්ෂය තුළ ණය ආපසු ගෙවීම සඳහා සමාගම විසින් මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද රුපියල් මිලියන 1,255 ක මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි විධිමත් අනුමැතියකින් තොරව අඩු කර ඇති අතර, මෙම ගැලපීම් 2011 වර්ෂයේ සිට සිදු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021/22 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද රුපියල් මිලියන 376.5 කින් ඌන ප්‍රකාශය කර ඇත.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ රඳවා ගැනීමේ බදු සහ කල්පිත බදු සම්බන්ධයෙන්, 1999/2020 සහ 2013/2014 වර්ෂයේ ලැබිය යුතු ආදායම් බදු ලෙස රුපියල් මිලියන 848 ක මුදලක් පෙන්වා ඇත. ඉන් අනතුරුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2023 ජනවාරි දිනැති ප්‍රකාශයේ සවිස්තරාත්මක විගණනයකට යටත්ව රුපියල් මිලියන 321 ක මුදලක් ආපසු ලබා දිය හැකි බව තහවුරු කර තිබුණි. එබැවින් ලැබිය යුතු රුපියල් මිලියන 527ක ආදායම් බදු ප්‍රමාණය සාක්ෂාත් කර ගැනීම අවිනිශ්චිත වේ.

(ඊ) 2011 මාර්තු 29 දින සීමාසහිත ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (ගු.ගු.සේ.ස) සහ ශ්‍රීලංකා එයාර්ලයින්ස් ලිමිටඩ් (SLAL) අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට (MOU) අනුව, ගු.ගු.සේ.ස විසින් ශ්‍රීලංකා එයාර්ලයින්ස් ලිමිටඩ් වෙත දැනටමත් වෙන් කර ඇති ඉඩ ඉදිරියටත් ලබා දෙනු ඇති අතර, දෙපාර්ශවයම බදු ගිවිසුමකට එළඹිය යුතුය. කෙසේ වෙතත්, කල්බදු ගිවිසුමක් අත්සන් නොකර, 2011 වසරේ සිට ශ්‍රීලංකා එයාර්ලයින්ස් ලිමිටඩ් වෙත ඉඩ ප්‍රදානයන් 3 ක් බදු දී ඇත. ගු.ගු.සේ.ස හි තවත් ක්‍රියාකාරකම් 7ක් සහ ඉඩ ප්‍රදානය බදු ගිවිසුම් අත්සන් නොකර ප්‍රදාන ලිපියක් මඟින් ශ්‍රීලංකා එයාර්ලයින්ස් ලිමිටඩ් වෙත ලබා දී ඇත.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී, ගොඩබෑම සහ නැවැත්වීම, සහ ගුවන් පාලම් ගාස්තු සහ කුලියට දීම සහ අනෙකුත් ගාස්තු සඳහා පැහැර හැරීමේ පොලී සම්බන්ධයෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් හි හිඟ ණයගැති ශේෂය රුපියල් මිලියන 1,541.8 ක් විය. කෙසේ වෙතත්, නොගෙවූ ණයගැතියා පියවීමකින් තොරව දින 365 කට වැඩි කාලයක් ගත වූවද කිසිදු පියවරක් ගෙන නොතිබුණි. තවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් ණයගැති ශේෂය තහවුරු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ (ම.රා.ජා.ගු) මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 2,033ක් වාර්තා කර තිබූ අතර, එය මෙහෙයුම් ආදායමට වඩා 26 ගුණයක් විය. විදේශ විනිමය අලාභය ප්‍රධාන වශයෙන් හේතු කොට සමාලෝචිත වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 22,214 ක් විය. 2017 සිට 2022 දක්වා බදු ගෙවීමෙන් පසු සමුච්චිත ශුද්ධ අලාභය රුපියල් මිලියන 42,818 විය. මත්තල ගුවන් තොටුපළේ අපේක්ෂිත වාර්ෂික මගී ධාරිතාව මිලියනයක් පමණ වුවද, පසුගිය වසර හය තුළ මුළු මගීන් සංඛ්‍යාව 103,324 ක් පමණක් වූ අතර, මුළු ගුවන් ගමන් සංඛ්‍යාව 2,612 ක් විය. එබැවින් ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා දරන ලද ඩොලර් මිලියන 247.7 ට සමාන රුපියල් මිලියන 36,564 ක මුළු මුදල ඵලදායී ලෙස භාවිත කර නොතිබුණි. තවද, ඉහත ඉදිකිරීම සඳහා ලබාගත් ඩොලර් මිලියන 190 ක ණය සඳහා වාර්ෂික ණය වාරිකය ලෙස රුපියල් මිලියන 1,842 ක මුදලක් ගු.ගු.සේ.ස විසින් ගෙවා තිබුණි.

(එ) 2017 වසරේ සිට 2022 දක්වා කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, (ර.ජා.ගු) - රත්මලාන හි සමුච්චිත අලාභය රුපියල් මිලියන 2,827.9 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 1,154 ක අලාභය ඊට ඇතුළත් වේ. සමාගම විසින් දක්වා ඇති ප්‍රකාශයට අනුව, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - රත්මලාන ප්‍රධාන වශයෙන් පුහුණුවීම් සහ දේශීය වාණිජ මෙහෙයුම් ක්‍රියාත්මක කරන අතරම ශ්‍රී ලංකා ගුවන් හමුදා මෙහෙයුම් සඳහා පහසුකම් සපයයනු ලබන හෙයින් එහි මෙහෙයුම් ක්‍රමවේදය ශ්‍රී ලංකාවේ අනෙකුත් ගුවන් තොටුපළවලට වඩා වෙනස් වේ. තවද, හරහා පියාසැරි ආදායම ගු.ගු.සේ.ස හි ආයතනික ආදායමට ලියනු ලැබේ. කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - රත්මලාන හි මූල්‍ය අලාභ වලට විශාල ප්‍රදේශ පාලන මධ්‍යස්ථානයට අදාළ පිරිවැය ඇතුළත් නමුත් ඒ ආශ්‍රිතව හරහා පියාසැරි ආදායම මේ වන විට ගු.ගු.සේ.ස හි ආයතනික ආදායමට අවශෝෂණය වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් යටතේ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - රත්මලාන වෙත හරහා පියාසැරි ආදායම උකහා ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා ගු.ගු.සේ.ස විසින් විය නිවැරදි කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. 2020 වර්ෂයේදී ගුවන් යානා සංචලනයන් 13 ක් පමණක් වන අතර, 2022 වර්ෂය තුළ ගුවන්යානා සංචලනයන් 38 ක් වූ අතර 2020, 2021 සහ 2022 වසර තුළ මගී සංචලන 60, 28 සහ 54 ක් විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඒ) යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ 2019 ඔක්තෝම්බර් 17 වන දින ආරම්භ කරන ලදී. ගුවන් තොටුපළ ආරම්භයේ සිටම ගුවන් යානා සංචලනයන් 166 ක් සහ මගී සංචලන 5,035 ක් පමණක් වාර්තා වී ඇති අතර, පසුගිය වසර 04 තුළ වාර්තා වූ සමුච්චිත අලාභය රු. මිලියන 232.8 කි. සමාලෝචිත වර්ෂය තුළ ආදායම සහ මෙහෙයුම් වියදම් පිළිවෙලින් රුපියල් මිලියන 4.7 ක් සහ රුපියල් මිලියන 81.8 ක් විය.

(වෙ) මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපළ 2018 මාර්තු 25 වන දින සිවිල් මෙහෙයුම් සඳහා විවෘත නැවත ආරම්භ කර ඇති අතර, පසුගිය වසර පහ තුළ වියදම ලෙස රුපියල් මිලියන 86.62ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී පවා කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ඔ) සමාගමේ එක් එක් අංශයේ ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දිය යුතු අතර ඒ අනුව සත්‍ය කාර්යසාධනය ඇගයීමට ලක් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කාර්යසාධන දර්ශකය ඇගයීම සිදු කර නොතිබුණි.

(ඕ) පැකේජ් B දූරස්ථ ගුවන් පථය සහ ධාවන පථය ඉදිකිරීම් කටයුතු 2017 අප්‍රේල් 25 දින ආරම්භ කර 2019 ඔක්තෝබර් 24 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු 2021 ජනවාරි 26 දින අවසන් කර තිබුණි. එම හේතුවෙන් නියමිත කාලය තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට නොහැකි විය.

(ඖ) පැකේජය A - මගී පර්යන්ත ගොඩනැඟිල්ල සහ ආශ්‍රිත කටයුතුවල ඉදිකිරීම්
පහත සඳහන් ඌනතාවයන් දැකගත හැකි විය

(i) ඉහත ඉදිකිරීම් කටයුතු ජපානයේ කොන්ත්‍රාත්කරු වෙත 2020 මාර්තු 04 දින භාර දුන් අතර, 2020 මාර්තු 12 වැනි දින ගිවිසුම අත්සන් කර, 2020 මාර්තු 25 වැනි දින කාර්යසාධන සුරක්ෂිතභාවය ලබා දී ඇත. කෙසේ වෙතත්, මාස 09 ක ප්‍රමාදයකින් 2020 මාර්තු 12 වන දින කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව, කොන්ත්‍රාත්තුවේ කටයුතු 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කර ඇත. එමෙන්ම කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සියයට 30ක් විය යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවේ සැබෑ ප්‍රගතිය සියයට 5.38 ක් පමණක් විය.

(ii) කොන්ත්‍රාත්තුවේ 14.7(ඉ) කොන්දේසිය අනුව, ඉංජිනේරුවරයාට ප්‍රකාශය සහ සනාථ කරන ලියකියවිලි ලැබීමෙන් දින 56ක් ඇතුළත, සේවායෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකයේ සහතික කර ඇති මුදල කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතුය. කෙසේ වෙතත්, 2022 පෙබරවාරි සිට 2022 ජූනි දක්වා කාලය සඳහා ලද IPC අංක 5 සහ 6 හි යෙන් 444,498,046 සහ ශ්‍රී ලංකා රුපියල් 1,486,804,716 ක මුදලක් 2023 පෙබරවාරි 28 වන විටත් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

		දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය	
	සටහන්	2022	2021
ආදායම	5	26,006,395,611	7,386,170,394
වෙනත් ආදායම්	6	1,640,400,773	492,782,034
		27,646,796,384	7,878,952,428
පරිපාලන සහ ආයතන වියදම්	7	(14,941,498,625)	(11,654,806,923)
මෙහෙයුම් (අලාභය)/ලාභය		12,705,297,759	(3,775,854,496)
මූල්‍ය ආදායම		6,136,674,362	3,321,110,256
මූල්‍ය පිරිවැය		(12,408,946,131)	(506,142,527)
ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම	8	(6,272,271,769)	2,814,967,729
බදු පෙර (අලාභය)/ලාභය		6,433,025,990	(960,886,767)
ආදායම් බදු වියදම්	9	(1,630,328,423)	(1,122,614,992)
වසර සඳහා (අලාභය)/ලාභය		4,802,697,567	(2,083,501,758)
කොටසක මූලික (අලාභය)/ඉපැයුම්	10	24,013	(10,417)
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීමේ උපකල්පන වල වෙනස්වීම් වලින් පැන නගින ලාභය/(අලාභය)	23	(366,067,192)	878,191,927
ආයුගණක ලාභය/(අලාභය) මත විලම්බිත බදු	13	87,856,126	(210,766,063)
වෙනත් මුළු විස්තීර්ණ ආදායම් එකතුව		(278,211,066)	667,425,865
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		4,524,486,501	(1,416,075,894)

පිටු අංක 90 සිට 117 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

		දෙසැම්බර් 31 දිනට	
	සටහන්	2022	2021
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	11	39,630,716,596	41,624,923,625
නොනිමි ප්‍රාග්ධන වැඩ	11	36,697,665,852	30,459,475,504
අස්පෘශ්‍ය වත්කම්	12	15,931,315	21,835,257
විලම්බිත බදු වත්කම්	13	3,104,834,912	1,878,384,291
		79,449,148,675	73,984,618,678
දිගුකාලීන ආයෝජන			
දිගු කාලීන ණය		11,588,500	12,788,500
ණයකර වල ආයෝජන	14.1	3,298,300,000	4,088,300,000
දිගුකාලීන බැංකු තැන්පතු	14.2	6,962,540,843	1,266,678,125
සමාගම් නිලධාරීන් වෙත ලබා දුන් ණය	16.1	68,338,785	61,602,205
		10,340,768,128	5,429,368,830
ජංගම වත්කම්			
තොග	15	2,246,363,918	808,185,284
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	16	8,734,298,692	3,845,984,745
ලැබිය යුතු ආදායම් බදු	26	91,084,038	848,093,206
කෙටි කාලීන බැංකු තැන්පතු	14.2	78,025,787,863	41,515,132,946
මුදල් සහ මුදල් සමාන දෑ	17	642,335,995	413,045,010
		89,739,870,507	47,430,441,191
මුළු වත්කම්		179,529,787,309	126,844,428,699
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	20,000,200	20,000,200
සංචිත	19	6,848,033,247	6,846,183,247
රඳවා ගත් ඉපැයුම්	20	38,389,121,466	34,448,138,251
		45,257,154,912	41,314,321,698
ජංගම නොවන වගකීම්			
ණය ගැනීම්	21	93,028,636,038	60,435,353,759
ණයකර	22	4,000,000,000	4,000,000,000
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	23	5,877,345,342	4,837,739,167
විලම්බිත බදු වගකීම	13	9,264,909,416	7,373,210,258
විලම්බිත රජයේ ප්‍රදාන	24	907,164,185	956,671,369
		113,078,054,981	77,602,974,554
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	25	7,950,084,768	3,637,802,214
ණය ගැනීම්	21	13,244,492,649	4,289,330,231
		21,194,577,417	7,927,132,445
මුළු වගකීම්		134,272,632,397	85,530,106,999
මුළු හිමිකම් සහ වගකීම්		179,529,787,309	126,844,428,699

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.
මෙම මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි.

සභාපති

අධ්‍යක්ෂ

මූදල් ප්‍රධානී

පිටු අංක 90 සිට 117 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි.

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

	සටහන්	ප්‍රකාශිත ප්‍රාග්ධනය	වෙනත් සංචිත	රඳවා ගත් ඉපැයුම්	එකතුව
2021 ජනවාරි 1 වන දිනට ශේෂය		20,000,200	1,077,266,769	35,885,634,586	36,982,901,555
පෙර වර්ෂය හා ගැළපුම්		-	-	(18,920,440)	(18,920,440)
වසර සඳහා (අලාභය)/ලාභය		-	-	(2,083,501,758)	(2,083,501,758)
වෙනත් විස්තීර්ණ ආදායම්					
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැදීම්වල ආයුගණන අලාභය		-	-	878,191,927	878,191,927
ආයුගණන ලාභය මත විලම්බිත බදු		-	-	(210,766,063)	(210,766,063)
වෙනත් විස්තීර්ණ ආදායම්		**-**	**-**	**667,425,864**	**667,425,864**
මුළු විස්තීර්ණ ආදායම		**-**	**-**	**(1,416,075,894)**	**(1,416,075,894)**
ගෙවූ ලාභාංශ	28	-	-	-	-
ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය		-	5,766,416,478	-	5,766,416,478
සංචිත ගිණුමට මාරු කිරීම්		-	2,500,000	(2,500,000)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**20,000,200**	**6,846,183,247**	**34,448,138,251**	**41,314,321,698**
2022 ජනවාරි 1 දිනට ශේෂය		20,000,200	6,846,183,247	34,448,138,251	41,314,321,699
පෙර වර්ෂය හා ගැළපුම්		-	-	(81,653,286)	(81,653,286)
වසර සඳහා ලාභය		-	-	4,802,697,567	4,802,697,567
වෙනත් විස්තීර්ණ ආදායම්					
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැදීම්වල ආයුගණන අලාභය		-	-	(366,067,192)	(366,067,192)
ආයුගණන ලාභය මත විලම්බිත බදු		-	-	87,856,126	87,856,126
වෙනත් විස්තීර්ණ ආදායම්		**-**	**-**	**(278,211,066)**	**(278,211,066)**
මුළු විස්තීර්ණ ආදායම්		**-**	**-**	**4,524,486,500**	**4,524,486,500**
ගෙවූ ලාභාංශ	28	-	-	(500,000,000)	(500,000,000)
සංචිත ගිණුමට මාරු කිරීම්		-	1,850,000	(1,850,000)	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**20,000,200**	**6,848,033,247**	**38,389,121,466**	**45,257,154,912**

පිටු අංක 90 සිට 117 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

		දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය	
	සටහන්	2022	2021
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහ			
ආදායම් බදු වියදමට පෙර (අලාභය)/ලාභය		6,433,025,990	(960,886,767)
ගැළපුම්:			
ක්ෂය කිරීම්	11	2,354,707,348	2,630,042,901
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	12	12,086,369	18,376,125
පෙර වර්ෂයේ ක්ෂය කිරීම් වීම්/ක්‍රමක්ෂය ගැළපුම්	11-12	16,674,876	13,631,931
දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන/මාරු කිරීම් සඳහා ගැළපුම්	11-12	410,106,958	512,203,484
ලියා හරින ලද වත්කම්	11-12	516,596	167,229,652
ණය පරිවර්තනය මත විනිමය (ලාභය) / අලාභය	8	43,977,059,211	2,141,205,420
ස්ථාවර තැන්පතු පරිවර්තනය මත විනිමය (ලාභය) / අලාභය	8	(33,422,478,229)	(2,775,429,116)
ආයෝජන වෙතින් ලද ආදායම	8	(6,110,206,527)	(3,301,121,938)
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද (ලාභය)/අලාභය		(1,121,060)	9,754,246
පෙර වර්ෂය හා ගැළපුම්	20	(81,653,286)	(18,920,458)
විලම්බිත රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	24	(49,507,184)	(48,656,180)
මූල්‍ය පිරිවැය	8	1,854,365,149	1,140,366,223
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම සඳහා ප්‍රතිපාදන	23	1,136,495,208	716,345,888
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		16,530,071,419	244,141,411
තොග (වැඩි වීම)/ අඩු වීම		(1,438,178,634)	28,903,438
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ (වැඩි වීම)/ අඩු වීම		(2,389,908,897)	(525,569,111)
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩි වීම/ (අඩු වීම)		3,461,203,011	1,204,329,621
මෙහෙයුම් වලින් උපයන ලද මුදල්		16,163,186,900	951,805,359
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගෙවීම	23	(462,956,225)	(482,947,999)
පොලී ගෙවීම්		(1,003,285,606)	(1,168,965,347)
ආදායම් බදු ගෙවීම්	26	(120,214,592)	(14,724,996)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් (භාවිත කරන ලද)/ උපයන ලද ශුද්ධ මුදල්		14,576,730,475	(714,832,983)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	11	(7,015,703,468)	(22,960,368,432)
ණයකරවල ශුද්ධ (ආයෝජන) / ආපසු ගැනීම්	14	790,000,000	1,550,000,000
බැංකු තැන්පතු වල ශුද්ධ (ආයෝජන)/ආපසු ගැනීම්		(8,784,039,406)	3,096,129,871
ක්‍රීඩා සංගමය (වෙත ලබා දුන්)/අයකරගත් ණය		1,200,000	(12,788,500)
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම		1,327,879	2,127,330
පොලී ලැබීම්		3,611,801,476	3,196,452,332
කාර්යමණ්ඩල ණය ප්‍රදාන		(90,623,662)	(101,513,352)
කාර්යමණ්ඩල ණය ලැබීම්		83,887,082	120,930,596
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් උපයන ලද ශුද්ධ මුදල		(11,418,824,975)	(15,109,030,155)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහ			
ලාභාංශ ගෙවීම්	28	(500,000,000)	-
ණය ලැබීම්	21	2,544,341,074	19,833,345,828
ණය ආපසු ගෙවීම් (දේශීය)	21	(266,666,666)	(133,333,334)
ණය ආපසු ගෙවීම් (විදේශීය)	21	(4,706,288,922)	(4,289,330,231)
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් (භාවිත කරන ලද)/ උපයන ලද ශුද්ධ මුදල්		(2,928,614,514)	15,410,682,264
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ (අඩු වීම)/ වැඩි වීම		229,290,986	(413,180,873)
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	17	413,045,010	826,225,883
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	17	642,335,995	413,045,010

පිටු අංක 90 සිට 117 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

1 ආයතනික තොරතුරු

1.1 පොදු තොරතුරු

ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ('සමාගම') ශ්‍රී ලංකාවේ සංස්ථාපිත නේවාසික පෞද්ගලික සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි පිහිටා ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ගුවන්තොටුපළ කළමනාකරණය, අභ්‍යන්තර ගුවන් යානා සහ ශ්‍රී ලංකා ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) හරහා පියාසර කරන ගුවන් යානා සඳහා ගුවන් යාන්ත්‍රණ සේවා සහ ගුවන්තොටුපළ පරිශීලකයින්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් සැපයීම යි.

1.3 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් නිකුත් කිරීම සඳහා 2023 පෙබරවාරි 21 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුකූලව අනුමැතිය ලබාදෙන ලදී.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අනුගමනය කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කළ සියලුම වසර සඳහා නිරතුරුවම යොදාගෙන ඇත.

2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKAs) අනුව සහ ඒවාට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. සමහර මූල්‍ය වත්කම් සහ වගකීම් සාධාරණ තක්සේරුව සහ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකම අනුව හඳුනා ගැනීම වෙනස් කරන ලද අතර වෙතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය විසින් ඔවුන්ගේ තීන්දුව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සඳහා උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර, සටහන 4 හි අනාවරණය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූල වේ.

2.1.1 ඒකාබද්ධ කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් සමාගමේ ඒකාබද්ධ තත්ත්වය ඉදිරිපත් කරන අතර මෙමගින්:

අ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන නියෝජනය කරන වැය ශීර්ෂ අරමුදල; හා

ආ) රඳවාගත් ආදායම් අරමුදලද ඇතුළත් වේ.

මෙය නීතිපතිවරයාගේ මතයක් බලාපොරොත්තුවෙන් 2011 වසර දක්වා වෙන වෙනම සකස් කර ඉදිරිපත් කරන ලද

2005 අගෝස්තු 17 දිනැති කැබිනට් අනුමැතියෙන් ලබා දුන් කැබිනට් සංදේශයේ 3.5 ඡේදය යටතේ සඳහන් වන ව්‍යවස්ථාපිත සංශෝධන ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස සමාගම සිවිල් ගුවන් සේවා අධිකාරියට කළ ඉල්ලීමකට අනුව අවශ්‍ය ව්‍යවස්ථාදායක සංශෝධන සමඟ ගුවන් තොටුපළේ වත්කම් සහ වගකීම් සමාගම සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නීතිපතිවරයාගේ මතය විමසා ඇත.

ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා අවශ්‍ය වූයේ පෙර පැවති ගුවන්තොටුපළ අධිකාරිය සතුව තිබූ වත්කම් වලින් කොටසක පමණක් හිමිකාරිත්වය 1983 වසරේ දී සමාගම පිහිටුවීමත් සමඟ සමාගමට පැවරීමත් ඉතිරි වත්කම් හා වගකීම් සමඟ ගුවන්තොටුපළ අධිකාරිය විසුරුවා හැරීමත් සමඟ වැය ශීර්ෂ සහ රඳවාගත් ආදායම් අරමුදල් යටතේ ගිණුම්ගත කර ඇත.

අරමුදල් දෙකෙහි සටහන් කර ඇති වත්කම් භාවිතයෙන් ආර්ථික ප්‍රතිලාභ ලබා ගනිමින් ද එසේම අදාළ වගකීම් වාර්තා කිරීමකින් තොරව ණය සේවා සැපයීමේ වගකීම් සඳහා ගිණුම්කරණය සිදුකරමින් ද සමාගම විසින් එහි මූලික ක්‍රියාකාරකම් වල නිරත වීමේ පදනම මත මේ අනුව මූලික ගිණුම්කරණ සංකල්පවලින් බැහැර වෙමින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2013 ජූනි 28 දින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRs/ LKAs) අනුකූල වන පරිදි ඒකාබද්ධ කිරීම අනුමත කරන ලදී.

2.1.2 අනුකූලතා ප්‍රකාශය

සමාගම් පනතේ සහ "SLFRs/LKAs" හි විධිවිධාන අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

2021 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්ත්වය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශ, හිමිකම් සහ මුදල් ප්‍රවාහ වල වෙනස්වීම්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ("මූල්‍ය ප්‍රකාශ") සංසන්දනාත්මක තොරතුරු ද සමඟින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූල වන අතර සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූල වේ. මෙම ප්‍රමිති www.casrilanka.com වෙබ් අඩවිය හි ලැයිස්තුගත කර ඇත.

2.1.3 සංසන්දනාත්මක තොරතුරු

වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කොට ඇත.

2.1.4 මිනුම් පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන වෙතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

- ආයෝජන දේපල - සාධාරණ වටිනාකම
- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ලෙස වර්ගීකරණය කරන ලද කෙටි කාලීන ආයෝජන - සාධාරණ වටිනාකම
- ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් - නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්තමාන වටිනාකමට හඳුනා නොගත් ආයුගණක ලාභ වැකතු කර හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභ අඩුකොට වගකීම් හඳුනාගෙන ඇත.

2.1.5 *ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්*

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් භාවිත කරමිනි (ක්‍රියාකාරී මුදල්). මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ඉදිරිපත් කිරීම් සහ ක්‍රියාකාරී මුදල් වල වෙනසක් සිදු නොවීය.

2.1.6 *මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම*

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති සමාගමේ වත්කම් සහ වගකීම් ස්වභාවය අනුව කාණ්ඩගත කර ඇති අතර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ කල්පිරීමේ රටාව පිළිබිඹු කරන අනුපිළිවෙලකට ලැයිස්තුගත කර ඇත. මූල්‍ය ප්‍රකාශන වලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ මුදල වාර්තා කරනු ලබන්නේ පිළිගත් මුදල් පියවීමට නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් පියවීමට අදහස් කරනවිට හෝ ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ නිරූපණයකින් අවසර දී ඇති අතර, සමාගමෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර ඇත.

2.1.7 *ප්‍රමාණවත් බව සහ සමාහරණය*

සමාන අයිතම වල සෑම ප්‍රමාණාත්මක කාණ්ඩයක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය- LKAS 1 හි 'මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' මඟින් අවසර දී ඇති පරිදි අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරිත්වයේ අයිතමයන් ප්‍රමාණාත්මක නොවන ඒවා හැර අනිත් අයිතමයන් වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.8 *විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය*

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තා කර ඇති වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් "SLFRS" සහ කළමනාකාරිත්වය සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ උපකල්පන අබණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන අවශ්‍ය විටෙක හඳුනා ගැනේ.

2.1.9 *අබණ්ඩ පැවැත්ම*

කළමනාකාරිත්වය විසින් අබණ්ඩ පැවැත්ම සඳහා ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමාගමේ අබණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳ කළමනාකරණය දැන නොසිටී. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අබණ්ඩව පැවැත්ම පදනම මත සකස් කරනු ලැබේ.

2.1.10 *මූල්‍ය උපකරණ*

මූල්‍ය උපකරණයක් යනු එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීම් හෝ හිමිකම් උපකරණයක් ඇති කරන ඕනෑම ගිවිසුමකි.

2.1.11 *විලම්බිත බදු වත්කම්*

බදු අලාභ සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇති අතර, එම බදු අලාභ භාවිත කළ හැකි වන්නේ අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට. අනාගත බදු-සැලසුම් උපාය මාර්ග සමඟ, අනාගත බදු අය කළ හැකි ලාභයේ විභව කාලය සහ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට උපකල්පන කරනු ලැබේ.

2.1.12 *ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් සහ හෙළිදරව් කිරීම්*

නව සහ සංශෝධිත ප්‍රමිති සහ අර්ථකථන

ගිණුම්කරණ ප්‍රමිතීන් සඳහා වන සංශෝධන කිහිපයක් 2022 ජනවාරි 1වන දිනෙන් පසු ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් මෙම සංශෝධන හරහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නැත.

SLFRS 3 ව්‍යාපාර සංයෝජන සඳහා සංශෝධන : සංකල්පීය රාමුව වෙත යොමුව යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් SLFRS 3 ව්‍යාපාර සංයෝජන සඳහා සංකල්පීය රාමුව වෙත යොමුව යාවත්කාලීන කිරීම සම්බන්ධ සංශෝධන නිකුත් කරන ලදී. 2018 මාර්තු මාසයේදී නිකුත් කරන ලද මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුව එහි අවශ්‍යතා සැලකිය යුතු ලෙස වෙනස් නොකර යොදා ගනිමින්, 1989 දී නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන රාමුව වෙත යොමුව ප්‍රතිස්ථාපනය කිරීමට මෙම සංශෝධන මඟින් අපේක්ෂා කරනු ලබයි.

පළමු වරට යොදා ගනු ලබන්නෙකු ලෙස ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අනුබද්ධ ආයතනය SLFRS 1 පළමු වරට යොදා ගැනීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් SLFRS ප්‍රමිති ක්‍රියාවලියට 2018-2020 වාර්ෂික වෙනස්කම් කිරීම්වල කොටසක් ලෙස, SLFRS 1 ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS 1) පළමු වරට යොදා ගැනීම සඳහා සංශෝධනයක් නිකුත් කරන ලදී. SLFRS වෙත වෙනස් වීමේ පරිපාලකයේ දිනය මත පදනම්ව, පරිපාලකය විසින් වාර්තා කරන ලද ප්‍රමාණයන් භාවිත කරමින්, සමුච්චිත පරිවර්තන වෙනස්කම් මැනීමට SLFRS 1 හි ඇ 16(අ) ඡේදය යොදාගැනීමට තෝරා ගන්නා අනුබද්ධිත ආයතනයකට, සංශෝධනය මඟින් අවකාශය ලබා දෙනු ලබයි. SLFRS 1 හි ඇ 16(අ) ඡේදය යොදාගැනීමට තෝරා ගනු ලබන ආශ්‍රිත හෝ හවුල් ව්‍යාපාරයකට ද මෙම සංශෝධනය අදාළ වේ.

2.2 විදේශ මුදල් පරිවර්තනය

(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ('ක්‍රියාකාරී මුදල්') භාවිත කරමිනි. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

(ආ) ගනුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලබන්නේ ගනුදෙනු කරන දිනයන්හි විනිමය අනුපාත භාවිත කරමිනි. එවැනි ගනුදෙනු පියවීම නිසා සහ වසර අවසාන විනිමය අනුපාත වල විදේශ මුදල් වලින් නම් කරන ලද මුදල් වත්කම් සහ වගකීම් පරිවර්තනයෙන් ලැබෙන විදේශ විනිමය ලාභ සහ අලාභ සාමාන්‍යයෙන් විස්තීරණ ආදායමක් ලෙස හඳුනා ගැනේ. එම ගනුදෙනු සුදුසුකම් ලබන මුදල් ප්‍රවාහ සුරැකුම් සහ සුදුසුකම් ලබන ශුද්ධ ආයෝජන සුරැකුම් වලට සම්බන්ධ නම් හිමිකම් වලින් වශයෙන් කල් දමනු ලබන අතර නැතහොත් විදේශීය මෙහෙයුමක ශුද්ධ ආයෝජනයෙන් කොටසකට ආරෝපණය කළ හැකිය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

ණය ගැනීම්වලට අදාළ විදේශ විනිමය ලාභ සහ අලාභ සහ මුදල් හා මුදල් සමාන දෑ 'මූල්‍ය ආදායම හෝ පිරිවැය' තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ 'වෙනත් (අලාභ)/ලාභ - ශුද්ධ' තුළ ඉදිරිපත් කෙරේ.

විදේශ මුදලකින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මුදල් නොවන අයිතම සාධාරණ වටිනාකම තීරණය කළ දිනයේ විනිමය අනුපාත භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ. සාධාරණ වටිනාකමින් ගෙන යන වත්කම් සහ වගකීම් පිළිබඳ පරිවර්තන වෙනස්කම් සාධාරණ වටිනාකම් ලාභයේ හෝ අලාභයේ කොටසක් ලෙස වාර්තා වේ. උදාහරණයක් ලෙස, විස්තීර්ණ ආදායම හරහා සාධාරණ වටිනාකමක් ඇති හිමිකම් වැනි මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් පිළිබඳ පරිවර්තන වෙනස්කම්, සාධාරණ වටිනාකම් ලාභයේ හෝ අලාභයේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායමේ හඳුනාගැනෙන අතර වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමක් ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම් වැනි මූල්‍ය නොවන වත්කම් වල පරිවර්තන වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනා ගැනේ.

2.3 ප්‍රවර්තන සහ විලම්බිත ආදායම් බදු

කාල සීමාව සඳහා බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. වෙනත් විස්තීර්ණ ආදායමක හෝ සෘජුවම හිමිකම් වල හඳුනාගත් අයිතම වලට අදාළ වන ප්‍රමාණයට හැර, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ බද්ද හඳුනාගෙන ඇත. මෙම අවස්ථාවෙහි දී, බද්ද පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමක හෝ සෘජුවම හිමිකමක හෝ හඳුනාගනු ලැබේ. ප්‍රවර්තන ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දී පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු නීති මත ය.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තා වල ගනු ලබන තීරණ කළමනාකරණය විසින් වරින් වර ඇගයීමට ලක් කෙරේ. බදු අධිකාරීන් වෙත ගෙවීමට අපේක්ෂා කරන අගයන් මත සුදුසු අවස්ථා වල දී කළමනාකරණය විසින් ප්‍රතිපාදන ස්ථාපිත කෙරේ.

වත්කම් සහ වගකීම් වල බදු පදනම් සහ මූල්‍ය ප්‍රකාශන වල ඒවා රැගෙන යන ප්‍රමාණයන් අතර පැන නගින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත ආදායම් බද්ද හඳුනා ගැනේ. කෙසේ වෙතත්, විලම්බිත බදු වගකීම්, කීර්තිනාමයේ මූලික පිළිගැනීමෙන් පැනනගින නම් ඒවා හඳුනා නොගනී; විලම්බිත ආදායම් බද්ද, ගනුදෙනුව සිදුවන අවස්ථාවේ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභය හෝ අලාභය බලනොපාන ව්‍යාපාරික සංයෝජනයක් හැර වෙනත් ගනුදෙනුවක වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් පැන නගින්නේ නම් එය ගණන් නොගනී. විලම්බිත ආදායම් බද්ද තීරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය මගින් පනවනු ලැබූ හෝ සැලකිය යුතු ලෙස පනවනු ලැබූ බදු අනුපාත (සහ නීති) භාවිතයෙන් වන අතර අදාළ විලම්බිත ආදායම් බදු වත්කම හඳුනා ගත් විට හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවූ විට යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි, අනාගත බදු අය කළ යුතු ලාභය ලබා ගත හැකි සම්භාවිතාව ඇති ප්‍රමාණයට පමණි.

ප්‍රවර්තන බදු වගකීම් වලට අදාළව ප්‍රවර්තන බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් එම බදු අධිකාරිය විසින් අය කරනු ලබන ආදායම් බදු වලට අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ.

2.4 තොග

යල්පැන ගිය සහ සෙමින් සංචලනය වන අයිතම සඳහා නියමිත ගැලපුම් කිරීමෙන් පසු තොග පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයට යන දෙකෙන් අඩු අගයට ගණනය කර ඇත.

2003 දෙසැම්බර් 31 දිනට පෙර මිලදිගත් ගිනි නිවන උපකරණ සඳහා අමතර කොටස් සහ පරිභෝජන ද්‍රව්‍ය ආගණනයක් මත පදනම්ව තක්සේරු කර පසුව බරතැබූ සාමාන්‍ය පදනම මත තක්සේරු කෙරේ.

ඉන්ධන හැර අනෙකුත් භාණ්ඩ තොග එහි වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන වීමේ දී දරන ලද පිරිවැය ගණනය කරනු ලබන්නේ බරතැබූ සාමාන්‍ය පදනම භාවිත කරමින් වන අතර ඉන්ධන ප්‍රථම-ලැබීම් ප්‍රථම-නිකුතු ක්‍රමය (FIFO) මත වටිනාකම ගණනය කරනු ලැබේ.

සමාගමෙහි වසර 10 කට වැඩි කාලයක් සංචලනය නොවන සියලුම තොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

2.5 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ

ලැබිය යුතු වෙළඳ මුදල් මුලින් සාධාරණ වටිනාකමින් හඳුනාගෙන පසුව හානිකරණය සඳහා අඩු ප්‍රතිපාදන සහිත ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂ වියදම් යටතේ මනිනු ලැබේ.

බොල් ණය සහ අඩමාන ණය ලැබිය යුතු දෑ පිරිවැයට ගැලපීමෙන් පසු අනිකුත් ලැබිය යුතු දෑ හඳුනා ගනු ලැබේ.

2.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අර්ථ දැක්වෙන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වන අතර මේවා දන්නා අගයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීමෙහි සුළු අවදානමකට යටත්ව වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් සහ බැංකු අයිරා වල ශුද්ධ බැංකු තැන්පතු වලින් සමන්විත වේ. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන වීනම් අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

2.7 දේපල, පිරියත සහ උපකරණ

සියලුම දේපල, පිරියත සහ උපකරණ මුලදී පිරිවැය මත වාර්තා කර ඇති අතර සමුච්චිත ක්ෂය වීම් අඩු කරන ලද ඓතිහාසික පිරිවැයෙන් ප්‍රකාශ කර ඇත. ඓතිහාසික පිරිවැයට අයිතමයන් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ද අයිතමය කඩා ඉවත් කිරීම සහ එය පිහිටා ඇති භූමිය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය පිළිබඳ මූලික ඇස්තමේන්තුව ද අයිතමය අත්පත් කර ගැනීම හෝ එම කාල සීමාව තුළ බඩු තොග නිෂ්පාදනය කිරීමට හැර වෙනත් අරමුණු සඳහා යම් කාල සීමාවක් තුළ භාණ්ඩය භාවිත කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස අයිතමය සතු වන වගකීම ද ඇතුළත් වේ.

ස්වයං-නිෂ්පාදිත වත්කම් වල පිරිවැයට ද්‍රව්‍ය වල පිරිවැය, සෘජු ශ්‍රමය සහ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සඳහා සුදුසු සමානුපාතිකයක් ඇතුළත් වේ.

පසුකාලීන වියදම්, වත්කම් ධාරන අගයට ඇතුළත් කර හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ, භාණ්ඩය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට සම්භාවිතාව ඇති විට පමනක් වන අතර භාණ්ඩයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිවිටය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරන අගය හඳුනා නොගනී. සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් ඒවා දරන මූල්‍ය කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය වෙතින් අය කෙරේ.

දිගුකාලීන ප්‍රාග්ධන ව්‍යාපෘති වල පිරිවැය, ව්‍යාපෘති අවසන් කර අදාළ වත්කම් භාවිතය සඳහා පවතින තුරු නොනිමි ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස ඉදිරියට ගෙන යනු ලැබේ.

ක්ෂය වීම ආරම්භ වන්නේ යම් දේපලක්, පිරියතක් සහ උපකරණයක් භාවිතය සඳහා පවතින විට වන අතර, එම කාල සීමාව තුළ අයිතමය අක්‍රිය වුව ද, එය හඳුනා නොගන්නා තෙක් දිගටම පවතිනු ඇත. භාණ්ඩයේ මුළු පිරිවැයට සාපේක්ෂව සැලකිය යුතු පිරිවැයක් සහිත දේපල, පිරියත සහ උපකරණ වල සෑම කොටසක් ම වෙන වෙනම ක්ෂය කළ යුතුය. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. අනෙකුත් වත්කම් වල ක්ෂය වීම් ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය භාවිත කර ඒවයේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයට වඩා ඒවායේ ඉතිරි අගයන් වෙත ඒවාහි පිරිවැය වෙන් කිරීම සඳහා ය.

වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:

ගොඩනැගිලි	වසර 50 ට වැඩි
පිරියත සහ උපකරණ	වසර 04 සිට 20 දක්වා
මෝටර් රථ වාහන	වසර 04 සිට 15 දක්වා
ලී භාණ්ඩ, සවිකිරීම් සහ කාර්යාල උපකරණ	වසර 08 ට වැඩි
සන්නිවේදන සහ ගඟන නාවික උපකරණ	වසර 05 සිට 10 දක්වා
වෙනත් උපකරණ	වසර 08 ට වැඩි
ගුවන්තොටුපළ යටිතල පහසුකම්	වසර 08 සිට 50 දක්වා

වත්කමක ධාරන අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම්, වත්කමේ ධාරන අගය වහාම එහි ආපසු ලබාගත හැකි අගය වෙනුවට ක්ෂණිකව ලියා හරිනු ලැබේ.

එක් එක් ප්‍රධාන පරීක්ෂාව සිදු කරන විට, හඳුනාගැනීමේ නිර්ණායක තෘප්තිමත් වන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියත සහ උපකරණ වල රැගෙන යන අගයන් හඳුනා ගැනේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් විකිණීමේදී හෝ එය භාවිත කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේ ආදායම සහ වත්කමේ ධාරන අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම හඳුනා නොගත් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් වේ.

වත්කම්වල සුන්බුන් අගයන්, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂය වීම් ක්‍රම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර සුදුසු නම් ගළපනු ලැබේ.

විකිණීමේදී ලැබෙන ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ධාරන අගය සමඟ ආදායම සංසන්දනය කිරීමෙන් වන අතර මෙය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් / (අලාභ) ශුද්ධ තුළ හඳුනා ගැනේ.

දේපල, පිරියත සහ උපකරණ වල අපහායනය
දේපල, පිරියත සහ උපකරණ වල ධාරන අගය ආපසු හැරවිය නොහැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ තත්වයන් වෙනස් වන විට අපහායනය සඳහා සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම් සහ ධාරන අගයන් ඇස්තමේන්තුගත අයකරගත හැකි අගය ඉක්මවන විට වත්කම් ඒවායේ අයකරගත හැකි අගයට ලියා හැර ඇත. එම වත්කම සඳහාම පෙර ප්‍රත්‍යාග ණන අතිරික්තයක් ආපසු හරවන්නේ නම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මඟින් අපහායන අලාභ හඳුනා ගැනේ.

2.8 ප්‍රකාශිත ප්‍රාග්ධනය
සාමාන්‍ය කොටස් හිමිකම් ලෙස වර්ග කෙරේ

2.9 වෙළඳ ගෙවිය යුතු දෑ
වෙළඳ ගෙවිය යුතු දෑ යනු සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී අත්පත් කරගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට ඇති බැඳීම් වේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ඒවා වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද අයිතම යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක කාල සීමාවකට ඔබ්බෙන් ගෙවීමට නියමිත ඒවා වේ.

ගෙවිය යුතු වෙළඳ මුදල්, ගනුදෙනු මිලට මුලින් හඳුනාගෙන පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂ පිරිවැයෙන් මනිනු ලැබේ.

2.10 ණය ගැනීම්
ණය ගැනීම් මුලින් හඳුනාගනු ලබන්නේ සිදු වූ ගනුදෙනු පිරිවැයේ ශුද්ධ සාධාරණ වටිනාකමින් ය. ණය ගැනීම් පසුව ක්‍රමක්ෂ මිලට සඳහන් කරනු ලැබේ; ඵලදායී පොලී ක්‍රමය භාවිත කරමින් ණය ලබා ගත් කාලසීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ලැබෙන ආදායම (ශුද්ධ ගනුදෙනු පිරිවැය) සහ නිදහස් කිරීමේ අගය අතර යම් වෙනසක් හඳුනා ගැනේ.

ණය පහසුකම් ස්ථාපිත කිරීමේ දී ගෙවනු ලබන ගාස්තු ණයෙහි ගනුදෙනු පිරිවැය ලෙස හඳුනාගෙන ඇති අතර එම පහසුකම්වලින් සමහරක් හෝ සියලු පහසුකම් අඩු කිරීමට ඉඩ ඇත. මෙම අවස්ථාවෙහි දී, මුදල ආපසු ගැනීම සිදු වන තෙක් ගාස්තුව කල් දමනු ලැබේ. සමහරක් හෝ සියලුම පහසුකම් අඩු කිරීමට ඉඩ ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති තාක් දුරට, ගාස්තු ද්‍රවශීලතා සේවා සඳහා පූර්ව ගෙවීමක් ලෙස ප්‍රාග්ධනීකරණය කර එය අදාළ පහසුකමේ කාලසීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.11 ණය ගැනීමේ පිරිවැය
අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් වීමට අත්‍යවශ්‍යයෙන්ම සැලකිය යුතු කාලයක් ගත වන සුදුසුකම් ලත් වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

සාමාන්‍ය සහ විශේෂිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් ඒවාහි අපේක්ෂිත භාවිතය සඳහා සැලකිය යුතු ලෙස සූදානම් වන කාලය වන තුරු පිරිවැය වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ.

සුදුසුකම් ලබන වත්කම් සඳහා වන වියදම් සඳහා නියමිත නිශ්චිත ණය ගැනීම් වල තාවකාලික ආයෝජනය මත උපයාගත් ආයෝජන ආදායම ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැයෙන් අඩු කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා දරන කාල සීමාව තුළ ලාභ හෝ අලාභ ලෙස හඳුනාගෙන ඇත.

2.12 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වර්තමාන නෛතික හෝ සාධනීය බැඳීමක් ඇති විට ප්‍රතිපාදන හඳුනාගෙන ඇති අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇති අතර වගකීමේ හි අගය මත විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැකිය. මුදල් වල කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, ප්‍රතිපාදන තීරණය කරනු ලබන්නේ මුදල් වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපළ තක්සේරු කිරීම් සහ, සුදුසු අවස්ථාවල දී, වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන බදු පෙර අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි. වට්ටම් භාවිත කරන විට, කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදන වැඩි වීම පොලී වියදමක් ලෙස පිළිගැනේ.

2.13 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත දායක සැලැස්මක් යනු සමාගම විසින් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන විශ්‍රාම වැටුප් සැලැස්මකි. වත්මන් සහ පෙර කාල පරිච්ඡේදය තුළ සියලුම සේවකයින්ට සේවයට අදාළ ප්‍රතිලාභ ගෙවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොමැති නම්, තවදුරටත් දායක මුදල් ගෙවීමට සමාගමට නෛතික හෝ ඵලදායී බැඳීමක් නොමැත. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන විශ්‍රාම වැටුප් සැලැස්මකි.

සාමාන්‍යයෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මඟින් සේවකයෙකු විශ්‍රාම යාමේ දී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණයක් නිර්වචනය කරන අතර සාමාන්‍යයෙන් මෙය වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතී.

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම, සැලසුම් වත්කම් වල සාධාරණ වටිනාකමට අඩු කළ අගය. වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම ස්වාධීන ආයුගණක ආයතන විසින් ආයුගණක තක්සේරුව භාවිතයෙන් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නම් කෙරෙන සහ අදාළ විශ්‍රාම වැටුප් වගකීමෙහි නියමයන්ට ආසන්නව කල් පිරෙන කොන්දේසි ඇති උසස් තත්ත්වයේ ආයතනික බැඳුම්කර වල පොලී අනුපාත භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් පිටතට ගලායාම වට්ටම් කිරීමෙනි. එවැනි බැඳුම්කර වල ගැඹුරු වෙළෙඳපොළක් නොමැති රටවල, රජයේ බැඳුම්කර වල වෙළෙඳපොළ අනුපාත භාවිත කරනු ලැබේ.

සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීම සඳහා වර්ෂය සඳහා ස්වාධීන ආයුගණක තක්සේරුකරුවෙකුගේ ඇගයීම් සේවාවන් ලබාගෙන ඇත.

පලපුරුද්ද මත කරනු ලබන ගැලපීම් සහ ආයුගණක උපකල්පන වල වෙනස් වීම් නිසා ඇතිවන ආයුගණක ලාභ හා අලාභ ඒවා පැන නැගෙන කාල පරිච්ඡේදයේ දී වෙනත් විස්තීර්ණ ආදායමෙ හි හිමිකම් වෙත අය හෝ බැර කෙරේ.

(ආ) නිශ්චිත දායක සැලසුම්

ශ්‍රී ලංකාව තුළ සිටින සමාගමේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර, එම සේවකයින්ගේ මූලික හෝ ඒකාබද්ධ වේතනයෙන් හෝ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හෝ 3% ක් වශයෙන් දායක වේ.

2.14 ප්‍රදාන සහ සහනාධාර

වත්කම් වලට අදාළ මූදල් ප්‍රදාන පිරිවැය ලෙස හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල් දමනු ලබන අතර වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

2.15 මූල්‍ය නොවන වත්කම් වල අපහායනය

අවිනිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති වත්කම් - නිදසුනක් වශයෙන්, කීර්තිනාමය හෝ භාවිත කිරීමට සූදානම් තත්ත්වයක නැති අස්පෘශ්‍ය වත්කම් - ක්‍රමක්ෂය කළ නොහැකි අතර වාර්ෂිකව අපහායනය වී ඇත්දැයි දැන ගැනීම සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය අය කර ගත නොහැකි බව සිද්ධීන් හෝ තත්ත්වයන් වෙනස් වීම් මඟින් පෙන්නුම් කරන සෑම අවස්ථාවකදීම ක්‍රමක්ෂය කිරීමට යටත් වන වත්කම් අපහායනය සඳහා සමාලෝචනය කෙරේ.

වත්කම් වල ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවන ධාරණ අගයක් ඇති විට අපහායන අලාභයක් හඳුනා ගැනේ. වත්කමේ ආපසු අය කර ගත හැකි අගය යනු වත්කමේ සාධාරණ අගයෙන් වත්කම විකිණීමට දරන පිරිවැය අඩු කළ පසු අගය හා වත්කම දැනට භාවිත කරන අයුරෙන් ඉපයිය හැකි ආදායම යන දෙකෙන් වැඩි අගය වේ. අපහායනය තක්සේරු කිරීමේ අරමුණු සඳහා වත්කම් විවිධ මට්ටම් වලට කාණ්ඩ කර ඇති අතර ඒ කාණ්ඩ සඳහා වෙන වෙනම හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් ඇත (මුදල් උත්පාදන ඒකක). එක් එක් වාර්තා කිරීමේ දිනයන්හි දී වත්කම් අපහායනය ආපසු හැරවිය යුතුද යන්න තීරණය කිරීම සඳහා අපහායනය වූ කීර්තිනාමය හැර මූල්‍ය නොවන වත්කම් සමාලෝචනය කෙරේ.

2.16 මූල්‍ය වත්කම්

2.16.1 වර්ගීකරණය

සමාගම සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩ වලට වර්ගීකරණය කරයි: ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ක්‍රමක්ෂය පිරිවැය යටතේ හඳුනාගන්නා වත්කම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා වත්කම් වශයෙනි. මුල් හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීමට සමාගම භාවිත කරන ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී.

(අ) ක්‍රමක්ෂය පිරිවැය

වත්කම් මනිනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශන වල වත්කම් මුලින්ම හඳුනාගැනීමේ දී ගනු ලැබූ අගයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර, එම ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ලාභ/ අලාභ වල සමුච්චිත අගය එකතු කිරීමට හෝ අඩු කිරීමට අවශ්‍ය ගැලපීම සිදු කිරීමෙන් පසු අගයට ය. සඵලදායී පොලී

ක්‍රමය උපයෝගී කරගනිමින් පොළී ආදායම ගණනය කෙරෙන අතර එය ලාභ හා අලාභ තුලින් හඳුනාගනු ලැබේ. සාධාරණ අගයෙහි වෙනස්කම් වත්කම් ගිණුම් වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණයකට ලක් කළ විට ලාභ හා අලාභ තුළින් හඳුනා ගැනේ.

(ආ) වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය

ණය සහ ලැබීම් - පොළී ආදායම, අපහායන ලාභ සහ අලාභ, සහ විදේශ විනිමය ලාභ සහ අලාභ වලින් කොටසක්, ක්‍රමක්ෂය කළ පිරිවැය වත්කම් සඳහා සමාන පදනමක් මත ලාභ සහ අලාභයන් හි හඳුනා ගැනේ. සාධාරණ අගයේ වෙනස්වීම් මුලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් (OCI) හි හඳුනා ගැනේ. වත්කම් ගිණුම් වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායමෙහි කලින් හඳුනා ගෙන තිබූ අතර සාධාරණ අගයන්හි වත්කම් ලාභ සහ අලාභ හරහා මූල්‍ය වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේ දී, ඒ මත පදනම්ව සෑම විටම සාධාරණ අගයට වත්කම් මනිනු ලබන අතර වෙනත් විස්තීර්ණ ආදායමෙන් ලාභ සහ අලාභය කෙරෙහි බලපැවැත්වෙන පරිදි එය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

හිමිකම් උපකරණ වල ආයෝජනය - - ලාභාංශ හඳුනාගනු ලබන්නේ ගෙවීම් ලැබීමට ආයතනයට ඇති අයිතිය තහවුරු වූ විට ය. එවිට ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට ඉඩ ඇති අතර එම මුදල විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ලාභාංශ ලාභ සහ අලාභ ඔස්සේ හඳුනාගනු ලබන්නේ ආයෝජනයේ පිරිවැයෙන් කොටසක් නැවත අයකර ගැනීම පැහැදිලිව නියෝජනය නොකරන්නේ නම් ඒවා වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් කළ යුතු ය. සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙ හි හඳුනාගෙන ඇති අතර වත්කම විකිණීම හෝ අපහායනය වීම සිදු වුව ද කිසි විටෙකත් ලාභ හා අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකෙරේ.

(ඇ) ලාභ සහ අලාභ තුළින් සාධාරණ අගය

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය (FVOCI) සඳහා වන නිර්ණායකයන් සපුරාලන්නේ නැති වත්කම් ලාභ සහ අලාභ ඔස්සේ සාධාරණ අගයට (FVPL) මනිනු ලැබේ.

2.16.2 හඳුනා ගැනීම හා මිනුම් කිරීම

මූල්‍ය වත්කම් නිතිපතා මිලදී ගැනීම් සහ විකිණීම ලභ සහ අලාභ ගිණුම හරහා සමාගම වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීමට එකඟ වූ දිනයේ දී හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනානොගන්නා මූල්‍ය වත්කම් මුලින් සාධාරණ අගයට ගනුදෙනු පිරිවැය එකතු කර මුලින් හඳුනා ගනු ලැබීය. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකමකින් ගෙන යන මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමින් හඳුනාගෙන ඇති අතර ගනුදෙනු පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් වශයෙන් සඳහන් කෙරේ. ආයෝජන වලින් මුදල් ගලා ඒමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ මාරු කළ විට සහ සමාගමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු වශයෙන් මාරු කළ විට මූල්‍ය වත්කම් ගිණුම් වලින් ඉවත් කෙරේ.

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම්' කාණ්ඩයේ සාධාරණ අගයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ශුද්ධ ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශනයෙහි ඉදිරිපත් කරන කාල සීමාව තුළ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම් වලින් ලැබෙන ලාභාංශ ආදායම සමාගමට ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට වෙනත් ආදායම් යටතේ කොටසක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාගනු ලැබේ.

විකිණීම සඳහා යොදා ගත හැකි යැයි වර්ගීකරණය කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන සුරුකුම්පත් වල සාධාරණ අගයෙහි වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායමක් ලෙස හඳුනා ගැනේ.

2.17 මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් ප්‍රමාණය හිලව් කිරීමට නීතියෙන් බලකළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම විකිණීමට සහ එකවර වගකීම් පියවීමට අදහස් කරන මූල්‍ය වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් වන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරයි. නෛතිකව බලාත්මක කිරීමේ අයිතිය අනාගත සිදුවීම් මත අසම්භාව්‍යයක් නොවිය යුතු අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී මෙන්ම සමාගමේ හෝ අදාළ පාර්ශ්වයන්ගේ පැහැර හැරීම, බුන්වත් වීම හෝ සමාගම හෝ සමාන තැනැත්තාගේ බංකොලොත් වීම යන සිදුවීම් වල දී බලාත්මක විය යුතු ය.

2.18 මූල්‍ය වත්කම් අපහායනය

සමාගම මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් ප්‍රභේද අපහායනය වීම පිළිබඳ විෂයාත්මක සාක්ෂි ඇත්ද යන්න සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේ දී ම තක්සේරු කරයි. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් ප්‍රභේද වල අගය අඩුවීමක් හෝ අගය අඩුවීම අනුව අලාභයක් මූලිකව හඳුනා ගත් වත්කම් (පාඩුවක් සිදුවන අවස්ථාවක්) සහ අලාභ සිදුවීමක් (හෝ සිදුවීම්) වැනි සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ මත බලපාන්නේ නම් එය විශ්වාසදායී ලෙස තක්සේරු කළ හැකිය.

අපහායනය වීමේ සාක්ෂි වලට ණය ගැතියන් හෝ ණයගැති ප්‍රභේද වල සැලකිය යුතු මූල්‍ය අපහසුතා, පොළී හෝ මුල් මුදල ගෙවීම පැහැර හැරීම හෝ නොගෙවා සිටීම, බුන්වත් වීමේ සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය අපහසුතා ඇතුළත් වන අතර නිරීක්ෂණය කළ දත්ත මඟින් හිඟ මුදල් වල වෙනස්වීම් හෝ ප්‍රමාද වීම් සමඟ සම්බන්ධිත ආර්ථික කොන්දේසි වැනි අනාගත මුදල් ප්‍රවාහ වල සැලකිය යුතු අඩුවීමක් ආදිය පෙන්නුම් කිරීම ඇතුළත් වේ.

සියලු ණය සුරුකුම්, ණය සහ වෙළඳ ලැබිය යුතු දෑ වල අපේක්ෂිත ණය අලාභ මාස 12 ක හෝ ජීව කාල පදනමෙන් වාර්තා කළ යුතු යැයි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 (SLFRS 09) මඟින් ඉල්ලා සිටියි. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා අලාභ දීමනාව නිතරම මනිනු ලබන්නේ අපේක්ෂිත ණය පාඩු ජීවකාලය (ECL) ට සමාන ප්‍රමාණයකට ය. මූලික හඳුනා ගැනීමේ සිට සහ අපේක්ෂිත ණය පාඩු තක්සේරු කරන විට මූල්‍ය වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇද්ද යන්න තීරණය කිරීමේ දී සමාගම අධික පිරිවැයක් හෝ උත්සහයක් නොමැතිව ලබාගත හැකි අදාළ සාධාරණ සහ සහයවන තොරතුරු සලකා බලයි. සමාගමේ ඓතිහාසික අත්දැකීම් සහ අනාගත තොරතුරු ද ඇතුළුව දැනුවත් වූ ණය තක්සේරු කිරීම් මත පදනම් වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු මෙහි ඇතුළත් වේ. දින 365 කට වැඩි ණය සඳහා මූල්‍ය වත්කමක ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩිවේ යයි සමාගම උපකල්පනය කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම සටහන්වල සියලුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

2.19 මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් යටතට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු ණය සහ අනෙකුත් ණය ගැනීම් සහ අහිතකර මූල්‍ය ඉදිරි ගිවිසුම් ආදිය ඇතුළත් වේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට දක්වන මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලු මූල්‍ය වගකීම් ආරම්භයේ දී ඒවායේ සාධාරණ වටිනාකමින් හඳුනාගන්නා අතර පසුව වට්ටම් කිරීමේ ප්‍රතිඵලය නොවැදගත් නම් සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. ඒ අනුව ඒවා පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.20 ආදායම් හඳුනාගැනීම

ආදායම හඳුනාගැනීම කරනුයේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු වේ යැයි අපේක්ෂා කළ හැකි ආදායම් හා ඒ ආශ්‍රිතව ඇතිවන හෝ ඇතිවිය හැකි වියදම් විශ්වාසයෙන් යුතුව මැනිය හැකි ප්‍රමාණයට පමණි. ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය හෝ වෙළඳ වට්ටම් හෝ විකිණුම් බදු වල ලැබිය යුතු ශුද්ධ අගය මත මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායකයන් භාවිත කරයි.

(අ) සේවා සැපයීමේදී

සේවා සැපයීමෙන් ලැබුණු ආදායම එම සේවාව සැපයූ හෝ ක්‍රියාත්මක කළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ දී හඳුනා ගනියි.

(ආ) පොලිය

අය කර ගැනීමේ අවිනිශ්චිතතාවයක් නොමැති නම් පොලිය උපචිත ආකාරයෙන් හඳුනා ගනියි.

(ඇ) බදු කුලී ආදායම

කුලී ආදායම කුලී ගිවිසුමෙ හි විස්තර කොට ඇති පරිදි උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඈ) වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු

අදාළ ගිවිසුමේ හරයට අනුකූලව වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඉ) ජාත්‍යන්තර / දේශීය ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම්

ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම, අවම ගාස්තු සහ ගුවන් තොටුපළ අංගනයෙහි නැවතුම් කාලයට යටත්ව උපරිම ඉහළ නැංවීමේ බර මත පදනම් වන අතර උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඊ) හරහා පියාසර ආදායම

හරහා පියාසර ආදායම උපරිම ඉහල නැංවීමේ බර මත පදනම්ව ගණනය කරන අතර උපචිත පදනම මත හඳුනා ගනී.

(උ) ගුවන් පාලම් ආදායම

ගුවන් පාලම් ආදායම ගුවන් පාලම පාවිච්චි කරන කාලය සහ ගුවන් යානා වර්ගය මත පදනම්ව ගණනය කරයි. ආදායම උපචිත පදනම මත හඳුනා ගනියි.

(ඌ) ගුවන් යානයට නැගීමේ බදු

ගුවන් යානයට නැගීමේ බදු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් මූල්‍ය පනතට අනුව විකතු කරනු ලබන අතර වික්සත් ජනපද ඩොලර් 9.75 ක් ලෙස ගු.ගු.සේ.ස. සමාගමට ප්‍රේෂණය කරයි. ආදායම උපචිත පදනම මත හඳුනා ගනියි.

(එ) ඇතුළුවීමේ අවසරපත් ගාස්තු, නැවතුම් ගාස්තු (වාහන), දැනුම් දීම් පුවරුව

ආදායම හදුනාගැනීම සහ විකතු කිරීම මුදල් පදනම මත සිදුවේ.

(ඒ) වෙනත්

විවේකාගාර ආදායම්, ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනම මත හඳුනා ගනියි.

දැවීමේ උපකරණ ආදායම් උපචිත පදනම මත හඳුනා ගනියි.

අනෙකුත් ආදායම් මූලාශ්‍ර, ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනමෙන් හඳුනා ගනියි.

3 මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1 මූල්‍ය අවදානම් සාධක

සමාගමේ ක්‍රියාකාරකම් විවිධ මූල්‍ය අවදානම් වලට විවෘතව පවතී. එනම් වෙළඳපොළ අවදානම (විදේශ මුදල් අවදානම්, මුදල් ප්‍රවාහ සහ සාධාරණ අගයේ පොලී අනුපාත අවදානම ඇතුළුව), ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම වේ.

(අ) වෙළඳපළ අවදානම

(i) විදේශ විනිමය අවදානම

සමාගම විනිමය අනුපාතයන් හි උච්ඡාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් වික්සත් ජනපද ඩොලර් (USD), යුරෝ සහ ජපන් යෙන් වලට අනුව ශ්‍රී ලංකා රුපියලේ (LKR) උච්ඡාවචනයන්ට විවෘතව පවතී. සමාගමේ ක්‍රියාකාරී මුදල් වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර බොහෝ ගනුදෙනු සිදුකරනු ලබන්නේ රුපියල් වලිනි. අනෙකුත් මුදල් බොහොමයක් විදේශ ණය ගෙවීමේ අරමුණු සඳහා විදේශ මුදල් ලෙස සැලකේ. සමහර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ද විදේශ මුදලින් සිදු කරයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන බැවින්, පරිවර්තන අවදානම සහ ගනුදෙනු අවදානම යන දෙකෙන්ම විදේශ විනිමය උච්චාවචනයන්ගේ බලපෑමට ලක්වෙයි. විදේශ මුදල් වල විනිමය අනුපාත වෙනස්කම් සමාගමේ ලාභ හෝ අලාභ කෙරෙහි බලපායි. උදාහරණයක් ලෙස වික්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව හරහා විදේශ මුදලින් ලබාගෙන ඇති ණය ගෙවීමට යාමේ දී සමාගමේ ලාභදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

